ශ්‍රී ලංකා වරාය අධිකාරිය



# වාර්ෂික වාර්තාව
# 2022

# අපගේ දැක්ම

**“ගෝලීය සමුද්‍රීය හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක තත්ත්වය මුදුන්පත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ගාමක ආයතනය බවට පත්වීම”**

# අපගේ මෙහෙවර

**“සියළුම සේවාලාභී ආයතන වෙත ජාත්‍යන්තර මට්ටමේ වරාය පහසුකම් හා සේවා සැපයීම මගින් ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීම”**

# පටුන


| | |
|---|---|
| අපගේ ආයතනික අරමුණු | 3 |
| අපගේ ආයතනික ක්‍රමෝපායයන් | 4 |
| අපගේ මෙහෙයුම් මූලධර්ම | 5 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය යනු | 6 |
| මෙහෙයුම් වැදගත් තොරතුරු | 7 |
| මූල්‍ය වැදගත් තොරතුරු | 10 |
| අපේ අමාත්‍යවරු | 11 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 12 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 16 |
| කළමනාකාරීත්ව කමිටුව | 22 |
| ව්‍යාපාර සංවර්ධන | 24 |
| සංවර්ධන ව්‍යාපෘති | 25 |
| මෙහෙයුම් සමාලෝචනය | 32 |
| මූල්‍ය සමාලෝචනය | 55 |
| මානව ප්‍රාග්ධනය | 60 |
| ආයතනික සමාජ වගකීම් | 61 |
| ආයතනික පාලන වාර්තාව | 62 |
| වැගදත් සංධිස්ථාන | 65 |
| වරාය සංඛ්‍යාලේඛන | 72 |
| මූල්‍ය ප්‍රකාශනයන් | 78 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 79 |
| මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 81 |
| විගණන කමිටු වාර්තාව | 82 |
| ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය | 85 |
| වැදගත් මෙහෙයුම් කරුණු | 86 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 87 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 88 |
| ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය | 89 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 91 |
| පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති | 92 |
| මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් | 110 |
| ප්‍රස්ථාරික සමාලෝචනය | 132 |
| විගණකාධිපති වාර්තාව | 134 |
| ආයතනික තොරතුරු | 156 |

# අපගේ ආයතනික අරමුණු

2022 - 2024 සැලසුම්ගත කාලසීමාව තුළ පහත සඳහන් අරමුණු හත (07) සාක්ෂාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉදිරියට ගමන් කරනු ඇත.

1. පොදුකාර්ය ව්‍යුහ හා උපරි කාර්ය ව්‍යුහ නවීන තාක්ෂණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නව්‍යතාවයෙන් යුතුව වැඩි දියුණු කිරීම තුළින් සුහුරු වරායක් නිර්මාණය කිරීම.

2. ඉදිරි තෙවසර තුළ වරාය ශ්‍රේණිගත කිරීම් වල හොඳම බහළු වරායයන් විස්ස (20) අතරට කොළඹ වරාය ගෙන ඒම.

3. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඵලදායීතාවය, සේවා ගුණාත්මකතාවය හා කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා මානව ප්‍රාග්ධනයේ නිපුණතාවය වැඩි දියුණු කිරීම.

4. ධනාත්මක ව්‍යාපාර සබඳතාවන් ශක්තිමත්ව ගොඩනැගීම සඳහා සියළුම වරාය ආශ්‍රිත ව්‍යාපාරික ආයතන, නැව් සමාගම් සහ රජයේ ආයතන වල සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.

5. අවම පිරිවැයකින් උපරිම වටිනාකමක් අත්පත් කර ගැනීම සඳහා සේවාලාභී පදනම, ව්‍යාපාර ධාරිතාවය සහ පිරිවැටුම වැඩි දියුණු කිරීම.

6. ආයතනික විශේෂිත පාලන කාර්යරාමුව, පද්ධති සහ කාර්යපටිපාටි දියුණු කිරීම.

7. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (UNSDGs) හා අනුගත වෙමින් කොළඹ වරායට හරිත සහ තිරසර තත්ත්වය ලභාකර ගැනීම.

පහත දැක්වෙන්නේ සංස්ථාපිත අරමුණු හා දිගුකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගනු ලබන උපාය මාර්ගයන්ය:

**වෙළඳපොළ අත්පත් කර ගැනීමේ ක්‍රමෝපාය**

සංවර්ධනය,මෙහෙයුම් සහ අලෙවිකරණය යන අංශ පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම තුළින් වර්තමානයේ වෙළඳපොළ මගින් ලබා දෙන වරාය සේවාවන් සඳහා වන වෙළඳපොළ කොටස් වර්ධනය කිරීම මෙම ක්‍රමෝපාය තුළින් අපේක්ෂා කරනු ලැබේ.

මෙම ක්‍රමෝපාය තුළ පහත ක්‍රමවේද ඇතුලත් වේ.

- ප්‍රතිඅපනයන කේන්ද්‍රීය ක්‍රමෝපාය
- සේවා සැපයුම් කේන්ද්‍රීය ක්‍රමෝපාය
- හරිත හා තිරසර වරාය ක්‍රමෝපාය

**නිෂ්පාදන/ සේවා සංවර්ධන ක්‍රමෝපාය**

මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිය වත්මන් නිෂ්පාදන සහ/ හෝ වරාය සේවා වැඩි දියුණු කිරීම මගින් හෝ නවීකරණය කිරීම මගින් ආදායම වැඩි කරගැනීමට හැකි වන ක්‍රමෝපායකි.

**විවිධාංගීකරණ ක්‍රමෝපාය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි මෙහෙයුම් වත්මන් වෙළෙඳපොල හා සේවා අභිබවා ක්‍රියාත්මක කරනු ඇති නමුත් තවමත් පවතින වටිනාකම් ජාලයේ ශක්‍යතාවය තුළ මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් සිටී.

**සහයෝගීතා ක්‍රමෝපාය**

වෙනත් ආයතන සමඟ එක්ව කටයුතු කිරීම තුළින් සමුද්‍රීය සහ සේවා සැපයුම් ක්ෂේත්‍රය තුළ තරඟකාරී වාසියක් අත්පත් කර ගැනීම සහයෝගීතා ක්‍රමෝපාය වේ. පහත සහයෝගිතා ක්‍රමෝපායයන් භාවිතා කළ හැක.

- ක්‍රමෝපායික සන්ධානය
- අන්‍යෝන්‍ය සේවා සුසංධානය
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

**බාහිර වශයෙන් භාවිතා කරනු ලබන ක්‍රමෝපායන්**

පහත හේතූන් මත තම හඳුනාගත් කාර්යයන් බාහිර වශයෙන් ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණය කර ඇත.

- පිරිවැය ඵලදායීතාව සඳහා
- වෙනත් ව්‍යාපාර සඳහා අවධානය යොමු කිරීමට
- සේවාදායකයන්හට ගුණාත්මක සේවාවක් ලබා දීමට

ඉහත සංස්ථාපිත අරමුණු සහ ක්‍රමෝපායන් මත පදනම්ව කෙටිකාලීන සහ දිගු කාලීන අරමුණු සාක්ශාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් විවිධ කොටියාශීය උපක්‍රම සහ මෙහෙයුම් ක්‍රමෝපායන් භාවිතා කරනු ඇත.

වරාය මෙහෙයුම් කටයුතු එකිනෙක සම්බන්ධ කර තීරණ ගැනීමේ අනුකූලතාවය පවත්වා ගෙන යෑමට අදාළ කර ගත හැකි ප්‍රධාන වටිනාකම් පද්ධතිය මෙහෙයුම් මූලධර්මය යනුවෙන් අදහස් කෙරේ.

**තිරසර භාවය**

සියළුම වරාය මෙහෙයුම් කටයුතු වල කේන්ද්‍රස්ථානය වන්නේ තිරසර සංවර්ධනයයි.

**හරිත වරාය**

සෑම වරායයකම දර්ශන තලය වන්නේ පරිසර හිතකාමී වටාපිටාව වේ.

**නවෝත්පාදනය**

ක්‍රමෝපායික අරමුණු ඉටුකර ගැනීම සඳහා නවීන ව්‍යාපාර සංවර්ධන මොඩලයන් භාවිතා කිරීම.

**ව්‍යාවසායකත්වය**

විකල්ප ව්‍යාපාරික මාර්ග ක්‍රියාකාරීත්වයේ ප්‍රතිලාභ සඳහා අනුගමනය කල හැකි අවස්ථා සොයා බැලීම.

**සබඳතා පුළුල් කිරීම**

බහු විධ පාර්ශ්වකරුවන් සමඟ පූර්ව ක්‍රියාකාරීව සන්නිවේදනය කර වටිනා හවුල්කාරිත්ව සබඳතා ඇති කර ගැනීම.

**ඵලදායීතාවය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම්, ආයෝජන සහ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම.

**තොරතුරු**

ප්‍රතිඵලදායී කාර්යභාරයක් සඳහා සෑම මට්ටමකම තීරණ ගැනීමේ හැකියාව රඳාපවතිනුයේ අදාළ හා කාලීන තොරතුරු මත පදනම්වය.

**කාර්යසාධන කළමනාකාරීත්වය**

සමස්ත කළමනාකාරීත්වය සහ සේවකයින් අතර අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගී සම්බන්ධතාවයක් නිර්මාණය වන අයුරින් අත්දැකීම් බහුල පළපුරුදු වෘත්තිකයින් රඳවා ගැනීමේ උපක්‍රමයික අරමුණු වෙත සමස්ත කාර්යමණ්ඩලය පෙළගස්වා ඇත.

**ලාභදායකත්වය**

සියළු කාර්යයන් පූර්ණ මූල්‍ය තක්සේරුවක් සහිතව සිදු කර පැවැත්ම සහ වර්ධනය තහවුරු කරනු ඇත.

**අභිලාෂයන්**

සියළු වරාය කටයුතු සම්බන්ධයෙන් නිවැරදි දැක්මක් ඇති වගකීමට බැඳී සිටින කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරන නව්‍යමය අදහස් ප්‍රවර්ධනය කරන නායකත්වයක සහිත ඉහළ කාර්යසාධනයෙන් යුත් ආයතනයක් ගොඩ නැගීම.

**සමෝධානය**

ඕනෑම තත්ත්වයකදී තරහකාරී ගාස්තු යටතේ උසස් මට්ටමේ සේවා සැපයීමට සාධාරණව, අවංකව හා වෘත්තීය මට්ටමින් කටයුතු කිරීම.

**සහයෝගීතාවය**

සාමූහික, ඵලදායී සහ පෞද්ගලික සම්බන්ධතා අභිවර්ධනය වන විවෘත හා සත්කාරක පරිසරයක් නිර්මාණය කිරීමට ප්‍රයත්න දැරීම.

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් 1979 අගෝස්තු 01 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලද අතර 1984 අංක 7 සහ 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත.

- නැව් භාණ්ඩ වාහක, නැවගත කිරීම් සහ ප්‍රතිනැවගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම්, වාප්පු කටයුතු, නෞකා වලට ජලය, ඉන්ධන සහ විදුලිය සැපයීම, නෞකා වලට හා නෞකා වලින් ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ලිහිසි තෙල් මෙහෙයුම් කිරීම බන්කර් සහ ඉන්ධන ගබඩා අතර කාර්යයන්, නියමු කටයුතු සහ නෞකා බැඳතැබීමේ කටයුතු, කිමිදුම් සහ නෞකා දිය යටදී අළුත්වැඩියා කිරීම හා එවැනි වෙනත් අනුශාංගික වූ ඕනෑම කාර්යයක් සඳහා කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම.

- සැසඳුම් හා ආරක්ෂක සේවා කාර්යක්ෂමව හා නිත්‍ය ලෙස සැපයීම.

- වරාය සීමාව තුළ හා වරාය ප්‍රවේශ මාර්ගයන්හි නැව් ගමනාගමනය විධිමත් කිරීම හා පාලනය කිරීම.

- වරාය ගොඩනැගිලි නඩත්තු කිරීම හා ඒවා හි භාවිතය ප්‍රවර්ධනය කිරීම, වරායයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම.

- කිසියම් නියමිත වරායක් තුළ රේගු දෙපාර්තමේන්තුවට අදාල කාර්යයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.

- ඒ ඒ වරායන් තුළට හා ඉන් පිටතට යාත්‍රාකිරීම සඳහා නෞකාවලට මහ පෙන්වීම හා ආරක්ෂාව සැපයීම සඳහා අවශ්‍ය ප්‍රදීපාගාර හා වෙනත් මාධ්‍යයන් ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.

- වරාය අධිකාරිය පනත මගින් පනවනු ලබන වෙනත් ඒ හා සමාන කාර්යයන් ඉටුකිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් ප්‍රතිසම්පාදනය කිරීමටත්, නව ආයෝජන වල යෙදවීමටත්, අධිකාරියේ වියදමට නොඅඩු ආදායමක් ලැබෙන පරිදි වරාය අධිකාරිය පනතේ විධිවිධාන වලට අනුකූලව අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සුදුසු පරිදි ගාස්තු අයකර ඒවා අධිකාරියේ ආදායමට බැර කර ප්‍රමාණවත් පොදු මූල්‍ය සංචිතයක් ඇති කර පවත්වාගෙන යාමට හැකිවන ආකාරයෙන් වරාය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සහ;

- වරාය අධිකාරිය පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සියළු විශේෂිත වරායන් බාහිර ආධාර අපේක්ෂාවෙන් තොරව, ඒ ඒ වරාය විසින්ම ස්වකීය ව්‍යවසාය ලෙස පවත්වාගෙන යාමට ප්‍රයත්න දැරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව, වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපතිවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි සමස්ත පරිපාලනය ඔහු භාරයේ පවතී.

**නෞකා පැමිණීම (සියළුම වරායයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 3,675 | 3,648 | -0.7 |
| ගාල්ල වරාය | 14 | 7 | -50.0 |
| ත්‍රිකුණාමල වරාය | 117 | 95 | -18.8 |
| හම්බන්තොට වරාය | 374 | 323 | -13.6 |
| **එකතුව** | **4,180** | **4,073** | **-2.6** |

**කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)** | | | |
| ආනයන | 162,388 | 127,499 | -21.5 |
| අපනයන | 158,733 | 128,819 | -18.8 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,846,264 | 1,633,176 | -11.5 |
| තැන් මාරු මෙහෙයුම් | 30,949 | 36,401 | 17.6 |
| **එකතුව** | **2,198,334** | **1,925,895** | **-12.4** |
| **සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT)** | | | |
| ආනයන | 136,824 | 117,773 | -13.9 |
| අපනයන | 128,461 | 111,938 | -12.9 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,521,373 | 1,481,563 | -2.6 |
| තැන් මාරු මෙහෙයුම් | 52,035 | 40,962 | -21.3 |
| **එකතුව** | **1,838,693** | **1,752,236** | **-4.7** |
| **කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT)** | | | |
| ආනයන | 303,223 | 263,068 | -13.2 |
| අපනයන | 309,426 | 281,133 | -9.1 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 2,482,410 | 2,520,946 | 1.6 |
| තැන් මාරු මෙහෙයුම් | 117,272 | 118,906 | 1.4 |
| **එකතුව** | **3,212,331** | **3,184,053** | **-0.9** |
| **කොළඹ වරාය** | | | |
| ආනයන | 602,435 | 508,340 | -15.6 |
| අපනයන | 596,620 | 521,890 | -12.5 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 5,850,047 | 5,635,685 | -3.7 |
| තැන් මාරු මෙහෙයුම් | 200,256 | 196,269 | -2.0 |
| **එකතුව** | **7,249,358** | **6,862,184** | **-5.3** |

**නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (සියළුම වරායයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස(%) |
|---|---|---|---|
| සමස්ත නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (මෙ.ටො. මිලියන) | **109.0** | **100.4** | **-7.9** |

**කොළඹ වරායේ නැව්බඩු ගොඩබෑම - ශ්‍රී.ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 14,935 | 13,607 | -8.9 |
| තොග කඩන | 854 | 262 | -69.3 |
| වියළි තොග | 3,141 | 1,652 | -47.4 |
| දියර තොග | 4,679 | 3,945 | -15.7 |
| **එකතුව** | **23,609** | **19,466** | **-17.5** |

**කොළඹ වරායේ නැව්බඩු පැටවුම් - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 13,198 | 11,865 | -10.1 |
| තොග කඩන | 4 | 2 | -50.0 |
| වියළි තොග | 0 | 0 | - |
| දියර තොග | 551 | 389 | -29.4 |
| **එකතුව** | **13,753** | **12,256** | **-10.9** |

**කොළඹ වරායෙන් මෙහෙයවූ සමස්ත නැව්බඩු ප්‍රමාණය - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස(%) |
|---|---|---|---|
| බහළුගත | 28,133 | 25,472 | -9.5 |
| තොග කඩන | 858 | 264 | -69.2 |
| වියළි තොග | 3,141 | 1,652 | -47.4 |
| දියර තොග | 5,230 | 4,334 | -17.1 |
| **එකතුව** | **37,362** | **31,722** | **-15.1** |

**ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 3,052 | 1,913 | -37.3 |
| පැටවීම් | 138 | 176 | 27.5 |
| **එකතුව** | **3,190** | **2,089** | **-34.5** |

**ගාල්ල වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 106 | 1 | -99.1 |
| පැටවීම් | 0 | 0 | - |
| **එකතුව** | **106** | **1** | **-99.1** |

**හම්බන්තොට වරායෙන් මෙහෙයවූ නැව් බඩු ප්‍රමාණය - ( ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 1710 | 1584 | -7.4 |
| පැටවීම් | 539 | 532 | -1.3 |
| **එකතුව** | **2,249** | **2,116** | **-5.9** |

**සමස්ත සේවක සංඛ්‍යාව**

| විස්තරය | 2021 | 2022 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 8,287 | 7,838 | -5.4 |
| ත්‍රිකුණාමල වරාය | 381 | 363 | -4.7 |
| ගාල්ල වරාය | 331 | 315 | -4.8 |
| **එකතුව** | **8,999** | **8,516** | **-5.4** |

**සියළුම වරායයන්** **(රු. මිලියන)**

| **විස්තරය** | **2022** | **2021** | **වෙනස (%)** |
|---|---|---|---|
| **ආදායම සහ වියදම** | | | |
| සමස්ත ආදායම | 99,073.9 | 60,606.4 | 63.5 |
| වියදම | (43,838.7) | (32,935.8) | (33.1) |
| **විදේශ ණය මත පොලී සහ විදේශ විනිමය (පාඩු) / ලැබීම් වලට පෙර ලාභ/(පාඩු)** | **55,235.2** | **27,670.6** | **99.6** |
| විදේශ ණය මත පොලිය | (2,400.3) | (799.6) | (200.2) |
| විදේශ විනිමය (පාඩු) / ලැබීම් | 4,190.9 | (1,269.7) | 430.1 |
| **බදු වලට පෙර සහ විදේශ විනිමය (පාඩු)/ලැබීම් වලට පසු ලාභ/(පාඩු)** | **57,025.8** | **25,601.3** | **122.7** |
| **බදු** | | | |
| ආදායම් බදු | (13,261.1) | (2,676.3) | (395.5) |
| විලම්භිත බදු | (445.5) | (2,229.8) | 80.0 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | (1,000.0) | - | (100.0) |
| **බදු සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභ/ (පාඩු)** | **42,319.2** | **20,695.3** | **104.5** |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 576,636.4 | 396,375.5 | 45.5 |
| ජංගම වත්කම් | 151,915.1 | 96,245.7 | 57.8 |
| ජංගම වගකීම් | 44,685.4 | 24,698.9 | (80.9) |
| ස්කන්ධ සහ වෙනත් ප්‍රාග්ධන | 7,591.4 | 7,591.4 | - |
| සංචිත හා ප්‍රතිපාදන | 542,880.3 | 362,542.1 | 49.7 |
| ජංගම නොවන වගකීම් | 133,394.4 | 97,788.9 | (36.4) |
| **අනුපාත** | | | |
| ආදායමට මෙහෙයුම් ලාභ | 51.9 | 43.0 | |
| වාර්ෂික ආදායම් වර්ධනය | 63.5 | 15.1 | |
| ප්‍රාග්ධන යෙදවුම් මත ප්‍රතිලාභ | 8.6 | 6.7 | |

**ගරු නිමල් සිරිපාල ද සිල්වා, පා.ම.**

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය**

**සහ**

**ගරු ප්‍රේමලාල් ජයසේකර, පා.ම.**

**වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍ය**

**විග්‍රහය**

අභියෝගය රාශියකට ලක් වූ 2022 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා සතුටට පත් වෙමි. වර්ෂය තුළ මුහුණදුන් අනපේක්ෂිත බාධාවන් නොසලකා හැර සිය පාර්ශ්වකරුවන්ගේ තෘප්තිමත්භාවය වෙනුවෙන් ස්වකීය ඉලක්ක සපුරාගනිමින් ස්ථීර ප්‍රගතියක් අත්කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකියාව ලැබිණ.

2024 වර්ෂය වන විට මෙහෙයුම් ධාරිතාවය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව ජය බහළු පර්යන්ත - V සහ නැගෙනහිර බහළු පර්යන්ත ව්‍යාපෘති කඩිනම් කිරීම මගින් 2022 වර්ෂයේදී අපගේ මෙහෙයුම් ධාරිතාවය වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. වර්තමානයේදී නැගෙනහිර බහළු පර්යන්තය අර්ධ වශයෙන් මෙහෙයුම් කරනු ලබන අතර නව ජැටි දොඹකර ස්ථාපිත කිරීමත් සමඟ ජය බහළු පර්යන්තයේ දැනට නැංගුරම්ලා නොහැකි අති විශාල නෞකා ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් ආරම්භ කිරීම මගින් ගැඹුරු වරායයක් ලෙස කොළඹ වරායේ ආකර්ෂණීය බව වැඩිවනු ඇති අතර අනාගත වෙළෙඳපොළ කොටස් වර්ධනය වනු ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය නව තාක්ෂණයට අනුගත වීමට විශේෂ ප්‍රයත්නයන් දරා ඇති අතර වරාය මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීම ද ආරම්භ කර ඇත. අභියෝගාත්මක කාලවකවානු තුළ ලිපි ලේඛන හා තොරතුරු ඩිජිටල්කරණය කිරීම සමුද්‍රීය ප්‍රවාහන මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගෙනයාම සඳහා අතිශය වැදගත් වූ බව ප්‍රත්‍යක්ෂ විය. ව්‍යාපාර කටයුතු පහසු වීමට හා ව්‍යාපාර ක්‍රියාවලියෙහි විනිවිදභාවය ඉහළ නැංවීමට මෙය ඉවහල් වූවා පමණක් නොව, දෝෂ සිදු වීමේ අවදානම අඩුවීමට හා අක්‍රමිකතා සිදු නොවීමට හේතු විය.

**2022 වසර තුළ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පසුගිය වර්ෂයේ රුපියල් බිලියන 24.9 ක මෙහෙයුම් ලාභයට සාපේක්ෂව, 2022 වර්ෂයේ දී රුපියල් බිලියන 47.2 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. 2021 වර්ෂයේ රුපියල් බිලියන 60.6 ක දළ ආදායම හා සන්සන්දනය කිරීමේදී 2022 වර්ෂයේ රුපියල් බිලියන 99.1 වූ අතර එය රුපියල් බිලියන 38.5 ක වැඩි වීමකි. 2021 වර්ෂයේදී රුපියල් බිලිනය 32.9 ක් වූ බදු වලට පෙර සමස්ත වියදම විදේශ ණය පොලිය හා විදේශ විනිමය ලැබීම්/පාඩු සමඟ සැසඳීමේදී 2022 වසරේදී මෙම මුදල රුපියල් බිලියන 43.7 ක් වූ අතර මෙය 33% කින් වැඩි වීමකි.

ශ්‍රී ලංකා රුපියල අව ප්‍රමාණය වීම හේතු කොටගෙන පෙර වර්ෂය හා සැසඳීමේදී 2022 වර්ෂයේ විදේශ ණය මත පොලිය 200% කින් ඉහළ යන ලදී. 2021 වර්ෂයේ විදේශ විනිමය පාඩුව වූ රුපියල් බිලියන 1.27 හා සැසඳීමේදී 2022 වර්ෂයේ විදේශ විනිමය ලාභය රුපියල් බිලියන 4.19 ක් විය.

ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුකොටගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2021 වර්ෂයේ රුපියල් බිලියන 20.7 හා සැසඳිමේදී රුපියල් බිලියන 42.3 ක බදු වලට පසු ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

**වරාය මෙහෙයුම් හා සේවා සැපයුම් කාර්යසාධනය**

2022 වර්ෂයේදී බොහෝ අභියෝගයන්ට මුහුණ පෑමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදු විය. කෙසේ වුවද, දේශපාලන අස්ථාවරත්වය මගින් තීව්‍ර කරන ලද දුෂ්කර ගෝලීය හා දේශීය ආර්ථික තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තයන්ට ඒවාහි සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවයන් පවත්වා ගැනීමට මෙන්ම ඵලදායී මට්ටම් පවත්වාගැනීමටද හැකියාව ලැබිණ. දේශීය වශයෙන් අසීරු කාලසීමාවක් තුළ සේවා තත්ත්වය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව

කැඳවීමට ගත් කාලීන ක්‍රියාමාර්ග හේතුවෙන් වරාය සේවා අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රයිම් රූට් ඔප්ටිමයිසේෂන් මොඩියුලය හා එක්ස්පර්ට් ඩෙකින් ඔප්ටිමයිසේෂන් මොඩියුලයේ අදියර හතර මගින් නිසි ලෙස සැලසුම්ගත පද්ධති හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කරන ලදී. මෙම මොඩියුල මගින් ජය බහළු පර්යන්තයේ උපකරණ භාවිතය උපරිම මට්ටමින් පවත්වාගෙන යාමට හැකි වූ අතර එමඟින් දෛනික මෙහෙයුම් පිරිවැය අඩු විය.

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මගින් බහළු විස්සේ සම ඒකක 1,925,895 ක වාර්ෂික මෙහෙයුම් ධාරිතාවයක් වාර්තා කරන ලදී. කලාපයේ පර්යන්ත සැලකිය යුතු ආකාරයේ පසුබෑමක් පෙන්නුම් කළ නාවික කර්මාන්තයේ පසුබෑමක් පෙන්නුම් කළ තත්ත්වයක, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වල මෙහෙයුම් ධාරිතාවයන් සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට හැකි විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වල සාමාන්‍ය ඵලදායීතාවය ආන්තීය සංවර්ධනයක් වාර්තා කර තිබියදී 2022 වර්ෂයේ ප්‍රධාන නැව් සමාගම්වල නෞකාවල ඵලදායීතාවය පැයට මෙහෙයුම් (MPH) 23.3 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 2.6% ක වර්ධනයක් ලෙස සඳහන් කල හැක. 2022 වර්ෂයේ පෝෂක නෞකා පැයට මෙහෙයුම් 20.99 වාර්තා කල අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 4.9% ක වර්ධනය වීමකි.

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය පූර්ණ බහළුම් බහළු විස්සේ සම ඒකක 101,477 ක් සෘජුව භාර දෙන ලද අතර පැය 48 ක් ඇතුළත සියළුම අර්ධ පූර්ණ බහළුම් ගොඩබෑම් ප්‍රමුඛ කාර්යසාධන දර්ශක මට්ටම අත්කර ගනිමින් අර්ධ පූර්ණ බහළුම්/ විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් විස්සේ සම ඒකක 19,156 ක් ගොඩබාන ලදී. ඉලෙක්ට්‍රොනික ලේඛන ඉදිරිපත් කිරීම, ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ගෙවීම් කිරීම, භාරදීමේ ගේට්ටු අවසර පත් ඉලේක්ට්‍රොනික මාර්ගයෙන් නිදහස් කිරීම සහ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඇණවුම් භාර දීම, හරහා සේවා සැපයුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගබඩා කිරීමේ ධාරිතාවය වැඩි කරමින් හා ට්‍රෙලර් පාදක කරගත් බහළුම් වලට ඇසුරුම් කිරීම/ බහළුම් හිස් කිරීමේ මෙහෙයුම් හා නවීකරණය කරන ලද කාර්යාලය සහිත බණ්ඩාරනායක ජැටි ගුදම් සංකීරණය නවීකරණය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ප්‍රධාන පෙළේ නෞකා නියෝජිතයන්ගේ අර්ධ පූර්ණ බහළු පැය 24 තුළ මෙහෙයුම් කිරීම ආරම්භ කිරීම සඳහා නව අධිවේගී සේවාවක් බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන I හි (CFS I) හි ආරම්භ කර ඇත. කොළඹ වරායේ සේවා සැපයුම් පහසුකම් පුළුල් කිරීම සඳහා සමගි බහළු පර්යන්තය බ්ලූමැන්ඩල් බහුකාර්ය ගුදම් සංකීර්ණය සහ වරාය නගර පරිශ්‍රය ආසන්නයේ අති නවීන ගුදම් සංකීර්ණ ආදී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකව ඇත.

**කොළඹ වරායේ මෙහෙයුම් ධාරිතාවය පුළුල් කිරීම**

නැගෙනහිර බහළු පර්යන්තය - ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මීටර් 600 ක් දිග ජැටි බැම්මක් මේ වන විටත් ඉදිකොට අවසන් කර ඇති අතර මීටර් 20 ක් ගැඹුරැති නැංගුරම්පොළවල් සහිතව ඉතිරි මීටර් 720 ක ජැටි බැම්ම ඉදිකිරීමට සැලසුම් කර ඇත. වසර 2025 වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පූර්ණ අයිතිය සහිත බහළු පර්යන්තයක් ලෙස මෙහෙයුම් කිරීමේ අරමුණ ඇතිව නැගෙනහිර බහළු පර්යන්තයේ සංවර්ධන කටයුතු අදියර වශයෙන් සිදු කෙරෙනු ඇත. මෙම පර්යන්තයේ ඉදිකිරීම් අවසන් වන විට අතිවිශාල බහළු නෞකා තුනක් මෙහෙයුම් කළ හැකි මීටර් 1320 ක් දිග ජැටි බැම්මක් හෙක්ටයාර 72 ක වපසරියකින් යුත් අංගණයක් සහ බහළු විස්සේ සම ඒකක මිලියන 3.0 ක වාර්ෂික ධාරිතාවයකින් යුක්ත වනු ඇත. නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන ස්වයංක්‍රීය දොඹකර වෙත ප්‍රවේශ විය හැකි ආකාරයෙන් සහ ස්ටැඩල් කැරියර් සහ ස්වයංක්‍රීයව රේල් පිලි මත දිවෙන ගැන්ට්‍රි දොඹකර වලින් සමන්විත වන අයුරින් නැගෙනහිර බහළු පර්යන්තය අර්ධ ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක වේ.

බටහිර බහළු පර්යන්තය - ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Adani Ports and Special Economic Zone Limited සමාගම සහ ස්වකීය දේශීය පාර්ශ්වකරු වන John Keells Holdings PLC සමාගම අතර හවුල් ව්‍යාපාරයක් මගින් වසර 35 ක් සඳහා ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ පදනම යටතේ රාජ්‍ය

පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් ලෙස බටහිර බහළු පර්යන්ත I සංවර්ධනය කිරීම සඳහා මාර්තු මස 1 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ව්‍යාපෘතිය සඳහා පර්යන්ත මෙහෙයුම්කරු ලෙස කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් පුද්ගලික සමාගම යන නමින් සමාගමක් සංස්ථාපනය කරන ලදී. ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ, ගිවිසුම 2021 සැප්තැම්බර් 30 දින ක්‍රියාත්මක කරන ලද අතර එය ක්‍රියාත්මක වන දිනය 2022 පෙබරවාරි 26 දිනය ලෙස වාර්තා කරන ලදී. වැඩබිම් කුලීබදු ගිවිසුම, කොටස්හිමිකාරිත්ව ගිවිසුම සහ ණය ලබා දෙන ආයතනයේ සෘජු ගිවිසුම ද 2022 පෙබරවාරි 25 දින ක්‍රියාත්මක කරන ලදී. බටහිර බහළු පර්යන්තය I හි ඉදිකිරීම් කටයුතු 2022.11.09 දින ආරම්භ කරන ලදී.

ජය බහළු පර්යන්තය -V: අවම අද්දර ගැඹුර මීටර් 15 ක් වන මීටර් 330 වඩා වැඩි දිගින් යුත් නෞකා දෙකකට ඉඩ පහසුකම් සැලසීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජය බහළු පර්යන්ත -IV හි බහළු ජැටි බැම්ම මීටර් 120 කින් දීර්ඝ කෙරෙනු ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 6,374 කි.

**පිටත වරාය සංවර්ධනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පිටත වරාය පොදුකාර්ය ව්‍යුහ පහසුකම් හා උපරි ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු වේගවත් කරමින් සිටී. කන්කසන්තුර වරාය වාණිජ වරායක් ලෙස මෙහෙයුම් කිරීම සඳහා එහි දියකඩනය සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම, නව වාණිජ නැංගුරම්පොළක් ඉදිකිරීම ඇතුළුව පොදු කාර්ය පහසුකම් සඳහා ඉන්දියාවේ එක්සිම් බැංකුව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 45 ක මූල්‍යාධාර සපයා ඇත. මෙහි සැලසුම් හා උපදේශක සේවා සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘති කළමනාකරණ උපදේශක ගිවිසුමකට එළැඹී ඇත. මෙහි ඉදිකිරීම් කටයුතු 2023 ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර සීමාව ඉක්මවූ පිරිවැය ආවරණය සඳහා ණය පහසුකම දීර්ඝ කර ගැනීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. කන්කසන්තුර වරායට යාබදව අක්කර 50 ක භූමි ප්‍රමාණයක් අත්පත් කර ගැනීමේ කටයුතු ද සිදු කෙරෙමින් පවතී.

මගී යාත්‍රා මෙහෙයුම්කරුවෙකු විසින් ක්‍රියාත්මක කරන මගී යාත්‍රා සේවාවක් කන්කසන්තුර වරායේ 2023 මැයි මස දී ආරම්භ කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර ඇත. ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය ඇතිව මෙහි අවශ්‍ය යටිතල පහසුකම් සහිත පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්ම උපයන අරමුදල් ආයෝජනය කර ඇත.

ත්‍රිකුණාමලය වරාය කාර්මික වරායක් ලෙස සංවර්ධනය කෙරෙමින් පවතින අතර දැනට මඩ කෝච්චි පිහිටා ඇති ඉංජිනේරු පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය එම ස්ථානයෙන් ඉවත් කර ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලෙහි ප්‍රතිස්ථානගත කිරීමේ සැලසුම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සකස් කෙරෙමින් පවතී.

ගාල්ල වරාය වාණිජ වරායක් ලෙස සිය කාර්යභාරයට සමගාමීව සංචාරක කර්මාන්තය ආශ්‍රිත වරායක් ලෙස සංවර්ධනය වෙමින් පවතී. ගැඹුරු මගී නෞකා පර්යන්තයක්, දියකඩන සහ අනෙකුත් පහසුකම් ඉදිකිරීම වරාය සැලසුම් වලට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කර ගනු ලබන්නේ පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරන අතරතුර රටේ ආර්ථික වර්ධනයට දායකවීම වේ. මෙම ව්‍යාපෘතිය සඳහා අභිප්‍රාය ප්‍රකාශ කිරීම නිකුත් කර ඇති අතර මේ වන විට ආයෝජකයන් කෙටි ලැයිස්තුගත කෙරෙමින් පවතී.ගාල්ල වරායේ සංවර්ධන කටයුතු මගින් කලාපයේ සීග්‍ර ආර්ථික වර්ධනයක් ඇති වීමට මෙන්ම විනෝදාස්වාදය සඳහා සහ ඉඩම් සංවර්ධනය සඳහා අවස්ථා සැලසීමට ද අපේක්ෂා කෙරේ.

ඩිජිටල්කරණය තුළින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ සියළුම පාර්ශ්වකරුවන් ඵලදායී ලෙස අනුකලනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව යෝජිත වරාය සන්නිවේදන පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය සොයා බැලීම සඳහා අධ්‍යයනයක් ක්‍රියාත්මක කර ඇත. මෙම අධ්‍යයනය මගින් සියළුම වරාය ආශ්‍රිත කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහ සංවර්ධනය වෙමින් පවත්නා හා අනාගත අවශ්‍යතාවයන්

සපුරාලිය හැකි වරායක් ලෙස කොළඹ වරාය ස්ථානගත කිරීමට අපේක්ෂා කෙරේ. මෙහි දෙවන අදියර වශයෙන් වරාය සන්නිවේදන පද්ධතියට අන්තර් මුහුණතක් නිර්මාණය කර එය මුදල් අමාත්‍යාංශයේ "Single Window" පද්ධතිය සමඟ අනුකලනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**අළෙවි හා ව්‍යාපාර සංවර්ධනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සශ්‍රීකත්වය රඳා පවතිනුයේ එහි වත්මන් විභව්‍ය සේවාලාභීන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට ඇති හැකියාව මතය. අපි අපගේ විවිධ මට්ටමේ සේවාලාභීන් සහ පාර්ශ්වකරුවන් සමඟ ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමට සහ ඒවා ඉටුකර දීම සඳහා පහසුකම් හා සේවාවන් සැලසීම වෙනුවෙන් අඛණ්ඩව සාකච්ඡා පවත්වාගෙන යමින් සිටිමු. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල සහ කොළඹ වරායේ බහළු ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් අළෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන ක්‍රමෝපායන් ගණනාවක් හඳුන්වා දී ඇත. මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ සහයෝගීතාවය තහවුරු කිරීම පිණිස ප්‍රධාන නැව් සමාගම් සමඟ පර්යන්ත සේවා ගිවිසුම් ගණනාවක් අත්සන් කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල මෙහෙයුම් ධාරිතාවය ඉහළ නැංවීම සඳහා පූර්ව දැනුම්දීමකින් තොරව පැමිණෙන නෞකා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත ආකර්ෂණය කර ගනිමින් සිටී.

**නිමාව**

2022 වර්ෂය තුළ අප ගමන් මගෙහි විවිධ අනපේක්ෂිත අභියෝග හා බාධක හමු වුවද, අපගේ කණ්ඩායම ඒවා සාර්ථකව ජය ගෙන මේ වන විට ක්ෂේත්‍රයේ ගෝලීය පරිමාණයෙන් ස්ථාවර තත්ත්වයක පසුවෙමින් සිටී. මෙම අසීරු කාලය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට ජය බහළු පර්යන්තය, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම සහ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම යන ආයතන තුනෙහි සහයෝගය නොමඳව ලැබිණ. මෙම ආයතන තුනෙහි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වයෙහි සහ සමස්ත කාර්ය මණ්ඩලයේ කැපවීම මත 2022 වර්ෂය සාර්ථක වර්ෂයක් කරා ඉදිරියට ගෙනයාමට අපට හැකියාව ලැබුණු අතර මෙම අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ දැක්වූ නිසි මඟ පෙන්වීම පිළිබඳව අදාළ නායකත්වය වෙත මාගේ හෘදයාංගම කෘතවේදීභාවය පළකර සිටිමි.

එමෙන්ම, මින් පෙර අත්නොවිදි මෙවන් අසීරු කාල පරිච්ඡේදයක් තුළ ලබා දුන් වටිනා මග පෙන්වීම පිළිබඳව ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්, අමාත්‍යාංශ නිලධාරීන් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ කෘතවේදීභාවය පළ කරමි.

අවසාන වශයෙන්, අපගේ වටිනා සේවාදායකයින්, හවුල්කරුවන් හා වෙනත් පාර්ශ්වකරුවන් වෙත වර්ෂය පුරාම දක්වන ලද පූර්ණ සහයෝගය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම සේවක මහත්ම මහත්මීන් වෙත ප්‍රණාමය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

අවදානම් සහගත තත්ත්වයන් අපගේ සීමා මායිම් සීඝ්‍රව ඉක්මවා යමින් ගෝලීය සීමාවන් වෙත ලඟාවෙත්ම, නව්‍ය වූ අරමුණු සහගත හැඟීමෙන් යුතුව එළඹෙන වර්ෂය වෙත අවතීර්ණවෙමින් සිටිමු. අප රටෙහි සමුද්‍රීය කටයුතු ඉදිරියට පවත්වාගෙන යමින් ගෝලීය තරඟකාරීත්වයේ ඉදිරියෙන් ස්ථාවරව පැවතීමට හැකිවන ප්‍රධාන පෙළේ සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස අපගේ පහසුකම් වැඩි දියුණු කිරීමට කැපවී සිටින බව අවසාන වශයෙන් සඳහන් කර සිටිමි.



**කීත් ඩී බර්නාඩ්**
**සභාපති**

**කීත් ඩී බර්නාඩ් මහතා**
**සභාපති**

කීත් ඩී බර්නාඩ් මහතාගේ වසර 40ක වෘත්තීය ක්‍රියාකාරී සේවා කාලය තුළ ආයතනික අංශයේ විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු වල වසර 30 කට අධික පළපුරුද්දක් ලබා ඇත. ලාභ ඉපැයීම සඳහා නොවන ඇමෙරිකානු ආධාර (USAID) වශයෙන් අරමුදල් සපයන පෞද්ගලික අංශයේ සංවර්ධන ව්‍යාපෘති වල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරා ඇති අතර ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙසද කටයුතු කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ අංක එක ස්ථානයේ සිටි කාල වකවානුව තුළ රජයට අයත් සංගෘහිත රක්ෂණ ආයතනය වන මෙම රක්ෂණ සමාගමෙහි සම කළමනාකාර අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කර ඇත. කෙටි කාල පරිච්ඡේදයක් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස හා ඊට අනුබද්ධිත ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / සභාපති ලෙස ඔහු කටයුතු කර ඇති අතර, රජයට අයත් ආයතනයන්හි දෝෂ කළමනාකරණය සඳහා උපදෙස් හා සහයෝගය දැක්වීමේ වගකීම සහිතව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විශේෂඥ කණ්ඩායමෙහි සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. තවද, ඔහු මූල්‍ය සේවා සහ විදුලි සංදේශ අංශයන්හි ක්‍රමෝපාය, ව්‍යාපාර පෙළගැස්වීම සහ අරමුණු සැකසීම සඳහා උපදෙස් ලබා දෙමින් උපදේශක කටයුතු වල ද නිරතව සිට ඇත.

බර්නාඩ් මහතා විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛ පෙළේ සමාගම් වල හා සීමිත වගකීම් සමාගම්වල (PLC) අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු දරා ඇත.

ඔහු වරලත් ගණකාධිකාරී කළමනාකරණ ආයතනයේ (එක්සත් ජනපදය) සහ වරලත් ගෝලීය ගණකාධිකාරී කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අතර වරලත් අලෙවිකරණ ආයතනයේද සාමාජිකයෙකු වේ. ඇබර්ඩීන්හි රොබට් ගෝඩන් විශ්වවිද්‍යාලයේ ඇබර්ඩීන් ව්‍යාපාර පාසලෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MBA) ද කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) උපාධිය හදාරන කාලය තුළ ඔහු විසින් ප්‍රදර්ශනය කරන ලද අරමුණු ජය ගැනීම, ප්‍රත්‍යුත්ක්‍රමශක්තිය හා නිර්මාණශීලිත්වය වෙනුවෙන් Douglas Gourlay සම්මානය දිනා ගැනීමට ද ඔහු සමත් විය.

**ජී යූ කේ අල්ගේවත්තගේ මහතා**
**උප සභාපති**

ජී යූ කේ අල්ගේවත්තගේ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති වශයෙන් කටයුතු කරන අතරම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වන සී/ස සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් පුද්ගලික සමාගම (SAGT), සී/ස කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් පුද්ගලික සමාගම (CICT), සී/ස කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් පුද්ගලික සමාගම, සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෘප් කම්පැණි පුද්ගලික සමාගම (HIPG), සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් පුද්ගලික සමාගම (HIPS) සහ සී/ස ලංකා නැව් සංස්ථාව යන ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

අල්ගේවත්තගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ශාස්ත්‍රපති උපාධිය ද, නාවල විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යා උපාධිය ද ලබා ඇත.

ඔහු විශිෂ්ට නායකත්වයෙන්, කෘතහස්ත භාවයෙන් යුත්, විවිධ දක්ෂතා ඇති කැපවීමෙන් කටයුතු කරන පළපුරුදු ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙක් වන අතර ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා කණිෂ්ඨ නිලධාරීන් සමඟ පුළුල් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රත්‍යුත්ක්‍රම ශක්තිය හා කාල කළමනාකරණය උපයෝගී කර ගන්නා ප්‍රබල හා ප්‍රත්‍යක්ෂ සන්නිවේදකයෙකි.

2018 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට 2022 ජූනි මාසය දක්වා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඵලදායීතා වෘත්තියෙකු වශයෙන් සේවය කළ අවධියේදී ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද මෙන්ම ආසියානු ඵලදායීතා ආයතනයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. 2006 වසරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයෙන් සිය වෘත්තීය දිවිය ආරම්භ කර ඇති ඔහු 16 වසරකට අධික කීර්තිමත් සේවා කාලයකට හිමිකම් කියන අතර මේ වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකි. මෙම කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණනාවක ප්‍රාදේශීය ලේකම්වරයෙකු වශයෙන් සේවය කර වසර 10 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

**උපුල් ජයතිස්ස මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

උපුල් ජයතිස්ස මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (විශේෂ ව්‍යාපාර පරිපාලන) උපාධිය ලබා ඇත. ඊට අමතරව, ස්විඩන්හි වර්ලඩ් මැරිටයිම් විශ්ව විද්‍යාලයෙන් වරාය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද එක්සත් රාජධානියෙහි Wigon & Leigh College අධ්‍යාපන ආයතනයෙන් අළෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

උපාධිය ලබා ගැනීමෙන් පසුව 1986 වර්ෂයේදී කළමනාකරණ අභ්‍යාසලාභීයෙකු වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට බැඳුනු ජයතිස්ස මහතා වරාය ක්ෂේත්‍රයේ වසර 35 කට අධික සේවා පළපුරුද්දක් ලබා ඇත. මැදපෙරදිග කලාපයේ වරායයන් වන කුවේට් රාජ්‍යයෙහි Ports Public Authority – Shuaiba Container Terminal සහ එක්සත් අරාබි එමිරේට්ස්හි Sharjah – Ports of Khorfakkan Container Teminals හි පර්යන්ත සැලසුම්ක නිලධාරියෙකු වශයෙන් වසර පහක පළපුරුද්දක් ලබා ඇත. කොළඹ විශ්ව විද්‍යාලය, මොරටුව විශ්ව විද්‍යාලය සහ රුහුණු විශ්ව විද්‍යාලය ඇතුළු විශ්ව විද්‍යාල ගණනාවක හා ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රධාන පෙළේ ආයතන රාශියක තාවකාලික කථිකාචාර්යවරයෙකු වශයෙන් වසර 14 කට අධික කාලයක සිට කටයුතු කරමින් සිටී.

උපුල් ජයතිස්ස මහතා 2021 වර්ෂයේ ජූනි මාසයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට පත් විය.

**පී ඒ එස් අතුල කුමාර මහතා**
**අධ්‍යක්ෂ**

පී ඒ එස් අතුල කුමාර මහතා ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදී විද්‍යාර්ථයෙකු වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ (රාජ්‍ය පරිපාලන) (විශේෂ) උපාධිධාරියෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සිය ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ඇත. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු වන අතුල කුමාර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද ලන්ඩන් වරලත් රාජ්‍ය මුදල් හා ගිණුම්කරණ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

1991 දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු වශයෙන් සේවයට බැඳී 1992 දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට ඇතුළත් වීමෙන් අනතුරුව 1992 – 1997 අතර කාලය තුළ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙසත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙසත් සේවය කළේය. 1997 – 2005 අතර කාලය තුළ උතුරු මැද පළාතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙස සේවය කර ඉන් අනතුරුව බත්තරමුල්ලේ පිහිටි මහවැලි හා වාරිමාර්ග, රජරට සංවර්ධන හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ කාර්යාලයේ වසර දෙකක කාලයක් සේවය කර ඇත.

2007 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට බැඳුණු අතුල කුමාර මහතා එහි විවිධ තනතුරු රාශියක් හෙබවීය. දැනට ඔහු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද වේ.

ඔහු ජාත්‍යන්තරව පිළිගත් ආයතන/ විශ්වවිද්‍යාල වලින් ගිණුම් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රමෝපායික සැලසුම් හා අවධානම් කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා ඇත.

තවද, ඔහු කලම්බු කොමර්ෂල් ෆර්ටිලයිසර් සමාගම, සී/ස මන්නායි සෝල්ට් සමාගම, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, සී/ස සිලෝන් ඇග්‍රෝ ඉන්ටස්ට්‍රීස් සමාගම, සී/ස ලංකා හයිඩ්‍රොලික් සමාගම, සිලෝන් සෙරමික් කෝපරේෂන් යන ව්‍යවස්ථාපිත ආයතන වල අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන වල විශේෂඥ කමිටු සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කර ඇත. ඊට අමතරව, 2012 සිට 2014 දක්වා දේශීය සංවර්ධන අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන්ද කටයුතු කර ඇත.

**පී බී එස් සී නෝනිස් මහතා**
**අධ්‍යක්ෂ**

නෝනිස් මහතා රාජ්‍ය සේවයේ විවිධ ප්‍රධාන තනතුරු දරමින් දශක 03 කට අධික පළපුරුද්දක් ලබා ඇති රජයේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙකි. දැනට ඔහු ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස සේවය කරන අතර රේගුවේ ආදායම් අය කිරීම, අදාළ නීති ක්‍රියාත්මක කරවීම සහ දෙදහසට අධික සේවක පිරිසක් පරිපාලනය කිරීම පිළිබඳ වගකීම සෘජුවම දරනු ලබන්නේ ඔහු විසිනි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් ලබා ඇති ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආවසරික සහතික ලාභියෙකි. ඔස්ට්‍රේලියානු රජයේ ප්‍රදාන යටතේ ඇඩලේඩහි ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ඇත.

1988 වර්ෂයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස රාජ්‍ය සේවයට ඇතුළත් වූ ඔහු 1997 දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට සම්බන්ධ විය. 1998 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් වී ධීවර හා සාගර සම්පත් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු ලෙස සේවය කරන ලදී. ඉන්පසුව, මුදල් අමාත්‍යාංශයට ස්ථාන මාරු වී පොදු ආදායම් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ හා වෙළෙඳ අයක්‍රම හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සේවය කරන ලදී.

තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යක්තීය මාර්ගෝපදේශ විශේෂඥවරයෙකු ලෙස පත්වීමට ප්‍රථම ඔහු බනිජතෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කළේය. ඔහු ප්‍රථම ශ්‍රී ලංකා පාලක ජෙනරාල්වරයා වූ අතර, රජයට අයත් මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් සිදු වන අවකළමනාකරණය හා නාස්තිය වැළැක්වීමේ අරමුණින් මධ්‍යම දත්ත පදනමක් පිහිටුවා රජයේ වත්කම් කාර්යක්ෂමව, ඵලදායීව හා සකසුරුවම් ලෙස භාවිතා කිරීමේ කාර්ය පාලක ජෙනරාල් වශයෙන් ඔහු වෙත පැවරිණ.

ඉන්අනතුරුව, ඔහු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස උසස් කරන ලද අතර, ජාතික අයවැය සම්පාදනය කිරීම, රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම, වාණිජමය, ගබඩා කටයුතු, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැකසීම සහ වියදම් වල වගකීම් දරණ ඒජන්සි ආයතන වල ඉල්ලීම් මත පදනම්ව ඒවාහි සීමා සංශෝධනය කිරීම, අයවැය අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම සහ අයවැය යෝජනා යටතේ නව වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පත් වෙන් කිරීම ඔහුගේ වගකීම් වලට ඇතුළත් වේ.

ඔහු ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා වශයෙන් සේවය කළ අතර ද්වීපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ආරක්ෂක සම්බන්ධිකරණය ඇතුළු යුධ උපකරණ ප්‍රසම්පාදනයට අදාළ අනුමැතීන් ලබා දීම ත්‍රිවිධ හමුදා සේවයේ නිලධාරීන්ගේ බඳවා ගැනීම්, සේවා උසස් කිරීම්, විශ්‍රාමගැන්වීම් සහ සේවා දිගු අනුමත කිරීම් ඇතුළු ආරක්ෂක ප්‍රතිපත්තිමය වගකීම් දැරීය. එමෙන්ම, ත්‍රිවිධ හමුදා සේවයේ දේශීය හා විදේශීය පුහුණුවීම්, සංචාර හා සම්මන්ත්‍රණ වලට යොමු කිරීම, පදක්කම් පැළඳීම සඳහා අනුමැතිය ලබා දීම සහ වැටුප් විෂමතා ප්‍රතිශෝධනය කිරීම, ආබාධිත සහ විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ සහ යුධ හමුදා ප්‍රවීණයන්ගේ වැටුප් වන්දි ගෙවීම් ආදී කාර්යයන් පිළිබඳ වගකීම් දැරීය.

එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සංවර්ධන සමුළුව/ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය (UNCTAD/WTO) ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද "රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම" "වෙළෙඳ ආරක්ෂක ලේඛන යුරෝපීය කොමිෂන් සභා නීති හා ව්‍යවහාර, වෙළෙඳ ආරක්ෂක ලේඛන නීති සහ ව්‍යවහාර හඳුන්වාදීමේ පාඨමාලාව සහ "ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති" වැනි ජාතික වැදගත්කමක් සහිත විවිධ පුහුණු වැඩසටහන් වලට සහභාගී වී ඇත.

තවද, ඔහු ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික ආයතනයේ ෆුලර්ටන් සංසදයේ (IISS Fullerton Forum) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම් ඇතුළු "ආසියා හා නිරිත දිග ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා වූ යටිතල පහසුකම් මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රතිපත්ති කතිකාවත" සඳහා වූ රැස්වීම්, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සංශෝධිත ලෝක වෙළෙඳ සංවිධාන ගිවිසුම, ප්‍රවාහන, වෙළෙඳ සේවා සැපයුම් හා වෙළෙඳ පහසුකම් සඳහා වූ බහුවාර්ෂික විශේෂඥ රැස්වීම් (UNCTAD) පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA) හා ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම යටතේ ඇතිකරගන්නා ලද තාක්ෂණික මට්ටමේ සාකච්ඡා ඇතුළු බහුවිධ වෙළෙඳ හා වෙනත් ජාත්‍යන්තර දූත මණ්ඩල වලටද සහභාගී වී ඇත.

**එන් ඒ ඒ පී එස් නිස්සංකා මහත්මිය**
**අධ්‍යක්ෂ**

නිස්සංකා මහත්මිය 1990 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන සේවයට බැඳුණු අතර, දැනට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සමාජ සංවර්ධන) වශයෙන් සේවය කරයි.

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක ලෙස සේවය කල නිස්සංකා මහත්මිය මහව ප්‍රාදේශීය ලේකම් සහ නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් වශයෙන් ද සේවය කර ඇත.

**ජේ ආර් යූ ද සිල්වා මහතා**
**අධ්‍යක්ෂ**

නවෝත්පාදන මත ධාරියෙකු වන රොහාන් ද සිල්වා මහතා බුද්ධිමත්ව හා අධිෂ්ඨානශීලීව විශිෂ්ටත්වය කරා ගමන් කරමින් සමූහ ව්‍යාපාර 75 කට අධික සංඛ්‍යාවක් පිහිටුවමින් මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරය රටෙහි විවිධ ප්‍රදේශවල ස්ථාපිත කිරීමට පියවර ගත්හ. ඔහු ඉදිරි ගමන් මඟ ආදර්ශමත්ව සකස් කරගනිමින් සමාගම තුළ කාර්යානුරූපී සංස්කෘතියක් බිහි කර ව්‍යාපාරය විනිවිදභාවයෙන් යුතුව මෙහෙයවනු ලබයි.

රොහාන් ද සිල්වා මහතා මැක්ලරන්ස් සමාගමෙහි වත්මන් සභාපතිවරයා ද වේ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය හා ක්‍රමෝපායයන් පිළිබඳ සිය කණ්ඩායම මෙහෙයවමින්, සමාගමේ ලාභදායීතාවය හා නව නාවික, සමුද්‍රීය සහ සේවා සැපයුම් හා සම්බන්ධ සේවාවන්හි වගකීම දරමින් කටයුතු කරයි. තවද, නව ආයෝජන, නවෝත්පාදන සහ ජ්‍යෙෂ්ඨ කුසලතා කළමනාකරණය ඔහු දැඩි උනන්දුවක් දක්වන අංශයන්ය. ශ්‍රී ලංකාවේ වරායයන්හි නාවික සේවා ප්‍රවර්ධනය කිරීමේ කටයුතු වලද නිරතව සිටී.

රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේ ප්‍රධාන පෙළේ ව්‍යාපෘති ගණනාවක් හා සම්බන්ධ විශේෂ කාර්යභාරයක් ඔහුගේ වෘත්තීය ජීවිතයට ඇතුළත්ව ඇත.

ගෝලීය සමුද්‍රීය හා සේවා සැපයුම් සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රමෝපායික නාවික කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියේදී සිය සහයෝගය දක්වමින් රාජ්‍ය හා පුද්ගලික අංශයේ කාර්යභාරයන් ගණනාවකට දායකත්වය ලබා දෙන අතර ඔහු කොළඹ වරාය නගර ආර්ථික කොමිසමේ සාමාජිකයෙකු වශයෙන් ද හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගෙමෙහි සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද කටයුතු කරයි. තවද, ඔහු ජය බහළු පර්යන්ත සමාගමෙහි හා කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරන අතර ඔහු ලංකා නැව් නියෝජිතියන්ගේ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

රොහාන් ද සිල්වා මහතා නැමීබියාවේ ශ්‍රී ලංකා කොන්සල්වරයා වශයෙන් ද පත් කර ඇත. ඔහු සිය කාලය කැප කරමින් ආයතන සහ කමිටු රාශියක සේවය කරමින් සිටී.

තවද, අවුරුදු ගණනාවක් තිස්සේ, මෝටර් රථ ධාවන තරඟ රාශියකට සහභාගී වී වාර්තා ගණනාවක් තබා ඇත. දක්ෂ බැඩ්මින්ටන් ක්‍රීඩකයෙකු ද වන රොහාන් ද සිල්වා මහතා ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලදී ජයග්‍රහණ රාශියක් අත්කරගෙන ඇත. ඒ අතර ප්‍රවීණ ගණයේ ක්‍රීඩකයින් සඳහා පවත්වන තරඟවලදී පිරිනමන "ශ්‍රී ලංකා ජාතික ශූරතාවය " ද ඇතුළත් වේ. ඔහු ජාත්‍යන්තර තරඟවලදී රන් පදක්කම් ලබා ඇත.

බැඩ්මින්ටන් ක්‍රීඩාව සඳහා වසර ගණනාවක් තුළ කැපවීමෙන් සහයෝගය දක්වා ඇති රොහාන් ද සිල්වා මහතා 2019 වසරේ ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සම්මේලනයේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර මේ දක්වාම එම තනතුරේ කටයුතු කරමින් සිටී. ඔහු ඔටෝමොබයිල් ක්‍රීඩාවල සහ ශ්‍රී ලංකාවේ මෝටර් රථ ධාවන කමිටුවේ පාලන මණ්ඩලයෙහි ද නිලධාරියෙකු වේ.

ඔහුගේ අදහස් පෙරදැරිව මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරය මගින් අනාථ නිවාස හා වැඩිහිටි නිවාස රාශියකට උපකාර කරන අතර සංස්ථාපිත සමාජ වගකීම්/පුණ්‍ය ක්‍රියා ව්‍යාපෘති වශයෙන් වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්හට විවිධ මට්ටමේ උපකාර කිරීමේ ද නිරතව සිටී. මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරයේ සෑම අංශයක්ම මෙහෙයවනු ලබන්නේ දූරදර්ශී ව්‍යාවසායකයෙකු හා කෘතහස්ත නායකයෙකු වන රොහාන් ද සිල්වා මහතා විසිනි. ඔහු ව්‍යාවසායකියන් වෙත දෙන සරල එහෙත් වැදගත් උපදේශය වන්නේ කිසියම් ආයතනයක් උසස් නිශ්පාදනයෙහි නියැලිය යුතු බවත්, ඒ සඳහා කාලය, උත්සාහය හා කැපවීම මහපෙන්වීම හා මනා දැක්ම ඉතා වැදගත් වන බවත්, එමඟින් අතිශය අසීරු කාලවලදී වුවද ව්‍යාපාරය ශක්තමත්ව පවත්වාගෙන යා හැකි බවත්ය. "අනලස්ව වැඩ කරන්න, අවධානයෙන් පසුවන්න, අවස්ථානුකූලව අභියෝගවලට මුහුණ දෙන්න" මේ ප්‍රායෝගික , යථාර්තවාදී මෙන්ම මානුෂීය නායකයෙකු වන රොහාන් ද සිල්වා මහතාගේ උපදෙස්ය.

**එන් ආර් හේවාතන්ත්‍රී මහතා**
**අධ්‍යක්ෂ**

නීතිඥ හේවාතන්ත්‍රී මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ලබා ඇති අතර ඔහු සිවිල් හා මානව හිමිකම් නඩු වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන පෙළේ වෘත්තීය නීතිඥවරයෙකි.

ඔහුගේ වෘත්තීය ජීවිතයට අතිරේකව සඳහන් කිරීමේදී 1995 දී කොළඹ ගෑස් සමාගමේ නීති උපදේශක වශයෙන් ද, 1996 දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකරණ මණ්ඩලයේ ද, 2001 දී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නීති කෙටුම්පත් කමිටුවේ සාමාජික වශයෙන් ද, 2004 දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද, 2016 දී ශ්‍රී ලංකා ගුවන් තොටුපොල හා ගුවන් සේවා පීල්සි සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද පත් කර ඇත. 2010 දී සෞඛ්‍ය නියාමන කොමිසමේ ආරම්භක සාමාජිකයෙකු ද විය. හේවාතන්ත්‍රී මහතා වත්මනෙහි වෘත්තීය චර්යාධර්ම කමිටුවේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

**වෛද්‍ය අජිත් මෙන්ඩිස් මහතා**
**අධ්‍යක්ෂ**

වෛද්‍ය උපුල් අජිත් මෙන්ඩිස් මහතා **(MBBS/DLM/MCMA/FCMA)** 2022 ජූනි මාසයේදී ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ උප සභාපති වශයෙන් පත් විය. මෙම තනතුරට පත් වූ දින සිට ඔහු ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගම යටතේ පවත්වාගෙන යනු ලබන අන්තර්ජාතික ගුවන්තොටුපොළවල් පහක පරිපාලන හා මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීමේ අතිශය වැදගත් කාර්යභාරය ඉටු කර ඇත. මීට අමතරව, ගුවන්තොටුපොළ පිළිබඳව පවතින මහජන ප්‍රතිරූපය ඉහළ නැංවීම පිණිස ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, ප්‍රධාන පාර්ශ්වකරුවන්, මාධ්‍ය ආයතන හා වෙනත් අභ්‍යන්තර සංවිධාන සමඟ සමීපව කටයුතු කරමින් සිටී.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉහළ කළමනාකාරිත්ව මට්ටමේ වසර 45 කට අධික අත්දැකීම් වෛද්‍ය මෙන්ඩිස් මහතා සතුව පවතින අතර රජයේ හා පෞද්ගලික අංශයේ පිළිගත් ආයතන ගණනාවක ඉහළ තනතුරු හොබවා ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් වෘත්තීය දිවිය තුළ ඔහු 2007 සිට 2012 දක්වා වසර 05 ක කාලසීමාවක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස සේවය කළ වෛද්‍ය මෙන්ඩිස් මහතා නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ සභාපති වශයෙන් ද කටයුතු කරන ලද අතර ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. දැනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරමින් සිටී. වෛද්‍ය මෙන්ඩිස් මහතා ප්‍රජා සත්කාරක කටයුතු සඳහා විශාල දායකත්වයක් ලබා දෙන කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ ජනගහන සේවා පිළිබඳ දේශීය අධ්‍යක්ෂ(Country Director) වශයෙන් ද කටයුතු කරයි.

වෛද්‍ය උපුල් මෙන්ඩිස් මහතා සතු විවිධ විෂයන් පිළිබඳ විශේෂඥ දැනුම ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ විවිධ ව්‍යාපාරික අංශ වල ප්‍රවර්ධනය සඳහා දායක කර ඇති අතර, ජාත්‍යන්තර සිවිල් ගුවන්තොටුපොළ හා ගුවන් සේවා ආයතනය වැඩි දියුණු කර නගා සිටුවීම සඳහා කැපවීමෙන් කටයුතු කරමින් සිටී.

**ෂෙහාරා නවරත්න මහත්මිය**
**නීති උපදේශක/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**

# කළමනාකාරීත්ව කමිටුව

කීත් ඩී බර්නාඩ් මහතා
**සභාපති**

ජී යූ කේ අල්ගේවත්තගේ මහතා
**උප සභාපති**

උපුල් ජයතිස්ස මහතා
**කළමනාකාර අධ්‍යක්ෂ**

සුසන්ත අබේසිරිවර්ධන මහතා
**අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)**

එච් එම් ප්‍රභාත් ජයන්ත මහතා
**අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පාලන/මෙහෙයුම්)**

ඩී එල් ආර් වීරසිංහ මහතා
**අධ්‍යක්ෂ (වරාය මෙහෙයුම්)**

ඩබ් එම් නලින් අපොන්සු මහතා
**අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)**

පී ඒ ආර් ඩී පතිරාජ මහතා
**අධ්‍යක්ෂ (තාක්ෂණ)**

මේජර් ජෙනරාල් සුදත් පෙරේරා (විශ්‍රාමික)
**අධ්‍යක්ෂ (ආරක්ෂක)**

එල් ප්‍රේමසිරි ද සිල්වා මහතා
**අධ්‍යක්ෂ (මුදල්)**

ජී වී ටී නානායක්කාර මහතා
**අධ්‍යක්ෂ (සංවර්ධන)**

කේ ජී එස් දයානන්ද මහතා
**අධ්‍යක්ෂ (අලෙවි හා මාධ්‍ය)**

සී ජේ වීරවික්‍රම මහතා
**අධ්‍යක්ෂ (සේවා සැපයුම්)**

අපර්ණා තිලකරත්න මහත්මිය
**ප්‍රධාන නීති නිලධාරිනී**

නිර්මාල් ද ෆොන්සේකා මහතා
**ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති)**

ජේ ඒ චන්ද්‍රරත්න මහතා
**ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික වැඩ)**

ඩී ජී ආර් එම් පතිවිල මහතා
**ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)**

කපිතාන් කේ එම් එන් පී සිල්වා
**හාබර් මාස්ටර්**

එස් එච් එස් පද්මිණි මහත්මිය
**ප්‍රධාන අභ්‍යාස කළමනාකරු**

නෙළුම් අනවරත්න මහත්මිය
**ප්‍රධාන කළමනාකරු (පරිපාලන)**

චිත්‍රාල් ජයවර්ණ මහතා
**ප්‍රධාන කළමනාකරු( සන්නිවේදන හා මහජන සබඳතා)**

ජී එන් ලියනගේ මහත්මිය
**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

ඒ එල් එම් නෞෂර් මහතා
**ප්‍රධාන ඉංජිනේරු (සංවර්ධන)**

ටී සී කේ පරණවිතාන මහතා
**ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)**

එෆ් එම් හුසේන් මහත්මිය
**ප්‍රධාන ඉංජිනේරු ( සැලසුම් හා සංවර්ධන)**

ජී ඉසෙඩ් මිස්කින් මහත්මිය
**ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)**

කේ එස් හෙට්ටිආරච්චි මහතා
**ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)**

එස් එච් තිලකපාල මහතා
**ප්‍රධාන කළමනාකරු**

එච් ජේ කේ යූ කුමාර මහතා
**ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)**

එල් පී එස් චන්දන මහතා
**ප්‍රධාන කළමනාකරු (සාම්ප්‍රදායික බහළු මෙහෙයුම්)**

එම් ආර් එම් රම්සීන් මහතා
**ප්‍රධාන මානව සම්පත් කළමනාකරු**

එන් එන් ජේ ඒ කුමාර මහතා
**ප්‍රධාන ඉංජිනේරු (නාවික)**

ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා
**ප්‍රධාන ඉංජිනේරු (විදුලි හා විද්‍යුත්)**

**2022 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වෙනස්වීම්**

**විශ්‍රාම ගැනීම් හා ඉල්ලා අස්වීම්**

**ශිරාණි වන්නිආරච්චි මහත්මිය,** අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.
**එස් එස් දේවප්‍රිය මහතා,** අධ්‍යක්ෂ (සංවර්ධන) ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වන ලදී.
**එම් එස් ඒ පතිරගේ මහතා,** ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වන ලදී.

**පත්කිරීම්**

**එච් එම් ප්‍රභාත් ජයන්ත මහතා,** අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පාලන/මෙහෙයුම්) ලෙස පත් කරන ලදී.
**කේ ජී එස් දයානන්ද මහතා**, අධ්‍යක්ෂ (අළෙවි හා මාධ්‍ය) ලෙස පත් කරන ලදී.
**එල් ප්‍රේමසිරි ද සිල්වා මහතා**, අධ්‍යක්ෂ (මුදල්) ලෙස පත් කරන ලදී.
**සී ජේ වීරවික්‍රම මහතා,** අධ්‍යක්ෂ (සේවා සැපයුම්) ලෙස පත් කරන ලදී.
**ජී වී ටී නානායක්කාර මහතා**, අධ්‍යක්ෂ (සංවර්ධන) ලෙස පත් කරන ලදී.
**එම් ආර් එම් රම්සීන් මහතා**, ප්‍රධාන මානව සම්පත් කළමනාකරු ලෙස පත් කරන ලදී.
**එච් ජේ කේ යූ කුමාර මහතා,** ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා) ලෙස පත් කරන ලදී.
**ජී එන් ලියනගේ මහත්මිය,** ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් කරන ලදී.
**එන් එන් ජේ ඒ කුමාර මහතා**, ප්‍රධාන ඉංජිනේරු (නාවික) ලෙස පත් කරන ලදී.
**ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා**, ප්‍රධාන ඉංජිනේරු (විදුලි හා විද්‍යුත්) ලෙස පත් කරන ලදී.

වර්ෂය තුළ කොළඹ වරායේ බහළු විස්සේ සම ඒකක මිලියන 6.86 ක් මෙහෙයුම් කරන ලද අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 5.3% ක අඩු වීමක් පෙන්නුම් කරයි. පර්යන්ත වශයෙන් සඳහන් කිරීමේදී පිළිවෙලින් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් සමාගම විසින් බහළු මිලියන 3.18 ක් ද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් බහළු මිලියන 1.92 ක් ද, සවු ත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම විසින් බහළු මිලියන 1.75 ක් ද, මෙහෙයුම් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම හ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම යන පර්යන්ත විසින් පෙන්නුම් කරන ලද කාර්යසාධනය 2021 වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් වර්ධනයේ පසුබෑමක් පෙන්නුම කරයි. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළම නැගෙනහිර බහළු පර්යන්තය විසින් බහළු විස්සේ සම ඒකක මිලියන 346,174 ක් මෙහෙයුම් කරනු ලැබීම අවධානයට යොමු කිරීම ඉතා වැදගත් වේ.

2021 වර්ෂයේදී කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම යන පර්යන්ත වල වෙළෙඳපොළ කොටස් පිළිවෙලින් 44% ක්, 30% ක් හා 25% ක් වූ අතර 2022 වර්ෂයේදී එය පිළිවෙලින් 46%, 28% සහ 25% ක් විය. ගැඹුරු පර්යන්ත ද්විත්වය නොතිබුනේ නම් කොළඹ වරායට මීටර් 14.25 ක් ඉක්මවූ ගැඹුරක් සහිත බහළු නෞකා 230 ක් සඳහා මෙහෙයුම් ඉඩ පහසුකම් සැලසීමට නොහැකි වන්නට ඉඩ තිබිණ.

ටොන් ප්‍රමාණය වශයෙන් සැලකීමේදී, 2021 වර්ෂයේ කොළඹ වරාය විසින් මෙහෙයුම් කරන ලද ටොන් මිලියන 103 හා සසඳා බැලීමේදී 2022 වර්ෂයේදී 7.4% ක ටොන් මිලියන 96 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

වෙනත් වරාය වල කාර්යසාධනය සැලකිල්ලට ගැනීමේදී 2021 වර්ෂයේදී හම්බන්තොට වරාය වෙත නෞකා 323 ක් පැමිණ තිබූ අතර එමඟින් මෙහෙයුම් කරන ලද ටොන් ප්‍රමාණයේ අඩු වීම 5.9% වශයෙන් පෙන්නුම් කෙරිණ. කෙසේ වුවද, හම්බන්තොට වරායේ මෝටර් රථ මෙහෙයුම් 13.1% කින් වැඩි වී ඇත. මේ අතර, 2021 වර්ෂය හා සැසඳීමේදී ත්‍රිකුණාමලය වරායට පැමිණි නෞකා වල අඩු වීම 18.8% ක් වූ අතර එමඟින් මෙහෙයුම් කරන ලද ටොන් ප්‍රමාණයේ අඩුවීම 34.3% ක් විය.

2022 ජනවාරි මාසයේදී, ගාල්ල වරායේ සංවර්ධනය ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය නාවික ක්ෂේත්‍රයේ 400 ක් පමණ සහභාගී වූ සාකච්ඡා සමුළුවක් අභිලාෂියිය ආයෝජකයින් වෙනුවෙන් පවත්වන ලදී.

ගෝලීය වසංගත තත්ත්වය හේතුකොට ගෙන, නැව් සමාගම් සහ වෙනත් පාර්ශ්වීය ආයතන වල කාර්යසාධනය ඇගයීම සඳහා පවත්වනු ලබන “Port of Colombo Awards Night” සම්මාන උළෙල පැවැත්වීමට නොහැකි විය.




# සංවර්ධන ව්‍යාපෘති

## වාර්ෂික වාර්තාව - 2022

රටෙහි සමස්ත වරායයන්හි පොදුකාර්ය පහසුකම් සහ ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙහෙයුම් ධාරිතාවය පුළුල් කිරීම, කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම මෙම ව්‍යාපෘති මගින් අවධාරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සංවර්ධන, කොන්ත්‍රාත් හා සැලසුම් සහ සංවර්ධන කොට්ඨාශ විසින් ආරම්භ කර ඇති ප්‍රධාන පෙළේ සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සහ 2022 වර්ෂයේ ඒවා පිළිබඳ ප්‍රගතිය මෙහි දැක්වේ.

## 1. නැගෙනහිර බහළු පර්යන්තය (ECT)

වරාය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිළිබඳ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය වන්නේ කොළඹ දකුණු වරායේ නැගෙනහිර බහළු පර්යන්තය හා බටහිර බහළු පර්යන්තය - I සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කිරීමය.

මීටර් 440 ක් දිග නැංගුරම්පොළෙහි මෙහෙයුම් හැකි ඉක්මනින් ආරම්භ කිරීමේ අරමුණ ඇතිව 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මීටර් 440 ක් දිග මෙහෙයුම් මට්ටමේ නැංගුරම්පොළක් සහිත මීටර් 600 ක් දිග ජැටි බැම්ම, හෙක්ටයාර 18 ක අංගණ ප්‍රදේශය, පර්යන්ත මාර්ග සහ අදාළ ගේට්ටු සංකීර්ණය දැනටමත් ඉදිකර ඇත. මීටර් 600 දිගින් යුත් පවත්නා ජැටිය මීටර් 18 ගැඹුරැති නැංගුරම්පොළක් සහිත වන ලෙස ඉදිකොට ඇති අතර ඉතිරි මීටර් 720 ක් දිග ජැටි බැම්මේ අත්තිවාරම මීටර් 20 ගැඹුරැති නැංගුරම්පොළක් ඉදිකිරීමට හැකිවන පරිදි සැලසුම් කර ඇත.

2025 වර්ෂය වන විට නැගෙනහිර බහළු පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පූර්ණ හිමිකාරීත්වය සහිත පර්යන්තයක් බවට පත් කිරීමේ අරමුණෙන් යුතුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කෙරෙනු ඇත. නැගෙනහිර බහළු පර්යන්තය අති විශාල බහළු නෞකා තුනක් මෙහෙයුම් කිරීමට ඉඩ පහසුකම් සලසන මීටර් 18 – 20 දක්වා ගැඹුර සහිත මීටර් 1320 ක් දිග ජැටි බැම්මකින් සමන්විතය. පර්යන්තය බහළු විස්සේ සම ඒකක මිලියන 2.4 ක වාර්ෂික ධාරිතාවයක් සහිත දළ වශයෙන් හෙක්ටයාර 72 ප්‍රදේශයකින් ද සමන්විත වේ.

**වර්තමාන ප්‍රගතිය**

- නැගෙනහිර බහළු පර්යන්තයේ ඉදිකිරීම් 2022.01.04 දින ආරම්භ කරන ලදී.
- වර්ෂ 2022 දෙසැම්බර් වන විට ප්‍රගතිය පහත පරිදි වේ.

  මූල්‍ය ප්‍රගතිය - ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.91
  ශ්‍රී ලංකා රුපියල් මිලියන 5,083

  සාමාන්‍ය අයිතම වල ප්‍රගතිය - 26%

  හෑරීම් සහ ගොඩකිරීමේ වැඩ වල ප්‍රගතිය 30%

  ජැටි බැම්ම ඉදිකිරීමේ ප්‍රගතිය - 1.2%

## 2. බටහිර බහළු පර්යන්තය (WCT – I)

**ව්‍යාපෘති විස්තර**

කොළඹ දකුණු වරායේ බටහිර බහළු පර්යන්තය - I මීටර් 400 හෝ ඊට වඩා වැඩි දිගින් යුත් අති විශාල බහළු නෞකා තුනක් එකවර මෙහෙයුම් කළ හැකි මීටර් 1400 දිගින් යුත් මීටර් 20 ක ගැඹුරු නැංගුරමපොළක් හා පසුපස අංගණ ප්‍රදේශයකින් සමන්විත වේ. පර්යන්ත ප්‍රදේශය දළ වශයෙන් හෙක්ටයාර 64 ක් වන අතර පර්යන්තයේ ඇස්තමේන්තුගත වාර්ෂික ධාරිතාවය බහළු විස්සේ සම ඒකක මිලියන 3 කි.

**වත්මන් ප්‍රගතිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Adani Ports Special Economic Zone Ltd., සමාගම සහ සිය දේශීය හවුල්කාර සමාගම වන John Keells Holdings PLC සමාගම් වලින් සමන්විත හවුල් ව්‍යාපාරයක් මගින් වසර 35 ක් සඳහා ඉදිකර මෙහෙයුම් කර, පවරා දීම යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපාරයක් ලෙස බටහිර බහළු පර්යන්තය I සංවර්ධනය කිරීම සඳහා 2021.03.01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

බටහිර බහළු පර්යන්ත I සංවර්ධනය හා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පර්යන්ත මෙහෙයුම්කරු ලෙස 'Colombo West International Terminal පුද්ගලික සමාගම (CWIT)' නමින් සමාගමක් සංස්ථාපනය කර ඇත.

ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුම 2021.09.30 දින ක්‍රියාත්මක කරන ලදී. වැඩබිම් බදු කුලී ගිවිසුම, කොටස් හිමිකාරිත්ව ගිවිසුම සහ ණය හිමියන්ගේ සෘජු ගිවිසුම 2022.02.25 ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ඉදි කර, මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුම බලපැවැත්වෙන දිනය 2022.02.26 ලෙස වාර්තා විය.

බටහිර බහළු පර්යන්ත I හි ඉදිකිරීම් කටයුතු 2022.11.09 දින ආරම්භ කරන ලදී.

## 3. කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේ උපදේශක සේවාව

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය බහළු මෙහෙයුම් ධාරිතාවය ඉදිරි වසර 30 තුළ පුළුල් කිරීම සඳහා දීර්ඝ කාලීන සැලසුමක් සකස් කර ඇත. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පවත්නා කොළඹ වරායේ උතුරු ප්‍රදේශයේ පිහිටා ඇති කොළඹ උතුරු වරාය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය යෝජනා කර ඇත. යෝජිත වරාය ද්‍රව තොග, වියළි තොග, රෝ රෝ සහ බහළු මෙහෙයුම් සිදු කිරීම සඳහා පවතින ඉල්ලුම මත පදනම්ව, අදියර වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ඉල්ලුමට ප්‍රමාණවත් ලෙස සරිලන යටිතල පහසුකම් හා වරාය සේවා සැපයීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවධානය යොමු කර ඇත.

වරාය ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ඉල්ලුම සපුරාලීම සඳහා අනෙකුත් වරාය සේවාවන් පවත්වා ගැනීමට සහතික වෙමින් බහළු මෙහෙයුම් ධාරිතාවය පුළුල් කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වර්තමානයේදී කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. ප්‍රවාහන ව්‍යාපෘති ප්‍රාරම්භක පහසුකම යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මෙම අධ්‍යයනය මාස 15 ක් තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

අවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ, අංකන ආකෘති සහ නාවික තක්සේරු සිදු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් සමාලෝචනය කිරීම පිණිස කෙටුම්පත් ශක්‍යතා වාර්තාව උපදේශක විසින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය කෙටුම්පත් වාර්තාව පිළිබඳ සිය නිරීක්ෂණ සහ අදහස් ලබා දී ඇති අතර උපදේශක විසින් එම යෝජනා අන්තර්ගත කරමින් ශක්‍යතා වාර්තාව මේ වන විට අවසන් කරමින් සිටී.

මීට අමතරව, කෙටුම්පත් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව උපදේශක විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර එය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික ඇගයීම සිදු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. 2022 සැප්තැම්බර් මසදී තාක්ෂණික ඇගයීම සිදු කරන ලද අතර 2022 නොවැම්බර් මස දී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හරහා අදාළ පාර්ශ්වයන්ගේ නිරීක්ෂණ හා අදහස් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබිණ. උපදේශක මේ වන විට මෙම අදහස් / යෝජනා ඇතුළත් කරමින් කෙටුම්පත් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව අවසන් කිරීමේ ක්‍රියාවලියේ නිතරව

සිටින අතර අවසන් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව මහජනතාවගේ දැන ගැනීම පිණිස නුදුරු අනාගතයේදී ඉදිරිපත් කරනු ඇත.

## 4. ජය බහළු පර්යන්ත V ව්‍යාපෘතියේ නැංගුරම්පොළ ධාරිතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ සිවිල් වැඩ සංරචකය

මීටර් 330 වඩා වැඩි දිගින් යුත් නෞකා දෙකක් එකිනෙකට සමාන්තරව නැංගුරම්ලා තැබිය හැකි අවම අද්දර ගැඹුර මීටර් 16 වන පරිදි ජය බහළු පර්යන්ත IV හි පවත්නා බහළු ජැටි බැම්ම මීටර් 120 කින් දීර්ඝ කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2017 වර්ෂයේ දී සිටම සැලසුම් කර තිබිණ. මෙම සංවර්ධන කොන්ත්‍රාත්තුවේ සිවිල් වැඩ සංරචකය 2018 වර්ෂයේදී බාහිර කොන්ත්‍රාත්කරුවෙකුහට ප්‍රදානය කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනයෙන් පරිබාහිර හේතු මත කොන්ත්‍රාත් වැඩ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. අවසානයේදී, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡාමය එකඟතාවයකට පැමිණ කොන්ත්‍රාත් වැඩ 2020 නොවැම්බර් මස ආරම්භ කරන ලද අතර 2022 වර්ෂය දක්වා අඛණ්ඩව සිදු කෙරිණ. ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 6,374 ක සමස්ත පිරිවැයකට ප්‍රදානය කරන ලද අතර මූලික කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය මාස 20 කි.

## 5. ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ප්‍රාදේශීය වාණිජ වරායක් ලෙස ගාල්ල වරායේ පවතින කාර්යභාරයට අමතරව සංචාරක කර්මාන්තය හා සම්බන්ධ වරායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා රජය සැලසුම් කොට ඇත. 1960 වසර තරම් ඈත කාලයක සිට ප්‍රයත්න දරණ ලද වුවද, කොළඹ වරාය සහ හම්බන්තොට වරාය සඳහා ප්‍රමුඛතාවය ලබා දීම හේතුවෙන් එහි සංවර්ධන කටයුතු මන්දගාමී වී ඇත. කෙසේ වුවද, කලාපය තුළ භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගාල්ල වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. රටෙහි ආර්ථික සංවර්ධනයට දායක වීම සඳහා ගාල්ල වරායේ ගැඹුරු මගී නෞකා පර්යන්තයක්, දියකඩන ප්‍රවේශ ඇළ මාර්ගය හා දෝණිය හාරා ගැඹුරු කිරීම සහ අනෙකුත් පහසුකම් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ (JICA) කණ්ඩායමක් විසින් සකසන ලද යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය මගින් උදම් රළ මගින් ගාල්ල බොක්ක ආරක්ෂා කිරීම පමණක් නොව විනෝදාත්මක කටයුතු සහ මගී නෞකා වලට පැමිණීම සඳහා ද උචිත ස්ථානයක් වනු ඇත. තිරසාර සංවර්ධනයක් ද ප්‍රවර්ධනය කරමින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය අරමුණු කොට ඇත. භූගෝලීය වශයෙන් ගාල්ල බොක්කේ සුවිශේෂී පිහිටීමේ වාසිදායක තත්ත්වය ප්‍රයෝජනයට ගෙන විනෝදාත්මක හා ඉඩම් දේපළ සංවර්ධනය කිරීමේ අවස්ථා මෙම ව්‍යාපෘතිය මගින් විවෘත කර දීමට අපේක්ෂා කෙරේ.

දේශීය මට්ටමින් හා අන්තර්ජාතික මට්ටමින් අභිප්‍රාය ප්‍රකාශ කිරීම් නිකුත් කිරීම මේ දක්වා ව්‍යාපෘති ප්‍රගතියට ඇතුළත් වන අතර එම අභිප්‍රාය කැඳවීම් කෙටි ලැයිස්තුගත කොට ඇත. කෙටි ලැයිස්තුගත ආයෝජකයන් වෙත නිකුත් කිරීමේ අරමුණ ඇතිව කෙටුම්පත් යෝජනා සඳහා ඉල්ලීම් (RFP) සහ ව්‍යාපෘති ගිවිසුම් මේ වන විට නිම කෙරෙමින් පවතී. සංචාරක කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරමින් ගාල්ල වරාය ප්‍රාදේශීය වාණිජ වරායක් ලෙස සංවර්ධනය කිරීම මගින් කලාපය තුළ සුවිශේෂී ආර්ථික වර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

## 6. වරාය සන්නිවේදන පද්ධතිය

ජාතික වරාය ප්‍රධාන සැලැස්ම මගින් වරාය සන්නිවේදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. වරාය සන්නිවේදන පද්ධතිය වරාය ක්ෂේත්‍රයේ ව්‍යාපාර ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා සම්බන්ධතාවය ඇති කරන ස්වාධීනව ක්‍රියාත්මක වන මෘදුකාංගයක් වන අතර යම්

ක්‍රියාවලියක ව්‍යාපාර චක්‍රය සම්පූර්ණ කිරීම සඳහා අදාළ ගනුදෙනු පමණක් ඉදිරියට ගෙන යාම හෝ නැවතීම සඳහා පොදු අතුරු මුහුණතක් එමඟින් නිර්මාණය වනු ඇත.

**වත්මන් ප්‍රගතිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2020 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික හා මූල්‍ය සහාය ඇතිව පූර්ව ශක්‍යතා අධ්‍යයනය සහ පාර්ශ්වකාර අනුරූපී සැලැස්ම 2019 දී සම්පූර්ණ කරන ලද අතර මෙම ව්‍යාපෘතිය සඳහා පාලන ආකෘතිය 2021 දී ස්ථාපිත කරන ලදී.

ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීමට හා ව්‍යාපෘතිය පහසුවෙන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් පත් ඇත. වරාය සන්නිවේදන පද්ධතියේ පූර්ව සැලසුම් හා ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ KPMG ආයතනය හා නෙදර්ලන්තයේ Port of Rotterdam අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් හවුල් ව්‍යාපාරයක් 2021.10.28 දින ඇති කර ගන්නා ලදී. මෙම අධ්‍යයනය යටතේ ප්‍රාරම්භක වාර්තාව, තොරතුරු පද්ධති සමීක්ෂණය, පාර්ශ්වකරුවන්ගේ සන්නිවේදන සැලැස්ම හා කළමනාකරණ සැලැස්ම වෙනස් කිරීමේ කාර්යය අවසන් කර ඇත.

ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රතිඉංජිනේරු වාර්තාව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර එය අවසන් කිරීමේ කටයුතු ක්‍රියාත්මකව පවතී. වරාය සන්නිවේදන පද්ධතිය ක්‍රියාවට නැංවීම මඟින් වරාය ක්ෂේත්‍රයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය විශාල වශයෙන් ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## 7. අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල් කිරීම, විජය කුමාර පාලමෙහි සහ ජය බහළු පර්යන්තයේ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු දෙවන අදියර, අඩු එසවුම් යන්ත්‍ර අළුත්වැඩියා අංශය සඳහා වැඩහල් ඉදිකිරීම.

2020 දෙසැම්බර් මාසය තුළ, ගිනි නිවීම් ඒකකයේ සිට සමර්හිල් ප්‍රදේශය දක්වා දුර ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කරමින් ප්‍රධාන අභ්‍යන්තර වරාය මාර්ගයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කරන ලද අතර 2022 වර්ෂය තෙක් නොකඩවා සිදු කෙරිණ. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකමේ සමාන වටිනාකම රුපියල් මිලියන 289 ක් ලෙස සංශෝධනය කරන ලදී.

විජය කුමාර පාලමේ ජැටි අංගණය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු වල දෙවන අදියර 2021 දී ආරම්භ වූ අතර 2022 වර්ෂය දක්වා අඛණ්ඩව සිදු කෙරිණ. මීට අමතරව, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ජය බහළු පර්යන්තයේ බහළු අංගණයේ මතුපිට සැකසීමේ වැඩ රුපියල් මිලියන 307.5 ක මූලික කොන්ත්‍රාත් මිලකට ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් අංගණයේ සමස්ත පහසුකම් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අරමුණු කොට ඇත.

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ කොටසක් ලෙස, උපකරණ නඩත්තු ශීතකරණ හා වායුසමීකරණ අළුත්වැඩියා සහ අඩු එසවුම් යන්ත්‍ර අළුත්වැඩියා යන අංශයන් සඳහා වැඩහල් තුනක් ඉදිකිරීම් කාර්ය කොන්ත්‍රාත් සහ සැලසුම් කොට්ඨාශය වෙත පැවරී ඇත. පළමු වැඩහල් දෙක 2021 වර්ෂයේදී සාර්ථකව ඉදිකර අවසන් කරන ලදී. අඩු එසවුම් යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වැඩබිම සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර පසුගිය වර්ෂය පුරාම අඛණ්ඩව සිදු කෙරිණ.

සිදු කෙරමින් පවතින ව්‍යාපෘති වලට අමතරව 2022 වර්ෂය තුළ, ත්‍රිකුණාමල වරායේ, ඉංජිනේරු වැඩහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ජල නල පද්ධතිය එළීම සඳහා ප්‍රසම්පාදන කටයුතු අඛණ්ඩව සිදු කෙරිණ. මෙම ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේදි ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. මෝටර් ගරාජ ගොඩනැගිල්ල සහ ජය බහළු පර්යන්ත V ගල් අතුරා තාර දැමීමේ කටයුතු ආදී නව ව්‍යුහයන්ගේ නිර්මාණ සැලසුම් ද සැලසුම් අංශය මඟින් ආරම්භ කරන ලදී.

## 8. කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම

**විදේශීය ණය අරමුදල් භාවිතයෙන් සිදු කරනු ලබන ව්‍යාපෘති**

කන්කසන්තුර වරාය වාණිජ වරායක් ලෙස මෙහෙයුම් කිරීම සඳහා අවශ්‍ය දියකඩන සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම, නව වාණිජ නැංගුරම්පොළක් ඉදි කිරීම ආදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඇතුළුව කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 45ක අරමුදල් ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් ලබා දී ඇත.

2017 මැයි 2 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, ඉන්දියාවේ එක්සිම් බැංකුව සමඟ ණය පහසුකම් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය 2018 ජනවාරි 10 දින ගිවිසුමකට එළැඹෙන ලදී. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා රජය අතර ණය නිදහස් කිරීමේ ගිවිසුම 2018 ඔක්තෝම්බර් මස 17 දින අත්සන් තබන ලදී.

ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම පිණිස සැලසුම් හා උපදේශක සේවා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘති කළමනාකරණ උපදේශක ගිවිසුමකට එළඹී ඇති අතර එහි කාර්යයන් 2020 ඔක්තෝම්බර් 12 දින ආරම්භ කර ඇත. ඒ අනුව, සමස්ත උපදේශක කටයුතු වලින් 47% ක් අවසන් කර ඇති අතර මේ දක්වා උපදේශකවරයා වෙත රුපියල් මිලියන 273 ක මුදලක් නිදහස් කර ඇත. පිරිවැය සීමාව ඉක්මවා යෑම ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ණය මුදලක් ලබා දීමට ඉන්දියාවේ එක්සිම් බැංකුවේ එකඟතාවය ලැබීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2023 වසරේ ආරම්භ කිරීමට නියමිතය.

**දේශීය අරමුදල් භාවිතයෙන් සිදු කරනු ලබන ව්‍යාපෘති**

ඉහත සංවර්ධන කටයුතු පහසු කරවීම සඳහා, නව ගේට්ටු සංකීර්ණය හා සීමා වැට තාප්පය ඉදිකිරීම, ජල ගබඩා ටැංකිය, ඉහළින් ඉදි කරන ලද ජල ටැංකිය සහ මාර්ග ඉදිකිරීම් කටයුතු සහ ව්‍යාපෘති පරිපාලන කටයුතු සඳහා මිලදී ගත් නිවසේ අළුත්වැඩියා කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තම අරමුදල් භාවිතයෙන් නිම කර ඇත. කන්කසන්තුර වරායට යාබදව පිහිටා ඇති අක්කර 50 ක ඉඩම (අක්කර 16 සහ අක්කර 34) පවරා ගැනීම/ මිලදී ගැනීම සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කිරීමට තෙලිප්පාලායි දිස්ත්‍රික් ලේකම්වරයා කටයුතු කරමින් සිටී.

## 9. වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

ඉහුරුකඩේ හන්දියේ සිට ආරම්භ වන වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය පරිශ්‍රය හරහා ගාලු මුවදොර දක්වා විහිදේ. එය දිගින් කි.මී. 5.3 ක් වන මංතීරු 4 කින් යුත් අධිවේගී ගුවන් මාර්ගයකි. ඇ.ඒ.ජ. ඩොලර් මිලියන 300 ක් වන ව්‍යාපෘති පිරිවැය ආසියානු සංවර්ධන බැංකුව විසින් යොදවනු ලැබේ.

**සමුද්‍රීය පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල)**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යාල ගොඩනැගිලි වලින් ඉවත් වීමට සිදු වන කාර්යමණ්ඩලය වෙනුවෙන්, කැනැල් අංගණ පරිශ්‍රයේ මහල් 17 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර ඇති අතර එය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 6,200 ක් වන අතර මෙම පිරිවැය ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදලින් සිදු කරනු ලැබේ. උප ව්‍යුහය සහ උපරි ව්‍යුහය වශයෙන් අදියර

දෙකකින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. ඉදිකිරීම් කටයුතු වලින් 19.5% ක් මේ වන විට අවසන් කර ඇත.

**නව වැඩබිම් ගොඩනැගිලි සංකීර්ණය**

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය හේතුකොටගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩහල් ප්‍රතිස්ථානගත කිරීමට අවශ්‍යව ඇති අතර ගොඩනැගිලි 4 ක් ඇතුළුව වැඩහල් සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 1090 ක් වන අතර (අසම්භාව්‍ය වියදම්, බදු සහ මිල ඉහළ යෑම හැර) ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් භාවිතයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වීමට නියමිතය.

කොන්ත්‍රාත්කාර සමාගම වන BEL – DGES JV වෙත භාර ගැනීමේ ලිපිය 2021 අගෝස්තු 06 දින ලබා දුන් අතර වැඩ කටයුතු 2021 සැප්තැම්බර් 09 දින ආරම්භ වී ඇත. ඉදිකිරීම් කටයුතු වලින් 54.04% ක් අවසන් කර ඇති අතර රුපියල් මිලියන 488 ක් කොන්ත්‍රාත්කරු වෙත මේ දක්වා නිදහස් කර ඇත.

## 10. ඔලුවිල් වරාය

ඔලුවිල් වරාය මේ වන විට වරාය ප්‍රවේශ මාර්ගයේ රොන්මඩ එක්රැස් වීමේ ගැටළුවට මුහුණ පා සිටින අතර මේ හේතුවෙන් නෞකා වලට වාණිජ වරායට සහ ධීවර වරායට ඇතුළු වීමට නොහැකි වී ඇත. Danish Hydraulic Institute ආයතනය හා එක්ව මේ පිළිබඳව ඉංජිනේරු අධ්‍යයනයක් සිදු කර ඇති අතර කඩිනම් විසඳුමක් සහ වරාය ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගෙන යෑම සඳහා ක්‍රමවේදයක් මෙම නිර්දේශයන්ට අයත් වන අතර මේ සඳහා විශාල මුදලක් වැය වනු ඇත. මූල්‍ය සහ තාක්ෂණික ගැටළු හේතුවෙන් මෙම කිසිදු ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන ලදී.

ඔලුවිල් වරාය ධීවර වරායක් ලෙස අදියර වශයෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක CP/211574/311/023 මගින් අනුමැතිය හිමි වී ඇති අතර මෙහි මුල් අදියර වශයෙන් ශීතාගාරය හා ඒ ආශ්‍රිත පහසුකම් ධීවර අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

ධීවර අමාත්‍යාංශය වෙත භාර දුන් ධීවර වරාය පරිශ්‍රයට අමතරව, ඉඩම් හා පරිපාලන ගොඩනැගිල්ල, ආපනශාලාව, ඉංජිනේරු කාර්යමණ්ඩලය සඳහා ගොඩනැගිල්ල, නේවාසික කළමනාකරුගේ නිල නිවාස සහ ඉංජිනේරු නිල නිවාස වාණිජ වරායට ඇතුළත් වන අතර එම ගොඩනැගිලි මේ වන විටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවතී.

වාණිජ වරායේ ඉඩම් සහ ගොඩනැගිලි බදු දීමට අවශ්‍ය වන්නේ නම් අභිප්‍රාය ප්‍රකාශ කිරීම සහ යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම ඇතුළත් වන අයුරින් තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 22/1787/628/016 මගින් මේ වන විට ලැබී ඇත. ඉඩම් සහ ගොඩනැගිලි බදු දීමට ආයෝජකයාගෙන් යෝජනා ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ආරම්භ කර ඇති මෙම සංවර්ධන ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකාව ඉන්දීය සාගර කලාපය තුළ සමුද්‍රීය හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට ඇති රජයේ කැපවීම අවධාරණය කරනු ලබයි. වරාය මෙහෙයුම් ධාරිතාවයන් පුළුල් කිරීම, පොදුකාර්ය පහසුකම් වැඩි දියුණු කිරීම හා ආයෝජන ආකර්ෂණය කිරීම මගින් වෙළෙඳ කටයුතු වැඩි දියුණු කිරීම රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ රටෙහි ආර්ථික ප්‍රවර්ධනයට පහසුකම් සැලසීම අපේක්ෂා කරනු ලැබේ.




# මෙහෙයුම් සමාලෝචනය

වාර්ෂික වාර්තාව - 2022

## මෙහෙයුම් කොටියාශය

ගෝලීය හා දේශීය ආර්ථික අර්බුදය සහ අස්ථාවර දේශපාලනික පරිසරය මධ්‍යයේ වුවද, බහළු මෙහෙයුම් ධාරිතාවය සහ අපේක්ෂිත ඵලදායීතා මට්ටම පවත්වාගෙන යෑමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොටියාශය විසින් සාමූහික ප්‍රයත්නයක් දරණ ලදී. ආර්ථික අර්බුදය, මධ්‍යයේ ජය බහළු පර්යන්තයට ඉන්ධන හිඟය, රට පුරා පැවති විරෝධතා සහ පර්යන්ත සේවා ගිවිසුම් අළුත් කිරීම සඳහා වූ තීරණාත්මක සාකච්ඡා පැවැත්වීමට සිදුවීම ආදී බාධාවන්ට මුහුණ පෑමට සිදු වූ නමුත් වාර්ෂික බහළු ධාරිතාවය අඩු වීම අවම කර ගැනීමට හැකි විය. මෙම අපහසුතා මධ්‍යයේ වුවද, ඉහළ තත්ත්වයෙන් යුත් සේවා ලබා දීම, නිරවද්‍යතාවය පවත්වා ගෙන යෑම සහ කාර්යක්ෂමතාවය සහතික කිරීම පිළිබඳව මෙම කොටියාශය සිය අවධානය යොමු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ඵලදායීතා මට්ටමෙහි වර්ධනයක් 2022 වර්ෂයේදී සිදු විය.

ගෝලීය වෙළෙඳාම කෙරෙහි ඇතිවූ උද්ධමනයේ බලපෑම ජය බහළු පර්යන්තයේ මෙහෙයුම් කෙරෙහිද දැඩි බලපෑමක් එල්ල කෙරිණ. MSC, Evergreen, CMA CGM, ඇතුළු ප්‍රධාන නෞකා සේවාවන්ගේ පර්යන්ත සේවා ගිවිසුම් කල් ඉකුත් වීම හේතුවෙන් මෙම අර්බුදයේ බලපෑම තවදුරටත් සංකීර්ණ වූ අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය සහ ප්‍රධාන නැව් සේවා අතර තීරණාත්මක සාකච්ඡා පවත්වන ලදී. රට තුළ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් ජය බහළු පර්යන්තයේ දෛනික මෙහෙයුම් කටයුතු වලට දැඩි අභියෝගයක් එල්ල වූ අතර, මෙහෙයුම් කාර්යමණ්ඩලය වරාය වෙත දෛනිකව ප්‍රවාහනය කිරීමට ක්‍රමවේදයක් සපයා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදු විය. සියළු බාධක හමුවේ, 2021 වර්ෂයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මගින් බහළු විස්සේ සම ඒකක 1,925,895 ක් මෙහෙය වූ අතර, වෙළෙඳ ධාරිතාවය අඩු වීම සහ 2022 වසරේදී මෙහෙයුම් සිදු කරන කාලය තුළ මුහුණ පෑමට සිදු වූ විවිධ අභියෝග හමුවේ මෙය සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක.

ප්‍රධාන නැව් සේවා වල සාමාන්‍ය දළ දොඹකර ඵලදායීතාවය පැයකට දොඹකර මෙහෙයුම් වාර 23.3 ක් ලෙස වාර්තා වූ අතර එය 2021 වසරේ ඵලදායීතාවයට සාපේක්ෂව 2.6% ක වැඩි වීමකි. ඒ අනුව, 2022 වසරේ පෝෂක නැව් සේවා වල සාමාන්‍ය දළ දොඹකර ඵලදායීතාවය පැයකට දොඹකර මෙහෙයුම් වාර 20.99 ක් ලෙස වාර්තා වූ අතර මෙය පෙර වසරට සාපේක්ෂව 4.9% ක වර්ධනයකි. මෙම ප්‍රතිඵල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි.

රට තුළ පවතින අර්බුදය හමුවේ වුවද, නෞකා මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීම සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය සේවයට ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රත්‍යාස්ථිතික බව හා කාර්යක්ෂම සේවා සැපයීම පිළිබඳව දක්වන කැපවීම පෙන්නුම් කරමින් පෙර වසර හා සැසඳීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල ඵලදායීතා මට්ටම 2022 වර්ෂයේදී වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2022 වසරේදී, රට තුළ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් පෙර වසර හා සැසඳීමේදී අන්තර් පර්යන්ත ට්‍රක් රථ හුවමාරුව (ITT) 52.6% කින් අඩු විය. මෙහි බලපෑම අවම කර අන්තර් පර්යන්ත ට්‍රක් රථ ධාවනය අඩු කිරීම පර්යන්ත සේවා ගිවිසුම් තිබියදීත් අන්තර් පර්යන්ත ට්‍රක්රථ ධාරිතාවය මත පදනම්ව නෞකා වලට ඕනෑම පර්යන්තයක නැංගුරම්ලෑම සඳහා ඉඩ සැලසීමට හෝ පර්යන්ත දෙකක සේවය කිරීමට (double dips) පර්යන්ත ත්‍රිත්වයම ගිවිසුමකට එළැඹෙන ලදී. මීට අමතරව, අන්තර් පර්යන්ත ට්‍රක් රථ ධාවනය අවම කිරීමට සහ අන්තර් පර්යන්ත ට්‍රක් රථ මෙහෙයුම් වලට සිදු වන බලපෑම අඩු කර ගැනීම සඳහා නැව් සමාගම් සිය සේවා ප්‍රතිසංවිධානය කරන ලදී. සියළු අභියෝග හමුවේ, විසඳුම් සොයා ගැනීමට සහ මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය පවත්වා ගෙන යෑම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ඔවුන්ගේ පාර්ශ්වකරුවන් විසින් දක්වන ලද කැපවීම මෙමඟින් පෙන්නුම් කරන ලදී.

2022 වසරේදී, සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයවන පර්යන්ත තුළ මෙහෙයවන ලද වියළි තොග නැව්බඩු ටොන් ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව 47.3% කින් අඩු වන ලදී. 2022 වසරේදී ටොන්

1,652,453 ක වාර්තාගත ධාරිතාවයක් මෙහෙයවන ලද අතර 2021 වසරේදී මෙය ටොන් 3,140,637 ක් විය. මෙහෙයවන ලද ද්‍රව තොග නැව්බඩු ප්‍රමාණය අඩු වූ අතර ටොන් 5,230,059 සහ 2022 වසරේදී ටොන් 4,333,670 මෙහෙයුම් කරන ලදී. මෙය 17.1% ක අඩු වීමකි. 2021 වසරේදී මෙහෙයවන ලද ටොන් 857,883 හා සැසඳීමේදී තොග කඩන නැව්බඩු මෙහෙයුම් ටොන් ප්‍රමාණය 2022 වසරේදී ටොන් 263,302 මෙහෙයුම් කරන ලද අතර මෙය 69.3% ක අඩු වීමකි. 2021 වසරේදී කොළඹ වරාය තුළ මෙහෙයුම් කරන ලද සමස්ත නැව්බඩු ටොන් ප්‍රමාණය වූ 103,823,774 හා සැසඳීමේදී 2022 වසරේදී ටොන් 96,169,811 ක් මෙහෙයුම් කළ අතර මෙය 7.4% ක අඩු වීමකි. මෙහෙයුම් ධාරිතාවය අඩු වීමට හේතු වශයෙන් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ගෝලීය ආර්ථිකය සංකෝචනය වීම සහ ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය සැලකිය හැක.

වසර තුළ මුහුණ දුන් විවිධ අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට සහ අවශ්‍ය ඵලදායීතා මට්ටම් පවත්වා ගෙන යෑම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2022 වර්ෂයේදී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.
මෙම ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- ඉන්ධන අර්බුදය පැවති කාලසීමාව තුළ සේවකයින් හට සේවයට පැමිණීමට තිබූ අපහසුතාවය මඟහැරවීම සඳහා ප්‍රවාහන පහසුකම් සපයා දීම.

- ඉන්ධන අර්බුදය හේතුවෙන් පර්යන්ත මෙහෙයුම් මත එල්ල වූ ඍණාත්මක බලපෑම අවම කිරීම සඳහා පැය 48 ක වැඩ මුර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් හට අඛණ්ඩව සේවයට වාර්තා කිරීම සඳහා ඉන්ධන ලබා දීම.

- උපකරණ භාවිතය ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් පිරිවැය අවම කිරීම සඳහා ජය බහළු පර්යන්තයේ N 4 ප්‍රශස්තකරණ මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

- අංගණයේ බහළු පැටවීමේ සහ ගොඩබෑමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා Expert Decking පද්ධතියේ අදියර 04 ක්‍රියාත්මක කිරීම.

- මෙහෙයුම් ඵලදායීතාවය මුදුන්පත් කර ගැනීමේදී සැලකිය යුතු බාධාවක්ව පැවති අංගණයේ මතුපිට ප්‍රදේශය අළුත්වැඩියා කිරීම.

## සේවා සැපයුම් කොට්ඨාශය

වරායට ගොඩබාන ලද පූර්ණ බහළුම්, අර්ධ පූර්ණ බහළුම්, තොග කඩන නැව්බඩු හා ඇසුරු නැව්බඩු, මෝටර් රථ හා ව්‍යාපෘති නැව්බඩු ආදිය ඇතුළත් සියළුම නැව්බඩු ක්‍රමවත්ව හා කාර්යක්ෂමව භාරදීම මගින් හා නැව්භාණ්ඩ ආශ්‍රිත වෙනත් සේවාවන් සේවාලාභීන් වෙත සැපයීම මගින් සේවා සැපයුම් කොට්ඨාශය 2022 වර්ෂය තුළදී සුවිශාල කාර්යභාරයක් ඉටුකර ඇත.

දවසේ පැය 24 තුළම සේවා සැපයීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පූර්ළු බහළුම් (FCL) විස්සේ සම ඒකක 101,232 ක් ඍජුව භාර දීම මගින් රුපියල් මිලියන 3,826.15 ක මුළු ආදායමක් ඉපැයීමට හැකි විය.

නැව් භාණ්ඩ භාර දීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව හා පාරිභෝගික හිතකාමී ක්‍රියාවලියක් බවට පත් කිරීමට කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී. ලේඛන අතින් භාරදීමේදී හා ගෙවීම් කිරීමේදී සිදු වන ගැටළුකාරී තත්ත්වයන් අවම කිරීම පිණිස පූර්ණ බහළු/ අර්ධ පූර්ණ බහළු, බහළු භාර දීම සඳහා ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතියක් හඳුන්වාදීමට ද කොට්ඨාශය කටයුතු කරන ලදී.

අර්ධ පූර්ණ බහළුම් (LCL) හා විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් (MCC) විස්සේ සම ඒකක මිලියන 19,156 ක් බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයෙහි මෙහෙයුම් කරන ලද අතර එමඟින් රු. මිලියන 389.04 ක් උපයන ලදී. අර්ධ පූර්ණ බහළුම් හා තොග නැව්බඩු භාරදීමේ ගාස්තු වශයෙන් රු. මිලියන 1,560.90 ක් උපයන ලදී. විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් මෙහෙයුම් මගින් රුපියල් මිලියන 307.05 ක් උපයන ලද අතර විශේෂ හා සාමාන්‍ය මෙහෙයුම් මගින් රුපියල් මිලියන 77.13 ක් උපයන ලදී. මීට අමතරව, හිස් බහළු සඳහා ප්‍රමාද ගාස්තු සහ ප්‍රතිඅපනයන බහළුම් සහ බහළුම් වල තත්ත්වය වෙනස් කිරීම මත අය කරන ගාස්තු මගින් රුපියල් මිලියන 381.10 ක ආදායමක් උපයන ලදී.

බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන (CFS) V ගුදම අළුත්වැඩියා කිරීම මගින් බැඳුම්කර නැව්බඩු ගුදම් පහසුකම් පුළුල් වීමත් සමඟ බැඳුම්කර වෙළෙඳාමේ ඉහළ යෑමක් සිදු වූ අතර එමඟින් රුපියල් මිලියන 119.51 ක ආදායමක් උපයා ඇත.

සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සේවා හා උපදේශක සමාගම හරහා අබලි යකඩ, ඉවතලන තෙල් සහ පාවිච්චි කරන ලද ටයර් ආදිය විකුණා දැමීම මගින් රුපියල් මිලියන 17.84 ක අතිරේක ආදායමක් උපයන ලද අතර අත්හල නැව්බඩු හා අබලි නැව්බඩු බැහැර කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මගින් රුපියල් මිලියන 315.21 ක මුළු ආදායමක් උපයන ලදී.

2022 වර්ෂය තුළ, නිෂ්කාශන නියෝජිතායතන සඳහා නව බලපත්‍ර නිකුත් කිරීම මගින් හා අළුත් කිරීම මගින් රුපියල් මිලියන 48.44 ක ආදායමක් උපයන ලදී. මුළු බලපත්‍ර සංඛ්‍යාව 1,267 දක්වා ගෙන එමින් නව බලපත්‍ර 79 ක් නිකුත් කරන ලද අතර බලපත්‍ර 1,188 ක් අළුත් කරන ලදී. මීට අමතරව, වාප්පු ලිපිකරුවන් සඳහා "A", "B" වර්ගයේ හා පොහොර නිෂ්කාශනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම මගින් රුපියල් මිලියන 7.82 ක සමස්ත ආදායමක් උපයන ලදී. වර්ෂය තුළ නිකුත් කරන ලද සහ අළුත් කරන ලද මුළු "A" බලපත්‍ර ප්‍රමාණය 2,664 ක් ලෙස වාර්තා වූ අතර "B" බලපත්‍ර ප්‍රමාණය 257 ක් හා පොහොර නිෂ්කාශන බලපත්‍ර ප්‍රමාණය 12 ක් විය.

සේවා සැපයුම් කොට්ඨාශය මගින් 2022 වර්ෂය තුළ සපයන ලද සේවා මගින් උපයන ලද සමස්ත ආදායම රුපියල් මිලියන 7,050.33 ක් විය.

2022 වර්ෂයේදී, සේවා සැපයුම් කොට්ඨාශයට වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය හරහා ප්‍රේෂණලාභීන්ගෙන් ගාස්තු අය කර ගැනීම් අත්හැරීමේ ඉල්ලුම් පත් 146 ක් ලැබී තිබුණි. මේවායින් ඉල්ලුම්පත් 67 ක් නිර්දේශ කරන ලද අතර 4 ක් ප්‍රතික්ෂේප කෙරිණ. ඉතිරි ඉල්ලුම් පත් ගාස්තු අත් හැරීමේ කමිටුවෙන් සහ අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබෙන තෙක් රඳවා ගෙන ඇත.

**2022 වර්ෂය තුළ සිදු කරන ලද වැඩි දියුණු කිරීම් හා උත්ශ්‍රේණි කිරීම්**

- ලේඛන විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා රේගුවෙන් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මුදා හැරීම සහ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ගෙවීම් කිරීමේ පහසුකම් සැලසීම හරහා කඩදාසි භාවිතයෙන් තොරව ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් පූර්ණ බහළුම් භාරදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යමණ්ඩලය යෙදවීම අවම කර ගනුදෙනුකරුවන්හට පහසුකම් සැලසීම උදෙසා විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළු එක්රැස් කිරීම, ප්‍රතිසැකසුම් සහ හිස් බහළුම් ඉවත් කිරීමේ මෙහෙයුම් සඳහා විද්‍යුත් ලේඛන භාර ගැනීම.

- නැව්බඩු ගබඩා කරන නෙස්ටෙනර් ගුදම් භාවිතා කිරීම ඉහළ දැමීම තුළින් ගුදම් තුළ ගබඩා කළ හැකි ධාරිතාවය වැඩි කිරීම.

- බැඳුම්කර ගුදම් වල උෂ්ණත්ව පාලන ප්‍රදේශය පුළුල් කිරීම, රාක්ක වැඩි සංඛ්‍යාවක් සවි කිරීම මගින් ඉඩ ප්‍රමාණය පුළුල් කිරීම සහ වට්ටෝරු භාණ්ඩ ලේඛනය නිවැරදිව පවත්වාගෙන යාම.

- බැඳුම්කර නැව්බඩු මෙහෙයුම් වැඩිදියුණු කර බැඳුම්කර ගුදම් කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීම.

- මෙහෙයුම් අංගණ ප්‍රදේශය ඇතුළු සියළුම ගුදම් වල CCTV කැමරා පද්ධති සවි කිරීම හා එමඟින් නැව්බඩු අස්ථානගතවීම හා හානි සිදු වීම අවම කිරීමට සැලැස්වීම තුළින් සේවා ලාභීන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

- ගුදම් මෙහෙයුම් වල ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා බණ්ඩාරනායක ජැටි ගුදමේ බහළු හිස් කිරීම/ බහළු ගත කිරීම් ට්‍රෙලර්ගත මෙහෙයුම් (Trailer Based) මගින් සිදු කිරීම සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම හා බණ්ඩාරනායක ජැටි ගුදම් සංකීර්ණයේ කාර්යාල විවේකාගාර අළුත්වැඩියා කිරීම සහ වෙනත් පොදු පහසුකම් ඇතුළත් ව්‍යාපෘති සැලසුම් කිරීම මගින් සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

- අර්ධ පූර්ණ බහළුම් නැව්ගත කිරීම් ප්‍රධාන පෙළේ නැව් සමාගම් මගින් අපනයන කිරීම පැය 24 ක් තුළ සිදු කිරීමේ සීඝ්‍ර සේවයක් බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන 1 හි ආරම්භ කර ඇත. මෙහෙයුම් කරන නැව් භාණ්ඩ පරිමාව සීඝ්‍රයෙන් ඉහළ නැංවීමේ අරමුණ ඇතිව වරාය පරිශ්‍රය තුළ අපනයන කටයුතු සිදු කිරීම මගින් නැව් නියෝජිතයින් වැඩි සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීම පිණිස මෙම නව සේවය දියත් කර ඇත.

## නාවික කොට්ඨාශය

**නියමු සේවා**

සමාලෝචනයට යටත් 2022 වර්ෂය තුළදී කොළඹ වරායට පැමිණි සියළුම වර්ගයේ නෞකා සඳහා සතියේ සෑම දිනකම පැය 24 පුරා නියමු සේවා සපයන ලදී.

**ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය**

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය නෞකා සඳහා කාර්යක්ෂම සහ අඛණ්ඩ ටග් යාත්‍රා සේවාවන් ලබා දෙමින් සතුටුදායක කාර්යභාරයක් ඉටු කර ඇත.

නෞකා එහා මෙහා ගෙනයෑම සඳහා ප්‍රමාණවත් ටග් යාත්‍රා සංඛ්‍යාවක් දෛනිකව යොදවන ලද අතර හදිසි අවශ්‍යතාවයන් සඳහා එක් ටග් යාත්‍රාවක් පොරොත්තු සේවයේ යොදවන ලදී.

කොළඹ වරාය තුළ නැංගුරම් ලෑමේ ටග් යාත්‍රා සමස්ත ගමන් වාර 17,511 ක් සිදු කරන ලද අතර, මෙයට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ටග් යාත්‍රා වල ගමන් වාර 9,490 ක් සහ කුලී ටග් යාත්‍රා ගමන් වාර 8,021 ක් අයත් වේ. ටග් සේවා සැපයීම තුළින් උපයන ලද ආදායම රුපියල් මිලියන 1,584 කි.

**ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය**

2022 වර්ෂය තුළ සියළුම ටග් යාත්‍රා, නියමු යාත්‍රා සහ මුවරිං දියත් යාත්‍රාවල මෙහෙයුම් හා අළුත්වැඩියා වලට අනුකූල වනසේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සේවයෙහි යොදවන ලදී.

යාත්‍රා ඇදගෙන යාම, නියමු සේවා සහ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය කරන යාත්‍රාවල දෛනික ගමන් වාර වලට අමතරව මෙම අංශයේ කාර්ය මණ්ඩලය විසින් එදිනෙදා ඉටු කලයුතු නඩත්තු කටයුතු සිදුකරන ලදී.

කළමනාකාරීත්වයේ නිර්දේශය මත, වැඩහල අවශ්‍ය උපකරණ සපයන අතරම ටග් යාත්‍රාවල එදිනෙදා නඩත්තු කටයුතු සිදු කිරීමට ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය කැපවී සිටී.

**වරාය ගිනි නිවන හමුදාව** (PFB)

ස්වකීය ගිනි නිවාරණ ප්‍රමිතීන් ක්‍රියාවට නංවමින් හා පවත්වාගෙන යමින් ගිනි හටගැනීමේ සිද්ධීන් හා වෙනත් හදිසි ආපදාවන්ගෙන් සිදුවන හානි පාලනය කරමින් 2022 වර්ෂය තුළදී ගිනි නිවන හමුදාව විසින් හදිසි සේවා කාර්යක්ෂමව ඉටු කරන ලදී.

2022 මුදල් වර්ෂය තුළ වරාය ගිනි නිවන හමුදාව විසින් ගිනි හටගැනීමේ සිද්ධි 2,336 ක් සඳහා ප්‍රතිචාර දක්වන ලද අතර ඉන් රුපියල් මිලියන 97 ක ආදයමක් උත්පාදනය කරන ලදී.

**වරාය නිරාපද අංශය**

අන්තරායකාරී නැව්බඩු සුපරීක්ෂාකාරීව මෙහෙයුම් කිරීම කොළඹ වරායේ වගකීමකි. අධිතාප වැඩ සඳහා අවසර ලබාදීමට ප්‍රථම වැඩබිම් පරීක්ෂා කිරීම් සිදු කරන ලද අතර අනවසර අධිතාප වැඩ පිළිබඳ සිද්ධීන් අනාවරණය කර ඒවා නැවැත්වීමට කටයුතු කරන ලදී. තවද, සමුද්‍ර දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරන ලද අතර විවිධ පුද්ගලයින් හා සමුද්‍රීය යාත්‍රා විසින් සිදු කරනු ලබන සමුද්‍රීය දූෂණ පිළිබඳව නිත්‍ය පරීක්ෂණ ද වරාය මගින් සිදු කරනු ලැබේ.

පසුගිය වසර තුළ සියළුම වරායයන් වෙත නෞකා 5,933 ක් පැමිණ ඇති අතර ඒවායින් දේශීය අන්තරාදායක නැව්බඩු මෙ.ටො. 217,655.786 ක් හා ප්‍රතිනැව්ගත නැව්බඩු මෙ.ටො. 766,198.572 ක් ගොඩබාන ලදී. මීට අමතරව, ප්‍රතිනැව්ගත අන්තරාදායක නැව්භාණ්ඩ බහළු 48,263 ක් මෙහෙයවන ලදී. තෙල් ප්‍රවාහන නෞකා 250 ක් කොළඹ සහ ත්‍රිකුණාමල වරාය වෙත පැමිණි අතර ද්‍රව පෙට්‍රෝලියම් වායු මෙ. ටො. 315,075.164, ගෑස් තෙල්/Jet Ai/ගැසොලීන්, නැව් තෙල් මෙ.ටොන් 2,230,259.038 ක්, බොර තෙල් මෙ.ටොන් 644,948.836 ක් ඉන්ධන තෙල් මෙ.ටොන් 559,051.014 ක් සහ පිරිපහදු නොකල තෙල් (base oil) මෙ. ටොන් 9,428.645 ක් ගොඩබාන ලදී.

අධි පුපුරණ ද්‍රව්‍ය (GPIE) මෙ.ටො. 81,322 ක් සහ පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය (GP IAE/IIE) මෙ.ටො. 15,273.90 ක් මෙහෙයුම් කරන ලදී. වරාය ගිනි නිවන හමුදාවේ සහය ඇතිව රසායනික ද්‍රව්‍ය කාන්දුවීමේ සිද්ධීන් වැලැක්වීම, රීවර්ක් මෙහෙයුම් (re-work operations) ගිනි නිවීමේ කටයුතු ගණනාවක් සිදු කරන ලදී.

සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහය ඇතිව අන්තරාදායක නැව් බඩු ගුදම් ඇතුළු ගුදම් පරීක්ෂා කිරීම කාලානුරූපීව සිදුකරන ලදී. අධිතාප වැඩ සඳහා අවසර ලබා දීමට අවශ්‍ය පරීක්ෂා කිරීම් සහ සමුද්‍ර දූෂණ සිද්ධීන් ඇතිවීම පරීක්ෂා කර බැලීම හා සමුද්‍ර දූෂණ සිද්ධීන් වැලැක්වීම සඳහා මග පෙන්වීම හා අදාළ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණය කරන ලදී.

මීට අමතර වශයෙන්, කාර්මික සහ සමුද්‍රීය හදිසි අනතුරු පිළිබඳව පරීක්ෂණ ද වරාය විසින් පවත්වනු ලැබේ. පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතා කරන්නේදැයි අවධානය යොමු කරමින් නාවික කොට්ඨාශයට අනුයුක්ත නැව් බඳින කණ්ඩායම් වල ආරක්ෂාව පිළිබඳව අධීක්ෂණය කරයි. මේ පිළිබඳව මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් පුහුණු වැඩසටහන් පිළියෙල කරනු ලැබේ.

සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව ද්‍රව පෙට්ට්‍රෝලියම් වායු සහ පෙට්ට්‍රෝලියම් තෙල් ගොඩබෑමේ කටයුතු නිරතුරුව අධීක්ෂණය කරනු ලැබේ. අනුමත කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරනු ලබන අප ද්‍රව්‍ය හා අපිරිසිදු තෙල් (Sludge Oil) ඉවත් කිරීමේ කටයුතු සමුද්‍රීය පරිසර දූෂණ අධිකාරිය (MEPA ) හා ඒකාබද්ධව නිරතුරුව අධීක්ෂණය කරනු ලැබේ.

ජය බහළු පර්යන්තය, සමඟි බහළු පර්යන්තය හා නැගෙනහිර බහළු පර්යන්තය යන අංගණවල අන්තරාදායක නැව්බඩු අඩුක් කිරීම සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව අඛණ්ඩ

පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අන්තරාදායක නැව්බඩු ප්‍රකාශ නොකරන නැව් නියෝජිතවරුනට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

**වෙරළ ප්‍රදීපාගාර අංශය**

ප්‍රධාන ජාත්‍යන්තර නැව් මාර්ග හරහා විහිදෙන දකුණු හා බටහිර වෙරළ තීරය ඔස්සේ ස්ථාපිත කර ඇති ප්‍රදීපාගාර නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

**ප්‍රවේශ ඇළ මාර්ගවල බෝයා**

වරාය එහි බෝයා පරීක්ෂා කර නඩත්තු කරමින් කිසියම් දෝෂ සහගත තත්ත්වයන් පවතින්නේ නම් ඒ පිළිබඳව චක්‍රලේඛ මගින් ලංකා නැව් නියෝජිතයන්ගේ ආයතනය (CASA), ශ්‍රී ලංකා නැව් නියෝජිතයින්ගේ ආයතනය (SLAVO) හා ශ්‍රී ලංකා නැවහිමින්ගේ සංගමය (LASO) වෙත අනතුරු ඇගවීම් නිකුත් කරනු ලබයි.

වරාය 2022 වසරේදී ප්‍රදීපාගාර ගාස්තු වශයෙන් රුපියල් මිලිනය 1,888 ක් මුදලක් උපයා ඇත.

**වරාය යාත්‍රා අංශය**

කොළඹ වරායේ යාත්‍රා ආරක්ෂිතව බැඳ තැබීම සහ මුදා හැරීම සඳහා නියමු යාත්‍රාවලට මූවරිං කණ්ඩායම් හා කාර්යමණ්ඩල සැපයීමට සහායවීමට වරාය යාත්‍රා අංශය මූලිකව කටයුතු කරයි. ඊට අමතරව, අයිලන්ඩ් දියකඩනයට සහ දකුණු දියකඩනයට විවිධ වැඩ කණ්ඩායම් ප්‍රවාහනය කිරීම, වරායේ ජලය පවිත්‍ර කිරීම සහ නියමු යාත්‍රාවල දෛනික නඩත්තු කටයුතු ඉටු කිරීම සහ මූවරිං යාත්‍රාවල නඩත්තු කටයුතු සතුටුදායක ලෙස ඉටු කිරීම ද මෙම අංශයෙන් සිදු කරනු ලැබේ.

**ජල ශාස්ත්‍රීය සමීක්ෂණ අංශය**

මෙම අංශයේ මිනින්දෝරුවන් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වරායයන් වල ඉල්ලීම මත ඉඩම් මැනීමේ කටයුතු හා ජල ශාස්ත්‍රීය සමීක්ෂණ සේවා ලබා දෙනු ලබන අතර කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ, ඔලුවිල් යන වරායයන් පිළිබඳ විවිධ සමීක්ෂණ මත පදනම්ව කටයුතු මෙම අංශය මගින් සිදු කරන ලදී. වරාය ද්‍රෝණිය සහ බෝයා පිහිටි ස්ථාන පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම, සිතියම් සංශෝධනය, ව්‍යාපෘති පිළිබඳ උපදේශක කටයුතු, ඒකාබද්ධ සමීක්ෂණ කටයුතු කල්බදු ගිවිසුම් පිළිබඳ සමීක්ෂණ, සැලසුම් කටයුතු, උදම් රළ සහ කාලගුණික දත්ත මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම, ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පිළිබඳව සමීක්ෂණ, යෝජිත මාර්ග සහ දුම්රිය මාර්ග අත්පත් කර ගැනීම පිළිබඳ රැස්වීම්, මගී ප්‍රවාහන පර්යන්ත පිළිබඳව දළ සටහන් සකස් කිරීම, නැවත පදිංචි කිරීමේ සමීක්ෂණ පිළිබඳ ලේඛන කටයුතු සහ ඉඩම් සඳහා කල්බදු සැලසුම් මෙම කටයුතු වලට අයත් වේ.

**නාවික අංශය**

2022 වර්ෂයේ නැව් සඳහා භාණ්ඩ සැපයුම්කරුවන්, දියත් යාත්‍රා මෙහෙයුම්කරුවන්, සමුද්‍රීය සමීක්ෂකයින්, සුළු හා මහා පරිමාණ අළුත්වැඩියා වැඩහල්, තෙල් හා තෙල් මිශ්‍ර ජලය අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසුකම් සලසන පුද්ගලයන් ඇතුළුව විවිධ සමුද්‍රීය ආයතන වාර්ෂිකව ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශයේ වගකීම වේ. වසර තුළ රුපියල් මිලියන 44.5 ක ආදායමක් උපයමින් බලපත්‍ර 416 ක් නිකුත් කරන ලදී.

## යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශය

සියළුම වරායයන්හි සියළුම ව්‍යුහ හා මෙහෙයුම් / මෙහෙයුම් නොවන යන්ත්‍ර හා උපකරණ වල ව්‍යුහ මනා ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වාගෙන යාම යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධානතම කාර්යය වේ.

නැංගුරම් ටග් යාත්‍රා, නියමු යාත්‍රා, භාරන යාත්‍රා සහ බහළු මෙහෙයුම් දොඹකර සහ අර්ධ ට්‍රෙලර් යන්ත්‍ර වල වානේ අළුත්වැඩියා කිරීම සඳහා සේවා සැපයීම මෙයට අයත් වේ. අළුත් වානේ ගොඩනැගිලි, ගුදම් සහ අනෙකුත් ව්‍යුහයන් ඉදිකිරීම මෙන්ම පරණ ගොඩනැගිලි කඩා ඉවත් කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීමකි.

නැව් බඩු මෙහෙයුම් උපකරණ සහ නාවික යාත්‍රා වලට අවශ්‍ය කරනු ලබන අමතර කොටස් යාන්ත්‍රිකව සකස් කිරීම, පිරිසැකසුම් කිරීම, නැව් බඩු මෙහෙයුම් උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් වල ඒවාහි ආවරණ සැකසීම සහ සියළුම වරායවල වෙනත් සියළුම වැඩ සහ වරාය ආශ්‍රිත වෙනත් ක්‍රියාකාරකම් ද මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. මෙහෙයුම් අවශ්‍යතා සඳහා භාවිතා කරන දම්වැල්, කම්බි රැහැන් සහ විලංගු පරීක්ෂාවට භාජනය කිරීම සහ ග්‍රැබ් උපකරණ නඩත්තු කිරීමේ වගකීම දරනුයේ ද මෙම කොට්ඨාශය මගිනි.

මෙම කොට්ඨාශය විසින් සම්පූර්ණ කරන ලද ප්‍රධාන ඉදිකිරීම් නඩත්තු ව්‍යාපෘති පහත සඳහන් වේ.

- ජය බහළු පර්යන්තයේ නව ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ලෙහි ව්‍යුහ පිරිසැකසුම් කිරීම හා ඉදිකිරීම් කටයුතු.
- ජය බහළු පර්යන්තයේ / සමඟි බහළු පර්යන්තයේ බහළු දොඹකර වල ප්‍රධාන ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු.
- සමඟි බහළු පර්යන්තයේ ඉන්ධන නල මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- කාමර වෙන් කිරීම සහ අළුත්වැඩියා කළ නොහැකි පරණ දොරවල් වෙනුවට අළුත් දොරවල් සවි කිරීම ඇතුළුව බණ්ඩාරනායක ජැටියේ ගුදම නවීකරණය කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මධ්‍යම මුළුතැන්ගෙයිහි දුමාරය පිටතට යවන නල මාර්ග පිරිසැකසුම් කර ස්ථාපනය කිරීම.
- බණ්ඩාරනායක ජැටියෙහි සුභසාධක ගොඩනැගිල්ලේ තරප්පු පෙළ ඉදි කිරීම.
- ජය බහළු පර්යන්තයේ සිට සමඟි බහළු පර්යන්තය වෙත ගමන් කරන TT16 සහ TT17 යන හුවමාරු දොඹකර වල ව්‍යුහ නවීකරණය කිරීම.
- පැලියගොඩ බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන ගුදම් පරිශ්‍රයේ අළුත්වැඩියා කටයුතු කිරීම.
- 'කතරගම' හා 'නුවරඑළිය' නිවාඩු නිකේතන වල අළුත්වැඩියා කටයුතු කිරීම.
- කම්මල් වැඩහලෙහි වායුවෙන් ක්‍රියාකරන මිටි ගලවා ඉවත් කර ප්‍රතිස්ථානගත කිරීම.
- සමර්හිල් ප්‍රදේශයේ ඇති ආහාර පිසින තෙල් නල මාර්ග ප්‍රතිස්ථානගත කිරීම.
- බේරේ ප්‍රදේශයේ ආරක්ෂක පුහුණු ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම.

- පා පැදි තවතා තැබීමේ මඩු පිරිසැකසුම් කිරීම.

- ජය බහළු පර්යන්තයේ I හා II ප්‍රදේශයෙහි ලයිට් කණුවක උස වැඩි කිරීම.

ඉහත සඳහන් කාර්යයනට අතිරේකව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනෙකුත් සියළුම කොට්ඨාශ මගින් ඉල්ලුම් කරනු ලබන අනෙකුත් සියළුම අළුත්වැඩියා, පිරිසැකසුම් හා නඩත්තු කටයුතු මෙම කොට්ඨාශය විසින් වර්ෂය තුළ ඉටුකර ඇත.

## යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය

සියළුම මෙහෙයුම් යන්ත්‍රෝපකරණ, වාහන සහ උපකරණ මනා තත්ත්වයෙන් පවත්වා ගෙන යෑම සහතික කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ වගකීම වේ. ගැන්ට්‍රි දොඹකර නඩත්තු ඒකකයක්, නැව්බඩු මෙහෙයුම් උපකරණ නඩත්තු ඒකක දෙකක් (02), මෝටර් ගරාජයක් සහ ඩීසල් ඇන්ජින් අළුත්වැඩියා ඒකකයක් සහ ප්‍රවාහන අංශයක් ඇතුළුව අංශ 09 කින් මෙම කොට්ඨාශය සමන්විත වේ. ජංගම දොඹකර, පස් කැපීමේ යන්ත්‍ර සහ ඉදිකිරීමේ උපකරණ නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම ද මෙම කොට්ඨාශය මගින් සිදු කෙරේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වාහන කල්බදු ගැනීම/ බදු දීම සහ පරිභෝජ්‍ය තෙල් ගබඩා ටැංකි සංකීර්ණ දෙකෙහි කල්බදු සහ නඩත්තු කටයුතු කළමනාකරණය කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීම් වේ.

**2022 වසර තුළ සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති**

- නැව්බඩු මෙහෙයුම් සඳහා ටොන් 45 හේ Reach Stackers උපකරණ තුනක් (03) ප්‍රසම්පාදනය කර ඇති අතර වරාය ගිනි නිවීමේ ඒකකය සඳහා අළුත් ගිනි නිවීමේ ට්‍රක් රථයක් ලබා ගෙන ඇත.

- නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය වන නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 12 ක් සහ පීලි මත සවි කර ඇත ස්වයංක්‍රිය දොඹකර 40 ක් ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මකව පවතින අතර ඒවාහි නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ වී ඇත.

## සිවිල් ඉංජිනේරු කොට්ඨාශය

වරාය ආශ්‍රිත විවිධ ව්‍යුහයන්, පහසුකම් සපයනු ලබන ගොඩනැගිලි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස, වරාය ද්‍රෝණිය තුළ වරාය ගැඹුර, ප්‍රවේශ ඇළ මාර්ග, අභ්‍යන්තර මාර්ග, බහළු අංගණ, ජැටි බැම්, ජල සැපයුම නඩත්තු කිරීම සහ පාර්ශ්වකරුවන් වෙත වෙනත් විවිධ සේවා සැපයීම සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ වගකීම වේ. මෙයට අමතරව, රට තුළ පවත්වාගෙන යනු ලබන ප්‍රදීපාගාර නඩත්තු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවතින සියළුම වරායයන්ගේ සමුද්‍රීය ව්‍යුහ සඳහා නඩත්තු සේවා ලබා දීම ද මෙම කොට්ඨාශය මගින් සිදු කෙරේ.

ටෙන්ඩර් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, ද්‍රව්‍ය මිලදී ගැනීම, ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම, තත්ත්ව පාලනය සහතික කිරීම සහ අභ්‍යන්තර සේවක දැනුම යොදා ගනිමින් ඉදිකිරීම් ව්‍යාපෘති සහ සුළු නව ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම ඇතුළුව ව්‍යාපෘති කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිවිල් ඉංජිනේරු කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රධාන සිවිල් ඉංජිනේරු නඩත්තු කටයුතු හදුනාගත් අවශ්‍යතා අනුව පූර්වයෙන් සැලසුම් කරනු ලබන අතර සුළු සිවිල් නඩත්තු කටයුතු අභ්‍යන්තර සේවකයන් විසින් සිදු කරනු ලැබේ. මීට අමතරව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් මෙම කොට්ඨාශය විසින් සාර්ථකව ස්ථාපිත කර ඇත.

සිවිල් ඉංජිනේරු කොට්ඨාශය විසින් 2022 වර්ෂය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති අවසන් කර ඇති අතර නවීකරණ ව්‍යාපෘති සිදු කෙරෙමින් පවතී. ජය බහළු පර්යන්ත අංගණය ප්‍රතිසංස්කරණය කිරීම, CFS – I ගුදම සඳහා නව පොම්පාගාරයක් සමඟ නව ගිනි නිවීමේ පද්ධතියක් සවි කිරීම කොළඹ වරායේ සීමා තාප්පය අළුත්වැඩියා කිරීම, බණ්ඩාරනායක පාලම් ගුදම් පහසුකම ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම, යෝජිත ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම, සමඟි බහළු පර්යන්තයේ තෙල් නළය එළීම සහ ජල කුළුණු අළුත්වැඩියා කිරීම සහ පින්තාරු කිරීම ද මේවාට ඇතුළත් වේ.

## විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනය යටතේ පවතින සියළුම වරායයන්හි විදුලි, විද්‍යුත් බල ශක්ති සහ සන්නිවේදන යන ක්ෂේත්‍ර වල සියළුම ඉංජිනේරු ව්‍යාපෘති සහ පහසුකම් සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශයේ වගකීම වේ.

වරාය මෙහෙයුම් කටයුතු වලට අදාළ සේවා පවත්වාගෙන යෑම සඳහා 95% කට වඩා වැඩි ප්‍රමාණයක් පවත්වාගෙන යාම සඳහා විදුලි හා සන්නිවේදනයට අදාළ සියළුම සේවා පවත්වා ගෙන යෑම සඳහා ප්‍රධාන ඉංජිනේරුවරයා, නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරුවරුන් දෙදෙනෙකු සහ විදුලි අධිකාරී ඉංජිනේරුවරු තිදෙනෙකු යටතේ ඉහළ සුදුසුකම් ලත් වෘත්තීය මට්ටමේ විදුලි ඉංජිනේරුවරුන් කණ්ඩායමක් විසින් පැය 24 පුරා ක්‍රියා කරනු ලැබේ.

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශයේ විෂය පථය යටතේ පහත සඳහන් කාර්යයන් 2022 වසර තුළ අවසන් කරන ලදී.

- අධි වෝල්ටීයතාවයෙන් සහ අඩු වෝල්ටීයතාවයෙන් යුත් විදුලිබලය බෙදාහැරීම පිළිබඳ ඉංජිනේරු සැලැස්ම, නැගෙනහිර බහළු පර්යන්තයේ දත්ත ජාලය සහ CCTV පද්ධතිය සකස් කිරීම.

- ජය බහළු පර්යන්තයේ අදියර 01 හි කිලෝ වොට් 11 ක විදුලි පුවරු සහ ජය බහළු පර්යන්ත අදියර 02 හි කිලෝ වොට් 3.3 ක ස්විච පුවරු ගලවා ඉවත් කර අළුතින් සවි කිරීම.

- ජය බහළු පර්යන්ත අදියර 5 නව විදුලි උප පොළෙහි කිලෝ වොට් 11 ක විදුලි බල බෙදා හැරීමේ පුවරු සවි කිරීම සහ පරීක්ෂා කිරීම.

- මිට්සුයි (Mitsui) වර්ගයේ අංගණ දොඹකරවල පැරණි DOS පාදක PLC පාලන පද්ධතිය අභ්‍යන්තර විශේෂඥ දැනුම භාවිතයෙන් වින්ඩෝස් පදනම් කරගත් පාලන පද්ධති බවට පත් කිරීම.

- වොට් 1000 ක ඉහළ විදුලි ධාරිතාවයක් වැය වන අදියර I සහ අදියර II අංගණ විදුලි පහන් වෙනුවට අඩු විදුලි ධාරිතාවයක් වැය වන LED විදුලි පහන් සවි කිරීම.

- නැගෙනහිර බහළු පර්යන්තයේ සහ ජය බහළු පර්යන්තයේ රැහැන් රහිත සහ රැහැන් සහිත දත්ත සන්නිවේදනය ජාලය වැඩි දියුණු කිරීම.

- පෑලියගොඩ ගුදම සංකීර්ණයෙහි CCTV කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

- අධිවේගී ගුවන් මාර්ගයේ කණු ඉදිකිරීම පහසු කරවීම සඳහා විදුලි, දත්ත හා විදුලි සංදේශ රැහැන් නැවත එළීම.

- ත්‍රිකුණාමල වරායේ සහ ගාල්ල වරායේ අධි වෝල්ටීයතාවයකින් යුත් විදුලි බල ජාලය උත්ශ්‍රේණි කිරීම.

- අඩු වෝල්ටීයතාවයකින් යුත් විදුලි බලය බෙදාහැරීම, දුරකථන ජාලය, රැහැන් සහිත සහ රැහැන් රහිත දත්ත සන්නිවේදන ජාලය උත්ශ්‍රේණි කිරීම, ටග් යාත්‍රා, දියත් යාත්‍රා, නාවික උපකරණ සහ සමුද්‍රීය සන්නිවේදනය සඳහා භාවිතා කරනු ලබන විදුලි බල පද්ධතිය උත්ශ්‍රේණි කිරීම.

- රේඩාර් සහ ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය සවි කිරීම, නඩත්තු කිරීම සහ දිවයින වටා ඇති සියළුම ප්‍රදීපාගාර නඩත්තු කිරීම.

- බලශක්තිය ඉතිරි කිරීමේ ක්‍රමවේද සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ක්‍රියාත්මක කිරීම.

## නාවික ඉංජිනේරු කොට්ඨාශය

නාවික ඉංජිනේරු කොට්ඨාශය කොළඹ වරායට පැමිණෙන සියළු නෞකා නිරුපද්‍රිතව හැසිරවීම සඳහා නාවික කොට්ඨාශය හා සම්බන්ධ වී කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැදගත් කොට්ඨාශයකි. මෙම කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම පාවෙන යාත්‍රා නඩත්තු කිරීම සහ දෛනික, නිරාපද සහ ප්‍රතිකාර්මික වැඩසටහන් අනුසාරයෙන් එම යාත්‍රා නිසි මෙහෙයුම් තත්ත්වයේ පවත්වා ගෙන යෑමයි. නාවික, මෙහෙයුම්, සිවිල් ඉංජිනේරු සහ ආරක්ෂක කොට්ඨාශ වල අවශ්‍යතාවයන්ට අනුව ප්‍රශස්ත මට්ටමේ වරායක් පවත්වාගෙන යනු පිණිස පාවෙන යාත්‍රා සපයා දීම 100% කින් සපුරාලමින් කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් ව්‍යක්තීයමය හැකියාවන්, නිපුණතාවයෙන් හා ප්‍රතිඵලදායී ගුණාංග වලින් මෙම කොට්ඨාශයට අනුයුක්ත සේවකයින් 350 දෙනා සමත්වී සිටී.

කොළඹ වරාය නාවික යාත්‍රා නිරුපද්‍රිතව මෙහෙයුම් කරන ජාත්‍යන්තර වරායක් ලෙස සහතික කරමින්, පාවෙන යාත්‍රා ලොයිඩ් ලේඛනයේ (Lioyd's Registry) නීති රීති වලට අනුකූලව වර්ගීකරණය කර පවත්වාගෙන යාමට මෙම කොට්ඨාශය වගකීමෙන් යුතුව බැඳී සිටී.

මෙහෙයුම් කොට්ඨාශයේ තොග කඩන නැව්බඩු මෙහෙයුම් සඳහා රුවල් ආදී ආම්පන්න අවශ්‍යතාවය සපුරාලීම මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මධ්‍යම මුළුතැන්ගෙයට අයත් උපකරණ නඩත්තු කිරීම ද මෙම කොට්ඨාශයට අයත් වගකීමකි.

කාර්යක්ෂම කළමනාකරණය සඳහා නාවික ඉංජිනේරු කොට්ඨාශය, නාවික ඉංජිනේරු I සහ නාවික ඉංජිනේරු II වශයෙන් ප්‍රධාන අංශ දෙකකට බෙදා වෙන් කර ඇත. එම අංශ මගින් සිදු කරන ලද ප්‍රධාන කටයුතු පහත පරිදි වේ.

**නාවික I**

**රිග්ට් ඉංජිනේරු අංශය :** ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියළුම නැංගුරම් ටග් යාත්‍රා, හැරීමේ යාත්‍රා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 'මෙඝ' ගිනි නිවන යාත්‍රාව සහ පිටතින් මෝටර් සවි කර ඇති සියළුම යාත්‍රා වල නිරාපද සහ ප්‍රතිකාර්මික නඩත්තු කටයුතු සිදු කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි. දිය යට මඩ හැරීමේ 'හංසකාවා' සහ 'දිය කොවුලා' ග්‍රැබ් හොපර් යාත්‍රාව නිසි ලෙස නඩත්තු කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක, නාවික හා සිවිල් යන ඉංජිනේරු කොට්ඨාශ විසින් භාවිතා කරනු ලබන සියළුම පිටතින් මෝටර් සවි කර ඇති යාත්‍රා වල දෛනික අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ද මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

**වරාය යාත්‍රා ඉංජිනේරු අංශය :** දියත් යාත්‍රා, මූවරිං දියත් යාත්‍රා සහ වෙනත් යාත්‍රා අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම, වරාය යාත්‍රා ඉංජිනේරු අංශයේ ප්‍රධාන වගකීම වේ. 'නියමු 12', 'නියමු 10' සහ 'එකෝ 3' යන නියමු දියත් යාත්‍රා මෙම වසර තුළදී අළුත්වැඩියා කරන ලදී. 2022 වර්ෂයේදී ත්‍රිකුණාමල වරාය සහ ගාල්ල වරාය වල භාවිතා කරනු ලබන යාත්‍රා වල අළුත්වැඩියා කටයුතු

ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම නියමු දියත් යාත්‍රා, මූවරිං දියත් යාත්‍රා සහ වෙනත් යාත්‍රා වල දෛනික නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු සාර්ථකව සිදු කර අවසන් කරන ලදී. සියළුම නියමු දියත් යාත්‍රා සහ මූවරිං දියත් යාත්‍රා සඳහා වර්ගීකරණ සමීක්ෂණ ද වසර තුළ සාර්ථකව සිදු කරන ලදී.

**නාවික I I**

**නැව්බඩු යාත්‍රා අංශය:** නාවික කොට්ඨාශය විසින් මෙහෙයුම් කරන සියළුම යාත්‍රා සහ මෙහෙයුම් කොට්ඨාශයට අනුයුක්ත ඇඳගෙන යාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, චතුර බත්තල් සහ තට්ටු බත්තල් වල වානේ සහ වායුහාත්මක අළුත්වැඩියා කටයුතු, මතුපිට සකස් කිරීම සහ පින්තාරු කිරීම නැව්බඩු යාත්‍රා අංශයේ වගකීම වේ. වසර තුළදී නියමු දියත් යාත්‍රා 10, 12 සහ 14, මූවරිං I යාත්‍රාව, 'නන්දිමිත්‍ර', 'අයිරාවණ' සහ 'ධීර' යන නැංගුරම් ටග් යාත්‍රා වල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු මෙම අංශය විසින් සිදු කරන ලදී. තවද, චතුර බත්තල් 17, 18, ජීලාවා ටග් යාත්‍රාව සහ එකෝ III යන නිරීක්ෂණ යාත්‍රා වල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු ද මෙම අංශය විසින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට මෙන්ම වෙනත් බාහිර ආයතන සඳහා අවශ්‍ය කරනු ලබන රැහැන් පටි (wire slings), තිර, කැන්වස් ආවරණ, වියන් සහ කූඩාරම් රෙදි ආදිය නිශ්පාදනය කර සැපයීමේ හැකියාව ද මෙම කොට්ඨාශයට ඇත. ගෑස් උදුන් සහ බත් බොයිලේරු, ඇළුමිනියම් සාස්පාන් සහ වෙනත් උපකරණ ද නඩත්තු කරන ලද අතර පිටකොටුව බෝට්ටු අංගනයේ බෝට්ටු දියත් මගට ගැනීමේ හා දියත් මගෙන් පිටතට ගෙන ඒමේ මෙහෙයුම් කටයුතු ද ඉටු කරනු ලැබේ.

**නව බේරේ අංශය :** මෙහෙයුම් කොට්ඨාශයේ භාවිතා කරන වානේ බත්තල් අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. චතුර බත්තල් 17, තට්ටු බත්තල් 15 සහ ඩිගර් 4 යන යාත්‍රා වල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු මෙම අංශය මගින් වසර තුළ සිදු කරන ලදී.

**නැව් තැනීමේ අංශය :** ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම පාවෙන යාත්‍රාවල දැව අළුත්වැඩියා කටයුතු සහ ෆයිබර් ග්ලාස් අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීම නැව් තැනීමේ අංශයේ ප්‍රධාන වගකීම වේ. නාවික කොට්ඨාශයේ භාවිතා වන නැංගුරම් ටග් යාත්‍රා සහ දියත් යාත්‍රාවල දැව ගෘහ භාණ්ඩ අළුත්වැඩියා පනේල කටයුතු සහ යාත්‍රාවල දැවමය බඳ අළුත්වැඩියා කිරීමේ කටයුතු නැව් තැනීමේ අංශය විසින් සිදු කරන ලදී. ටොන් 600 ක බරින් යුත් නෞකා ජේටන්ට් දියත් මගට රැගෙන ගොස් අළුත්වැඩියා කටයුතු සහ දියත් මෙහෙයුම් සිදු කිරීමේ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

වරායේ පාවෙන යාත්‍රාවල නඩත්තු කටයුතු නිසිලෙස පවත්වාගෙන යාම සහතික කරමින් සහ මෙහෙයුම් කටයුතු සඳහා නිසි සූදානමින් පවතින බව තහවුරු කරමින් මෙම කොට්ඨාශය ඉටු කරන කාර්යභාරය අඛණ්ඩව පවත්වාගෙන යන අතර 2022 වර්ෂය තුළ කොට්ඨාශයේ කාර්ය මණ්ඩලය ස්වකීය වගකීම් සාර්ථකව හා කැපවීමෙන් යුතුව ඉටුකර ඇත.

## ලේකම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනමය කේන්ද්‍රස්ථානය වන්නේ ලේකම් කොට්ඨාශයයි. සභාපති කාර්යාලය, උප සභාපති කාර්යාලය, කළමනාකාර අධ්‍යක්ෂ කාර්යාලය හා අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ කාර්යාලය ලේකම් කොට්ඨාශයට අයත් වන අතර අධිකාරියේ සමස්ත පරිපාලනමය කටයුතු මෙහෙයවනු ලබයි.

සියළුම කොට්ඨාශ / අංශ සම්බන්ධීකරණය වෙමින් ඉහළ කළමනාකාරීත්වයට හා බාහිර ආයතන වලට (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය, වෙනත් රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන) අවශ්‍ය තොරතුරු නිවැරදිව සැපයීම ප්‍රධාන වගකීම් වේ. පරිපාලනමය කටයුතු වලට අමතරව ප්‍රධාන උත්සව සංවිධානය කිරීම, ඉහළ කළමනාකාරීත්වයේ සහභාගීත්වයෙන් පැවැත්වෙන රැස්වීම්වලට අවශ්‍ය පහසුකම් සැපයීම, සමාජීය වගකීම් ක්‍රියාකාරකම් (CSR) සඳහා

මූලිකත්වය ලබා දී කටයුතු කිරීම වැනි ප්‍රධාන කාර්යයන්ද ලේකම් කොට්ඨාශය විසින් කළ යුතු වේ.

2022 වසර තුළ 2021 වසරට අදාළ වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම, විගණන වාර්තාවට පිළිතුරුද 2022 වර්ෂයට අදාළ පාර්ලිමේන්තු කමිටුවේ වරාය අධිකාරියට අදාළ වාර්තා, පාර්ලිමේන්තුවේදී අමාත්‍යතුමා වෙත යොමු කරන ප්‍රශ්න වලට පිළිතුරු, කාර්තුමය ප්‍රගති වාර්තා අදාළ කොට්ඨාශ සමඟ සම්බන්ධීකරණය වී සකස් කර අවසන් කර අදාළ ආයතන වලට යොමු කර ඇත.

එලෙසම වරාය අධිකාරියේ ඇතැම් විධායක නොවන සේවකයින් සඳහා පමුණුවනු ලබන විනයානුකූල දඩුවම් වලට එරෙහිව එම සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමද තවත් කාර්යයක් වේ. 2022 වසර තුළ මෙවැනි සේවක අභියාචනා 28 ක් ලැබී ඇති අතර වසර අවසන් වන විට එයින් 06 ක් නිම කර ඇත. ඉතිරි 22 පිළිබඳව අභියාචනා මණ්ඩලය විසින් විමර්ශනය කරමින් පවතී. 2022 වර්ෂයේදී විගණන විමසුම් 31 ක් ලැබී තිබුණු අතර සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු යවා ඇත.

පරිපාලනමය කටයුතු නිසි ක්‍රමවේදවලට අනුව පවත්වාගෙන යෑම පිණිස ඉහළ කළමනාකාරීත්වය විසින් වරින් වර ගනු ලබන තීරණ වලට අදාළව ලබා දෙන උපදෙස් අනුව 2022 වසර තුළ ලේකම් කොට්ඨාශය මගින් චක්‍රලේඛ 41 ක් නිකුත් කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර (රන්) සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2022 වසරේදී පහත පරිදි ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය මගින් ගෙවීම් සිදු කර ඇත.

| | **සේවක සංඛ්‍යාව** | **එක් අයෙකු සඳහා ගෙවිය යුතු මුදල** | **හිමිකම් පෑ මුදල (රු.)** |
|---|---|---|---|
| රෝහල් ගත | 1,311 | | 85,067,465.00 |
| බරපතල රෝග | 59 | | 29,346,821.00 |
| උකුල් ඇට බද්ධ කිරීම්/ දණහිස් බද්ධ කිරීම් | 2 | | 314,680.00 |
| මරණ | | | |
| 1. ස්වභාවික මරණ | 24 | 700,000.00 | 16,800,000.00 |
| 2. හදිසි අනතුරු මරණ | 06 | 2,000,000.00 | 12,000,000.00 |
| | **1,402** | | **143,528,966.00** |
| **සේවකයන්ගේ සහ පවුල් ඒකක සඳහා රක්ෂණය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෙවන ලද වාර්ෂික වාරික මුදල (2022.01.01 සිට 2022.12.31දක්වා )** | | | **106,728,000.00** |

සංචාරක බංගලාවලට අදාළ පරිපාලනය, පවත්වාගෙන යාම හා ඒවාහි කාමර වෙන් කිරීම ලේකම් කොට්ඨාශයේ වගකීම වේ. වසර තුළදී අධිකාරියේ නිලධාරීන් හා සේවයකින් සඳහා කාමර 320 ක් වෙන් කර තිබුණි.

## මානව සම්පත් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් කොට්ඨාශය සේවක සුභසාධනයට ප්‍රමුඛතායවය ලබා දෙන අතර ආයතනික අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා දායකත්වය ලබා දෙනු ලැබේ. කුසලතා සපිරි සේවකයන් මානව සම්පත් කොට්ඨාශය මගින් කළමනාකරණය කරන අතර මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා නිසි පුහුණුව ලබා දෙන අතරම වන්දි ගෙවීම, සේවක ප්‍රතිලාභ සහ වැඩබිම් සුරක්ෂිතතාවය සහතික කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාර්ථකත්වය උදෙසා නිසි යෝග්‍යතාවයෙන් යුත් සේවකයන් නිසි තනතුරු සඳහා පත් කර යෙදවීම තීරණාත්මක සාධකය වේ. 2022.12.31 දිනට විධායක, විධායක නොවන, තාක්ෂණික, තාක්ෂණික නොවන ශ්‍රේණි ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත සේවක සංඛ්‍යාව 8,516 ක් වේ. බහුතර සේවක සංඛ්‍යාව කොළඹ වරායට අනුයුක්ත වූ අතර (7,838) ගාල්ල වරායේ 315 ක් සහ ත්‍රිකුණාමල වරායේ 363 ක් වශයෙන් සේවයේ යෙදී සිටී.

### අභ්‍යන්තර උසස්වීම් සහ බාහිර බඳවා ගැනීම් පිළිබඳ විස්තර

2022 වසර තුළ අභ්‍යන්තර උසස්වීම් මගින් පුරප්පාඩු පිරවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රයත්න දැරූ අතර එසේ කිරීමට නොහැකි වූ අවස්ථාව වලදී කොන්ත්‍රාත් පදනම මත බාහිර බඳවා ගැනීම් සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බාහිරින් සේවකයින් 09 දෙනෙකු පමණක් බඳවා ගත් අතර විධායක නොවන ශ්‍රේණි වලින් අභ්‍යන්තර උසස්වීම් 139 ක් සිදු කරන ලදී. (79%) සේවකයන් 30 දෙනෙකු විධායක ශ්‍රේණි වලට උසස් කරන ලද අතර මෙය වසර තුළ සිදු කරන ලද අභ්‍යන්තර උසස්වීම් වලින් 14% කි. ආයතනය වෙත නව සේවකයින් බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය දැඩි අවධාරණයකින් යුතු ක්‍රියාපිළිවෙතක් අනුගමනය කරන ලදී.

### සේවයෙන් විශ්‍රාම ලැබූ සේවකයන් පිළිබඳ විස්තර

2022 වරාය තුළ සේවකයින් 490 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙම සංඛ්‍යාවෙන් 388 දෙනෙකු (79%) වයස අවු 60 සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගන්නා ලදී. වෛද්‍ය හේතූන් මත කිසිදු සේවකයෙකු සේවයෙන් ඉවත් වී නැත.

### හදිසි අනතුරු සහ වන්දි

2022 වර්ෂය තුළ වරාය පරිශ්‍රය තුළ හදිසි අනතුරු 67 ක් සිදු විය. ඉන් 03 ක් මාරාන්තික වූ අතර රු. 2,550,000 ක් කම්කරු වන්දි ලෙස ගෙවන ලදී. තවත්, රු. 2,000,000 ක මුදලක් ලේඛන සකස් කිරීමේ ගැටළු හේතුවෙන් තවමත් ගෙවා නොමැත. හදිසි අනතුරු වලට භාජනය වූ සේවකයින් 53 දෙනෙකු සඳහා හදිසි අනතුරු නිවාඩු ලබා දෙන ලද අතර හදිසි අනතුරු 11 ක් බරපතල නොවූ බවට වාර්තා විය.

### පාරිතෝෂික ගෙවීම්

2022 වසර තුළ වරාය සේවකයන්ගෙන් යැපෙන්නන් හට පාරිතෝෂික ගෙවීම් වශයෙන් රු. 563,999 ක මුළු මුදලක් ගෙවන ලදී. කොළඹ වරායේ සේවකයන් වෙත රු. 454,999 ක මුදලක් ද, ගාල්ල වරායේ සේවකයන් වෙත රු. 61,000/- ක මුදලක් ද, ත්‍රිකුණාමල වරායේ සේවකයන් වෙත රු. 48,000/- ක මුදලක් ද ගෙවන ලදී.

### සේවක දුක්ගැනැවිලි

කොළඹ වරායේ සහ ත්‍රිකුණාමල වරායේ සේවකයන්ගෙන් 2022 වසර තුළ සේවක දුක්ගැනැවිලි 73 ක් කමිටුවට ලැබිණ. මෙම දුක්ගැනැවිලි විසඳීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

**විනයානුකූල ක්‍රියාමාර්ග**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ගේ විනය පවත්වා ගෙන යෑම පිණිස මානව සම්පත් කොට්ඨාශයේ විනය අංශය විසින් විනය පරීක්ෂණ 126 ක් වසර ආරම්භයේදී සිදු කරන ලදී. වසර තුළ විනය පරීක්ෂණ 149 ක් පවත්වා ඇති අතර 145 ක් සාර්ථකව විසඳන ලදී.

## සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය අරමුණු මුදුන්පත් කර ගැනීමේදී මානව සම්පත කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරනු ලබයි. භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයට වඩා මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදය හාත්පසින්ම වෙනස් වේ. ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරමින් ස්වකීය සේවකයන්ගේ තෘප්තිමත් භාවයට හා වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමට ඉවහල් වන්නාවූ පහසුකම් හා ඉඩ ප්‍රස්ථාවන් ලබා දීම අරමුණු කරගෙන සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශයෙහි කාර්යභාරය විවිධ පැතිකඩයන් ඔස්සේ 2022 වසර තුළ විහිදී යන ලදී.

කාර්යාල ගණයේ සේවකයින්ට දිවා රාත්‍රී ආහාර පමණක්ද, මුර පදනමෙහි යොදවන සේවකයින්ට දිවා රාත්‍රී, උදැසන ආහාර සහ කැවිලි සමඟ තේ සැපයීමද මධ්‍යම මුළුතැන්ගෙවල් අංශයෙන් සිදු කරනු ලබයි. 2022 වසර තුළ දිවා රාත්‍රී සහ උදැසන ආහාර වේල් 2,806,722 ක් වෙනුවෙන් රු. 1,214,128,911/- ක් ද තේ, කැවිලි 4,000,000 ක් වෙනුවෙන් රු. 498,660,271/- ක් ද වැය කර ඇත. ඒ අනුව, සමස්ත ආහාර වියදම රු. 1,712,789,182/- ක් වේ.

ප්‍රවර්තන වර්ෂය තුළ ඇස් කණ්ණාඩි ලබා දීම වෙනුවෙන් රු.12,675,000/- ක් ද අනෙකුත් බාහිර වෛද්‍ය බිල්පත් වෙනුවෙන් රු. 29,066,932/- ක් ද වශයෙන් මුළු මුදල රු. 41,742,232/- ක් කාර්ය මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කර ඇත.

අ.පො.ස. (සා.පෙළ) සමත් සේවක දූ දරුවන්ට මසකට රු. 750/- බැගින් වසර දෙකක්ද, විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා මසකට රු. 2,500/- බැගින් උපාධියට අදාළ වසර සංඛ්‍යාවටද අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දෙනු ලබයි. 2022 වර්ෂය සඳහා ශිෂ්‍යත්ව සඳහා රු. 13,397,000/- ක මුළු මුදලක් වැය වන ලදී.

කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවති කාලය තුළ වරායේ කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් නිවසේ සිට කාර්යාලයටත්, කාර්යාලයේ සිට නිවසටත් ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංගම බස් රථ 23 ක් කුලී පදනම මත ප්‍රවාහනයේ යෙදවූ අතර ඒ සඳහා ගෙවන ලද මුදල රු. 131,541,090/- කි.

කොවිඩ් 19 වෛරසය ආසාධනයට ලක් වූ සේවකයින් හට රු. 10,000/- බැගින් මූල්‍යාධාර සැපයීම හේතුවෙන් රු. 1,820,000/- ක් වැය කර ඇත.

වසර පහළොවකට වැඩි සේවා කාලයක් හිමි විශ්‍රාම යන හෝ සේවයෙන් ඉල්ලා අස්වන සේවක මහත්ම/ මහත්මීන්ගේ සේවා කාලය අනුව රන් පවුම් ප්‍රදානය කරනු ලබයි. එමෙන්ම වසර 30 ක සේවා කාලය සම්පූර්ණ කරන සියළු සේවක මහත්ම/ මහත්මීන්ට අගනා පෝසිලේන් තේ කට්ටල ප්‍රදානය කෙරේ. 2022 වසර තුළ රන් තිළිණ ප්‍රදානය නොකළ අතර, පෝසිලේන් කට්ටල 157 ක් ප්‍රදානය කර ඇත.

2022 වර්ෂය තුළ කෞතුකාගාරය නැරඹීම සඳහා ශ්‍රී ලාංකිකයන් 16,797 දෙනෙකු සහ විදේශීය ජාතිකයින් 389 දෙනෙකු පැමිණ ඇත.

වරාය පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන ආපනශාලා වලින් බදු කුලී වශයෙන් රු. 5,107,659/- ක මුදලක් උපයන ලදී.

ඉහළ කළමනාකාරීත්වයේ පූර්ව අනුමැතිය මත විශේෂ උත්සව සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා සංග්‍රහ කටයුතු සිදු කරන ලදී.

## මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය (MPMA)

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුහුණු කිරීමේ අංශය වන මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ ප්‍රධාන කාර්යභාරය වරාය සේවකයින්, වරාය පරිශීලකයින් හා දේශීය හා විදේශීය අභ්‍යාසලාභීන් සඳහා පාඨමාලා සකස් කර පැවැත්වීම, සමුද්‍රීය ක්ෂේත්‍රයේ අභ්‍යාසලාභීන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් මෙහෙයවීම වේ. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් ජාතික හා ජාත්‍යන්තර ශ්‍රම බලකායේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩ මුළු, සම්මන්ත්‍රණ, වෘත්තීය පරීක්ෂණ, නිපුණතා පරීක්ෂණ හා ප්‍රායෝගික පුහුණු සැසි පවත්වනු ලැබේ.

මීට අමතරව, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් ලබා ගැනීමට අපේක්ෂා කරන්නන් සඳහා නිපුණතා පරීක්ෂණ හා සමුද්‍රීය වෘත්තිකයන් සඳහා පාඨමාලා පැවැත්වීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය කැපවී සිටී. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන පැන නැගුණු අභියෝග හා රට තුළ වෙනත් සාමාජීය ගැටළු හමුවේ වුවද සේවක කාර්යසාධනය වැඩි දියුණු කිරීම, තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීම, කණ්ඩායම් හැගීමෙන් වැඩ කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම, පාරිභෝගික සේවා පුළුල් කිරීම හා ප්‍රමිතිය පවත්වා ගෙන යාමේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම වැනි විවිධ වැඩ මුළු ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

වටිනා සහතිකයක් ලබා දෙන ගනුදෙනුකරුවන් වෙනුවෙන් සකසන ලද පාඨමාලා මගින් වරාය සේවකයින් හට සිය නිපුණතා සංවර්ධනය කොට වරාය මෙහෙයුම් පිළිබඳ විශේෂඥතාවයක් ලබා ගැනීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය අවස්ථාව සලසා දෙනු ලැබේ. මීට පෙර වර්ෂයන් වලදී මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ගේ බඳවා ගැනීමේ පරිපාටිය මත පදනම්ව, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පුහුණු පාඨමාලා ගණනාවක් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් ගණනාවක් ඊළඟ මට්ටමට උසස් කරන ලදී.

2022 වර්ෂයේ පවත්වන ලද සමස්ත පුහුණු පාඨමාලාවන්හි කාර්යසාධනය

| පුහුණු වැඩසටහන් | වැඩසටහන් ගණන | ඉල්ලුම්කරුවන් ගණන | මිනිස් පැය |
|---|---|---|---|
| සමුද්‍රීය හා නාවික | 248 | 5,210 | 45,540 |
| සේවා ස්ථානීය සෞඛ්‍ය හා ආරක්ෂාව | 107 | 2,307 | 46,663 |
| වරාය මෙහෙයුම් හා සේවා සැපයුම් | 68 | 1,239 | 50,835 |
| කළමනාකරණ | 66 | 2,794 | 44,998 |
| තොරතුරු පද්ධති | 45 | 1,118 | 23,328 |
| තාක්ෂණික | 49 | 688 | 8,203 |
| **මුළු එකතුව** | **583** | **13,356** | **219,567** |

**ඉපයූ ආදායම**

කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ අනෙකුත් සාමාජීය ගැටළු හේතුවෙන් අභියෝග පැන නැගුණ ද ගාස්තු මත පදනම් වූ සහ ගාස්තු මත පදනම් නොවූ පාඨමාලා අභ්‍යන්තර හා බාහිර යන පාඨමාලා හදාරන්නන් දෙකොටියාශයට ලබා දීම මගින් සැලකිය යුතු ආදායමක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් උපයා ගන්නා ලදී. 2022 දී මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය ගාස්තු මත පදනම් වූ වැඩසටහන් මගින් රු. 109,655,310 ක් උපයන ලද අතර වරාය මෙහෙයුම් වල

සමස්තයක් ලෙස කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ වෙනුවෙන් කරන ලද පුහුණු වීම් වලින් රු. 19,716,417 ක අමතර ආදායමක් උපයන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේදී මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් රු. 129,371,787 ක සමස්ත ආදායමක් උපයන ලද අතර එම වර්ෂයේදීම මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් පවත්වන ලද පාඨමාලා සඳහා දරණ ලද වියදම රු. 26,596,656/- ක් විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ උසස් වීම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන යෝග්‍යතා අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස නව පුහුණු අවශ්‍යතාවයේ වැදගත්කම හඳුනාගෙන ඇත. මෙම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය තෘතීය හා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගැලපෙන ආකාරයේ ව්‍යුහාත්මක අන්තර් ආයතනික වැඩ සටහන් හඳුන්වාදීමට සැලසුම් කර ඇත. 2022 වර්ෂයේදී, තොරතුරු තාක්ෂණය, කළමනාකරණය සහ උපකරණ මෙහෙයුම් කිරීම පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ පුහුණු කිරීමේ වැඩ සහන් ගණනාවක් පවත්වන ලදී.

මීට අමතරව, වරාය මෙහෙයුම් කළමනාකරණය, සේවා සැපයුම් කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය ගිණුම් හා විගණන, වරාය නිරාපද සහ ඉංග්‍රීසි විෂය පිළිබඳ උසස් ඩිප්ලෝමාව ආදී ඩිප්ලෝමා පාඨමාලා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක හා විධායක නොවන ශ්‍රේණිගත කාර්යමණ්ඩලයේ දැනුම හා සුදුසුකම් වැඩි දියුණු කිරීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් පැවැත්වීමට සැලසුම් කර ඇත. වරාය සේවකයින්ගේ මෙන්ම වරාය ක්ෂේත්‍රයේ අනෙකුත් අභිප්‍රායික පුහුණුවන්නන් හා සේවාස්ථ පුහුණුව ලබන්නන්ගේ දැනුම, කුසලතා හා නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා මෙම වැඩසටහන් මගින් අවධානය යොමු කරනු ලැබේ.

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් දේශීය හා විදේශීය නාවික කර්මාන්තයේ පාර්ශ්වකරුවන් හට ඔවුන්ගේ සුවිශේෂී අවශ්‍යතාවන්ට සරිලන පරිදි සහ ඔවුන්ගේ මෙහෙයුම් වල කාර්ක්ෂමතාවය වර්ධනය කර ගැනීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව සකසන ලද කාර්යස්ථ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ නව්‍ය සංවර්ධන පුහුණු පහසුකම් සහ පළපුරුදු අන්‍ය නිලයින් සිටීමේ හේතුවෙන් දේශීය හා විදේශීය නාවික කර්මාන්තයේ නියැලෙන්නන් සඳහා උසස් තත්ත්වයේ පුහුණු වැඩසටහන් ලබා දීමට මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සිය පුහුණු වැඩසටහන් සහ සම්පත් නාවික කර්මාන්තයේ වත්මන් ප්‍රවණතා සහ සංවර්ධනයන් සමඟ යාවත්කාලීන කර ගනිමින් නාවික කර්මාන්තය සඳහා අඛණ්ඩ සහාය වෙමින් කටයුතු කරනු ලැබේ.

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය දේශීය හා විදේශීය යන අංශ දෙකෙහිම නාවිකයන් සඳහා විවිධ නාවික පුහුණු වැඩසටහන් පවත්වමින් ගෝලීය නාවික කර්මාන්තයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) සහ ශ්‍රී ලංකා නාවිකයින්ගේ ජාතික එකමුතුව (NUSS) සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම මගින් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සිය පුහුණු වැඩසටහන් උසස් ප්‍රමිතියෙන් සහ කර්මාන්තයේ මනා කාර්මික පරිවයන්ට අනුකූල වන බවට සනාථ කළ හැකිය.

## වෛද්‍ය කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය කොට්ඨාශය එහි කාර්යමණ්ඩලයේ සෞඛ්‍ය හා යහපත් පැවැත්ම සම්බන්ධයෙන් විශේෂ උනන්දුවකින් කටයුතු කරයි. වර්ෂය පුරාම යහපත් සෞඛ්‍ය හුරු පුරුදු වර්ධනය කිරීමෙහිලා සහ රෝග බෝවීම වැළැක්වීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඒ පිළිබඳව සේවකයින්ගේ දැනුම හා ආකල්ප වැඩි දියුණු කිරීමට ද කටයුතු කර ඇත. එම වැඩ සටහන් වලින් කිහිපයක් පහත දැක්වේ.

- ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහයෝගය ඇතිව ඩෙංගු නිවාරණ වැඩසටහන් සඳහා වරාය පරිශ්‍රය පවිත්‍ර කිරීම, දූමායනය කිරීම හා එක් එක් කොට්ඨාශ අතර සෞඛ්‍ය ගැටළු පිළිබඳ තොරතුරු යථාවත් කිරීම.
- සියළුම සේවකයන්ට කොවිඩ් 19 රෝගය බෝවීම වැළැක්වීම සඳහා 4 වන මාත්‍රාව එන්නත් කිරීම.
- වරාය පරිශ්‍රයේ අයාලේ යන සුනඛයින් වඳ සැත්කම් වලට භාජනය කිරීම.
- වඩා පෝෂ්‍යදායී ආහාර වේලක් සේවකයින් වෙත සැපයීම සඳහා ආහාර වට්ටෝරුව නැවත සකස් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍යාරක්ෂිත නොවූ ආහාර පරිභෝජනය කිරීමෙන් සහ වැරදි ජීවන රටාවන් හේතුකොටගෙන ඇති වන බෝ නොවන රෝග වලින් සිදු වන අකල් මරණ සංඛ්‍යාව අඩු කිරීම සඳහා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- වැඩි අවධානමක් සහිත කාර්යයන්හි යෙදෙන සේවක කණ්ඩායම් වල සෞඛ්‍ය තත්ත්වය මනා ලෙස පවත්වාගෙන යාම සඳහා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම.
- සේවක මණ්ඩලය වෙත නිවැරදි සේවා හා උපදෙස් ලබා දීමට හැකි වන පරිදි වෛද්‍ය කොට්ඨාශයේ කාර්යමණ්ඩලයේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා මත්ද්‍රව්‍ය වල ඇති අනතුරුදායක බව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- සේවකයින්ගේ වෛද්‍ය වාර්තා පරිගණක පද්ධතියකට ඇතුළත් කිරීම.
- දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ළමුන් සඳහා වෛද්‍ය පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම.

## තොරතුරු පද්ධති කොට්ඨාශය

2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද මූලික N4 මොඩියුල වලට අමතරව Expert Decking, Prime Route, Auto Stow සහ XPS අධීක්ෂණ පද්ධතිය (XPS Monitoring tool) වැනි වෙනත් ප්‍රශස්තකරණ මොඩියුලද සාර්ථකව මෙම කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කර ඇත.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, Oracle E-Business පද්ධතිය සඳහා දත්ත යථාවත් කිරීමේ මෙවලමක් (Disaster Recovery Site) යෙදවීම පිළිබඳ සාකච්ඡා පවත්වමින් සිටී.

කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා අර්ධ ස්වයංක්‍රීය පර්යන්ත කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සාර්ථක ලංසුකරුවෙකු තෝරා ගෙන ඇත.

## නීති කොට්ඨාශය

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත යටතේ විශේෂයෙන් සඳහන් කර ඇති කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය, පේදුරුතුඩුව යන වරායයන් පිළිබඳ කටයුතු වලදී නීති උපදෙස් ලබා දෙන නීති උපදේශකවරු, නීති නිලධාරීන් වශයෙන් හඳුන්වනු ලබන අතර ඔවුන් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට, අධ්‍යක්ෂවරුනට, කොට්ඨාශ ප්‍රධානීන්හට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙනත් අංශ වලට නීති උපදෙස් ලබා දීම ද සිදු කරනු ලබයි.

### නීති උපදෙස්

2022 වර්ෂය තුළ වරාය අධිකාරියේ කළමනාකාරීත්වයට සහ කොට්ඨාශ ප්‍රධානීන්හට නීති උපදෙස් 138 කට වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන සහ නීති කොට්ඨාශයේ විෂය පථය යටතට ගැනෙන කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු (පැවරුම්, බදුකර, ප්‍රකාශන, උකස්කර

ආදිය) කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ වෙනත් කටයුතු වල නිරත වීමද නීති කොට්ඨාශයේ විෂය පථයට අයත් වේ.

**කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර සහ ඔප්පු**

2022 වර්ෂය තුළ කල් බදු ගිවිසුම් 43 ක්, ගිවිසුම්/කොන්ත්‍රාත් 58 ක්, පරිශිෂ්ට, ව්‍යාපාර, කොටස්හිමිකාර ගිවිසුම්, සෘජු ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් නීති කොට්ඨාශය විසින් බලාත්මක කරනු ලැබ ඇත. එම ලේඛනවලට අමතරව, පහත සඳහන් ගිවිසුම් හා බැඳුම්කරද බලාත්මක කරනු ලැබ ඇත.

- විදේශ රැකියා/ පුහුණු වීම්/ අධ්‍යාපන කටයුතු සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හා සම්බන්ධ ගිවිසුම් හා බැඳුම්කර 38 ක්.
- අවබෝධතා ගිවිසුම් 02 ක්
- පරිපූරක, ව්‍යාපාර, සෘජු, කොටස්හිමිකාර ගිවිසුම් 18 ක්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන අධිකරණ නඩු සම්බන්ධ සියළුම කටයුතු ද නීතිපතිගේ සහ නිල නොලත් නීතිඥ මඩුල්ලකගේ සහාය ඇතිව නීති කොට්ඨාශය විසින් මෙහෙයවනු ලබයි.

**අධිකරණ ක්‍රියාමාර්ග**

2021 දෙසැම්බර් මාසය අවසන් වන විට, ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණ, දිසා අධිකරණ, කම්කරු විනිශ්චය සභා, මහේස්ත්‍රාත් අධිකරණ, කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්,(Ombudsman) කම්කරු උසාවි, කම්කරු වන්දි සහ බෙරුම්කාර මධ්‍යස්ථාන හමුවේ නඩු/පැමිණිලි/ අයදුම් 274 ක් විභාග වෙමින් පැවතින.

2022 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව/ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අළුත් නඩු පැමිණිලි සහ අයදුම් 58 ක් (එනම්; ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය, කම්කරු විනිශ්චය සභා, මහේස්ත්‍රාත් අධිකරණය, මානව හිමිකම් කොමිසම, කම්කරු කොමසාරිස්, කම්කරු දෙපාර්තමේන්තුව, බෙරුම්කාර හා කම්කරු වන්දි විනිශ්චය සභාව සහ රේගු විමර්ශන අංශය හමුවේ) ගොනුකර ඇත. සමස්ත නඩු 332 න් 46 ක් 2022 වර්ෂයේදී විමසා අවසන් විය.

2022.12.31 දිනට නඩු /පැමිණිලි/අයදුම්/ විමර්ශන 286 ක් එකී විනිශ්චයායතනයන්හි නිම නොවී පැවතින.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩු**

2021 වසර අවසානය වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 51 ක් විභාග වෙමින් පැවතින. 2022 වසර තුළ අළුතින් නඩු 03 ක් ගොනු කර ඇත. සමස්ත නඩු 54 න් නඩු 05 ක විමසීම් අවසන් විය. (විමසා අවසන් වූ නඩු එකක් හා නිශ්ප්‍රභ වූ නඩු 04 ක් වශයෙන් ) 2022.12.31 දිනට නඩු 49 ක් විභාග වෙමින් පැවැතින.

**අභියාචනාධිකරණයේ පවරා ඇති නඩු**

2021.12.31 දිනට නඩු 40 ක් අභියාචනාධිකරණයේ විභාග වෙමින් පැවතින. 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අළුතින් නඩු 02 ක් ගොනු කර ඇත. මුළු නඩු 42 න් නඩු 05ක් නිෂ්ප්‍රභ වූ අතර එක් නඩුවක් ඉල්ලා අස්කර ගෙන ඇත. 2022.12.31 දිනට නඩු 36 ක් විභාග වෙමින් පැවතිනි.

**මහාධිකරණයේ පවරා ඇති නඩු**

2021 දෙසැම්බර් 31 දිනට මහාධිකරණයේ නඩු 08 ක් විභාග වෙමින් පැවතින. 2022 වර්ෂය තුළ අළුතින් නඩු 02 ක් ගොනු කර ඇත. මුළු නඩු 10 න් එක් නඩුවක් නිෂ්ප්‍රභ විය. 2022.12.31 දිනට නඩු 09 ක් විභාග වෙමින් පැවතින.

**දිසා අධිකරණයේ පවරා ඇති නඩු**

2021.12.31 දිනට නඩු 25 ක් විභාග වෙමින් පැවතින. 2022 වර්ෂය තුළ අළුතින් නඩු කිසිවක් ගොනු කර නොමැත. සමස්ත නඩු 25 න් නඩු 04 ක් අවසන් විය. 2022.12.31 දිනට දිසා අධිකරණයෙහි නඩු 21 ක් විභාග වෙමින් පැවතින.

**මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩු**

2021.12.31 දිනට නඩු 06 ක් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පැවතින. 2022 වර්ෂය තුළ අළුතින් නඩු 27 ක් ගොනු කර ඇත. සමස්ත නඩු 33 න් නඩු 10 ක් අවසන් විය. 2022.12.31 දිනට නඩු 23 ක් විභාග වෙමින් පැවතින.

**කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති නඩු**

2021.12.31 දිනට කම්කරු විනිශ්චය සභා වල නඩු 23 ක් විභාග වෙමින් පැවතින. 2022 වර්ෂයේ දී අළුතින් නඩු 02 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ගොනු කරන ලදී. සමස්ත නඩු 25 න් කම්කරු විනිශ්චය සභා නඩු 09 ක් අවසන් විය. 2022.12.31 දිනට නඩු 16 ක් විභාග වෙමින් පැවතින.

**මානව හිමිකම් කොමිසම වෙත ඉදිරිපත් කළ අයදුම්, කම්කරු ආරවුල් (සමතයට පත්කිරීමේ නඩු) සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද පැමිණිලි, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ කම්කරු වන්දි විනිශ්චය සභා කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද අයදුම්**

2021.12.31 දිනට මානව හිමිකම් කොමිසම ඉදිරියේ අයදුම් 29 ක්, කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ සමතයකට පත්කිරීම සඳහා පැමිණිලි 59 ක්, මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) ඉදිරියේ පැමිණිලි 21 ක් විභාග වෙමින් පැවතින. කම්කරු විනිශ්චය සභාව හමුවේ කිසිදු පැමිණිල්ලක් පවරා නොමැත.

2022 වර්ෂය තුළ, මානව හිමිකම් කොමිසම වෙත නව අයදුම් 07 ක්, කම්කරු කොමසාරිස්වරයා වෙත සමතයකට පත් කිරීම සඳහා නව පැමිණිලි 14 ක් සහ කම්කරු වන්දි විනිශ්චය සභාව ඉදිරියේ 01 අයදුමක් ද පවරා තිබූ අතර මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් නොවීය.

මානව හිමිකම් අයදුම් 04 ක්, සමතයකට පත් කිරීම සඳහා පැමිණිලි 06 ක් සහ මහජන පැමිණිලි පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත එක් පැමිණිල්ලක් ඉදිරිපත් වූ අතර කම්කරු වන්දි විනිශ්චය සභාව ඉදිරියේ කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් නොවීය.

ඒ අනුව, 2022.12.31 දිනට, මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අයදුම් 32 ක්, සමතයකට පත්කිරීම සඳහා පැමිණිලි 67 ක්ද, මහජන පැමිණිලි පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) ඉදිරියේ පැමිණිලි 20 ක් සහ කම්කරු වන්දි විනිශ්චය සභාව ඉදිරියේ එක් පැමිණිල්ලක් ද විභාග වෙමින් පැවතින.

**බේරුම්කාර කටයුතු**

2021.12.31 දිනට වාණිජමය බේරුම්කාර කටයුතු 02 ක් සහ කාර්මික බේරුම්කාර කටයුතු 08 ක් අවසන් නොවී පැවතුණි. 2022 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව එක් කාර්මික බේරුම්කාර නඩුවක් පවරන ලද අතර විභාග වෙමින් පවතින කාර්මික බේරුම්කාර නඩු වෙනුවෙන් වෙනස් නඩු අංක ලබා දෙන ලදී. එක් කාර්මික බේරුම්කාර නඩුවක් අවසන් කරන ලද අතර ( විභාග වෙමින් පවතින බේරුම්කාර නඩු සඳහා නව බේරුම්කරුවන් පත් කිරීමෙන් අනතුරුව නව නඩු අංක ලබා දීම හේතුවෙන්) කිසිදු වාණිජ බේරුම්කාර නඩුවක් අවසන් නොවන ලදී. 2022.12.31 දිනට වාණිජ බේරුම්කාර නඩු 02 ක් සහ කාර්මික බේරුම්කාර නඩු 08 ක් නිම නොවූ තත්ත්වයෙන් පවතිණි. (බේරුම්කාර විනිශ්චය සහා විසින් ප්‍රදානය කරන ලද සහන වලට එරෙහිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය අභියාචනා ඉදිරිපත් කර ඇති හෙයින් විමසා අවසන් කරන ලද වාණිජ බේරුම්කරණ දෙක නොවිසඳෙන ලද බේරුම්කරණ ලෙස සලකනු ලැබේ)

**රේගු විමර්ශන**

2021.12.31 දිනට, රේගු විමර්ශන 02ක් ලැබී තිබිණ. 2022.12.31 දිනට විමර්ශන දෙකක විමසුම් කටයුතු අවසන් නොවී පැවතුනි.

## ආරක්ෂක කොට්ඨාශය

ආරක්ෂක කොට්ඨාශය වරාය අධිකාරිය තුළ ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සියළුම වරාය සේවාවන් සඳහා ආරක්ෂාව සැපයීම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනයට අයත් සියළුම වරායයන් සතු දේපළ හා මානව සම්පත ආරක්ෂා කිරීම, වරාය භාවිතා කරන්නන්, වරාය භූමිය හා මුහුදු සීමාවන් ආරක්ෂා කිරීම මෙන්ම මෙහෙයුම් කරනු ලබන භාණ්ඩ හා සේවාලාභී යාත්‍රා වෙත ආරක්ෂාව සැපයීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන වගකීම් වේ. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිලාශයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ආරක්ෂක කටයුතු ඉතා ප්‍රශස්ථ මට්ටමින් සැපයීමට මෙම කොට්ඨාශය බැඳී සිටින අතර එම කාර්යය ඉටු කිරීම සඳහා ගතයුතු සෑම පියවරක්ම ගනු ලබන අතර සපයනු ලබන වෙනත් විවිධ සේවාවන් මගින් ආදායම් ඉපයීමට ද මෙම කොට්ඨාශය සමත් වී ඇත.

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ කොට්ඨාශය මගින් පහත සඳහන් කටයුතු සිදු කරන ලදී.

- කොළඹ වරායේ සියළුම පිවිසුම් දොරටු සඳහා ආරක්ෂක ආවේක්ෂණ කැමරා (CCTV) පද්ධති සවිකිරීමේ වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක කිරීමට නියමිත වේ. 2022 වර්ෂය අවසන් වන විට වරාය පිවිසුම් දොරටු අතරින් අංක 01 ඒ, අංක 01 - ප්‍රධාන දොරටුව සහ අංක 06 - නව පිවිසුම් යන දොරටු 03 ආවරණය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, වරාය පිවිසුම් දොරටු 09 න් 03 ක් සඳහා ආරක්ෂක ආවේක්ෂණ කැමරා (CCTV) සවිකර ඇති අතර ඉතිරි දොරටු 6 සඳහා කැමරා සවිකිරීමට 2023 වර්ෂයේ වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර ඇත.

- විවිධ කාණ්ඩයන් යටතේ වරාය පිවිසුම් බලපත්‍ර නිකුත් කිරීම මගින් ආරක්ෂක කොට්ඨාශය රුපියල් මිලියන 460.65 ක ආදායමක් උපයා ඇත.

- ආරක්ෂක නිලයින්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම සඳහා 2022 වර්ෂය තුළදී ආරක්ෂක පුහුණු පාසල මගින් විවිධ පුහුණු වැඩසටහන් 08 ක් යටතේ පුහුණු සැසිවාර 28 සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන් මගින් ආරක්ෂක නිලයින් 1987 ක් වෙත (එක් පුද්ගලයෙකු පුහුණු සැසිවාර කිහිපයකට සහභාගී වී ඇත) පුහුණුව ලබාදී ඇත.

තවද, 2022 වර්ෂයේදී ආරක්ෂක පුහුණු පාසලේ වායු රයිෆල් වෙඩිපිටියක් ආරම්භ කරන ලදී. මෙම වෙඩිපිටිය ඉලෙක්ට්‍රොනික ඉලක්ක කාඩ්පත් 20ක් සහ සාමාන්‍ය ඉලක්ක කාඩ්පත් 30 කින්

සමන්විත එකවර 50 දෙනෙකුට පුහුණුව සඳහා වෙඩි තැබිය හැකි වෙඩිපිටියක් වේ. මුදල් අයකිරීමේ පදනම මත මෙම වායු රයිෆල් වෙඩිපිටිය බාහිර පාර්ශ්වයන් වෙතද ලබාදීමෙන් වෙඩිතලා ගාස්තු වශයෙන් රුපියල් 32500.00 ක මුදලක් 2022 වර්ෂයේදී උපයා ඇත.

## සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් හා බාහිර ආයතන අතර පවතින සබඳතා වඩාත් ශක්තිමත් කරමින් හා වර්ධනය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශය එහි ආරම්භයේ සිටම කටයුතු කර ඇත.

දේශීය සහ විදේශීය ජනමාධ්‍ය ආයතන, සාමාන්‍ය ජනතාව, රජයේ දෙපාර්තමේන්තු හා නියෝජිතායතන සහ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමඟ පවත්නා සන්නිවේදනය හා මහජන සබඳතා වඩාත් ශක්තිමත් කිරීම සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශයේ වගකීම් වලින් එකකි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී මාධ්‍යවේදීන්, විශ්ලේෂකයින්, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් ප්‍රබල පාර්ශ්වයන් සමඟ සබඳතා සහ සන්නිවේදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශයේ අනෙකුත් කාර්යයන් අතර ප්‍රධාන කාර්යභාරයක් වේ. මෙම කොට්ඨාශය සතුව පවතින නිෂ්පාදන උපකරණ හා පුහුණු මානව සම්පත භාවිතයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැදගත් අවස්ථා ප්‍රචාරය කිරීම සඳහා සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශය සක්‍රියව කටයුතු කරයි.

පසුගිය වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් පිළිබඳව ප්‍රචාරණය කිරීම තුළින් තව තවත් නාලිකා ආකර්ෂණය කර ගැනීම සහ ධනාත්මක ප්‍රචාරයක් ලබා ගැනීම සඳහා සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශය නිර්මාණාත්මක ප්‍රවේශයකට අවතීරණ වී ඇත.

ප්‍රවෘත්ති හා විශේෂාංග ලිපි නිර්මාණය කර සන්නිවේදනය කිරීම, ඉලක්කගත කණ්ඩායම් වෙත බහු මාධ්‍ය භාවිතයෙන් තොරතුරු බෙදා හැරීම, සාම්ප්‍රදායික සහ සමාජ මාධ්‍ය මෙහෙයුම් සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පිළිගැනීම සහ කීර්තිනාමය ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවති පසුගිය වසර තුළ, පුවත්පත් නිල නිවේදන, වීඩියෝ වාර්තා චිත්‍රපට, ඡායාරූප, සංස්කරණය සහ නිෂ්පාදනය කිරීම තුළින් මෙම කාර්යය සාර්ථකව සිදු කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය සහ විශ්වාසනීයත්වය ඉහළ නංවමින් කාර්යක්ෂමව සහ ඵලදායී මෙහෙයුම් ක්‍රියාවලියක නිරතව සිටී.

සාම්ප්‍රදායික පුවත්පත් රටාව මත සැකසුනු පෙර "තීර්ථ" පුවත්පත පරිශීලකයන් වැඩි ප්‍රමාණයක් අතර තවදුරටත් ජනප්‍රිය කිරීම සඳහා වත්මන් මාතෘකා යටතේ යථාවත් කළ ප්‍රවෘත්ති සහිත වූ නව පෙනුමකින් යුත් ආකර්ෂණීය සඟරාවක් බවට පත් කිරීමට අප කොට්ඨාශය සමත් විය.

## අභ්‍යන්තර විගණන කොට්ඨාශය

අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ක්‍රියාකාරීත්ය වාර්ෂික විගණන සැලැස්ම මගින් සකස් කර එය විගණන කමිටුව මගින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. හඳුනාගෙන තක්සේරු කරන ලද එක් එක් කාර්යයට ඇති අවධානම සැලකිල්ලට ගෙන අවධානම මත පදනම් වූ විගණන සැලසුම පිළියෙල කර ඇත. ආයතනයෙහි අවධානම් කළමනාකරණය, පාලන රටාව හා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සාර්ථකව මෙහෙයවන බව සහතික කිරීම මගින් අධිකාරිය තුළ සවිමත් පාලනයක් ස්ථාපිත කිරීමට කාලය හා සම්පත් කළමනාකරණය කරමින් විගණන සැලැස්ම විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර විගණන කොට්ඨාශය කටයුතු කරයි.

### ආදායම පිළිබඳ විගණනය

වසරේ ආදායමෙහි විගණනය, විගණන සැලැස්මට අනුව සිදු කරන ලද අතර වරාය ගාස්තු, ණයගැති ගිණුම්, විවාදිත බිල්පත් සහ අගරු චෙක්පත් හා ණය ගැතියන්ගෙන් අයවිය යුතු මුදල්

සම්බන්ධයෙන් අනාවරණය වූ දෝෂ පරීක්ෂා කරන ලදී. ගොඩබෑම් හා භාරදීම් ඒකක සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ සිදු කරන ලදී.

**වැය පිළිබඳ විගණනය**

ප්‍රාග්ධන හා ප්‍රවර්තන වියදම් සහ ගබඩා ගෙවීම් වවුචර් පත් පරීක්ෂා කිරීම සඳහා ද විගණන ක්‍රියාමාර්ග ගන්නා ලද අතර අධි ගෙවීම් හා වෙනත් අක්‍රමිකතා හෙලිදරව් කිරීමට හැකි විය. වාහන ධාවන සටහන් හා වාහන අවසර පත් පරීක්ෂාවට ලක් කරන ලද අතර, ඒවා පිළිබඳ අඩුපාඩු නිරීක්ෂණය විය. වැටුප් හා වේතන පිළියෙල කිරීම පිළිබඳ විධිමත් පරීක්ෂණ සිදු කරන ලද අතර අනාවරණය වූ අඩුපාඩු පිළිබඳව වාර්තා කරන ලදී.

**ගබඩා පිළිබඳ භෞතික සමීක්ෂණ**

කොළඹ වරායේ ගබඩා පිළිබඳ භෞතික සමීක්ෂණ පවත්වන ලද අතර, අනෙක් වරායයන්හි වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සඳහා ද සහාය දක්වන ලදී. මෙම තොග සමීක්ෂණ කටයුතු වලදී භාවිතා නොකර ගබඩා කර ඇති භාණ්ඩ හඳුනාගත් අතර ඒ පිළිබඳ විස්තර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැපයුම් කොට්ඨාශය වෙත යොමු කරන ලදී.

**මුදල් පිළිබඳ විගණනය**

මුදල් හා සුළු මුදල් අග්‍රිමය පිළිබඳ හදිසි පරීක්ෂණ සිදු කරන ලද අතර හෙලිවූ අඩුපාඩු පිළිබඳව වාර්තා කරන ලදී.

**සේවක පැමිණීම පිළිබඳ විගණනය**

දිවා මුරයේ හා රාත්‍රී මුරයේ කම්කරු ශ්‍රේණි හා කම්කරු නොවන ශ්‍රේණි වල සේවකයින්ගේ පැමිණීම පිළිබඳ හදිසි පරීක්ෂා හදිසි වැටලීම් අංශය මගින් සිදු කරන ලදී. එම අවස්ථාවල සේවා ස්ථාන වලින් බැහැරව සිටි සේවකයින් පිළිබඳ විස්තර සුදුසු විනය ක්‍රියාමාර්ග සඳහා යොමු කරන ලදී. මෙමඟින් සේවකයින්ගේ පැමිණීමෙහි ප්‍රගතියක් ඇති විය.

**විමර්ශන**

සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි, වර්ෂය තුළ විශේෂ විමර්ශන සිදු කරන ලදී.

**මූල්‍ය වාර්තා**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අධිකාරියේ මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම මෙම කොට්ඨාශයේ වගකීම වේ.

**පූර්ව විගණන**

සමාලෝචනයට යටත් වසර තුළ, තැන්පතු මුදල් ආපසු ගෙවීම් හා වරාය ගාස්තු සඳහා සහන ලබා දීම පිළිබඳව පූර්ව විගණන ක්‍රියාත්මක කරන ලදී.

**ගාල්ල වරාය හා ත්‍රිකුණාමලය වරාය**

ගාල්ල වරායේ හා ත්‍රිකුණාමලය වරායේ ගබඩා සමීක්ෂණ පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණ ක්‍රියාත්මක කරන ලදී.



# මූල්‍ය සමාලෝචනය

## වාර්ෂික වාර්තාව - 2022

**ආදායම (සියළු වරායයන්)**

**ආදායම**
**(වරාය කටයුතු සාරාංශය)**
(රු. මිලියන)

| විස්තරය | 2022 | 2021 | විස්තරය | 2022 | 2021 |
|---|---|---|---|---|---|
| වරාය කටයුතු වලින් ආදායම | 68,408 | 45,455 | නාවික | 18,396 | 10,793 |
| වෙනත් ආදායම් | 30,666 | 15,152 | නැව් භාණ්ඩ වාහක මෙහෙයුම් | 28,901 | 20,441 |
| | | | වාප්පු මෙහෙයුම් | 8,014 | 6,260 |
| | | | වරාය පහසුකම් | 9,250 | 6,176 |
| | | | වෙනත් සේවා මෙහෙයුම් | 3,848 | 1,785 |
| **මුළු ආදායම** | **99,074** | **60,607** | | **68,408** | **45,455** |

**මෙහෙයුම් සහ වෙනත් වියදම් (සියළු වරායයන්)**

රු. මිලියන

| විස්තරය | 2022 වියදම | 2021 වියදම | (වැඩිවීම්)/ අඩුවීම් | % |
|---|---|---|---|---|
| වත්කම් නඩත්තුව | 1,852 | 1,457 | (395) | (27) |
| ඉන්ධන, විදුලිය, සහ ජලය | 5,760 | 2,509 | (3,251) | (130) |
| විදේශ ණය මත පොලිය | 2,400 | 800 | (1,600) | (200) |
| අතිකාල | 6,425 | 5,850 | (575) | (10) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 4,120 | 3,957 | (163) | (4) |
| වේතන, වැටුප් සහ දීමනා | 19,585 | 16,410 | (3,175) | (19) |
| වෙනත් | 6,097 | 2,752 | (3,345) | (122) |
| **වියදම** | **46,239** | **33,735** | **(12,504)** | **(37)** |
| **විදේශ විනිමය (පාඩු)/ ලාභ ඇතුළුව මුළු වියදම** | **42,048** | **35,005** | **(7,043)** | **(20)** |

## වරායයන් අනුව කාර්යසාධනය

### කොළඹ වරාය

2022 වර්ෂයේදී කොළඹ වරායේ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 46,270 ක් ලෙස වාර්තා විය. 2021 වර්ෂයේ රුපියල් මිලියන 58,715 හා සැසඳීමේදී 2022 වර්ෂයේ සමස්ත ආදායම රුපියල් මිලියන 94,897 ක් වූ අතර එය රුපියල් මිලියන 36,182 ක වැඩි වීමකි. 2022 වර්ෂයේ බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 39,584 ක් වූ අතර (විදේශ විනිමය ලැබීම් රුපියල් මිලියන 4,523 ඇතුළුව) 2021 වර්ෂයේ බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 33,232 ක් විය. (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 1,291 ඇතුළුව) එය 19%ක වැඩි වීමකි.



## ගාල්ල වරාය

2022 වර්ෂයේදී ගාල්ල වරායේ මෙහෙයුම් පාඩුව රුපියල් මිලියන 238 ක් ලෙස වාර්තා විය. 2021 වර්ෂයේදී රුපියල් මිලියන 956 හා සැසඳීමේදී 2022 වර්ෂයේ මුළු ආදායම රුපියල් මිලියන 1,470 ක් වූ අතර එය රුපියල් මිලියන 514 ක වැඩිවීමකි.

2022 වර්ෂයේදී බදු වලට පෙර මුළු වියදම (විදේශ විනිමය පාඩුව රුපියල් මිලියන 335 ක් ඇතුළුව) රුපියල් මිලියන 1,320 ක් වූ අතර 2021 වර්ෂයේදී බදු වලට පෙර මුළු වියදම (විදේශ විනිමය ලැබීම් රුපියල් මිලියන 21 ක ඇතුළුව) රුපියල් මිලියන 828 ක් විය. එය 59% ක වැඩිවීමකි.



### ත්‍රිකුණාමල වරාය

2022 වර්ෂයේදී ත්‍රිකුණාමල වරායේ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 1,176 ක් ලෙස වාර්තා විය. 2021 වර්ෂයේ මුළු ආදායම වූ රුපියල් මිලියන 936 හා සැසඳීමේ දී 2022 වර්ෂයේ මුළු ආදායම රුපියල් මිලියන 2,707 ක් වූ අතර එය රුපියල් මිලියන 1,771 ක වැඩිවීමකි.

2022 වර්ෂයේ බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 1,144 (විදේශ විනිමය ලැබීම් රුපියල් මිලියන 2 ඇතුළත්ව) වූ අතර, 2021 වර්ෂයේ වියදම රුපියල් මිලියන 946 ක් විය. (විදේශ විනිමය ලැබීම් රුපියල් මිලියන 0.3 ඇතුළත්ව) එය 21% ක වැඩිවීමකි.



# මානව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි මානව ප්‍රාග්ධනයේ ඇති වැදගත්කම හඳුනාගෙන සේවකයන්ගේ කුසලතා හා දැනුම ඇගැයීමට ලක් කර සිටී. 2022.12.31 දින විවිධ කාණ්ඩයනට අයත් සේවක සංඛ්‍යාව 8,516 ක් සහිත වූ වරාය අධිකාරිය ස්වකීය අරමුණු හා අභිලාෂයන් මුදුන්පත් කරගන්නා අතරම ඔවුන්ගේ සමාන අයිතිවාසිකම් සැපයීමට හා සමාජීය වගකීම් ඉටු කිරීමට ද බැඳී සිටී.

මානව ප්‍රාග්ධනයේ ආයෝජනය කිරීම ඉහළ ආර්ථික වටිනාකමකට හේතුවන අතර, අවසානයේදී ලාභදායීතාවය අත්කර ගන්නා ඵලදායීතාවයට ද හේතු වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය අධ්‍යාපනික හා පුහුණුවීමේ අවස්ථා සම්පාදනය කරමින් සිය සේවකයන් හට අනුග්‍රහය දක්වන අතරම දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් මගින් විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා මූල්‍ය පහසුකම් ද සලසා දෙනු ලැබේ.

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන පුහුණු කිරීමේ අංශය වන අතර සමුද්‍රීය, කළමනාකරණ, තාක්ෂණික හා උපකරණ මෙහෙයවීම පිළිබඳ මූලික සහතික හා ඩිප්ලෝමා පාඨමාලා සහ ප්‍රායෝගික සැසි පවත්වනු ලබන්නේ මෙම විද්‍යායතනය මගිනි. එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය ද පුහුණු ශ්‍රේණිගත සේවකයින් සඳහා ප්‍රායෝගික විභාග පවත්වමින් ඔවුන්ට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබා දීමට කටයුතු කරමින් සිටී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් ස්වකීය ආයතනයට මනා පක්ෂපාතීත්වයක් ඇතිව කටයුතු කරමින් සිටින අතර, ඔවුන්ගේ මෙන්ම ආයතනයේ අභිවෘද්ධිය පිණිස කැපවීමෙන් යුතුව කටයුතු කරයි. ඔවුන් ස්වකීය කාර්ය පරිසරයට මනාව හැඩගැසී සිටින අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිලාෂයන්, දැක්ම හා මෙහෙවර ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමේ උනන්දුවෙන් හා වගකීමෙන් යුක්තව කටයුතු කරයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය (SOR) ප්‍රශස්ත මට්ටමක පවත්වා ගනිමින් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස ආයතනයේ විධායක හා විධායක නොවන ශ්‍රේණි වල කාර්ය මණ්ඩලය නිරන්තර සමාලෝචනය කරයි. උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විනය ක්‍රියාමාර්ග වැනි මානව සම්පත් කටයුතු සාධාරණව හා සමානාත්මතාවයෙන් යුතුව සිදු කරනු ලබයි. සේවක දුක්ගැනවිලි විශේෂ අවධානයකින් යුතුව විමසා බලන අතර, ඒවා විසඳීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු කරයි.

අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුවද, ප්‍රශස්ත මට්ටමේ කාර්ය පරිසරයක් සේවකයින් හට ලබා දීම වෙනුවෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මුර සේවා, නිවසේ සිට රාජකාරීන් ඉටු කිරීම වැනි නව ක්‍රියාපිළිවෙත් හඳුන්වාදෙමින් හා ප්‍රවාහන සේවා පහසුකම් ද සලසමින් සේවකයින් දිරිමත් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරමින් සිටී. ආයතනය විසින් සේවක වැටුප්, වන්දි, අභ්‍යන්තර හා බාහිර ප්‍රතිලාභ සහ සේවක සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය පිළිබඳව විශාල වැදගත්කමක් ද ලබා දී ඇත.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය ආයතනික සමාජ වගකීම් අඛණ්ඩව ඉටු කරන ලදී.

- වරාය සේවකයින්ගේ අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාග විශිෂ්ට ලෙස සමත්වූ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරි නැමීම.

- වරාය සේවකයින්ගේ කුඩා දරුදැරියන්ගේ සුභසාධනය වෙනුවෙන් අංග සම්පූර්ණ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පවත්වාගෙන යාම.

- වරාය ගිනි නිවීමේ ඒකකය ගිනි නිවීම් කටයුතු වලදී කොළඹ මහ නගර සභාවට සහාය දක්වා ඇති අතර වෙනත් හදිසි අවස්ථාවලදී කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි ගිනි නිවීමේ කටයුතු වල නිරතව ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා අනු කමිටු**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබිය යුතුය. එනම්;

(අ) පුළුල් අත්දැකීම් ඇති වරාය මෙහෙයුම් සංවර්ධනය පිළිබඳව හෝ නෛතික හෝ මූල්‍ය කරුණු හෝ නාවික, වාණිජ හෝ ඉංජිනේරු කටයුතු හෝ පරිපාලනමය හෝ කම්කරු සබඳතා පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු සහ තවත් අධ්‍යක්ෂවරු තුන්දෙනෙකු (03) විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

(ආ) ප්‍රවීණ හා පළපුරුද්ද සහිත පුද්ගලයෙකු කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

(ඇ) මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම සඳහා මහා භාණ්ඩාගාර නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩල නියෝජිතයා මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් වශයෙන් පත් කළ යුතුය.

(ඈ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ඉ) ධීවර විෂය සඳහා නියෝජිතයෙකු ධීවර විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

සමාලෝචනයට යටත් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ඔවුන්ගේ වෘත්තීය විස්තර පිටු අංක 16 සිට 21 දක්වා සඳහන් කර ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රධාන වගකීම් වන්නේ:**

- ක්‍රමෝපායික අරමුණු, ප්‍රතිපත්ති හා ඉලක්ක ස්ථාපනය කිරීම තුළින් මඟ පෙන්වීම.
- ඉල්ක්ක හා අරමුණු අරභයා සිදු කෙරෙන කාර්යසාධනය අධීක්ෂණය කිරීම.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන රටාවක් හා උපරිම ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමට වගබලා ගැනීම.
- අරමුණු ඉටු කිරීම පිණිස මාර්ගෝපදේශ සකස් කර ඒවාහි කාලසීමාව තහවුරු කිරීම.
- සියළුම ප්‍රධාන ව්‍යාපාරික අවදානම් හඳුනා ගැනීම සහ ඒවා පිළිබඳව කටයුතු කිරීම සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පාලන, අධීක්ෂණ හා වාර්තාකරණ යාන්ත්‍රණ පවතින බවට තහවුරු කිරීම.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය පහත දැක්වෙන ආකාරයට වේ.**

සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙළ කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිතිපතා පවත්වනු ලබන අතර, සමාලෝචනයට යටත් වර්ෂය තුළ සාමාන්‍ය පරිදි පැවැත්වීමට නියමිත හා විශේෂ රැස්වීම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 14 ක් පවත්වනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත, අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ, පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ වල ප්‍රගති වාර්තාව, මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනයේ දර්ශක, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා ආදිය අතුළත් වන boardPAC නමින් පරිගණක යෙදවුමක් නිර්මාණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් තොරතුරු වෙත පිවිසීමේ අවස්ථාව ලැබේ.

අවසන් අනුමැතිය හා/හෝ නිර්දේශ ලබා දීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතැම් වගකීම් ප්‍රධාන වශයෙන් ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව (TLMC), විගණන කමිටුව හා අභ්‍යන්තර පාලන හා අවධානම් කළමනාකරණ කමිටුව වැනි අනු කමිටු ගණනාවක් වෙත විමධ්‍යගත කර ඇත.

**ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව (TLMC)**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන කටයුතු කළමනාකරණය කිරීම හා අධීක්ෂණය කිරීමට පවතින රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2022 නොවැම්බර් මාසය දක්වා කළමනාකරණ කමිටුවක් පත් කරන ලදී. කෙසේ වුවද, අංක 01/2021 හා 2021.11.16 දින දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ ප්‍රකාරව, රජයට අයත් ව්‍යවසායකයින් සඳහා ආයතනික පාලන විධි හා මෙහෙයුම් මාර්ගෝපදේශනයේ අවශ්‍යතාවය වූ කළමනාකරණ කමිටුව අහෝසි කරන ලද අතර ඒ වෙනුවට විධායක කමිටුවක් පත් කිරීම උචිත බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවබෝධය විය.

2022.09.22 දිනැති අධ්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, පසුගිය ආයතනික ව්‍යූහය - 2022 මගින් ආයතනික ව්‍යූහය ආදේශ කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුණු ජය ගැනීම පිණිස මනා අභ්‍යන්තර පාලන රටාවක් පිහිටුවීමට විධායක කමිටුව වෙනුවට ඉහළ කළමනාකරණ කමිටුව පත් කිරීමේ අවශ්‍යතාවය පැන නැගිණ.

ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව එහි ලේකම් වශයෙන් කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ඇතුළුව සාමාජිකයින් දහ හතර (14) දෙනෙකුගෙන් සමන්විත වේ. එනම්;

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති, උප සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළත් සාමාජිකයින් තිදෙනෙකු (03).

(ආ) පූර්ණ කාලීන සාමාජිකයන් දස දෙනෙකු (10) එනම්;
- වැඩ බලන අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පාලන හා මෙහෙයුම්)
- අධ්‍යක්ෂ (මෙහෙයුම්)
- අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
- අධ්‍යක්ෂ (තාක්ෂණ)
- අධ්‍යක්ෂ (මුදල්)
- අධ්‍යක්ෂ (සංවර්ධන)
- අධ්‍යක්ෂ (අළෙවි හා මාධ්‍ය)
- අධ්‍යක්ෂ (සේවා සැපයුම්)
- අධ්‍යක්ෂ (ආරක්ෂක)
- හාබර් මාස්ටර්

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට පෙර මාසයකට එක් වරක් ඉහළ මට්ටමේ කළමනාකාර කමිටුවේ රැස්වීම් පැවැත්වේ. සමාලෝචනයට යටත් වර්ෂය තුළ මෙම රැස්වීම් දෙකක් (02) පැවැත්විණ. කෙසේ වුවද, සමාලෝචනයට යටත් වර්ෂය තුළ ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව පත් කිරීමට ප්‍රථම විධායක කමිටු රැස්වීම් නවයක් (09) පැවැත්විණ.

**ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවේ ප්‍රධාන කාර්යභාරය**

(අ) ප්‍රතිපත්තිමය ගැටළු සම්බන්ධයෙන් අවසන් අනුමැතිය/ නිර්දේශ ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම ඒවා සමාලෝචනය කර සාකච්ඡා කිරීම.

(ආ) වරාය පරිශීලකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සේවා තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා සම්පත් වල උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම, ඵලදායීතාවය ඉහළ දැමීමට අදාළ සාමාන්‍ය පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම.

(ඇ) වාණිජමය වශයෙන් සාධ්‍ය ආයතනයක්ව පවතින අතරතුරදීම සාමාන්‍ය වගකීම් දරණ රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස කටයුතු කිරීමේ තීරණ ගැනීම.

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් ලෙස භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ වරාය අපරදිග රටවල ප්‍රසිද්ධියට පත්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබන ලදී.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිම කරන ලදී.

1899 වියළි තටාකාංගයේ ඉදිකිරීම් ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකාංගනයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකාංගය සඳහා මීටර් 250 ක් දිග නියමු පාලම ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ ගල් අහුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවීම.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දියඹක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දියඹක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55.800ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩ පහසුකම් ඉදිකිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කිරීම සහ එය ‘‘එළිසබෙත් රැජින ජැටිය’’ යනුවෙන් නම් කිරීම. (‘‘ගොතික්’’ රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලෑ පළමු යාත්‍රාව විය)

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කර වරාය (නැව්බඩු) සංස්ථාව පිහිටුවීම.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවීම.

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1979 කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීම.

1980 කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කිරීම.

1980 එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

1982 පළමු වැනි ග්‍රැන්ට් දොඹකරය - ටැන්ගෝ 80 සේවය සඳහා යෙදවීම.

1982 නව බහළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකචිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

1983 සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 සම්පූර්ණ උපකරණ සහිත අංග සම්පූර්ණ බහළු පර්යන්තයේ II වැනි අදියරෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

1984 එළිසබෙත් රැජිණ ජැටියේ බහළු නැංගුරම්පොළෙහි ‘‘හිටාචි’’ හුවමාරු දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

1985 ජයබහළු පර්යන්තයේ 1 වැනි අදියර උත්සවාකාරයෙන් විවෘත කිරීම.

1987 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

1987 ජයබහළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

1988 වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

1994 නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

1995 ජයබහළු පර්යන්තයේ III වැනි අදියර විවෘත කිරීම.

1996 ජයබහළු පර්යන්තයේ IV වැනි අදියර විවෘත කිරීම.

1998 සමඟි බහළු පර්යන්තය ආරම්භ කිරීම.

1998 අනුබද්ධිත වරාය සමුළුව පැවැත්වීම.

1999 නැගෙනහිර වෙරළ තීරයෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය ක්‍රියාත්මක කිරීම සහ ඔලුවිල් සමුද්‍රීය අභ්‍යාස පුහුණු ආයතනය විවෘත කිරීම.

1999 රැජිණ බහළු පර්යන්තයේ සවුත් ඒෂියා ගේට්වේ ටර්නමිල් (SAGT) සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

1999 ත්‍රිකුණාමල වරායේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කිරීම.

2000 දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම.

2000 ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම.

2000 පැලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2000 කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම.

2000 උතුරු පාලම සංවර්ධන ව්‍යාපෘතියෙහි II වැනි අදියර ආරම්භ කිරීම.

2000 තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2001 ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම.

2003 ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම.

2003 අර්ධ පූර්ණ බහළු (LCL) සහ තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2003 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රීය කෞතුකාගාරය විවෘත කිරීම.

2003 සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟ සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම.

2004 මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගැනීම.

2004 කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම.

2005 ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

2005 මධ්‍යම පරිමාන සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කිරීම.

2006 කොළඹ වරායේ බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් ක්‍රියාත්මක කිරීම.

2006 කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

2006 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

2007 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම.

2008 ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම.

2008 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීම.

2008 හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහා සහ තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම.

2009 හම්බන්තොට වරායේ නැව්තෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2009 ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය "NAVIS" පද්ධතිය දක්වා වර්ධනය කිරීම.

2010 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ වරාය ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

2010 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2010 ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

2010 කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයුම් කිරීම.

2011 නව ග්‍රැන්ටි දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ගෙන ඒම.

2011 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

2011 පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායේ සේවය සඳහා යෙදවීම.

2011 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සඳහා ගිවිසුම අත්සන් කිරීම.

2011 නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2011 දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2012 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ රෝ - රෝ නෞකා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම

2012 බිලුමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණයේ සිට කොළඹ වරාය දක්වා වූ ඉතා අබලන් තත්ත්වයේ පවතින ඉන්ධන නළ මාර්ගය නැවත එලීම.

2013 කිලෝ මීටර් 6.8 අතිවිශාල දියකඩනය සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමඟ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 ඔලුවිල් වරාය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 නැව්බඩු කළමනාකරණ පද්ධතියේ ආනයන පූර්ණ බහළු පැටවුම් මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

2013 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පරිපාලන ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ නැව් තෙල් සැපයීමේ පහසුකම් සහ තෙල් ටැංකි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

2015 නැගෙනහිර බහළු පර්යන්තය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2015 තත්ත්ව කළමනාකරන පද්ධතිය සඳහා ISO 9001 – 2008 තත්ත්ව සහතිකය ලබා ගැනීම.

2015 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය දෙවන අදියරෙහි වරාය ද්‍රෝණියේ කරදියවර පිරවීමේ මංගල්‍යය පැවැත්වීම.

2015 කොළඹ වරාය තුල බහළු විස්සේ සම ඒකක මිලියන 05 මෙහෙයවීම.

2016 CFS 1මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රති ස්ථාපිත කිරීම. (2016.08.10)

2016 යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය මගින් ජයබහළු පර්යන්තයේ උසින් අඩු නව ට්‍රෙලරයක් නිෂ්පාදනය කිරීම. (2016.08.31)

2016 විශාලතම බහළු නෞකාව වන MSC Maya කොළඹ වරායේ, කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය වෙත පැමිණීම. (2016.09.16)

2017 පූර්ණ වශයෙන් නැවත ඉදි කරන ලද බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ 01-(CFS-01) මෙහෙයුම් ආරම්භ කිරීම (2017.05.31).

2017 හම්බන්තොට වරායේ වරාය මෙහෙයුම් සඳහා චීනය සහ ශ්‍රී ලංකාව අතර සහන ගිවිසුම අත්සන් කිරීම (2017.07.29).

2017 19 වැනි Internaltional Network of Affliated Ports (INAP) සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුග්‍රහය දැක්වීම. (2017.11.07-08).

2017 හම්බන්තොට වරායේ කොටස්කරුවන්ගේ ගිවිසුම (Shareholders Agreement) සහ ඉඩම බදු දීමේ ගිවිසුම (Land Lease Agreeement) අත්සන් කිරීම (2017.12.08).

2017 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් සමාගම අතර හම්බන්තොට වරාය සහන ගිවිසුම යටතේ පළමු ගෙවීම සිදු කිරීම (2017.12.09).

2017 කොළඹ වරාය විසින් විස්සේ සම ඒකක මිලියන 06 ක් මෙහෙයවීම (2017.12.20).

2018 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සී/ස චයිනා මර්චන්ටස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කරගත් හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ 02 වන ගෙවීම උත්පාදනය කිරීම.

2018 කොළඹ වරාය සාමූහිකව සංවර්ධනය කිරීම සඳහා සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අවබෝධතා ගිවිසුමකට එළඹීම.

2018 2018 වසරේ හොඳම වරායට හිමි සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෝලීය වරාය සංසදයේදී (Global Ports Forum) දිනා ගැනීම.

2018 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කර ගන්නා ලද හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ ගෙවිය යුතු අවසන් කොටස (last tranche) උත්පාදනය කිරීම.

2018 කොළඹ වරාය විසින් ප්‍රථම වරට පවත්වන ලද " Colombo Port Award Night" සම්මාන ප්‍රදානෝත්සව රාත්‍රිය සංවිධානය කිරීම.

2018 2018 වසරේ පළමු භාගයේදී ලෝකයේ වැඩිම බහළු ප්‍රමාණයක් මෙහෙයවන වරාය ලෙස කොළඹ වරාය ශ්‍රේණිගත කිරීම - ඇල්ෆාලයිනර් ශ්‍රේණිගත කිරීමට අනුව.

2018 කොළඹ වරාය විස්සේ සම ඒකක මිලියන 7ක් මෙහෙයවීමට සමත්වීම.

2019 ගෝලීය වරාය සංසදය විසින් පවත්වන ලද සම්මාන උළෙලේදී "2019 වසරේ වරාය අධිකාරිය" ට හිමි සම්මානය දෙවන වරටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජයග්‍රහණය කිරීම.

2019 ගෝලීය වරාය සංසදය සම්මාන උළෙලේදී 2019 වසරේ වරාය රාජ්‍ය හවුල්කාරිත්වයට හිමි සම්මානය විසින් පවත්න ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජයග්‍රහණය කිරීම.

2019 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කිරීම.

2019 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 40 වන සංවත්සරය සැමරීම.

2019 කොළඹ වරාය විසින් දෙවන වරටත් කොළඹ වරාය සම්මාන රාත්‍රිය අගෝස්තු 31 වන දින පැවැත්වීම.

2020 ජය බහළු පර්යන්ත V අදියරෙහි ඇටි බැම්ම මීටර් 120 කින් දීර්ඝ කිරීමේ ඉදි කිරීම් ආරම්භ කිරීම.

2020 ජය බහළු පර්යන්ත V අදියර සඳහා ගෙන්වන ලද නව ගැන්ට්‍රි දොඹකර තුන නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් සඳහා සවි කිරීම.

2021 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා මහල් 17 කින් යුත් සමුද්‍රීය සේවා සැපයුම් මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීම.

2021 කොළඹ වරායේ බටහිර බහළු පර්යන්තය ඉදිකිරීම සඳහා Adani Ports Economis Zone Limited සමාගම, දේශීය හවුල්කරුවන් වන ජෝන් කීල්ස් සමූහය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර එළැඹෙන ලද ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ, ගිවිසුමට අත්සන් කිරීම.

**2022 කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තයේ (2 වන අදියර) 2022 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලදී.**

**2022 ඩුබායිහි එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 2022 සැප්තැම්බර් 28 දින පැවති 2022 "Global Port Forum Awards" සම්මාන උළෙලේදී වසරේ හොඳම වරාය අධිකාරියට හිමි සම්මානය දිනා ගැනීම.**




# වරාය සංඛ්‍යාලේඛන

## වාර්ෂික වාර්තාව 2022

කොළඹ වරාය

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 184.6 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 810 |
| ඊසාන දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 330 |
| බටහිර පිවිසුම | මීටර් 230 X මීටර් 16 |
| උතුරු පිවිසුම | මීටර් 190 X මීටර් 13 |

**කොළඹ නව වරාය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 192.0 |
| නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 5,140 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 1,550 |
| ප්‍රධාන පිවිසුම | 570 මීටර් X මීටර් 18 |

**නැංගුරම්පොළ පහසුකම්**

| පර්යන්තය | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| නැගෙනහිර බහළු පර්යන්තය | 5,140 | 18 |
| දකුණු බහළු පර්යන්තය (CICT) | 5,140 | 18 |

**වැඩ කරන වේලාවන්**

කොළඹ වරාය වසරේ සෑම දිනකම දවසේ පැය 24 පුරා සේවා සැපයීමේ පදනම මත ක්‍රියාත්මකව පවතී.

ගාල්ල වරාය

**වරාය පරිමාණය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 15.3718 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 140 |
| ගොඩබිම ප්‍රදේශය | හෙක්ටයාර් 17.1914 |
| සමස්ත උපරිම දිග ප්‍රමාණය | මීටර් 130 |
| උපරිම ගැඹුර | මීටර් 7.3 |

වැඩ කරන වේලාවන්

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව ගාල්ල වරාය වසරේ සෑම දිනකම පැය 24 සේවා සැපයීම් පදනම මත ක්‍රියාත්මකව පවතී.

**අපගමන වේලාව**

නැගෙනහිර - බටහිර ප්‍රධාන මාර්ගයෙන් නැත.

**නැංගුරම් පහසුකම්**

**සමස්ත අද්දර නැංගුරම්පළ සංඛ්‍යාව 05**

| නැංගුරම්පොළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ක්ලෝසන්බර්ග් ජැටිය | 420 | 8.9 |
| නව පාලම | 162 | 8.9 |
| නව පාලම/ හරස් | 84 | 8.9 |

**ගුදම් පහසුකම්**

| ගුදමේ නම හෝ පිහිටා ඇති ස්ථානය | ඒකක ප්‍රමාණය | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (වර්ග අඩි) | ධාරිතාවය (ඝන අඩි) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) |
|---|---|---|---|---|---|
| අංක 01 | 06 | 23 | 20,000 | 460,000 | 10 උස |
| අංක 02 | 12 | 23 | 40,000 | 920,000 | 10 උස |
| ගාල්ල වරායේ සබ්මැරීන කේබල් මධ්‍යස්ථානය (GSCD) | 10 | 23 | 33333.3 | 766666.68 | 10 උස |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 02 | 23 | 6666.7 | 153333.3 | 10 උස |

**2018.01.15 දින සිට 2023.01.14 දින දක්වා ගාලු වරායේ සබ්මැරීන කේබල් මධ්‍යස්ථානය වෙත අංක 02 දරණ ගුදමේ ඒකක 07ක් ලබා දී ඇත.**

## ත්‍රිකුණාමලය වරාය

**වරාය පරිමාණය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර්1,536 |
| ප්‍රවේශ ඇළ මාර්ගය (අවම පළල) | මීටර් 500 |
| ගොඩබිම් ප්‍රදේශය | හෙක්ටයාර් 2,254 |

වැඩ කරන වේලාවන්

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව ත්‍රිකුණාමලය වරාය වසරේ සෑම දිනකම පැය 24 සේවා සැපයීම් පදනම මත ක්‍රියාත්මකව පවතී.

**නැංගුරම්ලෑමේ පහසුකම්**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැංගුරම්පොළවල්**

| නැංගුරම්පොළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| අෂ්රෆ් ජැටිය | 250 | 12.5 |
| පැති නැංගුරම්පොළ- අෂ්රෆ් ජැටිය | 90 X 2 | 8.5 |
| මඩකොව් ප්‍රදේශයේ පිහිටි ජැටිය | 45 | 3.5 |
| ටීටීඒ හි පිහිටි ජැටිය ( TTA) | 190 | 2.0-4.0 |
| සිලෝන් ජැටිය | 50 | 2.5 |
| නගර ජැටිය | 50 | 2.5 |
| මුතූර් ජැටිය | 60 | 3.0 |
| වීඑස්ඕ ජැටිය (VSO) | 25 | 1.5 |
| පරණ නගර ජැටිය | 60 | 2.0 |
| තෙල් ජැටිය | 130 | 9.75 |

**වෙනත් නැංගුරම්පොළවල්**

| නැංගුරම්පොළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ප්‍රීමා ජැටිය (ඇතුළ්) | 122 | 5.9 |
| ප්‍රීමා ජැටිය (පිටත) | 227 | 14.3 |
| ප්‍රීමා ජැටිය (බහුකාර්ය) | 170 | 10.3 |
| ටෝකියෝ සිමෙන්ති ජැටිය | 160 | 9.5 |

**ගුදම් පිළිබඳ විස්තර – ටීටීඒ (TTA)**

| ගුදම | පරිමාණය (අඩි) | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය වර්ග අඩි (අඩි) | බහළු තැන්පත් කිරීමේ (උස) | ධාරිතාවය (ඝණ අඩි) |
|---|---|---|---|---|---|
| අංක 01 | 75 X 34 | - | 2,550 | 12 | 30,600 |
| අංක 02 සහ 03 | 90 X 70 | 15 | 6,300 | 12 | 75,600 |
| අංක 04 | 190 X 95 | 19 | 18,050 | 14 | 252,700 |
| අංක 05 ඒ | 150 X 110 | 25 | 16,500 | 15 | 247,500 |
| අංක 05 බී | 150 X 80 | 15 | 12,000 | 12 | 144,000 |
| අංක 06 | 300 X 110 | 20 | 33,000 | 15 | 495,000 |
| අංක 07 | 96 X 36 | - | 3,456 | 12 | 41,472 |

## හම්බන්තොට වරාය

### අදියර - I

**වරාය පරිමාණය**

වරාය ප්‍රදේශය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 70 |
| බටහිර දියකඩනයේ දිග | මීටර් 988 |
| නැගෙනහිර දියකඩනයේ දිග | මීටර් 312 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 |
| හැරවුම් පෙදෙස | මීටර් 600 |

**පාලම්වල දිග**

| | |
|---|---|
| සාමාන්‍ය නැව්බඩු පාලම | මීටර් 600 |
| සේවා පාලම | මීටර් 105 |
| තෙල් පාලම 1 | මීටර් 310 |
| තෙල් පාලම 2 | මීටර් 300 |
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 16 |
| නෞකා නිර්මාණය | ද.බ. ටො. 100,000 |

හම්බන්තොට වරාය - දෙවන අදියර

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| සම්පූර්ණ කිරීමෙන් පසු මුළු ජල ප්‍රදේශය | හෙක්ටයාර් 77 |
| හැරවුම් වක්‍රය | මීටර් 600 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 |

**පාලම් වල දිග**

| | |
|---|---|
| ප්‍රධාන බහළු නැංගුරම්පොළ | මීටර් 838.5 |
| පෝෂක බහළු පර්යන්තය | මීටර් 460 |
| බහුකාර්ය නැංගුරම්පොළ | මීටර් 838.5 |
| හුවමාරු නැංගුරම්පොළ | මීටර් 208 |

| | |
|---|---|
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බො.ටො. 100,000 |



# මූල්‍ය ප්‍රකාශනයන්

## වාර්ෂික වාර්තාව - 2022

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2022.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**කීත් ඩී බර්නාඩ් මහතා**
සභාපති

**ජී යූ කේ අල්ගේවත්තගේ මහතා**
උප සභාපති

**උපුල් ජයතිස්ස මහතා**
කළමනාකාර අධ්‍යක්ෂ

**පී ඒ එස් අතුල කුමාර මහතා**
අධ්‍යක්ෂ

**පී බී එස් සී නෝනිස් මහතා**
අධ්‍යක්ෂ

**ඒ ඒ පී එස් නිස්සංකා මහත්මිය**
අධ්‍යක්ෂ

**ජේ ආර් යූ ද සිල්වා මහතා**
අධ්‍යක්ෂ

**නීල් රාජකරුණා මහතා**
අධ්‍යක්ෂ

**වෛද්‍ය අජිත් මෙන්ඩිස් මහතා**
අධ්‍යක්ෂ

2022 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 14 ක් පවත්වන ලදී. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන ඉහළ මට්ටමේ කළමනාකාරණ කමිටුව මෙම කාල පරිච්ඡේදය තුළම රැස්වීම් 02 ක් පැවැත්විණ. කෙසේ වුවද, විමර්ශනයට යටත් කාල පරිච්ඡේදය තුළ ඉහළ මට්ටමේ කළමනාකාර කමිටුව පත් කිරීමට ප්‍රථම විධායක කමිටු රැස්වීම් නවයක් (09) පවත්වා තිබිණි. 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් උප කමිටුවක් වන විගණන කමිටුවේ රැස්වීම් පහක් (05) 2022 වර්ෂයේදී පවත්වා තිබිණ.

පසුගිය වර්ෂයට වඩා 5.3% ක අඩු වීමක් පෙන්නුම් කරමින් 2022 වර්ෂයේදී කොළඹ වරායේ මෙහෙයවන ලද මුළු ධාරිතාවය බහළු විස්සේ සම ඒකක මිලියන 6.86 ක් විය. මෙම මුළු මෙහෙයුම් ප්‍රමාණයෙන් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම බහළු විස්සේ සම ඒකක මිලියන 3.18 ක් ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත බහළු විස්සේ සම ඒකක මිලියන 1.92 ක් ද සවුත් ඒෂියා ගේට්වේ පර්යන්තය බහළු විස්සේ සම ඒකක මිලියන 1.75 ක් ද, මෙහෙයුම් කරන ලදී. මීට අමතරව, ප්‍රතිනැව්ගත බහළුම් මෙහෙයුම් 3.7% ක පහත වැටීමක් වාර්තා වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී දේශීය බහළු මෙහෙයුම් ප්‍රමාණය 14.1% කින් පහත වැටී ඇත.

පසුගිය වර්ෂය හා සැසඳීමේදී කොළඹ වරායේ මෙහෙයවන ලද බහළු ධාරිතාවය සහ මුළු ටොන් ප්‍රමාණය යන දෙඅංශයෙහිම පහත වැටීමක් අත්විඳින ලදී. විශේෂයෙන්ම, වරායේ බහළු මෙහෙයුම්

ධාරිතාවය බහළු විස්සේ සම ඒකක 2021 වර්ෂයේදී මෙහෙයුම් ධාරිතාවය මිලියන 7,249,358 සිට 2022 වර්ෂයේදී මිලියන 6,862,184 දක්වා පහත වැටීණ මෙමඟින් පසුගිය වර්ෂය හා සැසඳීමේදී බහළු විස්සේ සම ඒකක මිලියන 387,174 ක හෙවත් 5.3% ක අඩු වීමක් පෙන්නුම් කරනු ලබයි. තවද, වරායේ මුළු ටොන් ප්‍රමාණ මෙහෙයුම් පසුගිය වර්ෂය හා සැසඳීමේදී 7.4% කින් පහත වැටී ඇත.

පසුගිය වර්ෂයේ කොළඹ වරාය වෙත පැමිණි 3,675 ක් වූ මුළු නෞකා සංඛ්‍යාව 2022 වර්ෂයේදී 3,648 දක්වා සුළු පසුබෑමකට ලක්වෙමින් 0.7% ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, 3.4% ක වර්ධනයක් සලකුණු කරමින් පසුගිය වසරේ වරායට පැමිණි බහළු නෞකා 3,180 කට සාපේක්ෂව 2022 වර්ෂයේදී බහළු නෞකා 3,287 ක් පැමිණීමත් සමඟ බහළු නෞකා වල පැමිණීමේ සුළු වර්ධනයක් ඇති විය. බහළු නෞකා පැමිණීමේ මෙම වැඩි වීම කොළඹ වරාය කලාපයේ ප්‍රතිඅපනයන කේන්ද්‍රීය වරායක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක විමක් ලෙස සනිටුහන් වීමකි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වලට හා කොළඹ වරායට වැඩි බහළු ධාරිතාවයක් ආකර්ෂණය කර පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් අළෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන උපාය මාර්ග ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ අඛණ්ඩව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා නැව් සමාගම් පහක් සමඟ පර්යන්ත සේවා ගිවිසුම් අත්සන් කිරීම හා ඔවුන් සමඟ සබඳතා පවත්වාගෙන යාම ඊට ඇතුළත් වේ. තවද, අතිරේක මෙහෙයුම් ධාරිතා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරයා අධිකාරියේ පර්යන්ත වෙත පැමිණෙන තත්කාර්ය නෞකා ආකර්ෂණය කර ගැනීමද සිදු කරන ලදී.

අති විශාල බහළු නෞකා මෙහෙයුම් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ දකුණු වරායේ ගැඹුරු නැංගුරම්පොළ පහසුකම් ඉදිකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් වෙත මීටර් 14.25 ක වඩා වැඩි ගැඹුර සහිත බහළු නෞකා 230 ක් පැමිණි අතර නැගෙනහිර බහළු පර්යන්තය වෙත එවැනි නෞකා 17 ක් පැමිණෙන ලදී.

කෙසේ වුවද, නෞකා වල පරිමාණයන් වැඩි වීම, නව සන්ධානගත වීම්, සුසංගතවීම්, අත්පත්කර ගැනීම් සහ අනෙකුත් පෞද්ගලික පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් ප්‍රදානය කරන තරඟකාරී ගාස්තු ඇතුළුව අභියෝග ගණනාවක් හමුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පර්යන්ත මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. මෙම අභියෝගයන් හමුවේ වුවද කලාපය තුළ නාවික කර්මාන්තයේ ප්‍රමුඛ පෙළේ නැව් භාණ්ඩ මෙහෙයුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය සේවාවන් වර්ධනය කිරීමට හා ස්වකීය තත්ත්වය පවත්වා ගෙන යාම සඳහා අඛණ්ඩව කටයුතු කරමින් සිටී.

පෙර වර්ෂයේ රුපියල් බිලියන 24.9 ක මෙහෙයුම් ලාභය හා සැසඳීමේදී 2022 වර්ෂය තුළ රුපියල් බිලියන 47.2 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. 2022 වර්ෂයේ දළ ආදායම රුපියල් බිලියන 99.1 ක් වූ අතර 2021 වර්ෂයේ දළ ආදායම වූ රුපියල් බිලියන 60.6 සමඟ සංසන්දනය කිරීමේදී මෙය රුපියල් බිලියන 38.5 ක වැඩි වීමකි. 2022 වර්ෂය හා සැසඳීමේදී බදු වලට පෙර, විදේශ ණය පොළිය සහ විදේශ විනිමය ලාභ/පාඩු රුපියල් බිලියන 43. 7 ක් වූ අතර මෙය 33% ක වැඩි වීමකි.

ශ්‍රී ලංකා රුපියල අව ප්‍රමාණය වීම හේතු කොටගෙන 2022 වර්ෂය තුළදී විදේශ ණය පොළී පිරිවැය 200% කින් වැඩි විය. 2021 වර්ෂයේ විදේශ විනිමය පාඩුව වූ රුපියල් බිලියන 1.27 ට සාපේක්ෂව 2022 වර්ෂයේ විදේශ විනිමය පාඩුව රුපියල් බිලියන 4.19 ක් විය.

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල මූලිකව අව ප්‍රමාණය වීම හේතු කොටගෙන 2021 වර්ෂයේ රුපියල් බිලියන 20.7 ට සාපේක්ෂව ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් බිලියන 42.3 ක බදු වලට පසු ලාභයක් පෙන්නුම් කරන ලදී.

# මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සියළු ගණුදෙනු පිළිබඳ ගිණුම් පොත් නිසියාකාරව පවත්වාගෙන යනු ලබන බවටත්, පවතින තත්ත්වය හා වර්ෂයේ ලාභය/පාඩුව පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙන අයුරින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන බවටත්, සහතික කිරීමේ වගකීම 1971 අංක 38 දරණ මුදල් පනතේ (12) හා (13.6) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, ගිණුම් පොත් නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩලය මගපෙන්වා ඇති අතර, නිතිපතා පවත්වන ලද රැස්වීම් වල දී විගණන කමිටුව හරහා මූල්‍යමය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලදී.

මෙම වාර්තාවෙහි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු මගින් ගිණුම්කරන ප්‍රතිපත්ති අඛණ්ඩ පදනමක් මත පිළිගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ල යොමු වී ඇත.

අධිකාරියේ වත්කම් ආරක්ෂා කරගැනීම, වංචා හා වෙනත් අක්‍රමිකතා වලක්වා ගැනීම හා අනාවරණය කර ගැනීමත්, උදෙසා තමන්ට ගත හැකි සෑම පියවරක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර කටයුතු විධිමත් ක්‍රමවේදයකට ගෙනයාමට සහ අපගේ ලේඛනයන්හී නිරවද්‍යතාවය හා විශ්වාසවන්තභාවය හැකිතාක් දුරට ප්‍රායෝගික වන පරිදි ආරක්ෂා කිරීම සඳහා, අභ්‍යන්තර පරීක්ෂා කිරීම්, අභ්‍යන්තර විගණනයන් සහ මූල්‍ය හා අනෙකුත් පාලනයන් ඇතුළත් සඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**ෂෙහාර වයි. නවරත්න මහත්මිය**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

**විගණන කමිටුව - 2022 වර්ෂය තුළ සංයුතිය**

**පි ඒ එස් අතුළ කුමාර මහතා**

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත
2022.04.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී

**ජේ සී වැලිගමගේ මහත්මිය**

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත
2020.02.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
2022.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වන ලදී.

**සාමාජිකයන්**

**පී බී එස් සී නෝනිස් මහතා**

රේගු අධ්‍යක්ෂ ජෙනරාල්
අධ්‍යක්ෂ ( ශ්‍රී ව. අ. අධ්‍යක්ෂ මණ්ඩලය)
2022.09.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී

**එම් එම් පී පී කේ කේ නවරත්න මහතා**

නීතිඥ
අධ්‍යක්ෂ ( ශ්‍රී ව. අ. අධ්‍යක්ෂ මණ්ඩලය)
2022.09.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී
2022.11.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වන ලදී.

**එච් ඉසුරු බාලපටබැඳි මහතා**

අධ්‍යක්ෂ ( ශ්‍රී ව. අ. අධ්‍යක්ෂ මණ්ඩලය)
2021.08.23 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී
2022.08.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වන ලදී.

**මේජර් ජෙනරාල් ජී වී රවිප්‍රිය**

රේගු අධ්‍යක්ෂ ජෙනරාල්
අධ්‍යක්ෂ ( ශ්‍රී ව. අ. අධ්‍යක්ෂ මණ්ඩලය)
2020.06.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී
2022.07.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වන ලදී.

**කමිටුවේ ලේකම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරනු ලබයි. රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලන නිර්ණායකයන් යටතේ සලස්වා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් විගණන කමිටුව කැඳවනු ඇත.

**අනිවාර්ය සහභාගී වන්නන්**

කළමනාකාර අධ්‍යක්ෂ
හෝ
අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ

ප්‍රධාන මුදල් කළමනාකරු

**නිරීක්ෂකවරු**

විගණකාධිපතිගේ නියෝජිත

රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක

**කමිටු රැස්වීම්**

2022 මූල්‍ය වර්ෂය පුරාම විගණන කමිටුව ක්‍රියාත්මකව පැවති අතර වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 05 ක් පැවැත්වීමට හැකි විය. සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

| නම | සහභාගී වීමට යෝග්‍ය වූ /සහභාගී වූ |
|---|---|
| ජේ සී වැලිගමගේ මහත්මිය | 1/1 |
| පි ඒ එස් අතුළ කුමාර මහතා | 4/4 |
| මේජර් ජෙනරාල් ජී වී රවිප්‍රිය මහතා | 1/2 |

| | |
|---|---|
| එච් ඉසුරු බාලපටබැඳි මහතා | 2/2 |
| පී බී එස් සී නෝනිස් මහතා | 3/3 |
| එම් එම් පී පී කේ කේ නවරත්න මහතා | 0/2 |

විගණන කමිටුවේ ගණ පූර්ණය මාෂිකයන්ගෙන් සාමාන්‍ය බහුතරයකි.

**විගණන කමිටුවේ කාර්යභාරය**

විගණන කමිටුව පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවකි. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට සහ ඒවාහි ප්‍රමාද දෝෂ පිළිබඳ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා විගණන කමිටුව තම නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. මෙම කටයුතු ඉටු කිරීමේදී, කමිටුවේ ප්‍රධාන වගකීම් වන්නේ;

**මූල්‍ය වාර්තාකරණය සහ නියාමන අනුකූලතාවය**

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණයේදී දෝෂ හා අඩුපාඩු විමසා බැලීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගනු ලබන්නේ මූල්‍ය වාර්තා නිසි පරිදි පිළියෙළ කර ඉදිරිපත් කිරීම සහතික කරනු පිණිස නියාමන බලතල, රජයේ චක්‍රලේඛ, අනෙකුත් අදාළ පවතින රෙගුලාසි සහ නියමයන් වාර්තාකරණ ප්‍රමිති අනුගමනය කරමින් අදාළ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙලදරව් කර ඇද්ද යන්න විමසා බැලීම සඳහාය.

ආයතන පනත සහ මුදල් පනත ඇතුළු අනෙකුත් අදාළ පනත් සමඟ පවතින විධිමත් අනුකූලතාවය සමාලෝචනය කිරීම.

**අභ්‍යන්තර පාලනය**

අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත්භාවය හා ඵලදායීතාවය සමාලෝචනය කර තක්සේරු කර විශේෂ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම.

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන කාර්යයන් ස්වාධීනත්වය, ඵලදායීතාවය සහ ප්‍රවීණත්වය සහ ඒවාහි උපක්‍රමික අවශ්‍යතාවය සමාලෝචනය කර වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

අභ්‍යන්තර විගණන කොට්ඨාශය සහ බාහිර විගණකවරු අතර සම්බන්ධීකරණය සහතික කිරීම.

අභ්‍යන්තර විගණන කටයුතු අවදානම පාදක කොටගත් අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කිරීම මගින් හා අනුමත කිරීම මගින් අධිකාරියේ ක්‍රියාකාරීත්වයේ අවදානම් තක්සේරුව මත සිදු කෙරෙන බව තහවුරු කිරීම.

**බාහිර විගණනය**

විගණනයේදී සොයා ගනු ලබන කරුණු මත බාහිර විගණක සමඟ සුදුසු පරිදි සන්නිවේදනය කර ගැටළු නිවැරදි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කිරීම.

**2022 වසර තුළ සිදු කළ කටයුතු**

2022 වසරේ විගණන කමිටුව මගින් සිදු කරන ලද කටයුතු පහත විශේෂිත ක්ෂේත්‍ර යටතේ සාරාංශගත කර ඇත.

**මූල්‍ය වාර්තාකරණය සහ නියාමන අනුකූලතාවයන්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ඇතුළු නියාමන ප්‍රතිපාදන වලට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිණුම්කරණ වාර්තා වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු බව සහතික කිරීම සඳහා සහ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් විගණන කමිටුව මගින් සමාලෝචනය කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිවයන් යෝග්‍ය සහ ප්‍රමාණවත් බව, මූල්‍ය වාර්තාකරණ ක්‍රමය ඵලදායී බවට සාධාරණ ලෙස සහතික කළ හැකි වන පරිදි අභ්‍යන්තර

පාලන සහ ක්‍රියාවලිය පවතින බවට සහ විශ්වාසදායී සහ කාලීන තොරතුරු ලබා දීම සඳහා මනා ලෙස කළමනාකරණය කර ඇති බවට විගණන කමිටුව විසින් සෑහීමට පත් වී සිටී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය වාර්තාකරණයට අදාළ සුවිශේෂී අවදානම් සහ අවිනිශ්චිතභාවයන්, සහ අධිකාරියේ මූල්‍ය වාර්තාකරණයට අදාළ වල ප්‍රධාන ඇස්තමේන්තු සහ තීරණ පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති වල බලපෑම හා ප්‍රකාශිත මූල්‍ය වාර්තා මගින් හෙළිදරව් වූ කරුණු ප්‍රමාණවත්, යෝග්‍ය හා සාධාරණ ද යන්න සමාලෝචනය කරන ලදී.

**අභ්‍යන්තර පාලන**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද වල ප්‍රමාණවත් බව, ඵලදායී බව සහ කාර්යක්ෂම බව තක්සේරු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ස්වාධීනත්වය, අරමුණුගතභාවය සහ කාර්යසාධනය, සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර විගණන මගින් සොයාගත් කරුණු සහ අධිකාරිය විසින් ඒවාහි අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කරන ලද ආකාරය සමාලෝචනය කරන ලදී.

අවදානම මත පදනම් වූ සැලසුම් ක්‍රමවේදය මත පිළියෙළ කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කරන ලදී. ආවරණය කිරීමේ ප්‍රමාණවත්භාවය හා සංඛ්‍යාතය ඇගයීම් කරන ලදී.

අභ්‍යන්තර වාර්තා මගින් සොයාගත් ප්‍රධාන කරුණු සහ ඒවාට කළමනාකරණය දැක්වූ ප්‍රතිචාර සමාලෝචනය කරන ලද අතර, නිර්දේශ ක්‍රියාත්මක කළ ආකාරය සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ සම්පත් අවශ්‍යතාවය පිළිබඳව තක්සේරු කරන ලදී.

**බාහිර විගණනය**

අතුරු හා අවසන් විගණන වලින් පැනනැගුණු සියළු කරුණු සහ ඒ හා බැඳුණු කළමනාකරණ ප්‍රතිචාර සියල්ල සමඟ එකට ගෙන සාකච්ඡා කරන ලදී.

විගණන විමසුම් මගින් හෙළිකරගත් කරුණු පිළිබඳ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**ඉදිරි ගමන් මග**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කටයුතු වඩා විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීමට උපකාරී වීම සඳහා ආයතනයේ පාලනය සහ මූල්‍ය විනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා විගණන කමිටුව විසින් වැදගත් දායකත්වයක් ලබා දෙන ලදී. එසේම, අධිකාරියේ ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගනු වස් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය සහ පාලන විධිය ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍ර රැසකට අදාළ කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයට සහ වාර්තාකරණයට ලක් කිරීම විගණන කමිටුව අඛණ්ඩව නියැලෙනු ඇත.



**පි ඒ එස් අතුල කුමාර**
**සභාපති**
**විගණන කමිටුව**

# ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමේ තත්ත්වය සවිස්තරාත්මකව පහත දැක්වේ.

**1. සේවක අර්ථ සාධක අරමුදල - අධිකාරියේ සහ සේවක දායකත්වය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ස්ථිර සේවකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දායකත්වය වශයෙන් 15% ක් හා සේවක දායකත්වය වෙනුවෙන් 10% ක් වශයෙන් එළඹෙන මාසයෙහි අවසාන දිනට ප්‍රථම කම්කරු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

සේවකයින්ගෙන් අඩු කරනු ලබන සියළුම දායක මුදල් සහ අධිකාරියේ අදාළ දායක මුදල නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**2. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

අධිකාරියේ 3% ක් වන මාසික දායක මුදල සෑම මසකම නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**3. ආදායම් බදු**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 113 වගන්තිය ප්‍රකාරව උපයනු ලබන ආදායමට අදාළ ආදායම් බදු ගෙවීම, බදු ගෙවිය යුතු ආදායමක් උපයා ඇති සෑම අවස්ථාවකදීම නියමිත දිනවලදී කාර්තුමය වශයෙන් ගෙවනු ලැබ ඇත.

**4. වාර්ෂික ආදායම**

අධිකාරියේ ආදායම් බදු සම්බන්ධ වාර්ෂික වාර්තාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත වාර්ෂිකව ගොනුකර ඇත. මෙම ආදායම සකස් කිරීම අවසන් කර නොවැම්බර් 30 දිනට හෝ ඊට ප්‍රථම තක්සේරු වර්ෂයට පසුව ලබා දී ඇත.

**5. වාර්ෂික වාර්තාකරණය**

වාර්ෂික අයවැය, ගිණුම් සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

**6. සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL)**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු 2.5% ක අනුපාතයකට ගෙවිය යුතු පිරිවැටුම මත ගෙවා ඇති අතර එම මුදල් දක්වා ඇති දිනය හෝ ඊට ප්‍රථම ප්‍රේෂණය කර ඇත.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | ශ්‍රීලවඳ | |
|---|---|---|---|---|---|
| | කොළඹ | ත්‍රිකුණාමලය | ගාල්ල | 2022 | 2021 |
| **පැමිණි නෞකා සංඛ්‍යාව** | | | | | |
| නැවබඩු නෞකා | 3,547 | 84 | 3 | 3,634 | 3,804 |
| වෙනත් නෞකා | 101 | 11 | 4 | 116 | 102 |
| වෙනත් යාත්‍රා | 718 | 35 | 34 | 787 | 697 |
| | **4,366** | **130** | **41** | **4,537** | **4,603** |
| **බහළු ධාරිතාවය** | | | | | |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | |
| ප්‍රතිනැවගත | 1,633,176 | | | 1,633,176 | 1,846,264 |
| දේශීය | 256,318 | | | 256,318 | 321,121 |
| තැන්මාරු මෙහෙයුම් | 36,401 | | | 36,401 | 30,949 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **1,925,895** | - | - | **1,925,895** | **2,198,334** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| ප්‍රතිනැවගත | 1,481,563 | | | 1,481,563 | 1,521,373 |
| දේශීය | 229,711 | | | 229,711 | 265,285 |
| තැන්මාරු මෙහෙයුම් | 40,962 | | | 40,962 | 52,035 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **1,752,236** | - | - | **1,752,236** | **1,838,693** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | |
| ප්‍රතිනැවගත | 2,520,946 | | | 2,520,946 | 2,482,410 |
| දේශීය | 544,201 | | | 544,201 | 612,649 |
| තැන්මාරු මෙහෙයුම් | 118,906 | | | 118,906 | 117,272 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **3,184,053** | - | - | **3,184,053** | **3,212,331** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| ප්‍රතිනැවගත | 5,635,685 | - | - | 5,635,685 | 5,850,047 |
| දේශීය | 1,030,230 | - | - | 1,030,230 | 1,199,055 |
| තැන්මාරු මෙහෙයුම් | 196,269 | - | - | 196,269 | 200,256 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **6,862,184** | - | - | **6,862,184** | **7,249,358** |
| සාම්ප්‍රදායික මෙ.ටො. | 1,915,755 | 1,711,281 | 1,169 | 3,628,205 | 6,988,678 |
| දුව මෙ.ටො. | 4,333,670 | 377,475 | | 4,711,145 | 5,535,505 |
| | **6,249,425** | **2,088,756** | **1,169** | **8,339,350** | **12,524,183** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | | | | | |
| බහළුගත නැවබඩු | 25,472,397 | | | 25,472,397 | 28,133,393 |
| සාම්ප්‍රදායික නැවබඩු | 1,915,755 | 1,711,281 | 1,169 | 3,628,205 | 6,988,678 |
| දුව | 4,333,670 | 377,475 | | 4,711,145 | 5,535,505 |
| **මුළු නැව් භාණ්ඩ (මෙ.ටො.)** | **31,721,822** | **2,088,756** | **1,169** | **33,811,747** | **40,657,576** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| බහළුගත නැවබඩු | 22,731,145 | | | 22,731,145 | 24,061,998 |
| සාම්ප්‍රදායික නැවබඩු | | | | - | - |
| දුව | | | | - | - |
| **මුළු නැව් භාණ්ඩ (මෙ.ටො.)** | **22,731,145** | - | - | **22,731,145** | **24,061,998** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - (සී.අයි.සී.ටී.)** | | | | | |
| බහළුගත නැවබඩු | 41,716,844 | | | 41,716,844 | 42,399,804 |
| සාම්ප්‍රදායික නැවබඩු | | | | - | - |
| දුව | | | | - | - |
| | **41,716,844** | - | - | **41,716,844** | **42,399,804** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නැවබඩු | 89,920,386 | - | - | 89,920,386 | 94,595,195 |
| සාම්ප්‍රදායික නැවබඩු | 1,915,755 | 1,711,281 | 1,169 | 3,628,205 | 6,988,678 |
| දුව | 4,333,670 | 377,475 | - | 4,711,145 | 5,535,505 |
| **මුළු නැව් භාණ්ඩ (මෙ.ටො.)** | **96,169,811** | **2,088,756** | **1,169** | **98,259,736** | **107,119,378** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | |
| බහළුගත නැවබඩු | 25,472,397 | | | 25,472,397 | 28,133,393 |
| සාම්ප්‍රදායික නැවබඩු | 1,915,755 | 1,711,281 | 1,169 | 3,628,205 | 6,988,678 |
| වෙනත් | 4,333,670 | 377,475 | | 4,711,145 | 5,535,504 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **31,721,822** | **2,088,756** | **1,169** | **33,811,747** | **40,657,575** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| බහළුගත නැවබඩු | 22,731,145 | | | 22,731,145 | 24,061,998 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **22,731,145** | - | - | **22,731,145** | **24,061,998** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | |
| බහළුගත නැවබඩු | 41,716,844 | | | 41,716,844 | 42,399,804 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **41,716,844** | - | - | **41,716,844** | **42,399,804** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නෞකා | 89,920,386 | - | - | 89,920,386 | 94,595,195 |
| සාම්ප්‍රදායික නෞකා | 1,915,755 | 1,711,281 | 1,169 | 3,628,205 | 6,988,678 |
| වෙනත් | 4,333,670 | 377,475 | - | 4,711,145 | 5,535,504 |
| **මෙහෙයුම් කරන ලද මුළු ටොන් ප්‍රමාණය** | **96,169,811** | **2,088,756** | **1,169** | **98,259,736** | **107,119,377** |
| **සේවක මඩුල්ල** | | | | | |
| සේවක සංඛ්‍යාව | **7,838** | **363** | **315** | **8,516** | **8,997** |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | Note | සමූහය 2022 | සමූහය 2021 | ශ්‍රීලවඅ 2022 | ශ්‍රීලවඅ 2021 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | 251,719,813,895 | 148,971,536,673 | 251,628,153,511 | 148,870,349,879 |
| කල්බදු වත්කම් | 3.2 | 69,817,698 | 81,745,116 | 69,817,698 | 81,745,116 |
| අස්පෘෂ්‍ය වත්කම් | 4 | 2,254,637,128 | 738,795,770 | 2,254,347,128 | 738,795,770 |
| ආයෝජන දේපළ | 5 | 212,988,096,316 | 168,606,924,280 | 212,988,096,316 | 168,606,924,280 |
| පරිපාලික සමාගම් වල ආයෝජන | 6 | 100 | 100 | 76,000,100 | 76,000,100 |
| ආශ්‍රිත සමාගම් වල ආයෝජන | 7 | 36,704,085,016 | 37,469,717,172 | 39,196,120,030 | 39,196,120,030 |
| සාධාරණ අගය මත වෙනත් විස්තිර්ණ ආදායම් වලින් ජනිත වන මූල්‍ය වත්කම් | 8 | 67,584,339,272 | 35,623,899,913 | 67,584,339,272 | 35,623,899,913 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු මුදල | 9 | 40,989,023 | 53,926,469 | 40,989,023 | 53,926,469 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් - මහජන බැංකු ණය | 10 | 2,798,525,037 | 3,127,763,275 | 2,798,525,037 | 3,127,763,275 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **574,160,303,485** | **394,674,308,768** | **576,636,388,114** | **396,375,524,832** |
| **ජංගම වත්කම්** | | | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | 11 | 3,852,522,843 | 3,113,542,041 | 3,835,437,418 | 3,098,814,301 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 12 | 21,152,923,045 | 15,271,094,820 | 21,072,824,446 | 15,214,437,698 |
| තැන්පතු සහ අත්තිකාරම් | 13 | 5,595,918,027 | 1,641,444,023 | 5,592,446,093 | 1,638,893,846 |
| පෙර ගෙවූ වියදම් | | 464,420,859 | 211,475,724 | 464,420,859 | 211,475,724 |
| සේවක ණය | 14 | 5,974,510,352 | 4,777,253,798 | 5,921,234,530 | 4,732,399,376 |
| වෙනත් මූල්‍ය වත්කම් | 15 | 106,709,911,411 | 56,158,735,976 | 106,311,782,741 | 55,941,923,281 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 16 | 10,809,850,154 | 16,701,860,547 | 8,716,996,509 | 15,407,736,670 |
| දේපළ පිරියත හා උපකරණ - MPMC සමාගම | 17 | 205,575 | 260,539 | - | - |
| **මුළු ජංගම වත්කම්** | | **154,560,262,265** | **97,875,667,469** | **151,915,142,595** | **96,245,680,897** |
| **මුළු වත්කම්** | | **728,720,565,751** | **492,549,976,237** | **728,551,530,709** | **492,621,205,730** |
| **ස්කන්ධ සහ වගකීම්** | | | | | |
| **ස්කන්ධ** | | | | | |
| යෙදවූ ප්‍රාග්ධනය | 18 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 |
| ප්‍රාග්ධන සංචිත | 19 | 111,886,831,306 | 721,289,024 | 111,886,831,306 | 721,289,024 |
| වෙනත් සංචිත | 20 | 1,125,903 | 1,125,903 | 1,125,903 | 1,125,903 |
| විලම්බිත ආදායම | 21 | 168,535,618,225 | 166,448,063,988 | 168,535,618,224 | 166,448,063,990 |
| ණය නිදහස් කිරීමේ සංචිතය | 22 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 |
| ප්‍රතිප්‍රමාණන සංචිත | 23 | 74,101,416,216 | 74,451,820,964 | 74,101,416,216 | 74,451,820,964 |
| සාධාරණ අගය මත වෙනත් විස්තිර්ණ ආදායම් වලින් ජනිත වන මූල්‍ය වත්කම් | | 57,575,791,084 | 27,646,259,632 | 57,575,791,082 | 27,646,259,632 |
| රඳවාගත් ඉපැයීම් | | 116,599,667,908 | 83,571,990,373 | 126,165,972,783 | 88,659,988,029 |
| **මුළු ස්කන්ධ එකතුව** | | **540,905,380,314** | **365,045,479,557** | **550,471,685,185** | **370,133,477,214** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය | 24.1 | 78,885,991,365 | 47,806,929,003 | 78,885,991,365 | 47,806,929,003 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන | 25.1 | 2,883,723,647 | 4,786,458,194 | 2,798,525,037 | 4,702,382,701 |
| මූල්‍ය කල්බදු වගකීම් | 25.4.1 | 24,102,515 | 38,478,408 | 20,593,856 | 30,229,716 |
| රජයේ ප්‍රදානයන් | 26 | 27,219,591,156 | 27,527,628,973 | 27,219,591,156 | 27,527,628,973 |
| විලම්බිත බදු වගකීම් | 27 | 11,971,566,805 | 11,310,982,481 | 11,971,566,805 | 11,310,982,481 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 28 | 12,517,383,603 | 6,422,842,068 | 12,498,171,431 | 6,410,711,656 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **133,502,359,090** | **97,893,319,126** | **133,394,439,648** | **97,788,864,529** |
| **ජංගම වගකීම්** | | | | | |
| භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා වෙනත් ණය හිමියන් | 29 | 3,720,480,226 | 1,347,828,696 | 3,883,020,370 | 1,481,619,057 |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය | 24.2 | 8,924,559,413 | 5,088,708,668 | 8,924,559,413 | 5,088,708,668 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන | 25.2 | 13,242,043,396 | 7,661,767,726 | 3,612,798,808 | 2,653,014,068 |
| මූල්‍ය කල්බදු වගකීම් | 25.4.1 | 13,816,872 | 12,585,164 | 9,076,839 | 8,154,106 |
| තැන්පතු සහ ලැබූ අත්තිකාරම් | 30 | 4,037,746,434 | 2,046,730,085 | 3,987,746,434 | 2,046,730,085 |
| ගෙවිය යුතු ප්‍රවර්තන බදු | 31 | 11,607,087,654 | 3,122,901,177 | 11,529,589,539 | 3,114,882,922 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | 32 | 12,760,588,068 | 10,327,667,475 | 12,738,614,472 | 10,305,755,085 |
| විලම්බිත බදු වගකීම් | | 6,504,280 | 2,988,561 | - | - |
| **මුළු ජංගම වගකීම්** | | **54,312,826,345** | **29,611,177,551** | **44,685,405,876** | **24,698,863,990** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **728,720,565,751** | **492,549,976,237** | **728,551,530,709** | **492,621,205,730** |

පිටු අංක **92** සිට **109** දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක **110** සිට **131** දක්වා පිටුවල සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අනුකලනයන් නිර්මාණය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් **2022.12.31** දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙනු ලැබේ.

ගයනි ලියනගේ
ප්‍රධාන මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර පහත සඳහන් සුද්ගලයන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් තබන ලදී.

කීත් ඩී. බර්නාඩ
සභාපති

සුසන්ත අමෙසිරිවර්ධන
කළමනාකාර අධ්‍යක්ෂ

පී ඒ එස් අතුල කුමාර
අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජික

දිනය : **2023** පෙබරවාරි **24**
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | සටහන | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| | | 2022 | 2021 | 2022 | 2021 |
| ආදායම | 33 | 68,408,147,526 | 45,454,580,320 | 68,408,147,526 | 45,454,580,320 |
| සෘජු වියදම් | 34 | (30,909,453,234) | (23,994,553,154) | (30,721,474,450) | (23,860,767,840) |
| **දළ ලාභය** | | **37,498,694,292** | **21,460,027,167** | **37,686,673,076** | **21,593,812,481** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 35 | 22,526,441,373 | 12,220,624,438 | 22,546,087,410 | 12,310,486,630 |
| පරිපාලන වියදම් | 36 | (12,547,191,688) | (8,850,291,819) | (13,024,281,140) | (9,038,708,964) |
| **මෙහෙයුම් ලාභය** | | **47,477,943,977** | **24,830,359,787** | **47,208,479,346** | **24,865,590,147** |
| ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ ආදායම | 37 | 5,237,397,717 | 1,873,847,785 | 5,626,382,580 | 2,005,391,135 |
| විදේශ විනිමය ලාභ/(පාඩු) | | 706,852,371 | (1,558,480,234) | 4,190,928,257 | (1,269,650,219) |
| ආශ්‍රිත සමාගම් වල ලාභ කොටස් | 7 | (765,632,157) | (382,596,440) | - | - |
| **බදු වලට පෙර ලාභය** | | **52,656,561,909** | **24,763,130,898** | **57,025,790,184** | **25,601,331,063** |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 61 | (1,000,000,000) | - | (1,000,000,000) | - |
| ආදායම් බදු වියදම් | 38 | (13,337,098,475) | (2,690,840,465) | (13,261,098,236) | (2,676,325,878) |
| විලම්බිත බදු වියදම් | 27 | (449,012,109) | (2,229,753,296) | (445,496,390) | (2,229,753,296) |
| **වර්ෂය තුළ ලාභය** | | **37,870,451,326** | **19,842,537,137** | **42,319,195,558** | **20,695,251,889** |
| **මව සමාගමේ ස්කන්ධ හිමියන් අතර බෙදී යා යුතු** | | **37,870,451,326** | **19,842,537,137** | **42,319,195,558** | **20,695,251,889** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| වර්ෂය තුළ ලාභය | | 37,870,451,326 | 19,842,537,137 | 42,319,195,558 | 20,695,251,889 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම් | 28.2 | (5,010,014,736) | (422,191,678) | (5,004,613,077) | (424,407,222) |
| ලැයිස්තුගත ආයෝජන මත සාධාරණ අගයට ගණනය කල වෙනත් විස්තීර්ණ ආදායමේ මූල්‍ය වත්කම් වල අගය වෙනස් වීම | 8.1 | (44,598,296) | (12,898,527) | (44,598,296) | (12,898,527) |
| ලැයිස්තුගතනොවූ ආයෝජන මත සාධාරණ අගයට ගණනය කල වෙනත් විස්තීර්ණ ආදායමේ මූල්‍ය වත්කම් වල අගය වෙනස් වීම | 8.2 | 29,974,129,748 | 2,331,796,393 | 29,974,129,748 | 2,331,796,393 |
| **වර්ෂයේ මුළු වෙනත් විස්තීර්ණ ආදායම්** | | 24,919,516,716 | 1,896,706,188 | **24,924,918,375** | **1,894,490,644** |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම්** | | **62,789,968,042** | **21,739,243,325** | **67,244,113,933** | **22,589,742,534** |
| **මව සමාගමේ ස්කන්ධ හිමියන් අතර බෙදී යා යුතු** | | **62,789,968,042** | **21,739,243,325** | **67,244,113,933** | **22,589,742,534** |

පිටු අංක 92 සිට 109 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 110 සිට 131 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | යෙදවූ | ප්‍රාග්ධන | වෙනත් | විලම්බිත | ණය මුදාහැරීමේ | ප්‍රතිප්‍රමාණන | FVOCI හි ඇති | රඳවාගත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාග්ධනය | සංචිතය | සංචිත | ආදායම් | සංචිත | සංචිත | මූල්‍ය වත්කම් සංචිත | ඉපැයුම් (හරි) | |
| **සමූහය** | | | | | | | | | |
| **2021 ජනවාරි 01 දිනට ශේෂය** | **7,591,379,785** | **721,289,024** | **1,125,903** | **168,314,081,182** | **4,613,549,887** | **75,257,909,515** | **25,327,361,765** | **64,376,869,959** | **346,203,567,020** |
| වර්ෂයේ ලාභය | - | - | - | - | - | - | - | **19,842,537,137** | **19,842,537,137** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය මත ගැලපුම් | | | | | | (66,823,062) | - | **66,823,062** | - |
| පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 45) | - | - | - | - | - | - | - | (292,309,936) | **(292,309,936)** |
| ලාභ් ටර්මිනල් සමාගම් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | | | | | 261,829 | **261,829** |
| ටෝකියෝ සමාගමේ පෙර ගෙවුම් ගාස්තු | | | | | | | | | - |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | - | - | - | - | - | - | - | (422,191,678) | **(422,191,678)** |
| CICTසමාගමේ පෙර ගෙවුම් ගාස්තු | - | - | - | (103,534,286) | - | - | - | | **(103,534,286)** |
| ලාභ් ටර්මිනල් සමාගම් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | - | - | - | (658,207) | - | - | - | | **(658,207)** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | - | - | - | (10,300,000) | - | - | - | | **(10,300,000)** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | - | - | - | (31,626,840) | - | - | - | | **(31,626,840)** |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | - | - | - | (731,198,730) | - | - | - | | **(731,198,730)** |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | - | - | - | (981,799,130) | - | - | - | | **(981,799,130)** |
| ප්‍රතිප්‍රමාණන සංචිත මත විලම්බිත බදු ගැලපුම් | - | - | - | - | - | (739,265,489) | - | | **(739,265,489)** |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුද | - | - | - | (6,900,000) | - | - | - | | **(6,900,000)** |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම් | - | - | - | - | - | - | (12,898,527) | | **(12,898,527)** |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත ගැලපුම් | - | - | - | - | - | - | 2,331,796,393 | | **2,331,796,393** |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **721,289,024** | **1,125,903** | **166,448,063,988** | **4,613,549,887** | **74,451,820,964** | **27,646,259,632** | **83,571,990,373** | **365,045,479,556** |
| වර්ෂයේ ලාභය | | | | | | | | 37,870,451,326 | **37,870,451,326** |
| ගෙවූ ලාභාංශ | | | | | | | | (15,000,000) | **(15,000,000)** |
| ගෙවූ අධිභාර බදු | | | | | | | | (6,477,790) | **(6,477,790)** |
| ප්‍රතිප්‍රමාණන අතිරික්තය මත ගැලපුම් | | | | | | (129,317,515) | - | 129,317,515 | - |
| ශ්‍රීලවඅ අධිකාරියේ පොත් වල ඇතුළත් කළ ඉඩම් | | 111,165,542,282 | | | | | | | **111,165,542,282** |
| **පෙර වර්ෂය හා ගැලපුම් (සටහන 45)** | | | | | | | | 56,085,459 | **56,085,459** |
| සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් මත ක්ෂය ගැලපුම් | | | | | | | | - | - |
| ආරම්භක ශේෂය මත ගැලපුම් | | | | | | | | (2,683,538) | **(2,683,538)** |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම් | | | | | | | | (5,010,014,736) | **(5,010,014,736)** |
| CICTසමාගමේ පෙර ගෙවුම් ගාස්තු | | | | (103,534,286) | | | | | **(103,534,286)** |
| ලාභ් ටර්මිනල් සමාගම් මඟින් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | **(658,207)** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම් විසින් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (10,300,000) | | | | | **(10,300,000)** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මඟින් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (31,626,840) | | | | | **(31,626,840)** |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (731,198,730) | | | | | **(731,198,730)** |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (981,799,130) | | | | | **(981,799,130)** |
| CWIT සමාගමෙන් ලැබූ පෙර ගෙවුම් ගාස්තු | | | | 4,050,000,000 | | | | | 4,050,000,000 |
| CWIT සමාගම විසින් ගෙවන ලද පෙර ගෙවුම් ගාස්තුවේ ක්‍රමක්ෂය | | | | (96,428,571) | | | | | (96,428,571) |
| ප්‍රතිප්‍රමාණන සංචිත මත විලම්බිත බදු ගැලපුම් | | | | | | (215,087,933) | | | **(215,087,933)** |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදල | | | | (6,900,000) | | | | | **(6,900,000)** |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම් | | | | | | | (44,598,296) | | **(44,598,296)** |
| ලියා ඉවත් කල James Jesen Motor launch යාත්‍රාව | | | | | | (5,999,300) | | 5,999,300 | |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත ගැලපුම් | | | | | | | 29,974,129,748 | | **29,974,129,748** |
| | | | | | | | | | - |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **111,886,831,306** | **1,125,903** | **168,535,618,224** | **4,613,549,887** | **74,101,416,216** | **57,575,791,084** | **116,599,667,908** | **540,905,380,312** |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රීලවඅ | | | | | | | | | |
| **2021 ජනවාරි 01 දිනට ශේෂය** | **7,591,379,785** | **721,289,024** | **1,125,903** | **168,314,081,183** | **4,613,549,887** | **75,257,909,515** | **25,327,361,765** | **68,614,368,407** | **350,441,065,467** |
| වර්ෂයේ ලාභය | - | - | - | | - | - | - | 20,695,251,889 | **20,695,251,889** |
| ප්‍රතිප්‍රමාණන අතිරික්ත මත ගැලපුම | | | | | | (66,823,062) | | 66,823,062 | - |
| පෙර වර්ෂය හා ගැලපුම් (සටහන 45) | - | - | - | | - | - | - | (292,309,936) | **(292,309,936)** |
| සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් මත ක්ෂය ගැලපුම | | | | | | | | 261,829 | **261,829** |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | - | - | - | | - | - | - | (424,407,222) | **(424,407,222)** |
| CICTසමාගමේ පෙර ගෙවුම් ගාස්තු | - | - | - | (103,534,286) | - | - | - | | **(103,534,286)** |
| ලාන් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවූ මුළු මුදලේ කුමක්ෂය | - | - | - | (658,207) | - | - | - | | **(658,207)** |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදලේ කුමක්ෂය | - | - | - | (10,300,000) | - | - | - | | **(10,300,000)** |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ලබා ගත් මුළු මුදලේ කුමක්ෂය | - | - | - | (31,626,840) | - | - | - | | **(31,626,840)** |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ කුමක්ෂය | - | - | - | (731,198,730) | - | - | - | | **(731,198,730)** |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ කුමක්ෂය | - | - | - | (981,799,130) | - | - | - | | **(981,799,130)** |
| ප්‍රතිප්‍රමාණන සංචිත මත විලම්බිත බදු ගැලපුම | - | - | - | | - | (739,265,489) | - | | **(739,265,489)** |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුද | - | - | - | (6,900,000) | - | - | - | | **(6,900,000)** |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම් | - | - | - | | - | - | (12,898,527) | | **(12,898,527)** |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත ගැලපුම් | - | - | - | | - | - | 2,331,796,393 | | **2,331,796,393** |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **721,289,024** | **1,125,903** | **166,448,063,990** | **4,613,549,887** | **74,451,820,964** | **27,646,259,632** | **88,659,988,029** | **370,133,477,211** |
| වර්ෂයේ ලාභය | | | | | | | | 42,319,195,558 | 42,319,195,558 |
| ප්‍රතිප්‍රමාණන අතිරික්ත මත ගැලපුම් | | | | | | (129,317,515) | | 129,317,515 | - |
| ශ්‍රීලව අධිකාරියේ පොත් වල ඇතුළත් කළ ඉඩම් | | 111,165,542,282 | | | | | | | 111,165,542,282 |
| පෙර වර්ෂය හා ගැලපුම් (සටහන 45) | | | | | | | | 56,085,459 | 56,085,459 |
| සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් මත ක්ෂය ගැලපුම් | | | | | | | | | - |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම් | | | | | | | | (5,004,613,077) | (5,004,613,077) |
| CICTසමාගමේ පෙර ගෙවුම් ගාස්තු | | | | (103,534,286) | | | | | (103,534,286) |
| ලාන් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවූ මුළු මුදලේ කුමක්ෂය | | | | (658,207) | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදලේ කුමක්ෂය | | | | (10,300,000) | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ලබා ගත් මුළු මුදලේ කුමක්ෂය | | | | (31,626,840) | | | | | (31,626,840) |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ කුමක්ෂය | | | | (731,198,730) | | | | | (731,198,730) |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ කුමක්ෂය | | | | (981,799,130) | | | | | (981,799,130) |
| CWIT සමාගමෙන් ලැබූ පෙර ගෙවුම් ගාස්තු | | | | 4,050,000,000 | | | | | 4,050,000,000 |
| CWIT සමාගම විසින් ගෙවන ලද පෙර ගෙවුම් ගාස්තුවේ කුමක්ෂය | | | | (96,428,571) | | | | | (96,428,571) |
| ප්‍රතිප්‍රමාණන සංචිත මත විලම්බිත බදු ගැලපුම් | | | | | | (215,087,933) | | | (215,087,933) |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදල | | | | (6,900,000) | | | | | (6,900,000) |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම් | | | | | | | (44,598,296) | | (44,598,296) |
| ලියා ඉවත් කල James Jesen Motor launch යාත්‍රාව | | | | | | (5,999,300) | | 5,999,300 | - |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත ගැලපුම් | | | | | | | 29,974,129,748 | | 29,974,129,748 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **111,886,831,306** | **1,125,903** | **168,535,618,224** | **4,613,549,887** | **74,101,416,216** | **57,575,791,082** | **126,165,972,783** | **550,471,685,186** |

පිටු අංක 92 සිට 109 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 110 සිට 131 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය** | | | | |
| **බදු වලට පෙර ලාභය** | **52,656,561,909** | **24,763,130,898** | **57,025,790,184** | **25,601,331,063** |
| | | | | |
| ***ගැලපුම්*** | | | | |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (ශුද්ධ ලාභාංශ ) | 765,632,157 | 382,596,440 | | |
| ක්ෂය | 4,100,467,503 | 3,881,957,655 | 4,086,737,806 | 3,871,428,079 |
| බොල්ණය හා අඩමාණ ණය | 997,829,988 | 219,867,178 | 995,285,957 | 219,867,178 |
| අස්පෘශ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය | 96,918,908 | 74,718,722 | 96,908,908 | 74,718,722 |
| කල්බදු වත්කම් ක්‍රමක්ෂය | 11,927,418 | 11,277,620 | 11,927,418 | 11,277,620 |
| වසරේ පාරිතෝෂික ගාස්තු හා අදාළ පිරිවැය | 2,040,176,515 | 750,303,419 | 2,040,176,515 | 748,058,028 |
| පෙර වර්ෂයේ ආදායම | (9,169,753) | 592,139,522 | (9,169,753) | 592,139,522 |
| පෙර වර්ෂයේ වියදම | 65,255,212 | (5,697,817) | 65,255,212 | (5,697,817) |
| සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් මත ක්ෂය ගැලපුම් | - | 261,829 | - | 261,829 |
| ලාභාංශ ආදායම | (6,268,528,124) | (1,871,787,555) | (6,268,528,124) | (1,871,787,555) |
| පොලී ආදායම | (8,309,145,982) | (2,893,973,300) | (8,119,641,864) | (2,841,365,896) |
| පොලී වියදම | 2,978,836,932 | 983,787,392 | 2,400,347,952 | 799,636,638 |
| රාජ්‍ය පුදාන වල ක්‍රමක්ෂය | (308,037,817) | (308,589,492) | (308,037,817) | (308,589,492) |
| උපලබ්ධි නොවූ ශුද්ධ විනිමය ලාභ/පාඩු | 46,975,148,853 | 3,712,131,411 | 42,919,113,839 | 3,374,977,087 |
| CICTසමාගමේ පෙර ගෙවුම් ගාස්තු | (103,534,286) | (103,534,286) | (103,534,286) | (103,534,286) |
| හිමිකම්පෑම් සඳහා ප්‍රතිපාදන | (256,614,516) | (1,116,590,366) | (256,614,516) | (1,116,590,366) |
| ලාන් ටර්මිනල් පුද්ගලික සමාගමේ වර්ෂය තුළ ක්‍රමක්ෂය | (658,207) | (658,207) | (658,207) | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ට්ලරිස් පුද්ගලික සමාගමේ වර්ෂය තුළ ක්‍රමක්ෂය | (10,300,000) | (10,300,000) | (10,300,000) | (10,300,000) |
| HIPG/HPS සමාගම් වල කල්බදු අයිතීන් ක්‍රමක්ෂය | (1,712,997,860) | (1,712,997,860) | (1,712,997,860) | (1,712,997,860) |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදල | (6,900,000) | (6,900,000) | (6,900,000) | (6,900,000) |
| ටෝකියෝ සිමෙන්ති (ලංකා) සමාගමේ වසරේ ක්‍රමක්ෂය | (31,626,840) | (31,626,840) | (31,626,840) | (31,626,840) |
| CWIT වර්ෂය තුළ ක්‍රමක්ෂය | (96,428,571) | - | (96,428,571) | - |
| ස්ථාවර වත්කම් විකිණීම මගින් ලද ලාභය | 8,706,661 | (18,003,846) | 8,706,661 | (15,603,846) |
| **කාරක ප්‍රාග්ධන වීචල්‍යතාවයට පෙර මෙහෙයුම් ලාභය** | **93,583,520,098** | **27,291,512,415** | **92,725,812,612** | **27,268,043,599** |
| | | | | |
| **කාරක ප්‍රාග්ධන වීචල්‍යතා** | | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | (738,980,804) | (346,279,553) | (736,623,118) | (345,628,254) |
| වෙළඳ ලැබීම් | (6,524,434,467) | 611,133,983 | (6,524,434,467) | 608,355,442 |
| නැන්පතු හා අත්තිකාරම් | (4,013,424,506) | (1,241,632,876) | (3,953,552,246) | (1,241,632,876) |
| පෙර ගෙවූ වියදම් | (252,945,135) | (130,122,088) | (252,945,135) | (130,122,088) |
| සේවක ණය හා වෙනත් | (1,191,011,492) | 116,539,598 | (1,188,835,154) | 131,687,992 |
| භාණ්ඩ හා සේවා සැපයුම් සහ වෙනත් ණයහිමියන් | 2,458,419,083 | (228,235,819) | 2,401,401,313 | (225,358,860) |
| නැන්පතු හා ලැබූ අත්තිකාරම් | 1,941,016,349 | (462,237,911) | 1,941,016,349 | (462,237,911) |
| ප්‍රතිපාදන හා උපචිත වියදම් | 2,688,943,267 | 660,527,168 | 2,689,473,903 | 660,427,718 |
| **මෙහෙයුම් මගින් උත්පාදිත මුදල්** | **87,951,102,395** | **26,271,204,918** | **87,101,314,059** | **26,263,534,764** |
| | | | | |
| ගෙවන ලද පොලී | (1,201,577,331) | (866,669,765) | (1,187,544,268) | (861,844,045) |
| ගෙවන ලද ලාභාංශ | (15,000,000) | - | | - |
| ඒකාබද්ධ අරමුදලට දායකකම්වය | (1,000,000,000) | - | (1,000,000,000) | - |
| ගෙවන ලද කල්බදු වාරික | (13,144,185) | (11,791,146) | (8,713,127) | (7,879,090) |
| ගෙවන ලද පාරිතෝෂික | (958,193,747) | (707,473,364) | (957,329,817) | (705,732,188) |
| ගෙවන ලද බදු | (4,865,374,776) | (1,214,907,760) | (4,846,391,619) | (1,206,143,694) |
| **මෙහෙයුම් කාර්ය මගින් ලැබූ ශුද්ධ මුදල්** | **79,897,812,356** | **23,470,362,883** | **79,101,335,227** | **23,481,935,747** |
| | | | | |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | |
| දේපළ , පිරියත උපකරණ පවරා ගැනීම | (1,142,798,335) | (662,158,449) | (1,136,039,715) | (626,963,773) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 40,872,683 | 20,227,105 | 40,872,683 | 17,827,105 |
| විලම්බිත බදු ආදායම -කොළඹ තෙල් බැංකුව | - | (2,610,294) | | - |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | (38,973,434,459) | (2,291,419,592) | (38,973,434,459) | (2,291,419,592) |
| අස්පෘශ්‍ය වත්කම් පවරා ගැනීම | (1,612,761,214) | (652,803,511) | (1,612,461,214) | (652,803,511) |
| කල්බදු වත්කම් පවරා ගැනීම | - | (663,157) | - | (663,157) |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල | (275,415) | - | (275,415) | |
| ලැබූ ලාභාංශ | 6,268,528,124 | 1,872,229,486 | 6,268,528,124 | 1,871,787,555 |
| ණය ලැබීම් | 67,609,919 | 242,864,165 | 55,185,112 | 142,288,972 |
| ලැබූ පොලිය | 8,309,145,982 | 2,209,793,875 | 8,119,641,864 | 2,157,186,471 |
| CWIT සමාගමෙන් ලැබූ පෙර ගෙවුම් ගාස්තු | 4,050,000,000 | - | 4,050,000,000 | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල | 12,937,446 | 22,068,135 | 12,937,446 | 22,068,135 |
| වෙනත් මූල්‍ය වත්කම් මගින් ලැබූ ශුද්ධ උත්පාදන | (50,551,175,436) | (1,852,498,417) | (50,369,859,460) | (1,821,106,053) |
| **ආයෝජන වලින් ලැබූ (භාවිතා කල) ශුද්ධ මුදල්** | **(73,531,350,704)** | **(1,094,970,654)** | **(73,544,905,033)** | **(1,181,797,848)** |
| | | | | |
| **මුදල් යෙදවුම් මගින් ලැබූ මුදල් ප්‍රවාහයන්** | | | | |
| ලබාගත් ණය ශ්‍රී ලංකා රජය වෙත ආපසු ගෙවීම | (6,665,443,302) | (6,107,132,237) | (6,665,443,302) | (6,107,132,237) |
| ලබාගත් ණය මූල්‍ය ආයතන වෙත ආපසු ගෙවීම | (3,562,120,839) | (2,332,272,918) | (3,550,819,149) | (2,326,389,836) |
| CWIT සමාගමේ වර්ෂය තුළ ආයෝජන | (2,030,907,908) | | (2,030,907,908) | |
| **මූල්‍ය කටයුතු වලින් ලැබූ (භාවිතා කල) ශුද්ධ මුදල්** | **(12,258,472,048)** | **(8,439,405,155)** | **(12,247,170,358)** | **(8,433,522,073)** |
| | | | | |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වෙනස් වීම** | **(5,892,010,394)** | **13,935,987,073** | **(6,690,740,164)** | **13,866,615,827** |
| | | | | |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ | **16,701,860,547** | **2,765,873,475** | **15,407,736,670** | **1,541,120,845** |
| | | | | |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 16)** | **10,809,850,154** | **16,701,860,547** | **8,716,996,509** | **15,407,736,670** |

පිටු අංක 92 සිට 109 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 110 සිට 131 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු කරුණු

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 1979 අංක 51 දරණ පනත මගින් 1979 අගෝස්තු 01 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබූ අතර, ඉන්පසුව මෙම පනත 1984 අංක 07 හා අංක 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

නැව් භාණ්ඩ වාහක, නැවගත කිරීම් හා ප්‍රතිනැවගත කිරීම්, නැව් භාණ්ඩ ගොඩබෑම හා ගුදම්ගත කිරීම සහ වාප්පු සේවා කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව සැපයීම හා නෞකාවලට ජලය, ඉන්ධන හා විදුලිය සැපයීම, ඛනිජතෙල් නිෂ්පාදන හා ලිහිසි තෙල් නෞකා වලට නෞකා වලින් හා ඉන්ධන ගබඩා හා ඩිපෝ අතර මෙහෙයුම් කිරීම හා නියමු කටයුතු හා මූවරිං කටයුතු සඳහා යාත්‍රා බන්කර් සහ ඩිපෝ අතර ගෙනයාම, දිය යට නෞකා අළුත්වැඩියා කිරීම හා ඒ සේවා වලට අනුශාංශික වූ වෙනත් සේවා සඳහා ජලය, ඉන්ධන හා විදුලිය සැපයීම ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතු වලට ඇතුළත් වේ.

### 1.3 මුදල් වර්ෂය

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ කාලසීමාව දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වේ.

### 1.4 ලියාපදිංචි කාර්යාලය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය අංක 19, චෛත්‍ය පාර, තැ.පෙ.595, කොළඹ 01 යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.5 සේවක සංඛ්‍යාව

2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යාව 8, 516 ක් විය. (2021- 8,997)

### 1.6 නිකුත් කිරීම සඳහා අවසරය ලැබූ දිනය

2023.02.20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඉදිරිපත් කල යෝජනාවකට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර ලබා දෙන ලදී.

## 2 විශේෂ ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1 පිළියෙල කිරීමේ පදනම

අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ සාධාරණ අගයට ගණනය කරනු ලබන වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය ලෙස හඳුන්වනු ලබන මූල්‍ය ලේඛන පාදක කර ගෙන නොව, අතීත පිරිවැය සම්මතයන් පදනම් කර ගෙනය.
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිත්‍ය ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය කරනු ලැබේ. සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති අදාළ කරගනු ලබන ක්‍රියාවලියේදී කළමනාකාරීත්වයෙන්ද සිය අනුකූලතාවය දැක්වීම අවශ්‍ය කෙරේ.

### 2.2 ඒකාබද්ධකරණය

#### 2.2.1 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගමක් යනු අයිතියෙන් භාගයකට වඩා කොටස්කාරීත්වය සමඟ මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීම සඳහා සමූහයකට බලය ඇති ඒකකයකි. පරිපාලිත සමාගමක

පාලනය සමූහයට පවරණ දින සිට පරිපාලිත සමාගම පූර්ණ ලෙස ඒකාබද්ධ කරන ලද සමාගමක් ලෙස සැලකේ. පාලනය අවසන් වන දින සිට එහි ඒකාබද්ධතාවය අවසන් වේ.

අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය, ව්‍යාපාර ඒකාබද්ධ කිරීම සඳහා සමූහය විසින් අදාළ කරගනු ලැබේ. පරිපාලිත සමාගම සමන්විත වන්නේ පවරනු ලබන වත්කම් වල සාධාරණ අගය හා පරිපාලිත සමාගම විසින් දරනු ලබන වගකීම් වලිනි. පරිපාලිත සමාගම සම්පූර්ණයෙන්ම අධිකාරියට අයිති වන බැවින් පරිපාලිත සමාගමේ පාලනයට යටත් නොවන කටයුතු, සමූහය විසින් පිළිගනු නොලැබේ.

අන්තර් ස්ථිතික ගනුදෙනු, ශේෂ, සමූහයේ ස්ථිති අතර සිදුවන ගණුදෙනු මත ආදායම් හා වියදම් අත්හැර දමනු ලැබේ. තවද වත්කම් වලදී හඳුනාගනු ලබන අන්තර් ස්ථිතික ගනුදෙනු වලදී ඇතිවන ලාභ සහ පාඩු ද අත්හැර දමනු ලැබේ. සමූහය විසින් අනුගමනය කරනු ලබන ස්ථිතික ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය මත පරිපාලිත සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති අවශ්‍ය පරිදි වෙනස් කර ඇත.

### 2.2.2 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගමක් යනු සමූහය තුළ විශේෂ බලයක් ඇති, එහෙත් පාලන බලය නොමැති සාමාන්‍යයෙන් 20% ක සෘජු හෝ වක්‍ර ඡන්ද අයිතිය ඇති කොටස් හිමිකාරීත්වයක් සහිත ස්ථිතිකයකි. ආශ්‍රිත සමාගමක යොදවන ආයෝජනයක් ගිණුම්ගත කරනුයේ ස්කන්ධ ගිණුම් ක්‍රමය භාවිතා කිරීමෙනි. ස්කන්ධ ක්‍රමය යටතේ, ආයෝජනය මූලිකව පිරිවැයක් ලෙස හඳුනාගන්නා අතර පැවරුම් දිනයෙන් පසු ආයෝජිතයාගේ ලාභයේ හෝ පාඩුවේ කොටස හඳුනාගැනීම සඳහා ධාරණ අගය වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලැබේ.

පසු පැවරුම් මගින් සමූහයේ ලාභයේ හෝ පාඩුවේ කොටස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගන්නා අතර ආදායමෙහි පසු පැවරුම් කොටස්හි යෙදවුම් ආයෝජනයේ ධාරණ අගයට කරන අනුරූපී ගැලපුම් සහිතව වෙනත් විස්තීර්ණ ආදායම් මගින් හඳුනාගනු ලැබේ.

ආශ්‍රිත සමාගමේ ආයෝජනය හානිකරණය වී ඇත්ද යන බව සනාථ වන විෂයානුබද්ධ සාක්ෂි තිබේ ද යන්න, සමූහය විසින් සෑම වාර්තා කරන දිනයකදීම නිශ්චය කරනු ලබයි. එසේ වී ඇත්නම් හානිකරණ අගය ආශ්‍රිත සමාගමෙන් ලැබිය යුතු මුදලේ සහ එහි ධාරණ අගය අතර පවතින වෙනස ලෙස සමූහය විසින් ගණනය කරන අතර, එම මුදල් ආශ්‍රිත සමාගමෙහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආසන්න ලාභ/(පාඩු) කොටස වශයෙන් හඳුනාගනු ලැබේ.

## 2.3 විදේශ මුදල් පරිවර්තනය

### 2.3.1 ව්‍යවහාරික මුදල් හා ඉදිරිපත් කරන මුදල්

සමූහයේ එක් එක් ඒකක වල මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වන ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ එම ඒකකය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාරයේ පවතින මුදල් වර්ගය භාවිතා කරමිනි. ඒකාබද්ධ මුදල් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ සමූහය ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

### 2.3.2 ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් මගින් කෙරෙන ගනුදෙනු, ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙනු සිදු කරන දිනයන්හි පවත්නා විනිමය අනුපාතය භාවිතා කරමිනි. මෙවැනි ගණුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් ලෙස හා විදේශ මුදල් මගින් දක්වන වර්ෂාවසාන මූල්‍ය විදේශ විනිමය ලාභ

සහ පාඩු, විදේශ මුදල් ඒකක වත්කම් සහ වගකීම් වලින් විනිමය අනුපාත පරිවර්තනය සවිස්තරාත්මකව ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනු ලැබේ.

ක්‍රමක්ෂ පිරිවැය විචල්‍යතාවයට අදාළ පරිවර්තන වෙනස්කම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගනු ලැබේ.

**2.4 දේපල, පිරියත සහ උපකරණ**

**2.4.1**

අදාළ දෙපාර්තමේන්තු විසින් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කිරීමෙන් පසු නොනිමි වැඩ ගිණුම් වල පවතින පිරිවැය ප්‍රාග්ධනීත කරනු ලැබේ.

**2.4.2**

සමූහයේ කළමනාකාරීත්වය නිගමනය කරන පරිදි මෙහෙයුම් කිරීම සඳහා වත්කම් ස්ථානගත කිරීමට දරණ පිරිවැයක් ඇත්නම් එයද ඇතුළත් කර දේපළ, පිරියත හා උපකරණ මූලිකව පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසුවය. වෙනත් දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසුවය.

පසුකාලීන පිරිවැය වත්කම්හි ධාරණ අගයෙහි ඇතුළත් කිරීම හෝ වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම වත්කම හා බැඳුනු ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ලැබී වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කිරීමට හැකියාව ඇතිවීමෙන් පසුව පමණි. අනෙකුත් සියළු අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා වැය කරන මුල්‍ය වර්ෂය තුළ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

ඉඩම්වල අගය ක්ෂය නොකෙරේ. අනෙකුත් වත්කම් වල ක්ෂය ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය මගින් ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය මත ප්‍රතිපාදන සැලසීම සඳහා අනෙකුත් වත්කම් වන ක්ෂය සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ.

| වත්කම් කාණ්ඩය | | ප්‍රතිශතය |
|---|---|---|
| මෙහෙයුම් ගොඩනැඟිලි හා ව්‍යුහ | වසර 2 – 115 දක්වා | 0.86% - 50% |
| පාවෙන උපකරණ | වසර 1 – 22 දක්වා | 4.54% - 100% |
| මෙහෙයුම් උපකරණ | වසර 2 - 25 දක්වා | 4% - 50% |
| යන්ත්‍ර හා උපකරණ | වසර 1 – 20 දක්වා | 5% - 100% |
| කාර්යාල හා සුභසාධක ගොඩනැඟිලි | වසර 2 – 73 දක්වා | 1.36% - 50% |
| පරිගණක දෘඩාංග | වසර 1 – 15 දක්වා | 6.66% - 100% |
| මෝටර් රථ | වසර 1 – 18 දක්වා | 5.55% - 100% |
| විදුලි හා විද්‍යුත් උපකරණ | වසර 1 – 12 දක්වා | 8.33% - 100% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | වසර 1 – 15 දක්වා | 6.66% - 100% |
| සේවක නිල නිවාස හා වෙනත් ගොඩනැඟිලි | වසර 13 – 43 දක්වා | 2.32% - 7.69% |
| වෙනත් වත්කම් | වසර 1 – 20 දක්වා | 5% - 100% |

වත්කමක ධාරණ අගය, එහි ප්‍රතිලාභය ඇස්තමේන්තුගත අගයට වඩා වැඩි නම් එම වත්කමේ ධාරණ අගය එහි ඇස්තමේන්තුගත ප්‍රතිලාභ්‍ය අගයට ලියා තබනු ලැබේ..

නොනිමි වැඩ ප්‍රතිපත්තිය වන්නේ "අදාළ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිම කිරීමේ සහතිකය නිකුත් කල පසු නොනිමි වැඩ ගිණුමේ පවතින පිරිවැය ප්‍රාග්ධනිත කිරීමයි".

### 2.4.3 අස්පෘශ්‍ය වත්කම්

ලබාගෙන ඇති පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති ප්‍රාග්ධනිත කරනු ලබන්නේ ඒවා සපයා ගැනීමට වැය කල පිරිවැය හා අදාළ මෘදුකාංග හා පද්ධති භාවිතා කිරීමට පදනම් වූ හේතුව පදනම් කරගෙනය. පසුකාලීනව ලබා ගන්නා අස්පෘශ්‍ය වත්කම් සටහන් කරනු ලබන්නේ ඒවාහි සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකිරීමෙන් පසුව සහ පිරිවැයටය. එම වත්කම් වල ඇස්තමේන්තුගත ජීව කාලය ඉක්මවා පහත දැක්වෙන පරිදි ක්‍රමක්ෂය කෙරේ.

| | | |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | වසර 1 – 17 දක්වා | 5.88% - 100% |

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය, යෙදවූ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

### 2.4.4 ආයෝජන දේපළ

කුලී අයකිරීම මගින් ආදායම් ඉපැයීම සඳහා යොදවන ආයෝජන දේපල, මූලිකව පිරිවැයට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට පෙර පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ප්‍රත්‍යාගණනය කරන ලද අගයට ආයෝජන දේපළ පවත්වාගෙන යන ලදී. ආයෝජන දේපලවල විකුණුම් අගය සාධාරණ අගයට පුළුල්ව සැසඳුන බැවින්, ආයෝජන දේපල වල ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම ප්‍රත්‍යාගණනය කල දිනට උපකල්පිත පිරිවැයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ආයෝජන දේපල සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු සමුච්චිත හානිකරණ තුළින් පැන නගින අදේශිත පිරිවැයක් වශයෙනි. ඉන් අනතුරුව අනෙකුත් ආයෝජන දේපළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකළ පිරිවැයක් ලෙස ඇතුළත් කර ඇත.

ඉඩම්වල ක්ෂය ගණනය කරනු නොලැබේ. ගොඩනැගිලි වල ක්ෂය අස්තමේන්තුගත පිරිවැයට හෝ උපකල්පිත පිරිවැයට ප්‍රතිපාදන සැලසීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරනමින් පහත දැක්වෙන ආකාරයෙන් ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ආයෝජන දේපළ | වසර 05 - 100 | 1% - 20% |

### 2.4.5 කල්බදු වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (කල්බදු) ප්‍රකාරව, කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී, කොන්ත්‍රාත්තුව කල්බදු වත්කමක් ද එසේ නොමැතිනම් එයට කල්බදු වත්කමක් ඇතුළත් වන්නේද යන්න පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තක්සේරුවක් කරනු ලැබේ. ගිවිසුමෙහි කිසියම් කාලසීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතියක් දැක්වෙන්නේනම් එය කල්බදු වත්කමක් ලෙස සලකනු ලැබේ. කොන්ත්‍රාත්තුවෙහි නියමයන් හා කොන්දේසි වෙනස් වේ නම් පමණක් කොන්ත්‍රාත්තුව කල්බදු වත්කමක්ද, එසේ නොමැතිනම් එහි කල්බදු වත්කමක් ඇතුළත් වේද යන බව හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එය ප්‍රති තක්සේරු කරනු ලැබේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ බදු ගැණුම්කරු ලෙස සමූහය**

කල්බදු ගිවිසුමක් ආරම්භයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එම වත්කමෙහි භාවිත අයිතියක් හා කල්බදු වගකීමක් පවතීද යන්න හඳුනාගනු ලබයි. භාවිත අයිතිය ඇති වත්කම මූලිකව එහි මූලික වගකීම් තක්සේරුව, ලබාගත් බදු දීමනාව හැර ආරම්භක දිනයේදී හෝ ඊට ප්‍රථම කල ගෙවීම්, බදු ගැනුම්කරු විසින් වැය කරන ලද සෘජු වියදම් හා පිරිවැය, වට්ටෝරු භාණ්ඩ ලේඛන නිපැයීමට නොගන්නේනම් වත්කම දේපළ විහේදනය කර ඉවත් කිරීම සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කල මුදල ඇතුළත් පිරිවැයට ගණනය කරනු ලැබේ.

ආරම්භක දිනයේදී බදු ගැනුම්කරුවකු බදු වගකීම එදිනට නොගෙවන කල්බදු ගෙවීම් වත්මන් වටිනාකමට තක්සේරු කල යුතුය. තක්සේරු අනුපාතය කෂ්ණිකව තීරණය කල හැකි නම්, කල්බදුයේ සඳහන් පොලී අනුපාතය භාවිතා කරමින් කල්බදු ගෙවීම් වට්ටම් කල යුතුය. අනුපාතය ක්ෂණිකව තීරණය කල නොහැකි නම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි ණය ගැණුම් වර්ධක අනුපාතය භාවිතා කරයි.

**වත්කම් භාවිත අයිතිය හා එහි කල්බදු වගකීම පිළිබඳ පසු තක්සේරුව**

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ට අනුව, වත්කම් පිරිවැය අඩු කිරීමෙන් පසු සමුච්චිත තක්සේරු පිරිවැය ආකෘතිය අදාළ කරගනිමින් වත්කම් භාවිත අයිතිය තක්සේරු කිරීමද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට අනුව දේපළ, පිරියත හා උපකරණ හා ඒවාහි සමුච්චිත හානිකරණ ආලහ තක්සේරු කිරීම හා කල්බදු වගකීම් වල ප්‍රති තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ගැලපුම් ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉන් පසුව, ගිණුම් වල විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රතිගණනය කිරීමක් හෝ බදු විකරණයක් කර ඇත්නම් ඒවා ප්‍රතිවර්තනය කිරීමට හෝ ප්‍රතිශෝධිත ස්ථාවර කල්බදු කුලිය ගෙවීම් ප්‍රතිවර්තනය කිරීමට බදු වගකීම් මත ලැබෙන පොලිය ප්‍රතිවර්තනය කිරීමට බදු වගකීම් මත ලැබෙන පොලිය ප්‍රතිවර්තනය කිරීම සඳහා ධාරණ අගය වැඩි කිරීම මගින් සහ ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රතිවර්තනය කිරීම සඳහා ධාරණ අගය අඩු කරමින් කල්බදු වගකීම් තක්සේරු කරනු ලැබේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය බදු දීමනාකරු ලෙස**

කල්බදු ගිවිසුම මෙහෙයුම් කල්බදුකරයක් ලෙස වර්ගීකරණය නොකරන්නේ නම් එමෙන්ම උපකල්පිත වත්කමක අවදානම් හා ප්‍රතිලාභ හිමිකාරීත්වයට පැවරේනම් කොන්ත්‍රාත්තුව ආරම්භයේදී උපකල්පිත අගය මූල්‍ය කල්බදුකරයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වර්ගීකරණය කරයි. එවැනි වර්ගීකරණයක් රඳා පවතිනුයේ කාර්යයේ ද්‍රව්‍යය මත මිස කොන්ත්‍රාත්තුවේ ස්වභාවය මත නොවේ. බදු විකරණයක් ඇත්නම් පමණක් බදු වර්ගීකරණය පසුව ප්‍රතිගණනය කරනු ලැබේ.

**මූල්‍ය කල්බදු**

ආරම්භක දිනයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය කල්බදු යටතේ පවත්වාගෙන යන වත්කම් හඳුනාගෙන ඒවා කල්බදුකරයේ ශුද්ධ අයෝජනයට සමාන ලැබිය යුතු මුදලක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. කල්බදුයේ අන්තර්ගත අනුපාතිකය කල්බදුයේ ශුද්ධ ආයෝජනය තක්සේරු කිරීමට භාවිතා කරනු ලැබේ.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කල්බදුකරයේ පවතින ශුද්ධ ආයෝජන මත ලැබෙන නිත්‍ය කාලානුරූපී ආදායම් අනුපාතිකයක් ප්‍රතිවර්තනය වන රටාවක් පදනම් කරගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය කල්බදු කාලපරිච්ඡේදය මත ලැබෙන මූල්‍ය ආදායම හඳුනාගනී. කල්බදුකරයේ කාලීන මූල්‍ය අදායම ක්‍රමවත් හා ප්‍රමාණුකූල පදනමක් මත වෙන්කර, ආයෝජිත මුල් මුදල හා

නොඉපැයූ මූල්‍ය ආදායම අඩු කිරීමට කල්බදුකරයේ දළ ආයෝජනයේ කාලය සඳහා ගෙවීම් කිරීමට අදාළ කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි දැක්වෙන හඳුනාගැනීම් අත්හැරීමේ හා හානිකරණ අවශ්‍යතා කල්බදුකරයේ ශුද්ධ ආයෝජනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ කර ගනී.

මෙම පිරිවැය පහත පරිදි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| කල්බදු මෝටර් රථය | අවු 8 – 15 | 6.66% - 12% |

**මෙහෙයුම් කල්බදු**

මෙහෙයුම් කල්බදු සඳහා ගෙවිය යුතු කල්බදු ගෙවීම් සෘජු රේඛීය පදනම මත ලැබෙන ආදායමක් ලෙස හෝ වෙනත් විධිමත් ආකාරයට එනම්, පාදක වත්කම් භාවිතයෙන් ලැබෙන ප්‍රතිලාභ වල අඩු වීම මෙම පදනමින් පෙන්නුම් කරන්නේ නම් හෝ ඒවා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනාගනු ලැබේ. ක්ෂය වීම ඇතුළුව කල්බදු ආදායම ඉපැයීමේදී වැය වන ඕනෑම පිරිවැයක් වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. මෙහෙයුම් කල්බදු ලබා ගැනීමේදී වැය වන ඕනෑම මූලික ඍජු පිරිවැයක් පාදක වත්කමේ ධාරණ අගයට එකතු කරනු ලබන අතර කල්බදු ආදායම් පදනම මත කල්බදු කාලසීමාව පුරා දිවෙන වියදම් ලෙස මෙම පිරිවැය හඳුනාගනු ලැබේ.

මෙහෙයුම් කල්බදු වලට යටත් ක්ෂය විය හැකි පාදක වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒ හා සමාන වෙනත් සාමාන්‍ය ක්ෂය ප්‍රතිපත්ති වලට සමානුයෝග වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව ක්ෂය ගණනය කර මෙහෙයුම් බදුකරයකට යටත් පාදක වත්කමක් හානිකරණය වී ඇත්ද යන්න තීරණය කිරීමට සහ හානිකරණ ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 අදාළ කර ගනු ලැබේ.

**2.4.6 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය**

සෑම ගිණුම් වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදී, සමූහයේ වත්කම් හානිකරණය වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත හා උපකරණ, ආයෝජන දේපළ වල සහ අස්පෘෂ්‍ය වත්කම් වල ධාරණ අගය සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. හානිකරණයක් සිදු වී ඇත්නම්, හානිකරණ අලාභයේ (ඇත්නම්) ප්‍රමාණය තීරණය කිරීම සඳහා වත්කමේ ප්‍රතිලාභ්‍ය අගය ඇස්තමේන්තු කරනු ලැබේ. තනි වත්කමක ප්‍රතිලාභ්‍ය මුදල ඇස්තමේන්තු කිරීමට නොහැකි වේ නම්, සමූහය විසින් මුදල් ජනන ඒකකය නිශ්චය කර වත්කම අයත් වන මුදල් ජනන ඒකකයේ ප්‍රතිලාභ්‍ය අගය ඇස්තමේන්තුගත කරනු ලැබේ.

ප්‍රතිලාභ්‍ය වටිනාමක යනු විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් පසුව ඇති ධාරණ අගයේ ඉහළ වටිනාකම හා භාවිතයේ පවතින අගය වේ. භාවිතයේ පවතින අගය තක්සේරු කිරීමේදී මුදල් වල වත්මන් වෙළෙඳපොළ තක්සේරුව ප්‍රතිවර්තනය වන පූර්ව බදු මට්ටම ගණනය කිරීමේදී ඇස්තමේන්තු කරන අනාගත මුදල් ප්‍රවාහ ඒවාහි වත්මන් අගයට අඩුකර ඇති අතර අනාගත මුදල් ප්‍රවාහ සඳහා විශේෂිත වන වත්කම් ඇස්තමේන්තුගත කිරීමේ අවධානම ගැලපුම් කර නොමැත.

වත්කමක ප්‍රතිලාභ්‍ය මුදල (මූල්‍ය උත්පාදන ඒකකය) එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තුගත කර ඇත්නම් වත්කමේ ධාරණ අගය (මූල්‍ය උත්පාදන ඒකකය) අයකර ගත හැකි අගය දක්වා අඩු කෙරේ. හානිකරණ පාඩුවක්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් ක්ෂණිකව හඳුනාගනු ලැබේ.

## 2.5 මූල්‍ය වත්කම්

### 2.5.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය සිය මූල්‍ය වත්කම් පහත සඳහන් ගණනය කිරීමේ කාණ්ඩ යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරන මූල්‍ය වත්කම්
- වෙනත් විස්තීරණ ආදායම මත සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය වත්කම්
- ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් කළමනාරණය හා මූල්‍ය ප්‍රවාහයේ ගිවිසුම් ප්‍රකාර කොන්දේසි මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහයේ ව්‍යාපාර ආකෘතිය වර්ගීකරණය මත රඳා පවතී.

සාධාරණ අගය මත තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම්, ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හෝ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශන වල වාර්තා කරනු ලැබේ. විකිණීම සඳහා නොවන ස්කන්ධ උපකරණ මත කරන ආයෝජන සම්බන්ධයෙන් නම් මෙය රඳපවතිනුයේ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් අදාළ ස්කන්ධ ආයෝජනය ගිණුම්ගත කිරීමට හඳුනාගන්නා මුල් අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය විසින් වෙනස් කළ නොහැකි තෝරා ගැනීමක් සිදු කර ඇද්ද යන කරුණ මතය. ආයතනය සහ සමූහය මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එහි ව්‍යාපාරික ආකෘතිය එම වත්කම් කළමනාකරණය කිරීම සඳහා වෙනස් වන අවස්ථාවලදී පමණි.

### 2.5.2 හඳුනාගැනීම සහ මූලික තක්සේරුව

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමක් පවරාගනු ලැබීමකට හෝ නිකුත් කිරීමකට ඍජුවම සම්බන්ධතාවක් පෙන්නුම් කරන කාර්ය පිරිවැය ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගය තක්සේරු නොකරන්නේ නම්, මූල්‍ය වත්කම එහි සාධාරණ අගය සමඟ තක්සේරු කරනු ලැබේ. ලාභ හෝ පාඩු මගින් අවධාරණය වන මූල්‍ය වත්කමෙහි කාර්ය පිරිවැය විස්තීර්ණ ආදායමෙන් වියදමක් ලෙස සැලකේ.

### 2.5.3 අපර තක්සේරුව

- **ණය ලේඛන වල ආයෝජනය**

ණය ලේඛන මත සිදුකරන අපර තක්සේරු රඳාපවතිනුයේ වත්කම් කළමනාකරණය සඳහා වූ සමූහයේ ව්‍යාපාර ආකෘතිය සහ වත්කමෙහි ගති ස්වභාවයේ මුදල් ප්‍රවාහය මතය. ණය ලේඛන වර්ගීකරණය කරන තක්සේරු කාණ්ඩ තුනක් ඇත.

**ක්‍රමක්ෂය පිරිවැය**

මුල් මුදල හා පොළී ගෙවීම සඳහා පමණක්ම වන කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන වත්කම්, ක්‍රම ක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොළී ආදායම ක්‍රියාත්මක පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. හඳුනා ගැනීම අත්හැර දැමීම හේතුකොට ගෙන පැන නගින කිසියම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් වාර්තා මගින් ඍජුවම හඳුනාගනු ලබන අතර, එම විදේශ විනිමය ලාභ හා පාඩු සමඟ එක්ව ඉදිරිපත් කරනු ලැබේ.

**වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය (FVOCI)**

මුල් මුදල හා පොළී ගෙවීම සඳහා පමණක්ම නියෝජනය වන වත්කම් වල මුදල් ප්‍රවාහයන් කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ හා මූල්‍ය වත්කම් විකුණුම් සඳහා මූල්‍ය ප්‍රවාහ සඳහා පවත්වාගෙන

යනු ලබන වත්කම්, වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය මත තක්සේරු කරනු ලැබේ. විස්තීරණ ආදායම්හි හඳුනා ගනු ලබන හානිකරණ ලැබීම් සහ පාඩු, පොලී ආදායම සහ විදේශ විනිමය ලැබීම් සහ පාඩු හඳුනාගැනීම සඳහා මිස, අගයේ වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් මගින් පිළිගනු ලැබේ. මූල්‍ය වත්කම හඳුනානොගන්නා විටදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි පූර්වයේදී හඳුනාගන්නා ලද සමුච්චිත ලාභ හෝ පාඩු ස්කන්ධ ආදායමේ සිට විස්තීර්ණ ආදායම දක්වා ප්‍රතිවර්ගීකරණය කර වෙනත් විස්තීර්ණ ආදායමෙහි ලාභ හෝ පාඩු ලෙස හඳුනාගනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ පාඩු වෙනත් ලැබීම්/(පාඩු) සහ හානිකරන වියදම් ලෙස වෙනම රේඛීය අයිතම ලෙස විස්තීර්ණ ආදායමෙහි ගෙනහැර දක්වනු ලැබේ.

**ලාභ හෝ පාඩු මත සාධාරණ අගය (FVTPL)**

ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගය සඳහා වූ නිර්ණායකයන්ට අනුගත නොවන වත්කම් ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට තක්සේරු කරනු ලැබේ. ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට පසුකාලීනව තක්සේරු කරන ණය ආයෝජනයක ලාභය හෝ අලාභය විස්තීර්ණ ආදායම තුළින් හඳුනාගෙන එය පවතින කාලසීමාව තුළ වෙනත් ලාභ/ (පාඩු) ගිණුම් ඇතුළත ශුද්ධ ආදායමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

- **ස්කන්ධ උපකරණ වල ආයෝජන**

සියළුම ස්කන්ධ ආයෝජන ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය විසින් පසුකාලීනව සාධාරණ අගයට තක්සේරු කරනු ලැබේ. සමූහයේ කළමනාකාරීත්වය විසින් සාධාරණ අගයේ ලාභ සහ පාඩු වෙනත් විස්තීර්ණ ආදායමෙහි ස්කන්ධ ආයෝජන වල ඉදිරිපත් කිරීමට තෝරාගෙන ඇති බැවින් ආයෝජන හඳුනාගැනීම හේතුකොට ගෙන පසුව විස්තීර්ණ ආදායම සඳහා සාධාරණ අගයේ ලාභ සහ පාඩු ප්‍රති වර්ගීකරණය කරනු නොලැබේ.

ගෙවීම් ලබා ගැනීම සඳහා සමූහයේ අයිතිය තහවුරු වූ විට විස්තීර්ණ ආදායමෙහි වෙනත් ආදායම් ලෙස පවතින ආයෝජන වලින් ලැබෙන ලාභාංශ අඛණ්ඩව හඳුනා ගනු ලැබේ. ලාභ හෝ පාඩු මත මූල්‍ය වත්කම් සාධාරණ අගයට තක්සේරු කිරීම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ලාභ / (පාඩු) අදාළ පරිදි හඳුනාගනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම්හි සාධාරණ අගයට තක්සේරු කරනු ලබන ස්කන්ධ ආයෝජන වල හානිකරණ පාඩු (සහ හානිකරණ පාඩු වල ප්‍රතිවර්තනය) සාධාරණ අගයේ වෙනත් මාරු කිරීම් මගින් වෙන් වශයෙන් වාර්තා කරනු නොලැබේ.

### 2.5.4 හානිකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා සමූහය විසින් ඒවාහි ක්‍රමක්ෂය පිරිවැය හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය මත ධාරණය වන ණය උපකරණ ආශ්‍රිතව සිදු විය හැකි බැර අලාභ තක්සේරු කරනු ලබයි. මේ සඳහා අදාළ කර ගනු ලබන හානිකරණ ක්‍රමවේදය රඳාපවතිනුයේ ණය අවදානමෙහි විශාල වැඩිවීමක් සිදු වී ඇත්ද යන සාධකය මතය.

වෙළඳ ලැබීම් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ කරගනු ලබන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි ඇති වෙළෙඳ ලැබීම් වල මූලික හඳුනාගැනීම් වල අපේක්ෂිත දිගු කාලීන අලාභ හඳුනාගැනීමට අවශ්‍ය කරනු ලබන මූල්‍ය උපකරණ මගින් අනුමත කර ඇති සරල ප්‍රවේශය වේ. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ ලැබීම් වල මූලික හඳුනාගැනීම මගින් අපේක්ෂිත ජීව කාල පාඩු හඳුනාගැනීම වේ. අපේක්ෂිත පාඩු වල අනුපාතය ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් විස්තර හා ලබා ඇති පෙර අනුරූපී බැර පාඩු මත පදනම්ව ගණනය කරනු ලබයි. පෙර අලාභ අනුපාත, සාර්ව

ආර්ථික සාධක වල වත්මන් හා ඉදිරි තොරතුරු වල පිළිඹිබු වනසේ ගලපනු ලැබේ. (කළමනාකරණ තීරණ මත වෙනස් විය වේ.

**හඳුනාගැනීමෙන් ඉවත් කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය;

- මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහයට කොන්ත්‍රාත්තුමය අයිතීන් වල කාලය ඉක්මයාම, හෝ
- මූල්‍ය වත්කම් මාරු කිරීමෙන් පසු එම මාරු කිරීම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන අවස්ථාවලදී පමණක්,

මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

**සාධාරණ අගය ගණනය කිරීම**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13 ප්‍රකාරව කිසියම් වත්කමක් විකිණීමට නියම කරන මිල හෝ වෙළඳපොල හවුල්කරුන් අතර විධිමත් ගනුදෙනුවකදී කිසියම් වගකීමක් පැවරීමට තක්සේරුකරන දිනයේදී ගෙවන මිල, සාධාරණ අගය යනුවෙන් හඳුන්වනු ලැබේ. වත්කමක් විකිණීම සඳහා වන ගණුදෙනුව හෝ වගකීමක් පැවරීම සිදු වනුයේ වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළඳපොළ තුළ හෝ ප්‍රධාන වෙළඳපොළක් නොමැති විටකදී, වත්කම හෝ වගකීම සඳහා වඩාත් වාසිදායක වෙළඳපොළ තුළ බව සාධාරණ අගය ගණනය කිරීම මගින් උපකල්පනය කෙරේ.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගයේ ප්‍රමාණය හා එය භාවිතා කිරීම මගින් වෙළෙඳපොළ හවුල්කරුවෙකුහට එම වත්කම උපරිම ප්‍රයෝජනයට ගත හැකි ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන එය වෙනත් වෙළෙඳපොළ හවුල්කරුවෙකු වෙත විකිණීම මගින් එහි උපරිම හා හොඳම ප්‍රයෝජනය ගැනීමේ හැකියාව නිගමනය කරනු ලැබේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය සුදුසු තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කරන අතර, නිරීක්ෂණය කල හැකි අදාළ යෙදවුම් වල භාවිතය උපරිම කරමින් හා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වල භාවිතය අවම කරමින් ඇගයීම් කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත අධිකාරිය සහ සමූහය සතුව පවතී. ඒ සඳහා පහත සඳහන් යෙදවුම් භාවිතා කරනු ලැබේ.

පළමු වන මට්ටමේ යෙදවුම් : තක්සේරු කරනු ලබන දිනයට ස්ථීතියට ප්‍රවේශ විය හැකි අනන්‍ය වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොළෙහි පවතින මිල (ගැලපුම් නොකල)

දෙවන මට්ටමේ යෙදවුම් : වත්කම් හෝ වගකීම් සඳහා ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පළමු මට්ටමේ දත්ත වල ඇතුළත්ව පවතින මිල හැර වෙනත් යෙදවුම්

තෙවන මට්ටමේ යෙදවුම් : වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කල නොහැකි යෙදවුම්

**සාධාරණ අගයට ගණනය කරන වත්කම්**

| වත්කම් කාණ්ඩය | සටහන් අංකය | 2022.12.31 දිනට අගය | 01 මට්ටම | 02 මට්ටම | 03 මට්ටම |
|---|---|---|---|---|---|
| **වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම්** | | | | | |
| **ලැයිස්තුගත ආයෝජන** | | | | | |
| කොළඹ ඩොක්යාඩ් (පුද්.) සමාගම | 8.1 | 128,985,269 | 128,985,269 | - | - |
| **ලැයිස්තුගත නොකල ආයෝජන** | | | | | |
| කළමිබු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම | 8.2 | 3,717,215,564 | - | - | 3,717,215,564 |
| සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් සමාගම | 8.2 | 2,118,987,527 | - | - | 2,118,987,527 |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෘප් (ප්‍රයිවට්) ලිමිටඩ් | | 59,577,546,077 | | | 59,577,546,077 |
| ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් | 8.2 | 10,696,928 | | | 10,696,928 |
| කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් | | 2,030,907,908 | 2,030,907,908 | | |
| | | **67,584,339,273** | **2,159,893,177** | **-** | **65,424,446,096** |

## 2.6 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ තක්සේරු කරනු ලබන්නේ පිරිවැයේ අවමයට හා උපලබ්ධි කල හැකි ශුද්ධ අගයටය. පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය අනුගමනය කරමිනි. වට්ටෝරු භාණ්ඩ නෞකා සහ නැව් බඩු මෙහෙයුම් උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් සහ පරිභෝජ්‍ය භාණ්ඩ හා ඉන්ධන සහ ලිහිසි තෙල් වලින් සමන්විත වේ. වට්ටෝරු භාණ්ඩ පවත්වාගෙන යනු ලබන්නේ පරිභෝජනය සඳහා මිස ප්‍රති විකිණීම සඳහා නොවේ.

## 2.7 වෙළඳ සහ වෙනත් ලැබීම්

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ඉටුකරන සේවා වෙනුවෙන් පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර පවත්වාගෙන යාමේ මෙහෙයුම් චක්‍රය අනුව ලැබීම් අපේක්ෂා කරන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වෙළෙඳ ලැබීම් සාධාරණ අගයට හඳුනාගැනීමේදී විශේෂ මූල්‍ය සංරචක ඇතුළත් වේ නම් වෙළඳ ලැබීම් එහි සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර එසේ නොමැති නම් වෙළඳ ලැබීම් මූලිකව ගනුදෙනු මිලට හඳුනාගනු ලැබේ.

කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරින් වෙළඳ ලැබීම් රඳවා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ඒවා ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

වෙනත් ලැබීම් සාමාන්‍ය වශයෙන් පැන නගිනු ලබන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් වලට පරිබාහිරව සිදු වන මෙහෙයුම් වලිනි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ප්‍රකාරව, වෙළඳ ලැබීම් මත හානිකරණ අලාභයේ ප්‍රමාණය තක්සේරු කර හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂිත ණය අලාභ ආකෘතිය Expected Credit Losss Model (ECL) භාවිතා කරනු ලැබේ.

**සරල ප්‍රවේශය (Simplified Approach)**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි වෙළෙඳ ලැබීම් වල හානිකරණ හඳුනාගැනීම සඳහා සරල ප්‍රවේශය අනුගමනය කරයි. සරල ප්‍රවේශය අනුගමනය කිරීම හේතුකොට ගෙන බැර අවදානම් වෙනස්වීම නිරීක්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යතාවයක් ඇති නොවේ. මූලික පිළිගැනීමේ අවස්ථාවේ සිටම එක් එක් ගිණුම් වාර්තාකරණ දිනයට අපේක්ෂිත ණය අලාභ ආයුකාලය මත පදනම්ව හානිකරණ අලාභ එමගින් හඳුනාගනු ලැබේ.

ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, වෙළඳ ලැබීම් වල හානිකරණ අලාභ නිගමනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රතිපාදන න්‍යායක් (Provision Matrix) භාවිතා කරනු ලබයි. වෙළඳ ලැබීම් වල අපේක්ෂිත ආයු කාලය මත පෙර නිරීක්ෂණය වූ ගෙවීම් පැහැර හැරීමේ අනුපාතය ප්‍රතිපාදන න්‍යාය (Provision Matrix) මත පදනම් වන අතර ඉදිරි වාර්තාකරණ දිනයකදීම, පෙර නිරීක්ෂණය කරන ලද ගෙවීම් පැහැර හැරීම් වල අනුපාතය යාවත්කාලීන කරන අතර ඉදිරි කාලීන ඇස්තමේන්තු විශ්ලේෂණය කරනු ලැබේ. මෙම පදනම මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිණුම් වාර්තාකරණ දිනයට වෙළඳ ලැබීම් මත ප්‍රතිපාදන ඇස්තමේන්තු කරනු ලැබේ. කාලසීමාව තුළ හඳුනාගත් හානිකරණ අලාභ සීමා ගාස්තු අය කිරීම (හෙවත් ගෙවීම් ප්‍රතිවර්තනය) ආදායම් / වියදම් ලෙස හඳුනාගැනේ.

| | | පදනම | |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා යුධ හමුදා ප්‍රතිපාදන | මාස 12 දක්වා | නැත |
| | | මාස 12කට පසු | 50% |
| 2 | රජයේ ආයතන ප්‍රතිපාදන | මාස 12 දක්වා | නැත |
| | | මාස 12කට පසු | 100% |
| 3 | අධිකරණමය කටයුතු වලට ලක් වූ නැව් නියෝජිතයන් | | 100% |
| | නැව් නියෝජිතයින් - අතිහිටුවා ඇති සහ අක්‍රිය නැව් නියෝජිතයන් | | 100% |
| | විශාල මුදල් ප්‍රමාණයන් ගෙවීමට ඇති නැව් නියෝජිතයින් (මිලියන 1කට වැඩි) | මාස 12 දක්වා | නැත |
| | | මාස 12න් පසු | 50% |
| | අන්තර් පර්යන්ත ට්‍රක්රථ නිකුත් කිරීම් | | 25% |
| | වෙනත් විශේෂ නිකුත් කිරීම් | | 100% |

## 2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ, මුදල් සහ මුදල් හා සමාන දෑට අයත් වන්නේ අත ඇති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු හා මූලික කල් පිරීමේ කාල සීමාව තෙමසක් හෝ ඊට අඩු කාලයක් සහිත කෙටි කාලීන ඉහළ මට්ටමේ ද්‍රවශීලතා ආයෝජනයන් ය.

## 2.9 යෙදවූ ප්‍රාග්ධනය

මෙයට කොළඹ වරාය කොමිසන් සභාව, වරාය නැව් බඩු සංයුක්ත මණ්ඩලය, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව යන ආයතන වලින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරන ලද සියළු දේපළ වලට අදාළ අරමුදල් වලට අයත් සියළුම ණය, වගකීම් සහ බැඳීම් ඇතුළුව චංචල සහ නිශ්චල දේපළ මෙයට ඇතුළත් වේ.

### 2.10 මූල්‍යමය වගකීම්

සමූහය විසින් මූල්‍යමය වගකීම් වෙනත් මූල්‍යමය වගකීම් වලට වර්ගීකරණය කරනු ලබයි. සමූහයේ වෙනත් මූල්‍ය වගකීම් වලට අයත් වන්නේ ණය ගැනීම්, වෙළඳ හා වෙනත් ගෙවීම් ඇතුළත් වේ. වෙනත් මූල්‍ය වගකීම් මූලිකව තක්සේරු කරනු ලබන්නේ වෙළඳ පිරිවැය සඳහා සෘජුවම අදාළ මුදල සහ සාධාරණ අගයේ එකතුවෙනි. මූලිකව හඳුනාගැනීමෙන් අනතුරුව මෙම මූල්‍යමය වගකීම්, සඵල පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂ පිරිවැය ලෙස තක්සේරු කරනු ලැබේ. කොන්ත්‍රාත්තුමය වගකීම් නිදහස් කර අවලංගු කර හෝ අවසන් කර ඇති විට සමූහය විසින් මූල්‍ය වගකීම හඳුනාගැනීම අත්හරිනු ලැබේ.

### 2.11 වෙළඳ හා වෙනත් ගෙවීම්

වෙළඳ සහ වෙනත් ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ හා සේවා සම්බන්ධ ගෙවීම් සඳහා ඇති වගකීම් වේ. ව්‍යාපාරයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක මෙන් වෙළඳ හා අනෙකුත් ගෙවීම් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

වෙළඳ හා අනෙකුත් ගෙවීම් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයටය. මෙය ගණුදෙනු මිල වන අතර පසුව තක්සේරු කිරීමේදී මුල් ඉන්වොයිසියේ අගයට තක්සේරු කරන අතර, කෙටි කාලයක් තුළදී ගෙවීම් කිරීම කරන බැවින් මුදල් වල කාලයේ වටිනාකම වැදගත් නොවේ.

### 2.12 ණය ලබාගැනීම්

සමූහයේ ණය ගැනීම් වල ශ්‍රී ලංකා රජයෙන් හා වෙනත් මූල්‍ය ආයතන වලින් වරාය සංවර්ධන කටයුතු සඳහා ලබාගනු ලබන ණය ඇතුළත් වේ. ණය ගැනීම් මූලිකව වැය කළ ශුද්ධ ගනුදෙනුපිරිවැයේ සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. ඉන් පසුව ණය ගැනීම් පසුව ඵලදායි පොළි අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. ගිණුම් වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී පවතින පාවෙන පොළී අනුපාතිකය (ඵලදායි පොළී අනුපාතිකය) භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය ලෙස අස්ථිර අනුපාත ණය ගැනීම් තක්සේරු කරනු ලැබේ.

ණය ගැනීමේ පහසුකම් වෙනුවෙන් ගෙවන ලද ණය මුදල පිළියෙළ කිරීමේ ගාස්තුව, ව්‍යුහාත්මක ගාස්තුව, සැකසීමේ ගාස්තුව සහ කළමනාකරණ ගාස්තුව ණය මුදලේ ගනුදෙනු පිරිවැයට හඳුනාගනු ලැබේ.

ක්‍රමක්ෂ පිරිවැයට ණය මුදලේ ධාරණ අගය තක්සේරු කිරීමේදී ඇති වන විදේශ විනිමය ලාභ සහ පාඩු එක් එක් ගිණුම් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශ මගින් හඳුනාගනු ලැබේ.

### 2.13 ණය ගැනීමේ පිරිවැය

ණය ලබාගැනීමේ පිරිවැය සෘජුවම සම්බන්ධ වන්නේ පවරාගැනීම සහ සුදුසු වත්කම් ඉදිකිරීම් වෙනුවෙනි. මෙම වත්කම් ඒවාහි අපේක්ෂිත කාර්යය සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාලයක් ගතවේ. එම වත්කම් භාවිතා කිරීමට අදහස් කරන කාර්යය සඳහා සූදානම් කරන තෙක් එකී වත්කම් ඒවාහි පිරිවැයට එකතු කරනු ලැබේ.

අනෙකුත් සියළුම ණය ගැනුම් පිරිවැය ඒවා යොදවනු ලබන කාලපරිච්ඡේදය තුළ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් හඳුනාගනු ලැබේ.

## 2.14 රජයේ ප්‍රදාන

මූල්‍යමය නොවන ප්‍රදාන ඇතුළු රජයෙන් ලැබෙන ප්‍රදානයන් නිසැකවම ලැබෙන බවට හා ඒවාට අදාළ කොන්දේසි වලට සමූහය විසින් අනුකූල වන බවට ප්‍රමාණවත් සහතික වීමක් ලැබුණු විට ඒවා සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලැබේ. මෙය වන්දි ගෙවීම් සඳහා අදහස් කරන පිරිවැයට සරිලන පරිදි අවශ්‍ය කාලයේදී සළකා බලනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා අදාළ රජයේ ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම් වල ඇතුළත් කර ඇති අතර, ඒවා අදාළ වත්කම් වල අපේක්ෂිත ආයු කාලය අනුව සරල රේඛීය පදනම මත සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගනු ලැබේ.

මූල්‍යමය නොවන ප්‍රදාන, මූල්‍යමය නොවන වත්කම් වල සාධාරණ අගයට තක්සේරු කරනු ලබන අතර ප්‍රදාන සහ වත්කම් වල සාධාරණ අගයට ගිණුම්ගත කරනු ලැබේ.

## 2.15 ජංගම සහ විලම්භිත බදු

අදාළ කාලසීමාව සඳහා බදු වියදම් ජංගම සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. වෙනත් සවිස්තරාත්මක ආදායම් වල හඳුනාගනු ලබන කරුණු වලට අදාළ ප්‍රමාණය හැර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ බදු හඳුනාගනු ලැබේ. මෙම අවස්ථාවේ දී, වෙනත් සවිස්තරාත්මක ආදායම සඳහා ද බදු හඳුනාගනු ලැබේ.

ජංගම ආදායම් බදු ගෙවීම ගණනය කරනු ලබන්නේ වරාය අධිකාරියට, එහි පරිපාලිත සමාගම් වලට අදාළ ගිණුම් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී පනවනු ලබන ගෙවිය යුතු බදු මුදල පදනම් කර ගෙනය. ගෙවිය යුතු බදු මුදල පදනම් කරගෙන කළමනාකාරීත්වය විසින් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

වත්කම් වල හා වගකීම් වල සහ මූල්‍ය ප්‍රකාශන වල ධාරණ අගය අතර පැනනගින තාවකාලික විචල්‍යතාවයන් මත විලම්භිත බදු හඳුනාගනු ලැබේ. ගණුදෙනුව සිදුවන කාල වකවානුවේදී ගිණුම්වලටවත්, බදු ගෙවිය යුතු ලාභයටවත් හෝ අලාභයටවත් බල නොපවත්වන ව්‍යාපාරයකදී ඍජුවම මූලික හඳුනාගැනීම සම්බන්ධයෙන් විචල්‍යතාවයක් පැන නගින්නේ නම් විලම්භීත බදු සැලකිල්ලට ගනු නොලැබේ. වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනයට පනවා ඇති බදු අනුපාතය උපයෝගී කරගනිමින් විලම්භිත බදු ප්‍රමාණය තීරණය කර, එම විලම්භීත බදු උපලබ්ධි වූ විට හෝ විලම්භිත ආදායම් බදු වගකීම නිරවුල් වූ විට ඒවා අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

තාවකාලික විචල්‍යතාවයන් සඳහා උපයෝගී කිරීමට අනාගත බදු අයකල යුතු ලාභ පැවතිය හැකි ප්‍රමාණය අනුව පමණක් විලම්භීත බදු හඳුනාගනු ලැබේ.

ජංගම බදු වගකීම් වලට බදු වත්කම් හා වගකීම් හිලව් කිරීම සඳහා නීතිමය අයිතිය බලාත්මක කර ඇති අවස්ථාවක සහ එම බදු අයකිරීම් අධිකාරිය මගින්ම පනවා ඇති විලම්භිත බදු වත්කම් සහ වගකීම් සඳහා ආදායම් බදු හිලව් කරනු ලැබේ.

## 2.16 සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සහ නිශ්චිත දායකත්ව සැළසුම් සමූහය සතුව ඇත.

**(අ) නිශ්චිත දායකත්ව සැළසුම**

නිශ්චිත දායකත්ව සැලැසුමක් යනු සමූහය විසින් වෙනම ස්ථිතියක් වෙත නොවෙනස්වන දායකත්වයක් යටතේ ගෙවන ස්ථිර සේවක ප්‍රතිලාභයකි. ඊට වැඩිමනත් ගෙවීමක් කිරීමට නීතිමය හෝ සම්මුතික බැඳියාවක් සමූහයට නොමැත. ගෙවිය යුතු කාලය වනවිට සේවක ප්‍රතිලාභ ලෙස මෙම ගෙවීම් පිළිගනු ලැබේ.

සේවකයාගේ දළ වැටුපෙන් 15%ක් සේවක අර්ථ සාධක අරමුදලට ද 3%ක් සේවක භාරකාර අරමුදලට ද සමූහය විසින් හඳුනාගනු ලැබේ.

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම සම්බන්ධව සමූහයේ වගකීම වන්නේ ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ පවත්නා නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වත්මන් වටිනාකමය. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයු ගණක ක්‍රමය මගින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම සේවකයා විසින් වර්තමාන සහ පූර්ව කාල පරිච්ඡේදය සඳහා සේවාවන් වෙනුවෙන් උපයාගත් ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභ අඩුකරමින් නිර්ණය කරනු ලැබේ.

ආයු ගණක උපකල්පනයන් වල කර ඇති ගැලපුම් වෙනස්කම් වලින් මතුවන ආයු ගණක ලැබීම් සහ පාඩු ඒවා පැන නගින කාල සීමාව තුලදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිර වශයෙන් අරමුදල් යොදවනු නොලැබේ.

**(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ**

සේවකයා විසින් ඉටුකරනු ලබන සේවය වෙනුවෙන් ගෙවීමට අපේක්ෂා කරනු ලබන අඩු නොකරන ගෙවීම් මත කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කරනු ලැබේ.

## 2.17 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වත්මන් නීතිමය බැඳීමක් හෝ සම්මුතික බැඳීමක් ඇති අවස්ථාවක පරිමා ප්‍රතිදාන, නෛතික හිමිකම් පෑම් සහ වෙනත් වියදම් හඳුනාගනු ලැබේ. ආර්ථික වත්කම් පිටාර ගලනයක් සමූහයෙන් අපේක්ෂා කිරීමට ඉඩ ඇති අතර වටිනාකම් විශ්වාසනීයත්වයෙන් යුතුව ඇස්තමේන්තුගත කළ හැක.

වර්තමාන වගකීම හා බැඳුනු අවදානම් සහ අවිනිශ්චිතතාවයක් ඇතුළත් ගිණුම්, වාර්තාකරණ දිනයට ලබා ගත හැකි වඩාත් විශ්වසනීය සාක්ෂි මත පදනම් ව වත්මන් වගකීම් පියවීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් පිටාර යෑමේ සම්භාවිතාවය දුරස්ථ නොවේනම් සියළුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

## 2.18 ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්තු වලට එළැඹීමෙන් ලබන ආදායම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගනුදෙනුකරුවෙකු සමඟ කොන්ත්‍රාත්තුවට එළඹෙනු ලබන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 හි දැක්වෙන නිර්ණායක සපුරා ඇති අවස්ථාවලදීය. කොන්ත්‍රාත්තුව ආරම්භයේදී ගනුදෙනුකරු සමඟ ඇති කරගන්නා ගිවිසුම් වලට අනුකූලව සමූහය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිවිසුම්ගත භාණ්ඩ හෝ සේවා තක්සේරු කරන අතර ගනුදෙනුරුහට

පැවරීම සඳහා ගිවිස ගනු ලැබූ එක් එක් කාර්යසාධන වගකීම් පැවරීම සඳහා පහත සඳහන් කාර්යසාධන වගකීම්වලින් එකක් හඳුනාගත යුතුය.

(අ) නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් (හෝ භාණ්ඩ හෝ සේවා ගණනාවක්); හෝ

(ආ) ගනුදෙනුකරුහට පවරනු ලබන ආකාරයට බෙහෙවින් සමාන ආකාරයේ හෝ එකම ආකාරයේ නිශ්චිත භාණ්ඩ හෝ සේවා ගණනාවක්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආදායම් හඳුනාගනු ලබන්නේ සේවාලාභියෙකු වෙත ගිවිසගත් භාණ්ඩයක් හෝ සේවයක් (එනම් වත්කමක්) පැවරීම මගින් ආයතනය කාර්යසාධන වගකීම පිළිබඳ සෑහීමකට පත්වන කල්හිය. වත්කමක් පවරනු ලබන්නේ සේවා ලාභියා එම වත්කමෙහි පාලනය තමන් සතු කර ගන්නා විටදීය.

නියමිත කාලයෙන් පසු භාණ්ඩ වල හා සේවා වල පාලනය පවරනු ලබන විට සහ කාර්යසාධන වගකීම් පිළිබඳව සෑහීමට පත්වූ පසුව ආදායම හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය කාර්යසාධන වගකීම් ඉලක්කගත කාලයක් තුළ ඉටු කරන ලබන්නේ, කාර්යසාධන වගකීම් නිශ්චිත කාලයක් තුළ ඉටු කරන අවස්ථාවකදීය.

**ආදායම ගණනය කිරීම**

කාර්යසාධන වගකීම ඉටු වූ පසු, එම කාර්යසාධන වගකීම සඳහා වෙන් කරන ගනුදෙනු මිල ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආදායම ලෙස පිළිගනු ලබයි. ගනුදෙනු මිල තීරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ භාවිතා කරනු ලබන ව්‍යාපාර පරිචයන් ද සලකා බලනු ලැබේ. ගනුදෙනු මිල යනු තුන්වන පාර්ශ්වයන් වෙනුවෙන් අය කරනු ලබන මුදල අත්හැර, ගිවිසුම් ගත භාණ්ඩ හා සේවා ගනුදෙනුකරුවකු වෙත ලබා දීම වෙනුවට ස්ථිතිය විසින් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභය වේ. ගනුදෙනු මිල තීරණය කිරීමේදී පහත සඳහන් සියළුම කරුණු ශ්‍රී ලංකා වරාය අධිකාරය සහ සමූහය විසින් සලකා බලනු ලැබේ.

- විචල්‍ය ප්‍රතිශ්ඨාව
- විචල්‍ය ප්‍රතිශ්ඨාවේ සංරෝධක ඇස්තමේන්තුව
- කොන්ත්‍රාත්තුවේ පවතින විශේෂිත මූල්‍ය සංරචකයන් පැවතීම
- මූල්‍යමය නොවන ප්‍රතිශ්ඨාව
- ගනුදෙනුකරුවෙකුහට ගෙවන ප්‍රතිශ්ඨාව

ඉටුකරන ලද හඳුනාගත හැකි එක් එක් ප්‍රධාන පෙලේ සේවාවන් හඳුනාගැනීම සඳහා සමූහය විසින් පහත සඳහන් නිර්ණායක අදාළ කර ගනු ලැබේ.

**(අ) ගොඩබෑම් හා භාරදීමේ සේවා**

ආනයන අපනයන නැව්බඩු මෙහෙයුම් සම්බන්ධයෙන් නැව්බඩු පැටවීම්, ගොඩබෑම් හා ගබඩා කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම ආදී සේවාවන් සමූහය විසින් සපයනු ලැබේ. මෙම විකුණුම් සේවා සඳහා කාර්යය හෝ ගනුදෙනු සම්පූර්ණ කිරීම පදනම්ව සේවා සපයන අතර, සපයන ලද සත්‍ය සේවා පදනම් කොට අය කිරීම් තක්සේරු කරනු ලැබේ.

**(ආ) නාවික හා ආශ්‍රිත සේවා**

ප්‍රදීපාගාර ගාස්තු ප්‍රවේශ ගාස්තු හා අධිපැය ගාස්තු සහ නියමු ගාස්තු, ඒවා ලැබීමට නියම වන අවස්ථාවේදී, එනම් නෞකා පැමිණෙන අවස්ථාවේදි නියම කරනු ලැබේ. නාවික හා අදාළ සේවාවන්ගෙන් ලැබෙන ආදායම එම සේවාව සැපයූ කාලසීමාව තුළ හඳුනාගනු ලබන අතර, අදාළ කාර්යය හෝ ගනුදෙනුව සම්පූර්ණ කිරීමේ පදනම මත සහ සත්‍ය වශයෙන්ම සපයන ලද සේවාවන් මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

**(ඇ) නැව් භාණ්ඩ වාහක සේවා**

බහළු මෙහෙයුම් සහ සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් වලට අදාළව නැව් භාණ්ඩ වාහක සේවාවන්ගෙන් ලැබෙන ආදායම සේවාව සැපයූ කාලසීමාව තුළ හඳුනාගනු ලබන අතර කාර්ය හෝ ගනුදෙනුව සම්පූර්ණ කිරීමේ පදනම සහ සත්‍ය වශයෙන්මසපයන ලද සේවාව මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

**පොලී ආදායම**

ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ. ප්‍රදානය කල ණය මුදලක් හෝ ලැබිය යුතු ආදායමෙන් ණය මුදලක් හානිකරණය සිදු වූ විට, ශ්‍රී ලංකා වරාය අධිකාරි එහි ධාරණ අගය ප්‍රතිලාභ්‍ය අගයට අඩු කරන අතර එය ලේඛනයේ මූලික ක්‍රියාකාරී පොලී අනුපාතයට අඩුකල අනාගත මුදල් ප්‍රවාහය වශයෙන් එහි ධාරණ අගය ලැබිය යුතු අගයට අඩුකර පොලී අනුපාතිකය වශයෙන් වට්ටම අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. හානිකරණ ණය මත පොලී ආදායම හා ලැබීම් මූලික ක්‍රියාත්මක පොලී අනුපාතය භාවිතා කරමින් හඳුනාගනු ලැබේ. බැංකු ශේෂ හා බැංකු තැන්පතු මත ලැබෙන පොලිය උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**බදු කුලී ආදායම**

මෙහෙයුම් කල්බදු යටතේ ලැබෙන බදු ආදායම, අසම්භාව්‍ය බදු ආදායම ලැබෙන අවස්ථාවලදී හඳුනාගන්නා බදු ආදායම හැර, බදු කාලසීමාව මත සෘජු රේඛීය පදනම මත හඳුනාගනු ලැබේ. බදු කාලසීමාව යනු බදු ගිවිසුමේ දක්වා ඇති ස්ථාවර කාලසීමව සහ එය තවදුරටත් දීර්ඝ කල හැකි කාලසීමාව වන අතර ඒ සඳහා බදුකරුහට මෙම බදු ගිවිසුව අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ විකල්පය පවතින අතර, කල්බදු ගිවිසුම ආරම්භයේදී බදුකරු විසින් මෙම විකල්පය භාවිතයට ගනු ලබන බවට අධ්‍යක්ෂකරුන් හේතු සහිතව සහතික වේ. බදු ගිවිසුම් අවසන් කිරීම සඳහා ලැබෙන වාරික ලැබෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මගින් හඳනාගනු ලැබේ.

**ලාභාංශ ආදායම**

ලාභාංශ ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ ස්ථිතිය වෙත ලැබී, ලාභාංශයේ මුදල් ප්‍රමාණය විශ්වාසනීයත්වයෙන් යුතුව ගණනය කිරීමේ ප්‍රවාණතාවයක් ඇති වී ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

**රාජ්‍යභාග ආදායම**

ආදාළ ගිවිසුමේ අඩංගු කරුණු ප්‍රකාරව, සහ රාජ්‍ය භාග ආදායමට අදාළ ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ලැබීමේ සම්භාවිතාවක් ඇති බව සහ ආදායම විශ්වාසනීය ලෙස ගණනය කල හැකි වීම අනුව රාජ්‍ය භාගය හඳුනාගනු ලැබේ.

**දේපළ, පිරියත සහ උපකරණ විකුණා බැහැර කිරීමෙන් ලබන ලාභ සහ පාඩු**

දේපළ, පිරියත හා උපකරණ විකුණා බැහැර කිරීමෙන් ලබන ශුද්ධ ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර ඇත්තේ විකුණා බැහැර කිරීමෙන් ලබන ආදායම, වත්කම්හි ධාරණ අගය සහ අදාළ විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය.

**2.19 වියදම්**

මෙහෙයුම් සඳහා දරණු ලබන සියළුම වියදම් ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ආදායමට එකතු කර ඇත.

**2.20 වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසුව සිදුවන කරුණු.**

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදු වූ සියළුම ද්‍රව්‍යමය කරුණු සැලකිල්ලට ගෙන සුදුසු ගැලපුම් / හෝ අනාවරණ, මූල්‍ය ප්‍රකාශණයේ අදාළ සටහන් වල දක්වා ඇත.

**2.21 වගකීම්**

වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී සියළුම ද්‍රව්‍යමය වගකීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් අනාවරණය කර ඇත.

**2.22 විශේෂ ගිණුම් ඇස්තමේන්තු සහ නිගමන**

මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේ දී, කළමනාකාරීත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම පිළිබඳව නිගමන, ඇස්තමේන්තු සහ උපකල්පනයන් ගණනාවක් පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

**ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රථම වරට විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත15,09 සහ 16 භාවිතා කර ඇත. නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත භාවිතා කිරීම හේතුකොට ගෙන සිදු වී ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල ස්වභාවය සහ වෙනස් වීම් පහත විස්තර කර ඇත.

සංක්‍රමණික මාර්ගෝපදේශ වලට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 හි අනුගමනය කල හැකි වෙනස්කම් ප්‍රත්‍යෙක්ෂණව අනුගමනය කර ඇත. ඒ අනුව, ආරම්භක යෙදවුම් දිනය ඇතුළත් වන වාර්ෂික ගිණුම් වාර්තාකරණ කාලසීමාවේ ස්කන්ධ ප්‍රාග්ධනයේ රඳවාගත් ඉපැයීම් වල සමුච්චිත ශේෂය (සුදුසු පරිදි) ගැලපුම් කරනු ලැබේ. මෙම සංක්‍රමණික ක්‍රමවේදය යටතේ, මූලික යෙදවුම් දිනය වන විට අවසන් නොවූ කොන්ත්‍රාත්තු සඳහා පමණක් ප්‍රත්‍යෙක්ෂණව යෙදවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම ප්‍රමිතිය තෝරාගෙන ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 සංක්‍රාන්ති ප්‍රතිපාදන වල දක්වා ඇති පරිදි හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ වල වෙනස්කම් වලට අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකාරණ ප්‍රමිත 09 ප්‍රත්‍යෙක්ෂණ වශයෙන් භාවිතා නොකෙරේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ට අනුව, වර්ගීකරණය සහ ගණනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සමූහයේ ශේෂයන්ට අතිවිශාල බලපෑමක් ඇති නොකරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි ද දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 389 යටතේ සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය ලේඛන ගණනය කිරීම අඛණ්ඩව සිදු කර ඇත. මූල්‍ය ලේඛන වර්ගීකරණය පහත පරිදි දැක්විය හැක.

- පූර්වයෙහි ගණනය කරන ලද කල්පිරීමෙන් පසු රඳවාගන්නා රජයේ සුරැකුම්පත් සහ තැන්පතු වල ආයෝජනයන් වර්ගීකරණය කර ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ.
- කල් පිරීමේදි රඳවාගෙන වර්ගීකරණය කරන ණය ලේඛන ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය සහ ගණනය කරනු ලැබේ.

- පෙර ණය සහ ලැබීම් ලෙස ගණනය කරන ලද වෙළෙඳ ලැබීම් සහ වෙනත් ලැබීම් ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කර ගණනය කරනු ලැබේ.
- "විකිණීම සඳහා ඇති" වශයෙන් වර්ගීකරණය කර ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකල සමාගම් වල ස්කන්ධ ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කර ගණනය කරනු ලැබේ.

**2.22.1 මූල්‍යමය ප්‍රකාශන වලට වඩා වැදගත් බලපෑමක් සිදු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කර ගැනීමේදී ගනු ලබන විශේෂ විනිශ්චයන් පහත දැක්වෙන අයුරු වේ.**

**(අ) විලම්භීත බදු වත්කම් හඳුනාගැනීම**

විලම්භීත බදු වත්කම් හඳුනාගත හැකි ප්‍රමාණය කොතෙක්ද යන්න, අනාගත බදු අයකල හැකි ආදායමෙහි සම්භාවිතාවය මත පදනම් වේ.

**2.22.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම මත විශේෂ බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත:**

**(අ) ක්ෂණික වත්කම් වල ඵලදායී ජීවකාලය**

එක් එක් වාර්තාකරණ දිනයේදී වත්කම් වල අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව ක්ෂණික වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ ඇස්තමේන්තුව කළමනාකරණය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව, මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණික උපකරණ වල උපයෝගීතාව වෙනස් කළ හැකි තාක්ෂණික යල් පැනීම් වලට අදාළව සිදු වේ.

**(ආ) නිර්වචනීය ලද ප්‍රතිලාභ සැලැස්ම**

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්මේ වගකීම් වල වර්තමාන වටිනාකම සාධක ගණනාවක් මත රඳා පවතී. මෙය නිර්ණය කරනු ලබන්නේ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් කරනු ලබන ආයුගණක පදනම මත ය. වට්ටම් ඇතුළුව නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මෙහි ශුද්ධ පිරිවැය සහ වගකීම නිර්ණය කිරීමේදී මෙම උපකල්පනයන් භාවිතා කෙරේ. මෙම උපකල්පනයන්ගේ යම් වෙනස් වීමක් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ ධාරණ අගයට බලපෑමක් ඇති වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**3 දේපළ, පිරියත සහ උපකරණ**

| සමූහය | 2022 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය/ගැලපුම් කිරීම් | 2022 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **3.1 පිරිවැය මත** | | | | | |
| ඉඩම් | 51,806,736,202 | 65,458,387,590 | (12,736,000) | 13,646,000 | 117,266,033,792 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ | 114,218,730,062 | 261,240,596 | (99,768,965) | - | 114,380,201,693 |
| පාවෙන උපකරණ | 7,060,561,334 | 495,449,855 | (6,000,000) | - | 7,550,011,189 |
| මෙහෙයුම් උපකරණ | 27,606,560,703 | 173,428,115 | - | - | 27,779,988,818 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 996,410,485 | 42,786,750 | (766,115) | - | 1,038,431,120 |
| කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි | 1,040,098,335 | 14,149,850 | (27,824,865) | - | 1,026,423,320 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 454,821,991 | - | (84,252) | - | 454,737,739 |
| පරිගණක දෘඩාංග | 586,111,765 | 40,670,370 | (50,506,752) | - | 576,275,382 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,682,336,517 | 71,399,181 | (13,455,841) | - | 2,740,279,857 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 227,300,722 | 13,658,788 | (17,090,725) | - | 223,868,785 |
| රථ වාහන | 989,548,311 | (70,900) | (9,761,881) | - | 979,715,530 |
| වෙනත් වත්කම් | 507,694,347 | 21,372,535 | (2,784,239) | - | 526,282,643 |
| | **208,176,910,773** | **66,592,472,729** | **(240,779,635)** | **13,646,000** | **274,542,249,868** |

| **3.1.1 ක්ෂය** | **2022 ජනවාරි 01** දිනට | වසර තුළ අය කිරීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය/ගැලපුම් කිරීම් | **2022 දෙසැම්බර් 31** දිනට |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ | 33,126,069,783 | 1,350,000,171 | (85,924,450) | - | 34,390,145,503 |
| පාවෙන උපකරණ | 6,951,377,464 | 117,347,808 | - | - | 7,068,725,272 |
| මෙහෙයුම් උපකරණ | 16,655,849,088 | 952,732,241 | - | - | 17,608,581,329 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 670,269,720 | 60,027,193 | (738,105) | - | 729,558,807 |
| කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි | 392,743,431 | 29,119,599 | (17,138,116) | - | 404,724,914 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 270,796,685 | 13,546,778 | (29,766) | - | 284,313,696 |
| පරිගණක දෘඩාංග | 410,862,211 | 50,623,220 | (50,456,291) | - | 411,029,139 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,278,680,899 | 105,461,362 | (13,228,648) | - | 2,370,913,612 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 172,532,504 | 17,846,537 | (17,052,489) | - | 173,326,552 |
| රථ වාහන | 815,306,169 | 32,062,339 | (9,893,777) | - | 837,474,730 |
| වෙනත් වත්කම් | 405,987,942 | 23,221,261 | (2,779,715) | - | 426,429,488 |
| | **62,150,475,893** | **2,751,988,508** | **(197,241,358)** | - | **64,705,223,043** |

| **3.1.2 ඉදිරියට ගෙන ගිය ශුද්ධ වටිනාකම්** | | **2022 දෙසැම්බර් 31** දිනට | **2021 දෙසැම්බර් 31** දිනට |
|---|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ** | | | |
| ඉඩම් | | 117,266,033,792 | 51,806,736,202 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ | | 79,990,056,190 | 81,092,660,279 |
| පාවෙන උපකරණ | | 481,285,917 | 109,183,870 |
| මෙහෙයුම් උපකරණ | | 10,171,407,489 | 10,950,711,615 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 308,872,313 | 326,140,766 |
| කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි | | 621,698,406 | 647,354,904 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | | 170,424,043 | 184,025,306 |
| පරිගණක දෘඩාංග | | 165,246,243 | 175,249,554 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | | 369,366,245 | 403,655,618 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | | 50,542,234 | 54,768,219 |
| රථ වාහන | | 142,240,799 | 174,242,142 |
| වෙනත් වත්කම් | | 99,853,154 | 101,706,405 |
| | | **209,837,026,824** | **146,026,434,881** |
| **නොනිමි ප්‍රාග්ධන වැඩ** | **(සටහන 3.3)** | 41,381,934,801 | 2,764,042,687 |
| | | **251,218,961,625** | **148,790,477,568** |

| සමූහය | **2022 දෙසැම්බර් 31** දිනට | **2021 දෙසැම්බර් 31** දිනට |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ නිරවුල් කිරීමේ ගිණුම | 500,852,270 | 181,059,105 |
| | **500,852,270** | **181,059,105** |
| | **251,719,813,895** | **148,971,536,673** |

1. නිරවුල් කිරීමේ ගිණුමෙහි ඉඩම් රු. 113,159,199.33 , ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ රු.1,829,411.00 විදුලි හා විද්‍යුත් උපකරණ රු. 23,271,523.51 ,පිරියත යන්ත්‍රෝපකරණ රු. 7,214,515.87 , පරිගණක දෘඩාංග හා මෘදුකාංග රු.162,000.00 , පාවෙන උපකරණ රු.259,340,648.61 , මෙහෙයුම් ගොඩනැගිලි රු. 17,357,604.46 , මෙහෙයුම් උපකරණ රු.73,083,151.73 , වෙනත් වත්කම් රු. 5,434,215.64 ඇතුළත් වේ.

2. රු. 55,695,295.07 ක් වටිනා වත්කම් ආගමික ස්ථාන ලෙස භාවිතා කෙරේ.

3. වත්කම් ලේඛනයට අනුව 2022.12.31 දිනට තවමත් භාවිතයේ පවතින ක්ෂය වූ වත්කම් වල මුළු වටිනාකම රු. 30,640,050,632.17.

4. වත්කම් අන්තර් හුවමාරු (ලී බඩු හා කාර්යාල උපකරණ):ගාල්ල වරාය රු. 18,000.00, /වත්කම් හුවමාරු : (මෝටර් රථ) : ත්‍රිකුණාමලය වරාය රු.70,900.00

5. ඉඩම් එකතුවෙහි වටිනාකම (ශුද්ධ පොත් අගය ) දේපළ , පිරියත හා උපකරණ වශයෙන් රු. 65,416,535,508.23 ක් හඳුනාගන්නා ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08, ගිණුම් ප්‍රතිපත්ති , ගිණුම් ඇස්තමේන්තු හා දෝෂයන්ට අනුව ගැලපුම් අතිනයට බලපාන පරිදි සිදු කරන ලදී. ඉඩම් වල වටිනාකම් අදාළ විෂය භාර නිලධාරීන්ගෙන් සමන්විත වත්කම් යාවත්කාලීනකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. තවද,රු.41,852,082 ක් වත්කම් ඉඩම් නිරවුල් කිරීමේ ගිණුමෙන් මාරු කරන ලදී.

6.රු. 13,646,000 වටිනා ඉඩම් ආයෝජන දේපළ , පිරියත හා උපකරණ වලට ආයෝජන වත්කම් වලින් ප්‍රතිවර්ගීකරණය කර ඇත. ප්‍රතිවර්ගීකරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ට අනුව නිවැරදි කිරීමක් ලෙස ගැලපුම් කර ඇත. වෙනස්කම් අතිනයට බලපාන පරිදි සිදු කර ඇත. ආයෝජන දේපළ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිරිවැය ආකෘතිය භාවිතා කර ඇති බැවින් ධාරණ අගයේ කිසිදු වෙනස්කමක් ඉහත සඳහන් මාරු කිරීම් වල සිදු වී නොමැත.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**3 දේපළ, පිරියත සහ උපකරණ**

| ශ්‍රීලවඑ | 2022 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය/ගැලපුම් කිරීම් | 2022 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **3.1 පිරිවැය** | | | | | |
| ඉඩම් | 51,806,736,202 | 65,458,387,590 | (12,736,000) | 13,646,000 | 117,266,033,792 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ | 114,218,730,062 | 261,240,596 | (99,768,965) | - | 114,380,201,693 |
| පාවෙන උපකරණ | 7,060,561,334 | 495,449,855 | (6,000,000) | - | 7,550,011,189 |
| මෙහෙයුම් උපකරණ | 27,606,560,703 | 173,428,115 | - | - | 27,779,988,818 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 923,553,215 | 38,100,109 | (766,115) | - | 960,887,209 |
| කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි | 1,040,098,335 | 14,149,850 | (27,824,865) | - | 1,026,423,320 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 454,821,991 | - | (84,252) | - | 454,737,739 |
| පරිගණක දෘඩාංග | 580,351,988 | 39,746,000 | (50,506,752) | - | 569,591,235 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,682,336,517 | 71,399,181 | (13,455,841) | - | 2,740,279,857 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 210,645,464 | 12,511,179 | (17,090,725) | - | 206,065,918 |
| රථ වාහන | 927,384,882 | (70,900) | (9,761,881) | - | 917,552,101 |
| වෙනත් වත්කම් | 507,694,347 | 21,372,535 | (2,784,239) | - | 526,282,643 |
| | **208,019,475,040** | **66,585,714,109** | **(240,779,635)** | **13,646,000** | **274,378,055,515** |

| 3.1.1ක්ෂය | 2022 ජනවාරි 01 දිනට | වසර තුළ අය කිරීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය/ගැලපුම් කිරීම් | 2022 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ | 33,126,069,783 | 1,350,000,171 | (85,924,450) | - | 34,390,145,503 |
| පාවෙන උපකරණ | 6,951,377,464 | 117,347,808 | - | - | 7,068,725,272 |
| මෙහෙයුම් උපකරණ | 16,655,849,088 | 952,732,241 | - | - | 17,608,581,329 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 647,612,464 | 53,521,727 | (738,105) | - | 700,396,085 |
| කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි | 392,743,431 | 29,119,599 | (17,138,116) | - | 404,724,914 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 270,796,685 | 13,546,778 | (29,766) | - | 284,313,696 |
| පරිගණක දෘඩාංග | 406,528,177 | 49,788,500 | (50,456,291) | - | 405,860,385 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,278,680,899 | 105,461,362 | (13,228,648) | - | 2,370,913,612 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 163,591,881 | 15,717,584 | (17,052,489) | - | 162,256,976 |
| රථ වාහන | 792,378,846 | 27,856,744 | (9,893,777) | - | 810,341,812 |
| වෙනත් වත්කම් | 405,987,942 | 23,221,261 | (2,779,715) | - | 426,429,488 |
| | **62,091,616,658** | **2,738,313,774** | **(197,241,358)** | - | **64,632,689,074** |

| 3.1.2 ඉදිරියට ගෙන ගිය ශුද්ධ වටිනාකම් | | 2022 දෙසැම්බර් 31 දිනට | 2021 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ** | | | |
| ඉඩම් | | 117,266,033,792 | 51,806,736,202 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ | | 79,990,056,190 | 81,092,660,279 |
| පාවෙන උපකරණ | | 481,285,917 | 109,183,870 |
| මෙහෙයුම් උපකරණ | | 10,171,407,489 | 10,950,711,615 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 260,491,124 | 275,940,752 |
| කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි | | 621,698,406 | 647,354,904 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | | 170,424,043 | 184,025,306 |
| පරිගණක දෘඩාංග | | 163,730,850 | 173,823,811 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | | 369,366,245 | 403,655,618 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | | 43,808,943 | 47,053,584 |
| රථ වාහන | | 107,210,288 | 135,006,036 |
| වෙනත් වත්කම් | | 99,853,154 | 101,706,405 |
| | | **209,745,366,440** | **145,927,858,381** |
| **ප්‍රාග්ධන නොනිමි වැඩ** | **(සටහන 3.3)** | 41,381,934,801 | 2,761,432,393 |
| | | **251,127,301,241** | **148,689,290,774** |

| ශ්‍රීලවඑ | 2022 දෙසැම්බර් 31 දිනට | 2021 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ නිරවුල් කිරීමේ ගිණුම | 500,852,270 | 181,059,105 |
| | **500,852,270** | **181,059,105** |
| | **251,628,153,511** | **148,870,349,879** |

1. නිරවුල් කිරීමේ ගිණුමෙහි ඉඩම් රු. 113,159,199.33 , ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ රු.1,829,411.00 විදුලි හා විද්‍යුත් උපකරණ රු. 23,271,523.51 ,පිරියත යන්ත්‍රෝපකරණ රු. 7,214,515.87 ,

පරිගණක දෘඩාංග හා මෘදුකාංග රු.162,000.00 , පාවෙන උපකරණ රු.259,340,648.61 , මෙහෙයුම් ගොඩනැගිලි රු. 17,357,604.46 , මෙහෙයුම් උපකරණ රු.73,083,151.73 , වෙනත් වත්කම් රු. 5,434,215.64 ඇතුළත් වේ.

2. රු. 55,695,295.07 ක් වටිනා වත්කම් ආගමික ස්ථාන ෙ

3. වත්කම් ලේඛනයට අනුව 2022.12.31 දිනට නවමත් භාවිතයේ පවතින ක්ෂය වූ වත්කම් වල මුළු වටිනාකම රු.

4. වත්කම් අන්තර් භූවමාරු (ලී බඩු හා කාර්යාල උපකරණ):ගාල්ල වරාය රු. 18,000.00, /වත්කම් භූවමාරු : (මෝටර් රථ) : ත්‍රිකුණාමලය වරාය රු.70,900.00

5. ඉඩම් එකතුවෙහි වටිනාකම (ශුද්ධ පොත් අගය ) දේපළ , පිරියත හා උපකරණ වශයෙන් රු. 65,416,535,508.23 ක් හඳුනාගන්නා ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08, ගිණුම් ප්‍රතිපත්ති , ගිණුම් ඇස්තමේන්තු හා දෝෂයන්ට අනුව ගැලපුම් අතීතයට බලපාන පරිදි සිදු කරන ලදී. ඉඩම් වල වටිනාකම් අදාළ විෂය භාර නිලධාරීන්ගෙන් සමන්විත වත්කම් යාවත්කාලීනකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. තවද,රු.41,852,082 ක් වත්කම් ඉඩම් නිරවුල් කිරීමේ ගිණුමෙන් මාරු කරන ලදී.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිත සමාගම්හි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 13 (SLFRS 13) හි 76 වගන්තිය අනුව වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ අගයකින් මනිනු ලබන මූල්‍ය වත්කම් හඳුනාගැනීමේදී පළමු මට්ටම (Level 01) යටතේ වර්ග කිරීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොල මිලක් පැවතිය යුතු නමුත්, අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.5.4 ට අනුව වෙළඳපොල මිලක් නොමැති ලැයිස්තුගත නොකල නව සමාගමක් වන කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් සමාගම (Colombo West International Terminal Pvt Ltd) පළමු මට්ටම යටතේ වර්ග කර හෙලිදරව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 51 වන වගන්තිය අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කර වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ගිණුම්වලට ගැලපුම් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියෙහි ගාල්ල වරාය සතුව පැවති ධාරණ අගය රු.මිලියන 4,365 ක් වූ වර්ග 11 කට අයත් වත්කම් සමාලෝචනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 (LKAS 21) හි 21 වගන්තිය අනුව විදේශ මුදලින් වන ගනුදෙනු, ගනුදෙනු සිදුවන අවස්ථාවේ පැවති එතැන් විනිමය අනුපාතය (Spot Rate) යොදාගනිමින් දේශීය මුදලට පරිවර්තනය කල යුතුය. එසේ වුවද, අධිකාරිය විසින් ආදායම් හඳුනාගැනීමේදී එතැන් විනිමය අනුපාතයේ මිලට ගැනුම් අනුපාතය (Buying Rate) යොදාගැනීම වෙනුවට, වැඩි අගයක් සහිත විකුණුම් අනුපාතය (Selling Rate) යොදාගෙන තිබීම නිසා අධිකාරියේ ආදායම අධිතක්සේරු වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 (LKAS 21) හි 23 (අ) වගන්තිය අනුව ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේදී විදේශ මුදලින් වන මූල්‍ය වත්කම් හඳුනාගැනීමේදී වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දිනට පැවති "අවසාන විනිමය අනුපාතය" (Closing rate) භාවිතා කර දේශීය මුදලට පරිවර්තනය කල යුතු වුවද, අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට ණයගැති වටිනාකම් වාර්තා කිරීමේදී එක් එක් ණයගැතියාගේ නිරවුල් නොවූ බිල්පත් වල රුපියල් වටිනාකම් බිල්පත් දිනට පැවති විනිමය අනුපාතය යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් ණයගැති වටිනාකම් 2022 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය නිරූපණය නොවුණි

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 28 (LKAS 28) හි 17 වන වගන්තිය අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගිණුම්කරණය සඳහා ස්කන්ධ ක්‍රමය අනුගමනය කිරීම අවශ්‍ය නොවන්නේ මව් සමාගම (Parent Company) විසින් සමූහ මූල්‍ය ප්‍රකාශන (Consolidated Financial Statements) පිළියෙළ කිරීමෙන් නිදහස් අවස්ථා වලදී පමණි. එසේ වුවද, අධිකාරියෙහි

ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2.2 ට අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගිණුම්කරණය සඳහා ස්කන්ධ ක්‍රමය (Equity Method) යොදා ගන්නා බව සඳහන් කර තිබූ නමුත් අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට සමුහය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණ ද, අධිකාරියේ ආශ්‍රිත සමාගම්වල ආයෝජන පිරිවැයට (Cost Method) හඳුනාගෙන තිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ වත්කම් රු.මිලියන 765.6 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම [MPMCS] විසින් 2014 වර්ෂයේදී පුද්ගලික බැංකුවකින් ඇමරිකානු එක්සත් ජනපද (ඇ.එ.ජ) ඩොලර් මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එයින් ඇ.එ.ජ ඩොලර් මිලියන 18.82 (රු. මිලියන 6,836) ක් මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබූ අතර ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් වත්කම් නොමැති බවද නිරීක්ෂණය විය. බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණ ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37, 1 (අ) වගන්තිය අනුව ඒ සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 (LKAS 37) හි 85 වගන්තිය අනුව එක් එක් ප්‍රතිපාදනය සඳහා අදාල බැඳීම් ස්වරූපය පිළිබඳව කෙටි විස්තරයක්, ගෙවීමට සිදුවන කාල වකවානු හා අවිනිශ්චිතභාවයන් පිළිබඳව හෙළිදරව් කලයුතු වුවත් අධිකාරියෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් රු.මිලියන 6,399 ක හිමිකම් පෑ හැකි වෙන්කිරීම් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඌ) ගිණුම්කරණ සංකල්පනාත්මක රාමුවෙහි (Conceptual framework) 2.6. අනුව මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් හට තීරණ ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කරන තොරතුරු අදාල (Relevance) විය යුතු නමුත් පහත අවස්ථාවලදී අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(i) අධිකාරියේ ආදායම හඳුනාගැනීමේදී රුපියල් වටිනාකමට අමතරව ඇ.එ.ජ ඩොලර් වටිනාකම සටහන් මඟින් දක්වා නොතිබීම හේතුවෙන් අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල පහළයාමට සාපේක්ෂ ආදායමෙහි වර්ධනය/ පහළයාම පැහැදිලිව හඳුනාගත නොහැකි වී තිබූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ විදේශ විනිමය ගැලපීම මත සිදුවී ඇති ආදායම් ඉහළයාම පරිශීලකයින්ට වඩා පැහැදිලිව හඳුනාගත නොහැකි වී තිබුණි.

(ii) ලැයිස්තුගත නොකළ කොටස්වල ආයෝජනයෙහි 2022 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගයේ ඉහළ යාම රු.මිලියන 29,974 ක් වූ අතර එම වටිනාකම තුල වූ හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ සමාගමෙහි (HIPG) ආයෝජිත කොටස්වල සාධාරණ අගය 2021

සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 143 කින් (ඇ.එ.ජ.ඩොලර් 396,908.82 ) අඩු වී තිබුණි. නමුත් විදේශ විනිමය අනුපාතය ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස HIPG සමාගම ඇතුළු අනෙකුත් ආයෝජිත සමාගම් වල කොටස්හි සාධාරණ අගය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි. අධිකාරිය විසින් සමාගම් වල කොටස් ආයෝජනයන්හි සාධාරණ අගය හඳුනාගැනීමේදී රුපියල් වටිනාකමට අමතරව ඇ.එ.ජ ඩොලර් වටිනාකම සටහනක් ඉදිරිපත් කර නොතිබුණු බැවින් ආයෝජන වල වටිනාකම සමග විදේශ විනිමය ගැලපීම මත සිදුවී ඇති සාධාරණ අගයේ ඉහළයාම මූල්‍ය ප්‍රකාශන මඟින් පිළිබිඹු නොවුණි.

(එ) විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

(i) විගණිත දින වන විටත් නිරවුල් නොකල පහත දැක්වෙන වටිනාකම් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් ශේෂ සනාථ මඟින් තහවුරු කර නොතිබුණු අතර 2022 වර්ෂය සඳහා වූ ජනරජ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ තුළ ද මෙම ශේෂ ඇතුළත් කර නොතිබුණි.

- හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල වෙනුවෙන් වාරිකයක් ලෙස අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ගෙවන ලද රු. මිලියන 4,406 ක් හා මුද්දර ගාස්තු රු. මිලියන 372 ක් ද ඇතුළුව 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4,778 ක මුදල.

- හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෙල් ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබූ ඩොලර් ණය මුදල් මහා භාණ්ඩාගාරය විසින් නියමිත වේලාවට නොගෙවීම හේතුවෙන් 2018 වර්ෂයේදී එම රාජ්‍ය බැංකුවේ අධිකාරිය නමින් පවත්වාගෙන යන ඇ.එ.ජ ඩොලර් ගිණුමෙන් බැංකුව විසින් අයකරගෙන තිබූ ඇ.එ.ජ ඩොලර් 635,069, එනම් රු. මිලියන 377.8 ක මුදල.

(ii) ලංකා කෝල් සමාගමෙහි (Lanka Coal Company) කොටස්වල ආයෝජනයෙහි 2022 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබූ අතර එහි ශුද්ධ වත්කම් අගය 2021 සිට 2022 වර්ෂය දක්වා වෙනස් නොවී ඇති බවට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ නමුත් 2021 වර්ෂයේ එම සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොවුණු බැවින් එහි නිවැරදි බව තහවුරු කරගත නොහැකි විය.

(ඒ) විදේශ මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 1,531 ක් වූ ශේෂය තුළ, භාණ්ඩ ලැබී ගෙවීම් අවසන් කර තිබූ නමුත් වියදම් ලෙස ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට හෝ හඳුනාගත් ප්‍රතිපත්තියක් මත වත්කම් ප්‍රාග්ධනීත කිරීමට කටයුතු නොකල රු.මිලියන 1,071 ක් වූ අමතර කොටස් සහ වත්කම් මිලදී ගැනීම් පැවතුණි. මේ හේතුවෙන්

වර්ෂයේ ලාභය හා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අධිගණනය/ ඌනගණනය වී තිබුණි.

(ඔ) පරිශ්‍ර අංශයේ ඉඩම් රෙජිස්ටරයට අනුව රු.250,839,634 ක් වටිනා ඉඩම් කැබලි 14 ක් වෙනත් ආයතන වෙත බදු පදනම මත ලබාදී ඇති බව දක්වා තිබූ අතර මූල්‍ය අංශය විසින් පවත්වාගෙන යනු ලබන ආයෝජන දේපල පිළිබඳ ලේඛනයට එම ඉඩම් ඇතුලත්කර නොතිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන දේපල එම වටිනාකමින් ඌනගණනය වී තිබුණු අතර ඉඩම් වටිනාකම අධිගණනය වී තිබුණි.

(ඕ) ගාල්ල වරායේ බහුකාර්ය පර්යන්තයක් ඉදිකිරීම සඳහා 2006 මාර්තු 28 දින ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ණය ගිවිසුමකට එළඹ තිබුණු අතර ගාලු කොටුව ආශ්‍රිතව මෙම ඉදිකිරීම් සිදු කිරීම සඳහා යුනෙස්කෝ (UNESCO) අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ඒ සඳහා වසර 3 කට අධික කාලයක් ගතවීමත්, ණය අරමුදල් ප්‍රමාණවත් නොවීමත්, ණය කාලසීමාව දීර්ඝ නොකිරීමත් යන හේතු මත මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. මේ සඳහා වැය කරන ලද රු. මිලියන 422.5 ක් වූ උපදේශන ගාස්තු අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල කෙරිගෙනයන වැඩ යටතේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වියදම ප්‍රාග්ධන හෝ අයහාර වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඉහත වැය කරන ලද මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

(ක) හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ඉඩම් එළිපෙහෙලි කිරීමට අදාලව 2014 වර්ෂයේදී රු.මිලියන 4.39 මුදලක් ද, ඉඩම් අහිමිවූවන්ට වන්දි ගෙවීම සඳහා 2015 සහ 2016 වර්ෂයන්හිදී රු.මිලියන 108.77 ක මුදලක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ද වැයකර තිබුණි. 2021 අප්‍රේල් 30 දින වන විට අදාල වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාව අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් වැය කරන ලද රු.මිලියන 113.16 ක මුදල ආයෝජන දේපල ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ග) නැව් නියෝජිතයින් විසින් කලින් ගෙවන ලද අත්තිකාරම් පියවීමෙන් පසු, 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති ශේෂය රු.මිලියන 997.83 ක් වූ අතර එයින් කොළඹ වරායට අදාල රු.මිලියන 197.31 ක් මාස 06 සිට වර්ෂ 5 ඉක්මවා තිබුණු නමුත් විගණිත දිනය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන තුල නැව් නියෝජිත බැර ශේෂ ලෙස දක්වා තිබූ ඉන්ඩොයිස් වටිනාකමට වඩා වැඩියෙන් ගෙවන ලද රු.මිලියන 2,755 කින් කොළඹ වරායට අදාල රු.මිලියන 130 ක් මාස 06 සිට වර්ෂ 5 කාල පරාසයක් ගතවී ඇතත් විගණිත දිනය වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ව) අධිකාරිය විසින් MV Jammi නෞකාව සඳහා ලබාදෙන ලද සේවා සඳහා අයවිය යුතු මුදල් වෙනුවෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර 2009 මාර්තු 13 වන දින ලද තීන්දුව අනුව රු.197,093,842 (ඇ.එ.ජ ඩොලර් 1,945,712) ක මුදලක් අදාල යාත්‍රාවෙන් අධිකාරිය වෙත ලැබිය යුතුව තිබුණි. අදාල නෞකාව වෙන්දේසියෙන් ලද මුදල අධිකරණයේ තැන්පත් කර තිබුණු බවත් එම මුදල් සඳහා හිමිකම් සහිත විවිධ පාර්ශවයන් වෙත අදාල මුදල් ප්‍රමාණයන් මුදාහැරීමෙන් පසුව ඉතිරි වූ මුදල වන ඇ.එ.ජ ඩොලර් 692,080 ක මුදල සම සමව බෙදා ගැනීමට පෙත්සම්කාර Sri Lanka Shipping Company Limited හා අධිකාරිය 2017 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එකඟතාවයකට පැමිණ තිබුණ ද, තවදුරටත් මුළු මුදලම ලැබිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ශ) 2010 වර්ෂයේදී දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (SAGT) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණු බව මූල්‍ය ප්‍රකාශනවල 12.2 සටහනේ දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබූ මෙම මුදල හෝ කොටස්වල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාල සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට ශේෂ සනාථ මගින් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම සමග ගිවිසුම්ගත බැඳීමක් ඇති කරගෙන නොතිබීම හේතුවෙන් අධිකාරිය වෙත අදාල සමාගමේ කොටස් ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවති අතර, අධිකාරිය ඉහත ලැබිය යුතු කොටස් වටිනාකම සඳහා හානිකරණ වෙන්කිරීමක් ද සිදුකර නොතිබුණි.

(ෂ) ලැබිය යුතු බිම් කුලී ආදායම්

(i) නිෂ්කාශනය කර නොගත් ආනයන බහාලුම් 244 ක් දින 22 සිට දින 3583 දක්වා කාලයක් වරාය අංගනයේ පැවති අතර එම බහාලුම් සඳහා 2022 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතුව පැවති රු. මිලියන 3,952 ක බිම් කුලී මූල්‍ය ප්‍රකාශන තුල ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ii) නිෂ්කාශනය කර නොගත් ආනයනික වාහන 50 ක් දින 810 සිට දින 5203 දක්වා කාලයක් වරාය අංගනයේ පැවති අතර එම බහාලුම් සඳහා 2022 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතුව පැවති රු. මිලියන 1,949 ක බිම් කුලී මූල්‍ය ප්‍රකාශන තුල ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඩ) අධිකාරිය විසින් අධිභාර බද්ද ගිණුම් ගත කිරීමේදී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2022 අප්‍රේල් මස නිකුත් කරන ලද 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත ගිණුම් ගත කිරීම පිළිබඳ විකල්ප ප්‍රතිකර්ම ප්‍රකාශය (Statement of Alternative Treatment (SOAT))

අනුව එය මෙම මූල්‍ය වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ නොදක්වා එය 2021 වර්ෂයේදී ගෙවිය යුතු බද්දක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඒ පිළිබඳ අදාල විකල්ප ප්‍රතිකර්ම ප්‍රකාශයේ දක්වා ඇති හෙලිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ත) විලම්බිත බදු වගකීම් ගණනයේදී අධිකාරිය බදු සහන ලබාගත් තව දුරටත් භාවිතා කරන වත්කම්වල වටිනාකම වන රු.මිලියන 9,787 ක් සැලකිල්ලට නොගැනීම සහ රු.මිලියන 1,516 ක්වූ අස්පෘශ්‍ය වත්කම් නිශ්කාෂණ ගිණුමේ වටිනාකම දෙවරක් සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් අධිකාරියේ විලම්බිත බදු වගකීම රු.මිලියන 996 කින් අඩුවෙන් දක්වා තිබූ අතර එම ප්‍රමාණයෙන් ලාභය අධිගණනය වී තිබුණි.

(ද) අධිකාරියේ ආදායම් බදු ගණනයේදී මූල්‍ය ප්‍රකාශන අනුව බදු පෙර ලාභය වූ රු.57,025,790,184 වෙනුවට රු.58,025,790,184 ක් සාවද්‍ය ලෙස බදු පෙර ලාභය ලෙස යොදා ගැනීම නිසා බදු වගකීම රු.මිලියන 123 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(න) 2007/08 සිට 2010/11 වර්ෂ දක්වා වූ මූල්‍ය වර්ෂයන් සඳහා අධිකාරියේ ආදායම් බදු ගණනය කිරීම සම්බන්ධයෙන් අභියාචනයක් බදු අභියාචනාධිකරණයට ඉදිරිපත් වී තිබූ අතර තීන්දුවක් ලබා දී නොතිබූ බැවින් අදාළ වර්ෂ සඳහා බදු ගෙවා නොතිබුණි. කෙසේ වුවද, මේ සඳහා රු.මිලියන 6,387.35 ක් වූ වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළයුතු වුවද, රු.මිලියන 1,141.75 ක් අඩුවෙන් එනම් රු.මිලියන 5,245.6 ක වෙන් කිරීමක් පමණක් සිදු කර තිබුණි.

(ප) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ලෙස දක්වා තිබූ රඳවාගැනීමේ බදු ශේෂය රු.මිලියන 581.31 ක් හා ලැබිය යුතු ආදායම් බදු ශේෂය ලෙස රු.මිලියන 2,102 ක ශේෂයක්, ගෙවිය යුතු බදු වගකීමට එරෙහිව හිලව් කල යුතු වුවද අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(බ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජාත්‍යන්තර වරාය සමූහ සමාගමේ (HIPG) (ලැයිස්තුගත නොකල) කොටස්වල 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 59,577 ක් වූ සාධාරණ අගය 2021 වර්ෂයේ සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගණනය කිරීම් සිදුකර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත ගණනය නොකිරීම හේතුවෙන් HIPG හි ආයෝජන වටිනාකම රු.මිලියන 212 කින් අධිගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ

අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1. මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද අංක 1.2 (ආ), (ඊ), (උ), (එ) (i)(ii), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ඡ), (න), (ප) යන ඡේද සඳහා වූ නිර්දේශ හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති/ විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 10 (5) වගන්තිය සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 30 වගන්තියෙහි (අ) (ආ) හා (ඇ) ඡේද | යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර වරායවල් පිළිබඳ පනත අනුව අධිකාරියට පවරන ලද වත්කම්වල අගය සහ අධිකාරියට ලබාදුන් මූල්‍යමය දායකත්වය මත වර්ෂයකට සියයට 8 ක් නොඉක්මවන ලාභාංශයක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. 1979 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 43 ක් තුල අධිකාරිය විසින් ලාභ ඉපයූ වර්ෂ සඳහා පමණක් ස්කන්ධ ප්‍රාග්ධනය මත ගෙවිය යුතු උපරිම ලාභාංශ රු.මිලියන 15,383 ක් වූ අතර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණේ රු.මිලියන 1,585 ක් එනම් සියයට 10ක් පමණි. කෙසේ වුවද, 2020 හා 2021 වර්ෂ සඳහා රු.මිලියන 39,433 ක් වූ බදු පසු ලාභයෙන් රු.මිලියන 985 ක් එනම් සියයට 2 ක් පමණක් ලාභාංශ ලෙස මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙත කිසිදු මුදලක් ප්‍රේෂණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි අංක 1646 සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2003 අප්‍රේල් 25 දිනැති අංක 10/2003 චක්‍රලේඛය | ගමන් පිළිබඳ මාසික සාරාංශය වාහන භාර නිලධාරීන් විසින් වාර්තා ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර 268 (අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 වගන්තිය | අනුමත ස්ථීර සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් ස්ථීර පදනම මත පුරවන තෙක්, ඒ පුරප්පාඩුවට අනියම් පදනමක් මත නිලධරයෙකු බඳවා ගැනීමෙන් වැළකිය යුතු බවත් හදිසි අවශ්‍යතාව නිසා අතුරු පූරක අනියම් පත්වීමක් කරනු ලැබුවහොත් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව ස්ථීර නිලධරයෙකු පත් කිරීමට වහා පියවර ගත යුතු බවත් සඳහන් වුවද ඒ අනුව කටයුතු නොකළ තනතුරු 344 ක් වර්ෂ 23 ක් වැනි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. |
| (ඈ) | 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ (v) කොටසෙහි 38 (1) (අ) සහ (ආ) වන වගන්ති | අත්අඩංගුවට ගන්නා ලද හෝ රාජසන්තක කරන ලද භාණ්ඩ රේගුව විසින් බැහැර කරනු ලබන්නේ නම් අධිකාරියට ගෙවිය යුතු සියලුම ගාස්තු රේගුව විසින් අධිකාරියට ගෙවිය යුතුය. නමුත් අත්අඩංගුවට ගත් කන්ටේනර් 6 ක් සඳහා අධිකාරියට අයවිය යුතු රු.22,506,662 ක් එසේ අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | 1980 අංක 26 දරන ආහාර පනතේ 7 වන හා 32 වන වගන්තිය සහ ලංසුකරුවන්ට ලබාදුන් උපදෙස් මාලාවේ 4.18 වගන්තිය සහ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 2019 ජූනි 14 දිනැති 2019 ආහාර (පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ) නියෝගය | බේකරි ආහාර නිෂ්පාදකයන් විසින් එහි සඳහන් නියමිත ආකෘති පත්‍ර යටතේ ලියාපදිංචිය සඳහා අයදුම්කර එම ආහාර නිෂ්පාදන ස්ථාන සඳහා බලපත්‍රයක් ලබාගත යුතු නමුත් කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන්ට එලෙස බලපත්‍රයක් පවතීද යන්න ඇගයීමට ලක්වී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) | 3.2 (i) ඡේදය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ලිපිය | යම් ආයතනයක් විසින් බදවාගැනීමේ කාර්යය පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගතයුතු වුවත් අධිකාරිය විසින් කෙටුම්පත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) | 3.4 වගන්තිය | නව තනතුරක් නිර්මාණය කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාවේ වැඩි කිරීමකට පෙර නියමාකාරයෙන් රැකියා ඇගයීමක් හා අධ්‍යනය කිරීමක් සිදුකළ යුතු වුවද, අධිකාරියේ අංශ 10 ක සේවක සංඛ්‍යාවේ 282 ක අතිරික්තයක් පැවති අතර රැකියා ඇගයීමක් හෝ කාර්ය මණ්ඩල අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව එම අංශයන්වලට සේවකයන් බඳවාගැනීම් කර තිබුණි. |
| (iii) | 3 වන පරිච්ඡේදයේ 3.4 වගන්තියේ ix වන උපවගන්තිය | යම් විශේෂිත අවස්ථා වලදී වැඩ බැලීමේ තනතුරක් ඇති කරනු ලැබූ විට එය වසරක කාල සීමාවකට සීමා විය යුතු බව සඳහන් වුවද, අධිකාරිය විසින් වැඩ බැලීම සඳහා පත්කල වසරක කාල සීමාව ඉක්මවූ තනතුරු 13 ක් සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොත | |
| (i) | 6 වන පරිච්ඡේදයේ 2 හි (i) සහ (ii) වගන්තිය | රාජ්‍ය හිමිකාරත්වයක් ඇති අවසාන වර්ෂ 02 ක ඒකාකාරී වාර්ෂික අවම ආදායම රු.මිලියන 30 ක් |

| | | |
|---|---|---|
| | | උපයන රාජ්‍ය ආයතනවල අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා ආයෝජන කමිටුවක් (Investment Committee) පිහිටුවා ඒ අනුව කටයුතු කළයුතු අතර එම කමිටුව අවම සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වියයුතු වුවත්, අධිකාරිය විසින් එවැනි කමිටුවක් පත්කර නොතිබුණි. |
| (ii) | 2.3 වගන්තිය | සියලු රාජ්‍ය ව්‍යවසායන් තම ආයතනයට අයත් ප්‍රධාන මෙහෙයුම් කටයුතු සඳහා ඒවා සිදු කරන ආකාරය පිළිබඳ ක්‍රියාවලි අත්පොතක් ද පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා ක්‍රියාවලි අත්පොතක් ද සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කලින් කලට සමාලෝචනය කර යාවත්කාලීන කිරීම සිදුකල යුතු වුවද, අධිකාරියේ දැනට ක්‍රියාත්මකව පවතින "මුදල් කාර්යය පරිපාටි සංග්‍රහය-2013" හි ණය එකතු කිරීමේ ප්‍රතිපත්තිය හෝ ණය කාලසීමාවන් පිලිබඳව ප්‍රතිපාදන ඇතුළත් කර ක්‍රියාවලි අත්පොත යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වකුලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශය | |
| (i) | 2.2.5 වගන්තිය | පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කල යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. |
| (ii) | 4.3 වගන්තිය | අවදානම් කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනෙකු (03) නියෝජනය කලයුතු අතර ත්‍රෛමාසිකව කමිටුව රැස්විය යුතු වුවද, 2022 |

පෙබරවාරි 25 දින පත්කරන ලද අවදානම් කමිටුවෙහි දැනට සාමාජිකයන් දෙදෙනෙකුගෙන් (02) පමණක් සමන්විත වී තිබුණු අතර අවදානම් කමිටුව ත්‍රෛමාසිකව රැස් වී නොතිබුණි.

(ඒ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත

(i) 3 (2) (ඇ) (iii) වගන්තිය

(ඇ) (i) සහ (ii) අනු ඡේදවල දක්වා ඇති සේවා සහ පළමුවන උපලේඛනයේ ii වන කොටසේ සඳහන් යම් නිදහස් කරන ලද සේවාවක් හැර, ශ්‍රී ලංකාව තුළ යම් සේවාවක් සැපයීම මඟින් ලැබිය යුතු මුදල, මුදලින් ලැබුවා හෝ නොලැබුවා වුවද බද්දට යටත් ආදායම් සේ සැලකෙන අතර අධිකාරිය විසින් 2022 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා බදු අයකල හැකි ආදායම ගණනය කිරීමේදී රාජ්‍ය භාග (Royalty Income) ආදායම, බදු අයකල හැකි ආදායමෙන් ඉවත්කර තිබුණි.

(ii) පළමුවන උපලේඛනයේ ii වන කොටස

සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගණනයේදී, බද්දට යටත් ආදායම ගණනය කිරීමේදී ශූන්‍ය අනුපාතය යටතේ එකතු කල අගය මත බද්දට යටත් වන ආදායම් බාණ්ඩ (VAT Zero Rated Revenue) වන ගබඩා ගාස්තු, උපකරණ කුලියට දීමේ සහ ගිනි නිවීමේ සේවා සැපයීමේ ආදායම් යන රු.මිලියන 1,072 ක් වූ ආදායම්, සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ද නිදහස් ආදායම් ලෙස ගණනය කර තිබීම හේතුවෙන් රු.මිලියන 26.8 ක සමාජ ආරක්ෂණ බද්දක් නොගෙවා තිබුණි.

(ඓ) 2022 නොවැම්බර් 21 දිනැති අංක මුකො/මුගි/කො/41/2022 දරන 2022 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර වක්‍රලේඛය 2-12 වගන්තිය

සියළුම කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් විසින් ලබාගත් අත්තිකාරම් මුදල් අදාල වර්ෂය අවසානයට පෙර නිරවුල් කල යුතු වුවද, අධිකාරියේ විවිධ කොට්ඨාශ විසින් අවස්ථා 37 ක දී ලබාගත් අත්තිකාරම් රු.මිලියන 16.62 ක් පැවති අතර එම ශේෂය තුල වර්ෂ දෙක ඉක්ම වූ රු.මිලියන 3.5 ක් හා මාස 6-12 අතර රු.මිලියන 5.8 ක් නොපියවා පැවතුණි.

(ඔ) අධිකාරියේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ 9.5.2.1 වගන්තිය

එකම කොට්ඨාශයක වසර හයක සේවා කාලයක් සම්පූර්ණ කළ විධායක නොවන ව්‍යාපෘති සමීක්ෂණ සංවර්ධන සහකාර, කළමනාකාර සහකාර, වැඩ සහායක (විවිධ කාර්ය සහායක සහ සෞඛ්‍ය සේවක), රියදුරු ආදී තනතුරු දරණ නිලධාරීන් 39 ක් පොදු ස්ථාන මාරු ක්‍රමය යටතේ වෙනත් කොට්ඨාශයක සේවය සඳහා ස්ථාන මාරු කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණයන් හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ආ) සහ 2.3.2 (ඇ), 2.6.1 (අ) (ii), 5.1.1 (අ) සහ 5.2.1 (අ) වගන්ති අනුව ප්‍රසම්පාදන ක්‍රියාවන් භාරව සිටින නිලධරයන් විසින් පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම, ඒවා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම කලයුතු අතර පිරිවිතර සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කළ යුතුය. එසේ වුවද, මුළුතැන්ගෙහි ආහාර ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලදීගැනීමේදී ඉහත විධිවිධාන ප්‍රකාරව අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යාතනය විසින් නිකුත් කල ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයෙහි 4 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී මුළු වටිනාකම ඇස්තමේන්තුකර ඒ අනුව අමාත්‍යාංශ අතිරේක ලේකම් විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු පත් කිරීමේ ලිපිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු පත්කර මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් 2022 ජනවාරි සිට ජූනි මාසය දක්වා පිළිවෙලින් රු.මිලියන 44.9 ක් සහ රු.මිලියන 29.1 ක් වැය කර තිබූ කුකුල් මස් සහ කපු මද ප්‍රසම්පාදනයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ (x) වන පරිච්ඡේදයේ III වන කොටසෙහි මුළුතැන්ගෙවල් අංශයේ භාණ්ඩ මිලදී ගැනීමේ පටිපාටියෙහි 41 වන වගන්තිය ප්‍රකාරව හැකිතාක් දුරට තරහකාරී මිල සලකා බලා රජයේ දෙපාර්තමේන්තු වලින්, රජය සතු

ව්‍යාපාරික ආයතන වලින් හෝ සංස්ථා වලින් මිලදී ගත යුතු බව සඳහන් වුවද, කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ 2019 මැයි 25 දිනැති බඳවා ගැනීම් පරිපාටියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ රාජකාරි වගකීම් කොටසේ සඳහන් පරිදි මධ්‍යම මුළුතැන්ගෙවල් සඳහා ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේදී එම ප්‍රසම්පාදනයන් පරීක්ෂා කර සහතික කලයුතු වුවත් මිලදී ගනු ලැබූ කුකුල් මස්, මාළු හා කරවල ආදිය පරිභෝජනයට සුදුසු තත්ත්වයේ පවතිද යන්න පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පරීක්ෂා කර නොතිබුණි.

(ඉ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතෙහි II කොටසේ 14 (2) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ මුදල් කළමනාකාරවරයා විසින් වියදම් පිළිබඳ සියලු මූල්‍ය බලපෑම් දැක්වෙන මුදල් විග්‍රහයක් ඉදිරිපත් කරනු ලබනහොත් මිස අධිකාරිය විසින් රුපියල් දස ලක්ෂයකට නොඅඩු මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් මුදල් ස්වභාවයේ තීරණ නොගත යුතු වුවද, එසේ ඇගයීමක් සිදු නොකර කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී පෙර පැවති මාසිකව මිල ගණන් කැඳවා බේකරි ආහාර ලබාගැනීමේ ක්‍රමය වෙනුවට අධිකාරියේ පරිශ්‍රය ඇතුළත ස්ථාපිත කරන ලද බේකරිය බාහිර අයතනයක් වෙත බද්දට ලබාදීම මගින් වර්ෂ 05ක් දක්වා බේකරි නිෂ්පාදන මිලට ගැනීම සිදු කර තිබුණි. තවද, අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමේ කොන්දේසි මාලාවේ 3 වන වගන්තිය අනුව කටයුතු නොකිරීම මත ප්‍රසම්පාදනයේදී ඇතිවන වෙළඳපල තරඟකාරීත්වයේ ප්‍රතිලාභ නැවත වසර 05 ක් යනතෙක් අධිකාරියට ලබාගැනීමේ හැකියාව අහිමි වී තිබුණි.

(ඊ) කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළකල පුවත්පත් දැන්වීමෙහි ලංසු කැඳවීමේ ලේඛන මිලදී ගැනීමේදී ගෙවිය යුතු ආපසු නොගෙවන ගාස්තුව රු.25,000 ක් ලෙස සඳහන්ව තිබූ අතර එය සිංහල මාධ්‍යයෙන් පළකළ පුවත්පත් දැන්වීමෙහි රු.25,000.000.00 ක් ලෙස මුද්‍රණ දෝෂයක් සහිතව සඳහන්ව තිබුණි. එසේ සත්‍ය වශයෙන් ආපසු නොගෙවන ගාස්තුව රුපියල් 25,000 වුවද එම සිංහල මාධ්‍ය නිවේදනයෙන් පසුව නිවැරදි කර ප්‍රසිද්ධ කිරීමක් කර නොතිබුණි. මේ නිසා බහුලව භාවිතා කරන සිංහල මාධ්‍ය දැන්වීමෙහි ඉතා අධික ආපසු නොගෙවන තැන්පතුවක් දැක්වෙන ආකාරයට සඳහන් කිරීම අපේක්ෂිත ලංසුකරුවන් අධෛර්යමත් කිරීමට හේතුවක් වී තිබුණි.

(උ) කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී සැපයුම්කාර ආයතනය සමග බේකරි නිෂ්පාදන වල මිල සෑම මාස හයකට වරක් සාමාන්‍ය වෙළඳපළ මිල අනුව සංශෝධනය කළ යුතු බවට ගිවිසුම්ගතව තිබූ අතර අධිකාරිය දිනකට බේකරි ආහාර ඒකක 4000 ක පමණ තොගයක් මිලදී ගන්නා ආයතනයක් වුවද, බේකරි ආහාර ද්විත්ව කවර ක්‍රමය යටතේ ලංසු කැඳවීම් කර තෝරා ගැනීමේදී මිල ප්‍රධාන නිර්ණායකයක්වී නොතිබූ අතර, මිල සංශෝධනයන් වලදී ද තොග මිල සැලකිල්ලට ගන්නා පරිදි ගිවිසුමේ කොන්දේසි සකස් කර නොතිබුණි. බේකරි

ආහාර වල මිල සංශෝධනය සම්බන්ධයෙන් අධිකාරිය සිදුකල බේකරි නිෂ්පාදන වර්ග වෙළඳපලේ අලෙවි කරනු ලබන මිල ගණන් අධ්‍යයනයට අදාල විශ්ලේෂණ වාර්තාවට අනුව බේකරි අහාර වර්ග 63 කින් අයිතම 20 ක වෙළඳපළ තොග මිල සැලකිල්ලට නොගෙන සිල්ලර මිල සැලකිල්ලට ගෙන තිබුණි.

(උ) කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී සැපයුම්කාර ආයතනය සමග ඇතිකරගත් ගිවිසුමෙහි 20 වන වගන්තිය අනුව බේකරි ආහාර සඳහා අධිකාරිය විසින් පත්කරන ලද ප්‍රමිති පරීක්ෂා කිරීමේ කමිටුවක් (QVC) මගින් බේකරි ආහාර වල ප්‍රමිතිය පිළිබඳව මාස 03 කට වරක් හෝ කිසියම් පැමිණිල්ලක් මත පරීක්ෂාවට ලක්කළ යුතු බව සඳහන්ව තිබුණ ද, 2022 සැප්තැම්බර් 28 දින දක්වා එවැනි පරීක්ෂාවකට ලක්කර අදාල කමිටුවෙහි සාමාජිකයන් විසින් වාර්තාවක් ලබාදී නොතිබුණි.

**2.3. වෙනත් කරුණු**

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ණය කාලසීමාව ඉක්මවූ මුළු නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 4,795 ක් වූ අතර එය මුළු නැව් නියෝජිත ණයගැති ශේෂයෙන් සියයට 64 ක් විය. එය තුළ වූ රු.මිලියන 2,798 ක් ව පැවති කොළඹ වරායේ ණය කාලසීමාව ඉක්මවූ ශේෂය විගණිත දින වන විට ද නිරවුල් කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කර ඇති (Under Litigation) නැව් නියෝජිත ණයගැති වටිනාකම රු.491,666,581 ක් වූ අතර එයින් කොළඹ වරායට අදාල රු.428,867,567 ක ශේෂය සඳහා ණයගැතියන් 12 දෙනෙකු (Marshal of Admiralty High Court ඇතුළුව) මූල්‍ය කොට්ඨාශය මගින් දක්වා තිබුණ ද එම වටිනාකම තුල වූ රු.20,220,148 ක ණයගැතියන් 4 දෙනෙකු සම්බන්ධයෙන් නඩු පවරා ඇති බවට නීති කොට්ඨාශය මගින් විගණනය වෙත දන්වා නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් දීර්ඝ කාලීනව මුදල් අයකරගෙන නොතිබූ රු. 40,372,508 ක වටිනාකමකින් යුත් පරිශ්‍ර කුලී ණයගැතියෙකු හා රු.3,597,489 ක වටිනාකමින් යුත් නැව් නියෝජිත ණයගැතියන් දෙදෙනෙකු සම්බන්ධයෙන් පවරන ලද නඩු කටයුතු වල නියෝග අධිකාරියට පක්ෂව තීන්දු කර ඇති බව නීති කොට්ඨාශය විසින් විගණනය වෙත දන්වා තිබුණි. කෙසේ වුවද, නියෝග දිනයේ සිට දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද එම තීන්දු ක්‍රියාත්මක කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට ආරවුල් සහිත ණයගැති ශේෂය (dispute debtors) රු.මිලියන 229 ක් සහ නැවත විසඳීම සඳහා (re-dispute) යොමු කල ණයගැති ශේෂය රු.මිලියන 10.8 ක් නිරවුල් නොකර පැවතුණි.

(ඉ) අධිකාරියේ මිලදී ගැනීම් වෙනුවෙන් විවිධ අවස්ථාවලදී සැපයුම්කරුවන් වෙත ගෙවූ රු. මිලියන 331 ක් වූ අත්තිකාරම් ශේෂයක් පැවති අතර එම ශේෂය තුල 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුල ගෙවීම් කරන ලද රු. මිලියන 1.5 ක ශේෂයක් ද මාස 2 ඉක්මවූ රු. මිලියන 30 ක ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට නොපියවා පැවතුණි.

(ඊ) 2022 නොවැම්බර් 21 දිනැති අංක මුකොා/මුගි/කොා/41/2022 දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 6.5 වගන්තිය ප්‍රකාරව බදු දී ඇති පරිශ්‍ර වෙනුවෙන් ලැබිය යුතු බදු මුදල් සහ විදුලි බිල් ප්‍රතිපූර්ණයන් නියමිත කාලය තුල අප්‍රමාදව එකතුකර ගැනීමට ක්‍රමවේදයක් අනුගමනය කල යුතු වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට මාස 6 ඉක්මවූ පරිශ්‍ර කුලී ණයගැතියන් රු. 172,884,699 ක් වූ අතර එය මුළු පරිශ්‍ර කුලී ණයගැතියන්ගෙන් සියයට 76 ක් පමණ විය. 2023 මැයි 24 දින වන විටත් ඉන් රු.1,062,272 ක් පමණක් නිරවුල් වී තිබූ අතර රු.5,614,262 ක මුදලක් ලියාහැරීමට අධිකාරිය කටයුතු කර තිබුණි.

(උ) 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කොට්ඨාශ 25 මගින් ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල විස්තර අනුව තනතුරු 86 කට අදාල අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 914 දෙනෙකු සේවයේ යොදවා තිබුණද අධිකාරියේ මෙහෙයුම් කටයුතු (Operations) සඳහා සෘජුවම සම්බන්ධතාවයක් දක්වන කොට්ඨාශයන්හි සේවකයන් 726 දෙනෙකු පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. එසේම අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන කොට්ඨාශ 10 ක සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී අතිකාල දීමනා වශයෙන් රු. මිලියන 924 ක් ඇතුළුව අධිකාරියේ සමස්ත අතිකාල දීමනාව රු. මිලියන 11,968 ක් ගෙවා තිබුණි.

(ඌ) උතුරු නැගෙනහිර පිවිසුම් කලාප සංකල්පය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට 2018 ජනවාරි 10 දින ගිවිසුම් ගත වී තිබුණි. නමුත් එම ණය මුදල ප්‍රමාණවත් නොවේ යැයි පුරෝකථනය කර ඇ.එ.ජ ඩොලර් මිලියන 16.23 ක අතිරේක මුදලක් සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 61.5 ක් දක්වා එම ණය මුදල ඉහළ නංවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ඉන්දියානු රජය එය අනුමත කර නොතිබුණි. ණය ගිවිසුම අත්සන් කර වසර 05 ක් ගතවී තිබුණ ද වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් ඇ.එ.ජ ඩොලර් මිලියන 0.905 (ඇ.එ.ජ ඩොලර් 905,194.38) ක් පමණක් වැයකර තිබුණු අතර ලබා නොගත් ණය සඳහා කැපකිරීමේ ගාස්තු (Commitment charges) ලෙස ඇ.එ.ජ ඩොලර් 21,139.78 (රු.5,838,633.73) ක මුදලක් සහ ණය පොළිය ලෙස ඇ.එ.ජ ඩොලර් 20,937.57 (රු.6,100,768.26) ක මුදලක් ද අධිකාරිය විසින් අනාර්ථික වියදම් ලෙස දරා තිබුණි.

(එ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිපාලිත සමාගමක් වන ලංකා ගෑස් ටර්මිනල් සමාගමෙහි මෙහෙයුම් කටයුතු සිදු නොවන බවට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබූ අතර 2023 මාර්තු 15 දින වන විටත් මෙම සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය විසින් තීරණයන් ගෙන ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඒ) 2019 දෙසැම්බර් 04 වන දින නෞකාවක් කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තයෙහි ගැටීම නිසා සිදුවූ අනතුර හේතුවෙන් ජය බහාලුම් පර්යන්තයේ ජල වාරකය (Caisson), වේග වළක්වනය (Fenders), වරාය වේදිකා බිත්තිය (Quay wall) යනාදියට හානි සිදුවී තිබුණි. එම හානිය රු.මිලියන 315.90 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එසේම ඉහත හානිය වෙනුවෙන් රු.මිලියන 384.42 ක මුදලක් 2019 දෙසැම්බර් 30 දින අධිකාරිය වෙත ලැබී තිබුණ ද වේග වළක්වනය හැර අනෙකුත් අළුත්වැඩියා කිරීමේ කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි.

(ඔ) 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 2 (1) (අ) වගන්තිය අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රු. මිලියන 2000 ක් ඉක්මවනු ලබන තනි පුද්ගලයන්ගේ, හවුල් ව්‍යාපාර හෝ සමාගමක, බදු අය කළ හැකි ආදායම මත සියයට විසිපහක ප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතුය. 2020/21 වර්ෂයේ අධිකාරියේ බදු අයකළ හැකි ආදායම වන රු. මිලියන 4,420.9 මත ගණනය කල විට අධිභාර බද්ද රු. මිලියන 1,105.2 වුවද, අධිකාරිය රු. මිලියන 1,952.2 ක් අධිභාර බදු ලෙස ගෙවා තිබුණි. තවද මෙලෙස වැඩිපුර ගෙවූ රු. මිලියන 847 ක මුදල 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) අධිකාරියේ විදේශ විනිමයෙන් ලැබෙන ආදායම් දේශීය මුදලට පරිවර්තනයේදී ගැනුම් මිල අනුපාතය (Buying Rate) වෙනුවට වැඩි වටිනාකමක් සහිත විකුණුම් මිල (Selling Rate) යොදාගත් පහත අවස්ථා නිරීක්ෂණය විය.

(i) කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්ත සමාගමේ (CICT) බහාලුම් මෙහෙයුම් ප්‍රමාණය මත එනම් එකහවූ අවම බහාලුම් සංඛ්‍යාව (TEUs) හා ඊට අමතරව මෙහෙයවනු ලබන බහාලුම් සංඛ්‍යාව මත ලැබෙන "රාජ්‍ය භාග" (Royalty) ආදායම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී විකුණුම් මිල භාවිතා කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු දෑ හි වටිනාකම රු.69,547,027 කින් අධිතක්සේරුවී තිබුණි.

(ii) අධිකාරිය වෙත දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම (SAGT) විසින් ගෙවනු ලබන රාජ්‍ය භාග (Royalty) ආදායම හා බදු කුලී (Lease Rent) ආදායමෙන් 2022 දෙසැම්බර් 31

දිනට ලැබිය යුතු වටිනාකම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී විකුණුම් මිල අනුපාතය යොදාගැනීම හේතුවෙන් එකී ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු.5,236,012 න් හා රු.2,936,872 කින් අධිතක්සේරුවී තිබුණි.

(ක) පරිශ්‍ර කුලී ණයගැති ශේෂය තුල පවත්නා NFCL PENNA Port Storage (Pvt) Ltd ණයගැතියාගේ කල්බදු ගිවිසුම "දෙපාර්ශවය විසින්ම ගිවිසුම් කොන්දේසි කඩකිරීම" මත 2022 පෙබරවාරි 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අවලංගු කර 2022 නොවැම්බර් 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව නැවත ක්‍රියාත්මක කර තිබුණි. එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව කල්බදු ගිවිසුම නැවත ක්‍රියාත්මක කිරීමේදී අදාල සමාගම විසින් අධිකාරිය වෙත රු.මිලියන 30 ක් ගෙවීමෙන් ණයගැති ශේෂ නිරවුල් කිරීමට තීරණය කර තිබුණ ද, ලැබිය යුතු මුළු මුදල වන රු.මිලියන 95 ක් තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ග) ශ්‍රී ලංකා වරාය කළමනාකරණ උපදේශන සේවා සමාගම (SLPMCS) විසින් ගාලු මුවදොර පිටියෙහි නඩත්තු කටයුතු සිදු කිරීම වෙනුවෙන් අධිකාරිය වෙත කොමිස් ලෙස ලැබිය යුතු රු.940,230 ක මුදලක් සහ ගාලු මුවදොර පිටියෙහි නවීකරණ කටයුත්තක් වෙනුවෙන් අධිකාරිය විසින් 2018 වර්ෂයේදී වැය කර තිබූ රු.මිලියන 7.61 ක මුදල එම සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**නම**

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ව්‍යවස්ථානුකූල කාර්ය තත්ත්වය**

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ ප්‍රතිපාදන යටතේ කොළඹ වරාය කොමිසම, වරාය(නැව්බඩු) සංස්ථාව, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට 1979 අගෝස්තු 1 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපනය කරන ලදී.

**අපගේ ආයතනික අගය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වූ කලී ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ප්‍රධාන දායකත්වය සපයන ආයතනයන්ගෙන් එකකි. ආදායම් උත්පාදනය කරන සහ සේවා සපයන ප්‍රමුඛ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය එමගින් සපයන සේවාවන්ගේ විශිෂ්ටත්වය සමඟ සෘජුවම බැඳී පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල අධිකාරියේ ඇගයීම් රටාව පරදුභාරකරුවන් සමඟ එහි ඇති මෙහෙයුම් සබඳතාවයේ සාර්ථකත්වයට පදනම වේ. මෙම අගයයන්/ වටිනාකම් පහත පරිදි වර්ග කල හැක.

- විශ්වාසය තැබිය හැකි බව
- කාලානුරූපී බව සහ නිවැරදි බව
- අත්කරගත් ජයග්‍රහණ සඳහා වගවීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායීබව සහ පිළිගැනීම
- සෘජුව කටයුතු කිරීම

ඉහත සඳහන් වටිනාකම්/අගයයන් අධිකාරියේ සෑම මට්ටමකම ප්‍රගුණ කරවීම සභාපති/විධායක නිලධාරී, කළමනාකාර අධ්‍යක්ෂ සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලයේ වගකීම වනු ඇත.

**ප්‍රධාන කාර්යාලය**
**කොළඹ වරාය**

අංක 19, චෛත්‍ය පාර
කොළඹ – 01
දුරකථන: (+94 11) 2421201, 2421231
ෆැක්ස්: (+94 11) 2440651

**ගාලු වරාය**

ක්ලෝසන්බර්ග් ජැටිය
මාගාල්ල
ගාල්ල
දුරකථන: (+94 91) 2232213, 2234936

**ත්‍රිකුණාමලය වරාය**

නව ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය
දුරකථන: (+94 26) 2222460

**බැංකුකරුවන්**

ලංකා බැංකුව (ප්‍රධාන බැංකුව)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

**විගණනකරුවන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක. 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

**වෙබ් අඩවිය/ විද්‍යුත් තැපෑල**

www.slpa.lk/ info@slpa.lk